# බුදු ගුණ භාවනාව

## (අරහං ගුණය)

දන්කන්දේ ධම්මරතන හිමි

(සියළුම හිමිකම් ඇවිරිණි.)

## තමන් තමන්ම රවටා ගැනීමක්

ප්‍රායෝගික පදනමක පිහිටා අප විසින් ඉදිරිපත් කර ඇති ධර්ම දේශනා පොත්-පත් ආදිය උපයෝගී කර ගෙන ප්‍රත්‍යක්ෂමය භාවනා අත්දැකීම් තමා විසින් ම ලබා ගන්නේ නම්, ඒවා එලෙසින්ම කොපිකර ඉදිරිපත් කිරීමෙන් ඇතිකර ගනු ලබන 'තමන් තමන්ම රවටා ගැනීමේ මුලාවෙන්' මිදීමට හැකි බව කරුණාවෙන් සළකන්න.

කවර හෝ උපුටා ගැනීමක් දක්වන අවස්ථාවන්හි දී ඒවායේ මූලාශ්‍රයන් දක්වා සදාචාර සම්පන්න වන එක ඉතා අගනේ ය.

**පළමු මුද්‍රණයෙන්.......**

## අනුස්මරණය

අපගේ මෑණියන්ට බුදුගුණ භාවනාව වැඩීම සඳහා මෙම පොත මුලින්ම ලියා දුන්නේ 1990 ජනවාරි මාසයේ දී ය. ඇය 2009 නොවැම්බර් 28 දින මිය ගියාය. ඇයගේ මරණයෙන් තෙමස් පූරණය වෙනුවෙන්, එය පොතක් වශයෙන් මුද්‍රණය කර නොමිලේ බෙදා දීමට අදහස් කෙළෙමි.

විදර්ශනා භාවනා කිරීම සඳහා ඇයට ලියා දුන් 'තිලකුණු භාවනාව' නමැති පොත, 'නිවන ඔබටත්' නමින් මුද්‍රණය කොට, පිටපත් 2000 ක් නොමිලේ බෙදා හැරියෙමු. එය කියවා, ඒ අනුව පිළිපැද සමහර අය සාර්ථක ප්‍රතිඵල ලබාගත්හ.

මෙම පොත කියවන අයට ද බුදුරජාණන් වහන්සේ ගැන මහත් වූ ශ්‍රද්ධාවක් ජනිත වනු ඇත. එය මහත්ඵල මහානිශංස භාවයක් ලබා දෙන පුණ්‍ය ශක්තියක් වනු නො අනුමාන ය. එවන් මහත් පුණ්‍ය ශක්තියක් අන් අයට ලබා දෙන මෙම ධර්ම දානමය පුණ්‍ය ශක්තියේ බලයෙන්, තව්තිසා දෙව්ලොව ඉපදී සිටින අපගේ මෑණියන්ට සෙසු මාර්ග ඵල අවබෝධ කරගෙන සසර දුක සම්පූර්ණයෙන් නිම කිරීමට වාසනාව ශක්තිය උදාවේවා යි පතමි.

**දන්කන්දේ ධම්මරතන හිමි**
**2010 පෙබරවාරි**

# පටුන

පිටු අංක

1. පිවිසුම 11
2. අරහං ගුණය (බුදුරජාණන් වහන්සේ ලත් ආමිෂ පූජා) 25
3. පූජා මහත්තත්වය 35
4. මහානිශංස 39
5. ශීල 40
6. සමාධි 44
7. ප්‍රඥා 45
8. නික්ලේශීභාවය 54
9. රහසිනුදු පවක් නොකළ බව 55
10. ස්වයම්භූඥාණය (මාර පරාජය) 55
11. අනන්ත ගුණ 59
12. ලබාදුන් ශාන්තිය 61
13. අනන්ත ඍද්ධි 64
14. අනන්ත ආනුභාව 67
15. පාරමිතා ප්‍රකරණය 70

දෙවන කොටස
ප්‍රතිපත්ති පූජා 79
ප්‍රතිපත්ති පූජාවන්ට සුදුසුභාවය 81

තෙවන කොටස
සියලු කෙළෙසුන් කෙරෙන් දුරුවීම 102

සිවුවන කොටස
කෙළෙස් සතුරන් නැසීම 120

පස්වන කොටස
සංසාර චක්‍රයේ අරයන් සිඳලීම 123

හයවන කොටස
විදශීනාවට නැඟීම 133

# පිවිසුම

**පඤ්චිමානි භික්ඛවේ ඉන්ද්‍රියානි. කතමානි පඤ්චඃ සද්ධින්ද්‍රියං, විරියින්ද්‍රියං, සතින්ද්‍රියං, සමාධින්ද්‍රියං, පඤ්ඤින්ද්‍රියං ඉමේසං ඛො භික්ඛවේ පඤ්චන්නං ඉන්ද්‍රියානං සමත්තා පරිපූරත්තා අරහං හෝති, තතෝ මුදුතරේහි අනාගාමී හෝති, තතෝ මුදුතරේහි සකදාගාමී හෝති, තතෝ මුදුතරේහි සෝතාපන්නෝ හෝති.**

(ඉන්ද්‍රිය සංයු.)

මහණෙනි, මේ ඉන්ද්‍රිය ධර්‍ම 5 කි. කවර 5 ක් ද? සද්ධා ඉන්ද්‍රිය, විරිය ඉන්ද්‍රිය, සති ඉන්ද්‍රිය, සමාධි ඉන්ද්‍රිය, පඤ්ඤා ඉන්ද්‍රිය යි.

මේ ඉන්ද්‍රිය ධර්ම 5 සම්පූර්ණයෙන්ම පරිපූරණය කළ විට රහත් වේ.

එයට වඩා අඩුවෙන් වැඩූ අයෙක් අනාගාමී වේ.

එයටත් වඩා අඩුවෙන් වැඩූ අයෙක් සකදාගාමී වේ.

එයටත් වඩා අඩුවෙන් වැඩූ අයෙක් සෝවාන් වේ.

සෝවාන් ආදී මාර්‍ග-ඵල ලබා නිර්‍වාණාවබෝධ කිරීම සඳහා වැඩිය යුතු මෙම ඉන්ද්‍රිය ධර්‍ම 5 න් පළමුවෙන් දක්වා ඇත්තේ ශ්‍රද්ධාවය.

**සද්ධා ධනං** : ශ්‍රද්ධාව ආර්ය ධන 7 අතුරෙන් එකකි.

**සද්ධා බීජං** : නිර්‍වාණාවබෝධය සඳහා ඇතිකර ගත යුතු බීජය ශ්‍රද්ධාව ය.

**සද්ධාය තරති ඕඝං**: කාම ඕඝ, භව ඕඝ, දිට්ඨි ඕඝ, අවිද්‍යා ඕඝ යන සසරෙහි ගසාගෙන යාමට හේතු වූ සැඩ පහරවල් 4 තරණය කරන්නේ ශ්‍රද්ධාවෙනි.

එම නිසා නිවන් දැකීමට ප්‍රාර්ථනා කරන ඔබ තුළ ඇති ශ්‍රද්ධාව, ඉන්ද්‍රිය ධර්‍මයක් වශයෙන් හා බල ධර්‍මයක් වශයෙන් දියුණු කර ගැනීම අත්‍යවශ්‍යය ය. තම සිත තුළ ශ්‍රද්ධාව අධිපතිකම් කරන ලෙසින්, ඉසුරු භාවයක් උසුලන විට ශ්‍රද්ධාව ඉන්ද්‍රිය ධර්‍මයක් ලෙස වැඩෙන අතර, '**අස්සද්ධියේ අකම්පියට්ඨේන සද්ධා බලං**' අශ්‍රද්ධාව ඇතිකර දෙන, ශ්‍රද්ධාව නැති වී යන කරුණකදී පවා, නො සැලී පවත්නා ශ්‍රද්ධාවක් ඇති විට, එය බල ධර්‍මයක් ලෙස වැඩේ. ත්‍රිවිධ රත්නය කෙරෙහි පවත්නා කිසිදිනක, මොනම හේතුවකටවත් නො සැලෙන ශ්‍රද්ධාවක්, අචල ශ්‍රද්ධාවක් ඇති වන්නේ සෝවාන් වූ පසු පමණි.

මෙලෙසින් ශ්‍රද්ධාව ඉන්ද්‍රිය ධර්මයක් හා බල ධර්මයක් වශයෙන් දියුණු කර ගැනීමට බුදුගුණ භාවනාව බෙහෙවින් උපකාරී වේ. ඒ තුළින් බුද්ධ රත්නය කෙරෙහි අප්‍රමාණ ශ්‍රද්ධාවක් හා ගෞරවයක් ජනිත වේ. කායික හා මානසික සුවයක් ද, ප්‍රීතියක් ද ඇති වේ. කෙලශ ධර්ම, නීවරණ ධර්ම යටපත් වේ. සම්මා සතිය දියුණු වන අතර චිත්ත ඒකාග්‍රතාවයක් ද දියුණු කර ගැනීමට ඉවහල් වන බුදුගුණ භාවනාව ඥාන සම්ප්‍රයුක්තව හා විදර්ශනාව වැඩෙන අයුරින් කළ හොත්, ඒ තුළින්ම වුව ද මාර්ග - ඵල අවබෝධ කළ හැකි ය. සිත විසිර යාමට ඉඩ නොදී, අවබෝධයෙන් යුතුව මේ පොත කියවීමම බුදුගුණ භාවනාවක් වන්නේ ය. විදසුන් ඇසකින් දැකිය යුතු කොටස්, තමාටම ප්‍රත්‍යක්ෂ අවබෝධයන් ඇතිවන සේ කියවීමෙන්, ඔබට ද පාරමී පුණ්‍ය ශක්තියක් ඇත්නම්, සමහරවිට මේ ජීවිතයේ දී ම වුවත් නිවන් අවබෝධ කර ගැනීමේ හැකියාවක් තිබිය හැකි ය. ඒ සඳහා මෙම පොත වරක් කියවා පසෙක තබන්නේ නැතිව, නැවත නැවත කියවා ප්‍රත්‍යක්ෂ අවබෝධයක් ඇතිකර ගැනීම අත්‍යවශ්‍ය ය.

## බුදුගුණ භාවනාව වැඩිය හැකි ආකාර

බුදුගුණ භාවනාව වැඩිය හැකි ක්‍රම කිහිපයක් ඇත.

**(1) පළමු ක්‍රමය**

'බුද්ධෝ' කියන වචනය පමණක් හැකි සැමවිටම සිහිපත් කිරීම. මෙය යම් යම් කායික ක්‍රියාවන් කරන අතරතුරේ දී වුවත් කළ හැකි ය. දවසේ වැඩි කාලයක් ඒ සඳහා මිඩංගු කළහොත්, සම්මා සතිය ඉතා ඉක්මණින් දියුණු කර ගත හැකි වන අතර, සම්මා සමාධිය දියුණු කර ගැනීමට ද එය උපකාරී වේ.

මෙසේ 'බුද්ධෝ' යන වචනය නිතර සිහිපත් කරන සමහර අයට සමාධි නිමිති පවා දර්ශනය වේ. ඒ සමාධි නිමිති නැවත නැවත ඇතිකර ගනිමින් වශී භාවයකට පත්කර ගැනීමෙන් ධ්‍යාන සිතක් වුව ද උපදවා ගත හැකි වනු ඇත.

මේ භවයේදී හෝ, මීට පෙර භව වලදී විදර්ශනා භාවනාව ප්‍රගුණ කර ඇති කෙනකුට නම්, බුද්ධෝ යන වචනයේ අර්ථය නැවත නැවත, මතුවි මතුවී ඒම තුළින්, චතුරාර්ය සත්‍ය ධර්මයන් ප්‍රතිවේධ කිරීමට පවා හැකිවනු ඇත.

(2) දෙවන ක්‍රමය

නව අරහාදී බුදුගුණ මුල සිට අගටත්, අග සිට මුලටත් සජ්ඣායනා කිරීම හෝ සිතීම.

මෙය තමා ඉතා ප්‍රිය කරන බුද්ධ ප්‍රතිමාවක් දෙස බලාගෙන ප්‍රගුණ කළ හැකි නම් එය වඩා සුදුසු ය. මෙවිට සමහර අයට බුදුරජාණන් වහන්සේ හෝ එම ප්‍රතිමාවක් හෝ බුදු රැස් වැනි දෙයක් හෝ දර්ශනය වන අවස්ථා ද තිබේ. එසේ දක්නා බුද්ධ ප්‍රතිමාවක් වැනි දෙයක් තමාගේ හදවත තුළම දිස්වේවා යි අධිෂ්ඨාන කළ පසු, එය හදවත තුළ දිස් වුවහොත්, අසීමිත ශ්‍රද්ධාවක් හා ප්‍රීතියක් ජනිත වේ.

එවැන්නක් නැවත උපදවා ගැනීමේ අභිලාෂයෙන් හෝ ඒවා කෙරෙහි ආශාවෙන් හා බැඳීමෙන් කටයුතු කරන කෙනකුට නැවත එවැනි අත්දැකීමක් ලබා ගැනීමට අසීරු වේ.

බුදුගුණ 9 මුල සිට අගට:

අරහං - සම්මා සම්බුද්ධෝ - විජ්ජාචරණ සම්පන්නෝ - සුගතෝ - ලෝකවිදූ - අනුත්තරෝ පුරිසදම්ම සාරථී - සත්ථා දේවමනුස්සානං - බුද්ධෝ-භගවා.

බුදුගුණ 9 අග සිට මුලට

භගවා - බුද්ධෝ - සත්ථා දේවමනුස්සානං - අනුත්තරෝ පුරිසදම්ම සාරථී - ලෝකවිදූ - සුගතෝ - විජ්ජාචරණ සම්පන්නෝ - සම්මා සම්බුද්ධෝ - අරහං.

(3) තෙවන ක්‍රමය

අරහං ආදී එක් එක් බුදුගුණය තුළ අන්තර්ගත වන කරුණු තරමක් විස්තර සහිතව අවබෝධ කර ගැනීම.

මේවා කට පාඩම් කර ගෙන නැවත නැවත සිහිපත් කරන්න. ටික දවසක් ගත වූ පසු, ඒවා සිත තුළින් නිරායාශයෙන්ම මතුවි මතුවී එනවා නම් එය වඩා සුදුසු ය.

අරහං:

ඒ භාග්‍යවත් වූ, අරහත් වූ, සම්මා සම්බුදුරජාණන් වහන්සේ

1. වාසනා සහිත සියලු කෙලශයන්ගෙන් දුරු වූ බැවින් ද,
2. රාගාදී කෙළෙස් සතුරන් නැසූ බැවින් ද,
3. සංසාර චක්‍රයේ අවිද්‍යාව ආදී අංගයන් සිඳලූ බැවින් ද,
4. ආමිස ප්‍රතිපත්ති පූජාවන්ට සුදුසු වූ බැවින් ද,

5. රහසිනිදු පවක් නො කළ බැවින් ද
අරහත් නම් වන සේක.

**සම්මා සම්බුද්ධෝ:**

ඒ භාග්‍යවත් වූ, අරහත් වූ, සම්මා සම්බුදුරජාණන් වහන්සේ පරෝපදේශ රහිතව ස්වයංභූඥානයෙන්

1. පිරිසිඳ දත යුතු දුක්ඛ සත්‍යය පිරිසිඳ දත් බැවින් ද,
2. ප්‍රහාණය කළ යුතු සමුදය සත්‍යය ප්‍රහාණය කළ බැවින් ද,
3. සාක්ෂාත් කළ යුතු නිරෝධ සත්‍යය සාක්ෂාත් කළ බැවින් ද,
4. වැඩිය යුතු මාර්ග සත්‍යය වැඩූ බැවින් ද,
5. සියල්ල දන්නා සර්වඥානයෙන් සමන්නාගත වූ බැවින් ද,

සම්මා සම්බුද්ධ නම් වන සේක.

**විජ්ජාචරණ සම්පන්නෝ:**

ඒ භාග්‍යවත් වූ, අරහත් වූ, සම්මා සම්බුදුරජාණන් වහන්සේ

1. ප්‍රාතිමොක්ෂ සංවර ශීලය
2. ඉන්ද්‍රිය සංවර ශීලය,
3. භෝජනයෙහි පමණ දැනීම ආදී ප්‍රත්‍ය සන්නිශ්‍රිත ශීලය
4. ජාගරියානුයෝගය (නිදි වැරීම)
5. ශ්‍රද්ධාව
6. හිරි (පවට බිය)
7. ඔතප් (පවට ලජ්ජාවීම)
8. බහුශ්‍රැත භාවය
9. වීර්යය
10. සතිය
11. ප්‍රඥාව
12. පළමු ධ්‍යානය
13. දෙවන ධ්‍යානය
14. තෙවන ධ්‍යානය
15. සතරවන ධ්‍යානය සහිත සියලු ආනෙඤ්ජ ධ්‍යාන

යන පසළොස් චරණ ධර්මයන්ගෙන් ද, එසේම

1. විදර්ශනා ඥාන (උදයබ්බ - භංග ආදී ඥාන)
2. මනෝමය ඍද්ධි ඥානය (තමන් වහන්සේ වැනි රූප මැවීමේ ඥානය)
3. ඍද්ධිවිධ ඥානය, (විවිධ ඍද්ධි ප්‍රාතිහාර්ය පෑමේ ඥානය)

4. දිබ්බසෝත ඥානය (බොහෝ ඈත ඉතා සියුම් ශබ්ද පවා ඇසිය හැකි ඥානය)
5. පරචිත්ත විජානන ඥානය (අන් අයගේ සිත් බැලිය හැකි ඥානය)
6. පුබ්බේ නිවාසානුස්සති ඥානය (පෙර භව දැකීමේ ඥානය)
7. දිබ්බචක්ඛු ඥානය (පියවි ඇසට නො පෙනෙන දෙවියන් වැනි අය හෝ දේවල් දැකිය හැකි ඥානය)
8. ආශ්‍රවක්ෂය ඥානය (සියලු ආශ්‍රව ක්ෂය කර චෙතෝ විමුත්තියට හා ප්‍රඥා විමුත්තියට සම වැද සිටීමේ ඥානය) යන අෂ්ඨ විද්‍යාවන්ගෙන් ද සමන්නාගත වූ බැවින්

විජ්ජාචරණ සම්පන්න නම් වන සේක.

**සුගතෝ:**

ඒ භාග්‍යවත් වූ, අරහත් වූ, සම්මා සම්බුදුරජාණන් වහන්සේ

1. සම්මා සම්බුද්ධත්වය ලැබීම සඳහා පාරමිතා - උප පාරමිතා පරමත්ථ පාරමිතා පුරමින් උතුම් වූ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කළ බැවින් ද,
2. පරම ශාන්ත නිර්වාණ ධාතුවට ගමන් ගත් බැවින් ද,
3. මග-ඵල නැණින් නසන ලද කෙළෙස් නැවත නූපදවමින් ගමන් ගත් බැවින් ද,
4. ලෝක සත්ත්වයා සසර දුකින් මුදවාලීමට සමත් වූ, සාර්ථක වූ සද්ධර්ම දේශනා ඇති බැවින් ද,
5. කර්ණරසායන, බ්‍රහ්මස්වර වාග් විලාශයකින් සමන්නාගත වූ බැවින් ද,
6. දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් හෙබි, සවණක් ඝන රැසින් බැබළුණු උතුම් ශරීර ශෝභාවකින් සමන්නාගත වූ බැවින් ද

සුගත නම් වන සේක.

**ලෝකවිදූ:**

ඒ භාග්‍යවත් වූ, අරහත් වූ, සම්මා සම්බුදු රජාණන් වහන්සේ

1. ස්කන්ධ - ධාතු - ආයතන ආදී ලෝකය දත යුතු සෑම ආකාරයකින්ම අවබෝධ කළ බැවින් ද,
2. කාම ලෝක - රූප ලෝක - අරූප ලෝක ආදී සත්ත්ව ලෝකය සර්වප්‍රකාරයෙන්ම අවබෝධ කළ බැවින් ද,

3. අනන්ත වූ චූලනිකා - මජ්ඣිමා - මහා සහශ්‍රී ආදී අනන්ත අභ්‍යවකාශ ලෝක ධාතූන් සර්ව සම්පූර්ණව ම අවබෝධ කළ බැවින් ද,
4. අනිත්‍ය - දුක්ඛ - අනාත්ම - ශූන්‍ය ආදී ලෝක ස්වභාවයන් නිරවශේෂ වශයෙන් අවබෝධ කළ බැවින් ද,
5. ලෝකය - ලෝක සමුදය - ලෝක නිරෝධය සහ ලෝක නිරෝධ ගාමිණී පටිපදාව දත යුතු සෑම ආකාරයකින්ම අවබෝධ කළ බැවින් ද

ලෝකවිදූ නම් වන සේක.

**අනුත්තරෝ පුරිසදම්ම සාරථීඃ**

ඒ භාග්‍යවත් වූ, අරහත් වූ, සම්මා සම්බුදු රජාණන් වහන්සේ

1. මහා ශීලස්කන්ධයෙන් ඔබවහන්සේ හා සමාන අන් අයකු නො මැති ලෙසින්ම අනුත්තර වූ බැවින් ද,
2. අසම සම මහා සමාධිස්කන්ධයෙන් අනුත්තර වූ බැවින් ද,
3. අසමසම මහා ප්‍රඥාස්කන්ධයෙන් අනුත්තර වූ බැවින් ද,
4. අසමසම විමුක්තිස්කන්ධයෙන් උත්තරීතර වූ බැවින් ද,
5. මහා විමුක්ති ඥාන දස්සන ස්කන්ධයෙන් අසමසම වූ බැවින් ද,
6. අනන්ත පුණ්‍ය ශක්තියෙන්, අනන්ත ගුණ සම්පත්තියෙන්, අනන්ත ඥානයෙන්, අනන්ත තේජසින්, අනන්ත ආනුභාවයෙන්, අනන්ත ඍද්ධියෙන් ආදී සෑම සියලු දෙයකින් ම අග්‍රගණ්‍ය - උත්තරීතරම වූ බැවින් ද,
7. දමනය කළ යුතු මනුෂ්‍ය - අමනුෂ්‍ය - දිව්‍ය - බ්‍රහ්ම - තිරච්ඡාන ආදී සත්ත්වයන් යහපත් අයුරින්ම දමනය කළ බැවින් ද,
8. නිවනට පත් කළ 24 අසංඛ්‍යයන් දිව්‍ය - බ්‍රහ්ම - මනුෂ්‍ය ආදී සත්ත්වයන් සදාකාලික වශයෙන් ම හා උත්තරීතර ආකාරයෙන් ම දමනය කළ බැවින් ද

අනුත්තරෝ පුරිසදම්ම සාරථී නම් වන සේක.

**සත්ථා දේවමනුස්සානංඃ**

ඒ භාග්‍යවත් වූ, අරහත් වූ, සම්මා සම්බුදුරජාණන් වහන්සේ

1. දෙවියන් වන, බ්‍රහ්මයන් වන, මනුෂ්‍යයන් වන, සතර අපායට ගමන් කරවන, නිවන් ලබා දෙන සියලු ප්‍රතිපදාවන් දන්නා

සම්බත්ථ ගාමිණී පටිපදා ඥානයෙන් සමන්නාගත ව,

i. මේ ලෝකාර්ථ ශුභ සිද්ධිය සඳහා ධර්මය දේශනා කළ බැවින් ද,

ii. පරලෝකාර්ථ ශුභසිද්ධිය සඳහා ධර්මය දේශනා කළ බැවින් ද,

iii. නොවරදවා ම, නිසැක වශයෙන්ම නිවනට පමුණුවන, නිර්වාණ ශුභ සිද්ධිය සඳහා වූ ධර්මය දේශනා කළ බැවින් ද,

2. සත්ත්වයන්ගේ ඉන්ද්‍රිය - ආශ්‍රව - අනුශය - අධිමොක්ඛ - චරිත ආදී සියල්ල දන්නා ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥානයෙන් හා ආසයඅනුසය ඥානයෙන් සමන්නාගතව, ඒ ඒ සත්ත්වයාට සුදුසු සුදුසු වන, නො වරදින ආකාරයෙන් ම ධර්මය දේශනා කොට අනන්ත අප්‍රමාණ සත්ත්වයා සසර දුකින් එතෙර කරවූ බැවින් ද,

3. 10,000ක් සක්වළ දෙවියන් බ්‍රහ්මයන් සහිත ලෝක සත්ත්වයාට අනුත්තර වූ ශාස්තෘන් වහන්සේ වූ බැවින් ද,

සත්ථා දේවමනුස්සානං වන සේක.

බුද්ධෝ:

ඒ භාග්‍යවත් වූ, අරහත් වූ, සම්මා සම්බුදුරජාණන් වහන්සේ

1. ස්කන්ධ - ධාතු - ආයතන ආදී ධර්මයන් ද, ඒවායේ සමුදය ද, නිරෝධය ද, නිරෝධගාමිණී පටිපදාව ද, ඒවායේ ආශ්වාදය ද, ආදීනව ද, නිස්සරණය ද සර්වාකාරයෙන්ම අවබෝධ කොට, අන් අයට ද ඒවා අවබෝධ කරවූ බැවින් ද,
2. සියලු සංස්කාර ධර්ම අනිත්‍ය වශයෙන් ද, දුක් වශයෙන් ද, සියලුම ධර්ම අනාත්ම වශයෙන් ද අවබෝධ කර ගෙන, අන් අයට ද ඒවා අවබෝධ කර වූ බැවින් ද,
3. 'අවිද්‍යාව නිසා සංස්කාර ජනිත වේ' ආදී සංසාර චක්‍රය හෙවත් පටිච්ච සමුප්පාද ධර්මයන් අනුලෝම හා ප්‍රතිලෝම වශයෙන් අවබෝධ කොට, අන් අයට ද අවබෝධ කර වූ බැවින් ද,
4. හේතූන්ගෙන් හටගත් සියලුම ධර්ම, නිරුද්ධ වී යන බව මැනවින් අවබෝධ කර, අන් අයට ද අවබෝධ කර වූ බැවින් ද,

5. කාමාශ්‍රව - භවාශ්‍රව - දිට්ඨාශ්‍රව - අවිජ්ජාශ්‍රව යන ආශ්‍රව ධර්මයන් ද, ඒවායේ සමුදය - නිරෝධය හා නිරෝධගාමිණී පටිපදාව අවබෝධ කර ගෙන, අන් අයට ද ඒවා අවබෝධ කර වූ බැවින් ද,
6. දුක්ඛ සත්‍යය - සමුදය සත්‍යය - නිරෝධ සත්‍යය - මාර්ග සත්‍යය සර්වසම්පූර්ණයෙන්ම අවබෝධ කොට, අන් අයට ද අවබෝධ කර වූ බැවින් ද

බුද්ධ නම් වන සේක. (පටිසම්භිදා මග්ග පාළියට අනුව)

භගවා:

ඒ භාග්‍යවත් වූ, අරහත් වූ, සම්මා සම්බුදුරජාණන් වහන්සේ

1. මහත් වූ පුණ්‍ය භාග්‍යය, ධර්ම භාග්‍යය, යසස් භාග්‍යය, ලාභ සත්කාර ආදී කාම භාග්‍යය, රූප ශ්‍රී භාග්‍යය ආදී භාග්‍යයන්ගෙන් සමන්නාගත වූ බැවින් ද,
2. කිසිවකුටත් මැඩලිය නො හැකි වූ චිත්තේශ්වර භාවය, ධර්මේශ්වර භාවය, ලෝකේශ්වර භාවය ආදී ඓශ්වර්ය භාග්‍යයන්ගෙන් සමන්නාගත වූ බැවින් ද,
3. රූපාවචර ධ්‍යාන, අරූපාවචර ධ්‍යාන, මෙත්තා - කරුණා - මුදිතා - උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහාර, අටඨ විමෝක්ෂ, අටඨ අභිභායතන, නව අනුපුබ්බ නිරෝධ ධර්ම ආදියෙන් සමන්නාගත වූ බැවින් ද,
4. සතර සතිපට්ඨාන ආදී සත්තිස් බෝධිපාක්ෂික ධර්ම සර්ව සම්පූර්ණයෙන් වැඩූ බැවින් ද,
5. අධි ශීල - අධි චිත්ත - අධි ප්‍රඥාවන්ගෙන් යුක්ත වූ බැවින් ද,
6. භාවිත කාය, භාවිත සීල, භාවිත චිත්ත, භාවිත ප්‍රඥා ඇති බැවින් ද,
7. රාග - දෝෂ - මෝහ සංඛ්‍යාත සියලු කෙළෙස් නැසූ බැවින් ද,
8. අර්ථ රස - ධම්ම රස - විමුක්ති රස සහ කාය විවේක, චිත්ත විවේක, උපධි විවේක වලින් යුතුවූ බැවින් ද,
9. දිව්‍ය විහරණ, බ්‍රහ්ම විහරණ, අරිය විහරණ වලින් වැඩ සිටිය බැවින් ද,
10. අනිමිත්ත - අප්පණිහිත - සුඤ්ඤත යන විමෝක්ෂ වලින් සමන්නාගත බැවින් ද,

11. දස තථාගත බල, චතු වේසාරජ්ජ ඥාන, චතු පටිසම්භිදා, ඡළභිඤ්ඤා ආදියෙන් සමන්නාගත වූ බැවින් ද,
12. විවිධාකාරයෙන් ධර්මය බෙද බෙදා පෙන්වා වදාළ බැවින් ද,
13. සසර ගමනේ අන්තයට ගිය බැවින් ද

භගවා නම් වන සේක. (පටිසම්භිදා මග්ග පාළියට අනුව)

(4) **සිව්වන ක්‍රමය:**

එක් එක් බුදුගුණයක් තුළ අන්තර්ගත ඉහත කී කරුණු තව තවත් විග්‍රහ කරමින් විස්තර වශයෙන් බැලීම.

උදාහරණ වශයෙන් 'ස්වයංභූඥානයෙන් දුක්ඛ සත්‍යය පිරිසිඳ දත් නිසා සම්මා සම්බුද්ධ ය' කියන කොටස ගතහොත්, උන්වහන්සේ ජාති දුක අවබෝධ කර ගත් බව, ජරා දුක - ව්‍යාධි දුක - මරණ දුක - සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාස දුක - අප්‍රිය සම්ප්‍රයෝග දුක - ප්‍රිය විප්‍රයෝග දුක - කැමැති දෑ නො ලැබීමේ දුක - පංචස්කන්ධ දුක - මනුෂ්‍ය ලෝක දුක, තිරිසන් ලෝක දුක, ප්‍රේත ලෝක ආදී සතර අපා දුක අවබෝධ කර ගත් ආකාරය, විස්තර වශයෙන් විමස විමසා බැලිය හැකි ය. මෙලෙසින් සෑම බුද්ධ ගුණයක්ම විස්තර වශයෙන් බැලීමට පුළුවන.

මෙම පොතේ දක්වා ඇත්තේ අරහං ගුණය ගැන දැක්වූ එවැනි විස්තරයකි. එහි 'සියලු ආමිස - ප්‍රතිපත්ති පූජා පිළිගැනීමට සුදුසු වූ බැවින් අරහත් ය' යන කොටස විස්තර කරන විට, බුදුරජාණන් වහන්සේ ලත් ආමිස හා ප්‍රතිපත්ති පූජාවන් කෙටියෙන් සඳහන් කර, එම පූජාවන් ලැබීමට සුදුසු වන්නේ කවර හෙයින්ද යන්න වෙන් වෙන් වශයෙන් විස්තර කර ඇත. එහෙත් 'කෙළෙස් සතුරන් නැසූ බැවින් හා සංසාර චක්‍රයේ අරයන් සිඳලූ බැවින් අරහත් නම් වන සේක යන ගුණයන් ගැන දක්වා ඇත්තේ හැඳින්වීම් මාත්‍රයක් පමණකි.

(5) **පස්වන ක්‍රමය:**

අනන්ත බුදුගුණ අතරින් අපට ඇති කර ගත හැකි ගුණ හැකි තරම් ගැඹුරින් හා පළල්ව තමා තුළ ඇති කර ගනිමින් බුදුගුණ භාවනා කිරීම.

ඉහත දක්වා ඇති සෑම ක්‍රමයකටම වඩා ඉතා උසස් බුදුගුණ භාවනා ක්‍රමය මෙය වේ.

වෙනත් සම්මා සම්බුදු කෙනකුට හැර අන් කවරකුටවත් බුදුරජාණන් වහන්සේගේ ගුණ ඒ ආකාරයෙන්ම ඇති කර ගැනීමට කිසිසේත්ම නො හැකි ය. එහෙත් අපගේ ප්‍රඥාවේ මට්ටමට අනුව, සමහර ගුණධර්ම දියුණු කර ගැනීමේ හැකියාව අපට ඇත.

උදාහරණ වශයෙන්, බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා සමාපත්ති ඥානය ගැන සිතන විට, උන්වහන්සේගේ සිත තුළ ලෝක සත්ත්වයා කෙරෙහි කරුණාව පහළ වූ ආකාරය අවබෝධ වන කල අප සිත තුළ ද නිරායාශයෙන්ම කරුණාවක් ජනිත වේ. මේ තුළින්ම කෙනකුට කරුණා භාවනාවෙන් ලබනා ධ්‍යාන සිතක් වුව ද උපදවා ගත හැකි වේ.

මෙසේම උන්වහන්සේ ක්ෂාන්තිවාදී ජාතක වැනි අවස්ථාවල දී තමා මරන, මරවන හතුරන්ටත් මෛත්‍රිය පැතුරූ ආකාරය දැන, තමනුත් එලෙසින් මෛත්‍රිය පැතුරුවහොත්, මෛත්‍රී ධ්‍යානවලට පවා සම වැදිය හැකි ය.

උන්වහන්සේ ජාති දුක - ජරා දුක ආදී දුක්ඛ සත්‍යය කෙතෙක් නම් ගැඹුරින් දුටුවා දැයි අපට අවබෝධ වී පෙනී යන විට, අපගේ සිත තුළ ද දුක්ඛ සත්‍යය ගැන මනා අවබෝධයක් ජනිත වේ.

ස්කන්ධ - ධාතු - ආයතන ආදී සංස්කාර ධර්ම අනිත්‍ය - දුක්ඛ - අනාත්ම ආදී ලෙසින් උන්වහන්සේ අවබෝධ කළ ආකාරය අපට වැටහී යන විට, අපගේ සිත තුළ ද ත්‍රිලක්ෂණාවබෝධයක් ජනිත වේ.

මේ අයුරින් සමථ හා විදර්ශනා භාවනාවත් බුදුගුණ භාවනාව තුළින්ම වුවත් දියුණු කර ගෙන, ධ්‍යාන හා මාර්ග ඵල සිත් උපදවා ගත හැකි ය. එහෙත් බුදුගුණ භාවනාව තුළින් උපදවා ගත හැක්කේ ධ්‍යාන මට්ටමකටත් වඩා අඩු උපචාර සමාධියක් පමණක් ය යන්න, සම්ප්‍රදායික වශයෙන් පිළිගත් අදහස යි. මෙහි ඇති සාවද්‍ය භාවය, බුදුරජාණන් වහන්සේ වදාළ පහත දැක්වෙන පාඨයෙන් පමණක් වුව ද තේරුම් ගත හැකි ය.

''ඒකධම්මෝ භික්ඛවේ භාවිතෝ බහුලීකතෝ ඒකන්ත නිබ්බිදාය විරාගාය නිරෝධාය උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය

**නිබ්බාණාය සංවත්තති. කතමෝ එකෝ ධම්මො: බුද්ධානුස්සති...**
(අංගු. නිකාය)
මහණෙනි, එකම ධර්මයක් භාවනා වශයෙන් වැඩීම, ඒකාන්තයෙන් සසරෙහි කලකිරීම සඳහා, සසරෙහි නො ඇලීම සඳහා, රාගාදී කෙලශ ධර්මයන්ගේ නිරෝධය සඳහා, කෙළෙස් සංසිඳීම සඳහා, සංස්කාර ධර්ම අනිත්‍යාදී වශයෙන් විශිෂ්ඨ ඥානයකින් දැනගැනීම සඳහා, සම්බෝධිය සඳහා, නිවන සඳහා පවත්නේ ය. ඒ එකම ධර්මය කුමක් ද: බුද්ධානුස්සතිය යි.

(6) හයවන ක්‍රමය
බුදුගුණ භාවනාව විදර්ශනාවට හරව හරවා බැලීම.
මෙය ආකාර කිහිපයකින් ම කළ හැකි ය.

(i) අරහං - සම්මා සම්බුද්ධෝ ආදී ගුණ සිහිකරන විට, අරහං කියා සිතූ සිත්, සම්මා සම්බුද්ධෝ කියා සිතන විට නැත. ඒවා අනිත්‍යයට ගොස් නිරුද්ධ වී ගොස් ඇත. සම්මා සම්බුද්ධෝ කියා සිතන විට පහළ වූ සිත්, ඊළඟ බුදුගුණ පදය සිහි කරන විට, අනිත්‍යයෙන් නිරෝධයට පත් වේ. මේ අනිත්‍යයට යාම සහ නිරුද්ධ වී යාම ප්‍රත්‍යක්ෂ ලෙස දකිමින් භාවනා කළ හැකි ය. එය පුරුදු වූ පසු අරහං ආදී එක් එක් පදයක එක් එක් අකුර සිහිවන සිතුවිලි අනිත්‍යයට හා නිරෝධයට පත්වන හැටි දැකිය හැකි වේ. ඒ සඳහා මුලදී අ-ර-හ-ං ආදී වශයෙන් මද ප්‍රමාදයකින් යුතුව ඒ පදය සිතමින් හෝ කියමින් භාවනා කිරීම සුදුසු ය. පසුව සාමාන්‍ය පරිදි එසේ අරහං ආදී වශයෙන් සිතීම හෝ කීම කළ හැකි ය.
මීට පසුව මේ අනිත්‍යයට යන ධර්මයන්ගේ ''මම, මගේ'' කියා ගැනීමට කුමක් ශේෂ වේදැයි අවබෝධ වන විට අනාත්ම ලක්ෂණය ප්‍රකට වේ.
මෙලෙසින් කටයුතු කිරීමෙන් පමණක් වුව ද, පාරමී ශක්තියක් ඇති කෙනකුට නිවන අවබෝධ කළ හැකි ය.

(ii) ක්‍රමය: බුදුගුණ භාවනාව කරන විට සත්‍ය වශයෙන් සිදු වූයේ කුමක් දැයි දකින්න. සත්‍ය වශයෙන් සිදු වන්නේ සිතුවිලි නාම ධර්ම ඇති වි ඇති වී, නැති වි නැති වී යාම පමණි. මෙම

සිතුවිලි ඇතිවෙමින් නැතිවෙමින් යාම හැර බුදුගුණ භාවනාව කරන ''මමෙක්' නො මැති බව එවිට වැටහේ. නැති වී යන සිතුවිලිවල ඉතිරි වන්නේ කුමක් ද? කුමක් ගැන සිතුවත් සිදුවන ක්‍රියාදාමය මෙය යි. නිරන්තරයෙන් ඇතිවෙමින් නැතිවෙමින් යන කයක් හා සිතක් හැර වෙනත් අන් කිසිවක් තිබේදැයි බලන්න. නැති වී යන මේ නාම රූප ධර්මවල කවර නම් මමෙක්ද? ආත්මයක් වශයෙන් ගන්නට කුමක් නම් ශේෂ වේද? ප්‍රත්‍යක්‍ෂ ලෙස මේ කරුණු දැකීම තුළින් වුව ද අනාත්ම ලක්‍ෂණ අවබෝධ වී නිවන් දැකිය හැකි ය. මේ සඳහා සුදුසු උපදෙස් සුදුසු කෙනකුගෙන් ලබා ගත යුතු බව අමතක නො කළ යුතු ය.

(මේ පොතේ ඇති විදර්ශනා කොටස ද බලන්න.)

කල්ප ගණන් 'බුද්ධ' යන වචනය පවා අසන්නට නො ලැබෙන කාල ඇත. එබැවින් මේ වටිනා බුද්ධොත්පාද කාලයේ, මහත්ඵල මහානිසංස ලබාදෙන බුදුගුණ භාවනාව වඩන්න.

මෙම පොත කියවීමම බුදුගුණ භාවනාවක් වන අතර, එයින් ඔබ සිත තුළ අසීමිත ශ්‍රද්ධාවක් ඇති වන බව නියත ය. බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඇතිකර ගන්නා ශ්‍රද්ධා මාත්‍රයකින්, ප්‍රේම මාත්‍රයකින් පවා මහා විපාක ශක්තියක් ලබා දෙන බව සංයුත්ත නිකායේ සරකානි සූත්‍රයේ බුදුරජාණන් වහන්සේ විසින්ම වදාරා ඇත. අසීමිත වූ ශ්‍රද්ධාවක් ඇතිවීමෙන් ජනිත වන පුණ්‍ය ශක්තිය අසීමිත ය.

**එවං අචින්තියා බුද්ධා - බුද්ධ ධම්මා අචින්තියා**
**අචින්තියෙසු පසන්නානං - විපාකො හොති අචින්තියො**
(බුද්ධාපදාන පාළි)

සිතා නිම කළ නො හැකි ගුණ සාගරයක් වූ බුදුරජාණන් වහන්සේ අචින්තිය ම ය. ධර්ම රත්නය ද අචින්තිය ම ය. අචින්තිය වූ බුද්ධ රත්නය හා ධර්ම රත්නය කෙරෙහි ඇති කර ගත් ප්‍රසාදය, ශ්‍රද්ධාව තුළින් අචින්තියමය වූ විපාක ශක්තියක් ලැබේ.

මේ පොත කියවන සෑම කෙනකුටම එවැනි අසීමිත පුණ්‍ය ශක්තියක් ලැබෙනු ඇත. විදර්ශනාවට තරමක නැඹුරුභාවයක් දක්වමින් මේ පොත ලියා ඇති බැවින් මෙය කියැවීමෙන් විදර්ශනාමය දැනුමක්

ද ඇතිවනු ඇත. එය කෙදිනක හෝ නිවන් සුව ලැබීම සඳහා හේතු වේ.

දන්කන්දේ ධම්මරතන හිමි

# අරහං ගුණය

නමොතසස භගවතො අරහතො සමමා සමබුදධසස

**සො භගවා පච්චයාදීනං අරහනතා ඉතිපි අරහං,**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ සියලු ම පූජා පිළිගැනීමට සුදුසු වූ හෙයින් ද අරහත් නම් වන සේක.

**සො භගවා ආමිස පූජාය අරහනතා ඉතිපි අරහං**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ සියලු ම ආමිස පූජාවන්ට සුදුසු වූ හෙයින් ද අරහත් නම් වන සේක.

**සො භගවා පටිපතති පූජාය අරහනතා ඉතිපි අරහං**

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ සියලු ම ප්‍රතිපත්ති පූජාවන්ට සුදුසු වූ හෙයින් ද අරහත් නම් වන සේක.

## බුදුරජාණන් වහන්සේ ලැබූ ආමිෂ පූජා

1. (i) ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේ එදා දීපංකර ශ්‍රී බුද්ධ පාද මූලයෙහි නියත විවරණ ලත් දා පටන් අද දක්වාම, වචනයෙන් කියා හෝ සිතින් මුළු ජීවිත කාලය තුළදීම සිතා හෝ නිම කිරීමට බැරි තරම් අනන්ත අප්‍රමාණ ආමිස ප්‍රතිපත්ති පූජා ලත් සේක. එදා දීපංකර ශ්‍රී බුද්ධ පා මූලයෙහි නියත විවරණ ලත් පසු, දීපංකර බුදු පියාණන් වහන්සේ පවා සමන් මල් අට මිටකින් ඔබවහන්සේට පූජාවක් කළ සේක. එසේම හාර ලක්ෂයක් රහතන් වහන්සේලා ද හාර ලක්ෂයක් සමන් මල් මිටින් පූජා කළ සේක. දස දහසක් ලෝකධාතුවල දෙවියන් බ්‍රහ්මයන් සාධුකාර පූජා පැවැත්වූහ. බුද්ධත්වය සඳහා පූරණය කිරීමට ඇති පාරමිතා සිහිකරමින් ශරීරයේ අඟපසඟ මෙන්ම ජීවිතය ද පරිත්‍යාග කරමින් දස පාරමිතා පූරණය කරන බව ඔබවහන්සේ එදා සිතන විට, මහපොළොව කම්පා වෙමින් වෙව්ල වෙව්ලා ඔබවහන්සේට නමස්කාර පූජා පැවැත්වී ය.

ඊට පසුව පාරමී පූරන සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක කාලය තුළ ඔබවහන්සේ කොතෙක් නම් පූජා ලැබූ සේක් ද? ඒ පූජා වෙනත් බුදු කෙනකුන්ට හැර වෙන කිසිවකුට සිතා ගැනීමටත් නො හැකි ය. එදා වෙස්සන්තර ජාතකයේ දී පමණක් මුළු මහපොළොවම හත් දිනක දී හත් වරක් කම්පා කරවමින්, අසංඛ්‍ය ගණන් දිව්‍ය දේවතාවන්ගේ අනන්ත අප්‍රමාණ සාධුකාර මධ්‍යයේ පූජා ලත් සේක.

දෙව්ලොවින් චුතව අවුත් බුදු වන්නයැයි දෙවියන් කළ ඉල්ලීම පිළිගත් අවස්ථාවේ දී, 10,000ක් සක්වළ අනන්ත අප්‍රමාණ දෙවියන් බ්‍රහ්මයන් ප්‍රීතිඝෝෂා පවත්වමින් ඔබ වහන්සේට කළ පූජා කෙතෙක් ද?

මවුකුස පිළිසිඳගත් දා සතරවරම් දෙව්වරුන් ඇතුළු 40,000ක් දෙවියන් බෝසතුන්ට ආරක්ෂාව සලසමින් පූජා කළහ. මවුකුසින් බිහිවන අවස්ථාවේ දී ද 10000ක් සක්වළ දෙවියන් බ්‍රහ්මයන් කොඩි සේසත් අල්ලමින්, තූර්‍ය්‍යවාදන ආදී පූජා පවත්වමින්, මුළු ලොව ම ඒකනිංනාද කරවමින් සාධුකාර පූජා දෙමින් කළ පූජා කෙතෙක් ද?

ලෝකයට ජනිත වූ දිනයේම මහා සෘද්ධිමත් අසිත කාලදේවල තවුසා ද, පියරජු ද උන්වහන්සේට නමස්කාර පූජා පැවැත්වූහ. ඉපැදී පළමු දිනයේ දී ම ශාක්‍ය රජවරුන් විසින් 80,000ක් ශාක්‍ය කුමාරවරුන් ඔබ වහන්සේට පිරිවර වශයෙන් පූජා කරන ලදී.

ගිහිගෙයින් නික්ම පැවිදි වීමට යන දිනයේ දී 10000ක් සක්වළ දෙව්දේවතාවුන් බ්‍රහ්මයන් දිව්‍ය පහන්වලින්, දිව්‍ය සුගන්ධයන්ගෙන්, දිව්‍ය තූර්‍ය්‍යවාදනවලින්, දිව්‍ය සාධුකාර පූජාවලින් ඔබ වහන්සේ ලද පූජා කොතෙක් ද? අනෝමා නදී තීරයේ දී පැවිදි වෙස් ගත් දා කපා අහසට ඇමූ කෙස් ටික පවා දිව්‍ය ලෝකයට ගෙන ගොස් සිළුමිණ සෑය කරවා අද දක්වාම දෙව්වරු වැඳුම් පිදුම් පූජා සත්කාර පවත්වති. එසේ ම එදා අහසට වීසි කළ ගිහි ඇඳුම් බ්‍රහ්මයන් විසින් ගෙන ගොස් බ්‍රහ්මලෝකයේ සළුමිණ සෑය කරවා අද දක්වා පූජා පවත්වති.

1. (ii) සම්මා සම්බුද්ධත්වයට පත් වූ අවස්ථාවේ, අතුරු සිදුරු නැතිව සිටි දෙවියන්, බ්‍රහ්මයන්, දිව්‍ය නාග සුපර්ණයන් විසින් උන්වහන්සේට කෙතෙක් නම් පූජා පවත්වනු ලැබීද? සක්දෙව්රජ එදා විජයුත්තර නම් සක පිඹිමින්, පංචසිඛ දෙවියා වීණානාද පූජා පවත්වමින්, සුයාම දෙවියන් චාමර පවන් සලමින්, සහම්පති නම්

බ්‍රහ්මයා සේසත් අල්ලමින්, මහා කාල නම් දේවනාගයා 80,000ක් නාටකයන් සමඟ ප්‍රීති ගී පූජා පවත්වමින්, අසංඛ්‍ය ගණන් සෙසු දෙවියන්, සෙසු බ්‍රහ්මයන් සාධුකාර පූජා පවත්වමින්, ප්‍රීතිඝෝෂා පූජා පවත්වමින් එදා ඔබවහන්සේ ලද පූජා සිතා නිම කළ හැකි ද?

සම්බුද්ධත්වයට පත්ව පළමු ධර්ම දේශනය ඉසිපතනයේ දී දේශනා කරන දිනයේ දී 10000ක් සක්වළින් පැමිණි දෙවියන් බ්‍රහ්මයන් ඉඳිකටු තුඩ තරම් සියුම් වෙස් මවාගෙන මුළු අහස පුරා අසංඛ්‍ය ගණන් සිටියහ. එදා ඒ ධර්ම දේශනය කරන අවස්ථාවේ දී, 10,000ක් සක්වළ හිරු දහසක් පැවූවා මෙන් ඒකාලෝක විය. 10,000ක් සක්වළ කම්පිත විය. (අයඤ්ච දස සහස්සී ලොකධාතු සඞ්කම්පි, සම්පකම්පි සම්පවෙධි, අප්පමාණොච උළාරො ඕභාසො ලොකෙ පාතුරහොසි - ධම්මචක්කප්පවත්තන සූත්‍රය) එසේ 10000ක් සක්වළ පුරා ආලෝකය පැතිර යත් දී, 10000ක් සක්වළ කම්පිත වෙමින් සැළෙත් දී, අසංඛ්‍ය ගණන දෙවියන් බ්‍රහ්මයන් කරන ලද සාධුකාර පූජා ප්‍රීතිඝෝෂා පූජා ආදිය කියා නිම කළ නො හැක. එදා 18 කෝටියක් බ්‍රහ්මයන් රහත්වූ අතර, අසංඛ්‍ය ගණන් දෙව්වරු සෙසු මාර්ගඵල ලැබූහ. ඒ දෙවියන් බ්‍රහ්මයන් කළ පූජා නිමක් නැත.

1. (iii) මෙසේ උන්වහන්සේට ජීවමානව වැඩසිටි කාලයේ දී ලත් පූජා සිතා නිම කළ නො හැක. උන්වහන්සේට එදා වේළුවනාරාමය පූජා කරත් දී මුළු මහපොළොවම පවා වෙව්ලා කම්පිත විය. එදා රැස් වූ කෝටිප්‍රකෝටි ජනීජනයා හැසිරවීමට වෙන දෙයක් තබා සක්දෙව්රජ මිනිස් වෙසක් ගෙන පැමිණියේ ය. එදා එක්ලක්ෂ දසදාහක් දෙනා නිවන් දුටහ. එදා ලත් වේළුවනාරාම පූජාව ඇතුළු අනෙකුත් පූජා ගණනින් දැක්විය නො හැකි ය.

එසේම උන්වහන්සේට අනේපිඬු සිටුතුමා විසින් 54 කෝටියක් ධනය වියදම් කර ජේතවනාරාමය සාදා පූජා කෙළේ ය. එහි රාත්‍රී ශාලා, දිවා ශාලා, සක්මන් මළු, මණ්ඩප, පොකුණු ආදී සියලු දේ ම තිබිණ. බුදුපියාණන් වහන්සේට වැඩ සිටීමට පමණක් කළ ගන්ධකුටිය කරවූයේ ලක්ෂ 100ක් මුදල් වැය කරමිනි.

තවද විශාඛා මහෝපාසිකාව 27 කෝටියක්ම වියදම් කොට කාමර 1000ක් තිබූ පූර්වාරාමය කරවා පූජා කළා ය. මෙසේම ජීවිකාරාමය, ඝෝෂිතාරාමය, නිග්‍රෝධාරාමය වැනි වෙනත් වෙහෙර විහාර ද

උන්වහන්සේට පූජා කරන ලදී. කෝටි ප්‍රකෝටි ගණන් වියදම් කරමින් පැවැත් වූ මෙවන් පූජාවන් අන් කවරකු නම් ලබයි ද?

1. (iv) තවද කොසොල් රජතුමා එක් දවසක දානය දීමට 13කෝටියක් වියදම් කළේ ය. ඒ අසදෘෂ මහා දානය ලැබීමට පෙර, බුදු පියාණන් සැවැත් නුවරින් නික්ම මාස ගණනක් සෙසු ජනපදවල චාරිකා කළ සේක. බුදුපියාණන් වහන්සේ ආපසු සැවැත් නුවරට වැඩිය පසු, 'මේ නුවරට මෙතෙක් දවසකට පසුව වැඩිය බුදුරදුන්ට පළමු දිනයේ දානය මගෙන්, වෙන කිසිවකුට දානය දීමට නො හැකි යැ'යි රජතුමා රටවැසියාට අණ කෙළේ ය. ඊට පසුව කියා නිම කළ නො හැකි තරම් අති විශාල දාන ප්‍රමාණයක් සකසා 'මගේ දානය පැමිණ බලන්න' යැයි රජතුමා රටවැසියාට කීවේ ය. විශාඛාව, අනේපිඬු සිටුතුමා ඇතුළු කෝටි ගණනක් රටවැසියා දානය බැලීමට පැමිණ, රජු පරදවා අපිත් දානයක් දෙමුයි කථාකරගෙන, පසු දා රජු දුන් දානයට වඩා 10, 15 ගුණයකින් වැඩි දානවස්තු සකස් කොට අපේ දානයත් බලන්න එන්න යැයි රජුට ආරාධනා කෙළේ ය. රජු පැමිණ ඒ දානය දැක ලජ්ජාවට පත්ව, ඊට පසු දා රටවැසියා දුන් දානයට වඩා වැඩි ගුණයකින් මහා දානවස්තු පිළියෙල කරවා රටවැසියා කැඳවා ඒ දානය පෙන්නී ය. මෙලෙස දින 6ක් ම රජුත්, රටවැසියාත් එකිනෙකාට වැඩි වැඩියෙන් දානය සකස් කොට පූජා පැවැත්වූහ. පස්වන දිනයේ රජුගේ දානය බැලීමට පැමිණි මිනිසුන් 'අපට රජු පරදවන්න බැහැ' යි කියා ඒ මහා විශාල දාන සම්භාර වස්තුව දැක පසු බැස්සේ ය. එවිට විශාඛාව, අනේපිඬු සිටුතුමා ඇතුළු අය 'එක රජකු අපට පරදවන්න නො හැකි මන්දැයි' කියා අපි මුළු රටවැසියාම එකතු වී දානයක් හෙට සකසමුයි කථාකර ගත්හ. රජු පැරදවීමට යැයි කියා මිථ්‍යාදෘෂ්ටි අය පවා එදා බුදුරදුන්ට පූජා කළ දානයට සහභාගි වූහ. කෝටි ගණන් රටවැසියා එකතුව එදා පිළියෙල කළ දානයට තිබූ දාන වස්තු කෙළවරක් නැත.

රජුට එදා දානය බැලීමට එන්නයැයි රටවැසියා ආරාධනා කෙළේ ය. රජු පැමිණියේ ය. පැමිණ කොපමණ ඇවිද ඇවිද දානය බැලුවත් නිමාවක් දක්නට නැත. එවැනි දානයක් දෙනවා තබා, එවැන්නක් දීම ගැන හිතාගැනීමටවත් රජුට නො හැකිව පරාද වී ගියේ ය. සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා දන් දුන් බුදුපියාණන් වහන්සේට

මේ තරම් විශාල දානයක්, කෝටි ගණන් ජනයා එකතු වී එක් දිනයක දී පමණක් පූජා කිරීම කවර නම් පුදුමයක් ද?

රජු පැරද මාලිගාවට ගොස් දුක් වෙමින් සිටිනා විට, මල්ලිකා දේවිය අවුත් ඒ ගැන විමසා රටවැසියා පැරදවීමට මා කියන විධියට දානයක් දෙන්නයැයි කියා ඒ මහා අසදෘෂ දානය මෙසේ පිළියෙල කෙළේ ය.

තනිකර සල්ගස්වලින්ම පමණක් විශාල ශාලාවක් කරවා, ඒ ශාලාවේ රත්රන් වලින් විසිතුරු කළ රෙදිවලින් වියන් බැන්දහ. රත්රන්, රිදී, මුතු මැණික් ඒ වියනේ එල්ලී ය. රත්රන් වලින් විසිතුරු කළ පාවඩ බිමට එළී ය. දොර ජනෙල් තිර රත්රන් රිදීවලින්ම කළහ. බුදුරදුන්ට වැඩ සිටීමට කළ බුද්ධාසනය ද, පිට තැබීමට කළ ආසනය ද, සිරසට තබා තිබූ සේසත ද, ශ්‍රී පාද තැබීමට සැදූ ආසනය ද රත්රන් මුතු මැණික් වලින්ම කළහ. ඒවායේ වටිනාකම නිම කළ නො හැකිය. රහතන් වහන්සේලා 500කට තවත් ආසන 500ක් දුරින් දුරින් පනවා, ඒ ඒ ආසනය අතර 500ක් ඇත්තු සරසා සේසත් අල්ලමින් සිටින ලෙස සිටවූහ. ස්වර්ණාභරණින් සැරසුණු බිසෝවරු 500ක් රහතන් වහන්සේලාට පවන් සලමින් සිටියහ. ශාලාව මැද තනිකර රත්රනින් කළ ඔරු 8ක් විය. ලක්ෂ ගණන් ආභරණ පැළඳි බිසෝවරු, ඒ ඔරුවල සුවඳවර්ග දමා කුඩු කරමින් සිටියහ. ඒ සුවඳ දුම් වෙනත් ස්වර්ණාභරණින් සැරසුණු 500ක් බිසෝවරු ගෙනවිත් ඉසිමින් සිටියහ. ඇතුන් 500 දෙනාට, එක් හීලෑ ඇතකු නැති බැවින් රජු කනස්සල්ලට පත්ව සිටින විට, මල්ලිකා දේවිය ඉතාමත් ම දරුණුම ඇතා ගෙනැවිත් අංගුලිමාල මහරහතන් වහන්සේ ළඟ සිටුවීමට අණ කළා ය. ඒ ඇතා අංගුලිමාල මහරහතන් වහන්සේ දුටු විගස ම ඉතා බියේ හැකිළි හැකිළී රහතන් වහන්සේට සේසත් අල්ලමින් සිටිනු දුටු ජනීජනයා සතුටු කඳුළු වැගිරූහ.

මෙසේ කෝටි ගණන් වියදම් කරවා, තවත් කෝටි ගණන් වියදම් කර දාන වස්තු පිළියෙල කරවා, රටවැසියාට එය බලන්න එන්න යැයි කියා යැවී ය. එවැනි දානයක් රටවැසියාට කවදාවත් ම දෙන්න නො හැකි නිසා රටවැසියා පැරදුණි. ඒ දානය වැනි දානයක් බුදුරදුන්ට නැවත වරක් නො ලැබෙන බැවින් ද, එවැන්නක් දීමට වෙන කිසිවකු සමත් නො වන බැවින් ද, සෑම බුදුරජාණන් වහන්සේලාට ම එවැනි එක් දානයක්ම ලැබෙන බැවින් ද, ඒ දානයට අසදෘෂ දානය යැයි

කියනු ලැබේ. රජතුමා බුදුරදුන්ට "ස්වාමීනි, මෙහි තිබෙන සියලු වස්තු කැප වුවත් අකැප වුවත් සියලු දේම පූජා කරමි" යි කියා ඒ දානය පූජා කෙළේ ය.

මෙසේ එක් දවසකදී 13 කෝටියක් වියදම් කර දෙන දානයක් වෙන කවරකු නම් ලබයි ද? සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා දන් දුන් බුදුපියාණන් වහන්සේට ම පමණක් එවැනි දානයක් ලැබෙන්නේ ය. ඒ 13 කෝටියට අමතරව, බුදුරදුන්ට වැඩ සිටීමට පැනවූ ආසනය, සේසත, පිට තැබීමට කළ ආසනය, ශ්‍රී පා තැබීමට කළ ආසනය යන ඒවායේ වටිනාකම කෝටි මෙපමණකැයි කියා නිමකළ නො හැක.

1. (v) තවද බුදුපියාණන් වහන්සේ යමාමහ පෙළහර පාන දිනයේ දී සැතපුම් 192ක් දිග පළල දිව්‍යමය නිලුපුල් මල් වලින් මණ්ඩපයක් සක්දෙව්රජ විසින් මවා පූජා කෙළේ ය. ඒ මණ්ඩපයට ඉහළින් යොදුන් 1203 කෝටි 45 ලක්ෂයක් දිග රත්රනින් කළ සක්මනක් මවා පූජා කෙළේ ය. එදා ඒ රුවන් සක්මනට නැගුණු බුදුපියාණෝ 10000ක් ලෝකධාතු පුරා අස්සක් මුල්ලක් නැර සවණක් ඝන බුදුරැස් විහිදුවා, 10000ක් සක්වළ පුරාම දිවෙන පරිදි ශරීරයෙන් ගිනිකඳක් හා දිය කඳක් නිකුත් කරනවිට, ඒ දුටු දෙවියන් බ්‍රහ්මයන් මනුෂ්‍යයන් ඇතුළු 10000ක් සක්වළ සියලු සත්ත්වයෝ 'අහෝ බුද්ධෝ අහෝ බුද්ධෝ' බුදුරජාණන් වහන්සේ ආශ්චර්යඞමත් ය, බුදුරජාණන් වහන්සේ ආශ්චර්යඞමත් ය කියමින්, සාධුකාර දෙමින්, ප්‍රීතිඝෝෂා පවත්වමින්, සතුටු කඳුළු වගුරුවමින් එදා මුළු ලෝකවාසී සියලු සත්ත්වයාම එකවිට පූජා කළ පූජාවන් කාට නම් සිතා නිම කළ හැකි ද?

තවද බුදුපියාණන් වහන්සේ දෙව්ලොව අභිධර්මය දේශනා කිරීමට වැඩිය විට, සැතපුම් 960ක් දිග සැතපුම් 800ක් පළල ඒ තරම් විශාල පණ්ඩුකම්බල ශෛලාසනය නම් වූ සක්දෙව් රජු ගේ පඬුපුල් අසුන පූජා කෙළේ ය. මේ තරම් විශාල පඬුපුල් අසුන බුදුරදුන්ට පූජා කළාට, බුදුරජාණන් වහන්සේට එය හරි විශාල වැඩිය කියා ශක්‍රයා සිතුවේ ය. ඒ දැනගත් බුදුපියාණෝ දෙපට සිවුර කිහිප වරකට නමා ඒ ආසනය මත තබන විට, ඒ තරම් විශාල මුළු ආසනයම ඒ නමන ලද දෙපට සිවුරෙන් වැසී ගියේ ය. සිවුර ආසනය පුරා පැතිර ගියාට බුදුරදුන් කුඩා තැනක වැඩ සිටිතැයි කියා ශක්‍රයා එවිට සිතී ය. ඒ දැනගත් බුදුපියාණෝ, මුළු ලංකාවම වගේ හතරපස් ගුණයක් විශාල

ඒ සා මහත් ඒ ආසනය සම්පූර්ණයෙන්ම වැසී යන සේ එහි වැඩ සිටිය සේක. බුදුරදුන්ගේ ඍද්ධි විෂයය අචින්තිය ම ය. 10,000ක් සක්වළින් පැමිණි අසංඛ්‍ය ගණන් දෙවියන් බ්‍රහ්මයන් එදා උන්වහන්සේට කරන ලද දිව්‍ය පූජා භාණ්ඩ, දිව්‍ය ගන්ධ, දිව්‍ය තූර්යවාදන ආදී පූජා ගැන කෙසේ නම් සිතාගන්න ද?

බුදුපියාණෝ මුළු තුන් මාසයක් පුරාම රෑ දවල් දිගටම අභිධර්මය දේශනා කළ සේක. දාන වේලාවන් පැමිණෙන විට නිර්මිත බුදුරුවක් මවා, මා නැවැත්වූ තැන සිට මෙතෙක් ධර්මය දෙසන්නැයි අධිෂ්ඨාන කොට උතුරුකුරු දිවයිනට පිඬු සිඟා වඩනා සේක. කිසිම දෙවියෙක් කිසිම බ්‍රහ්මයෙක් මේ නිර්මිත බුදුපියාණෝ දහම් දෙසති'යි කියා නො දතී. ඒ මාගේ බුදුරජාණන් වහන්සේ ගේ ඍද්ධිය ය. බුදුරදුන්ට මාස 3ක් පුරා එක දිගටම දෙවිවරු බ්‍රහ්මවරු පූජා පැවැත්වූහ. ඒ අභිධර්ම දේශනය නිම වන විට 80 කෝටියක් දෙවිවරු බ්‍රහ්මවරු අමා මහ නිවන් දුටහ. ඒ 80 කෝටියක් ඇතුළු අසංඛ්‍ය ගණන් දෙවියන් බ්‍රහ්මයන් මාස 3ක් පුරා කළ පූජා කෙසේ නම් සිතාගන්න ද?

දෙව්ලොව සිට මිනිස්ලොව සංකස්ස නගරයට වැඩිය දිනයේ බුදුපියාණන් වහන්සේට වැඩීම පිණිස, මහාමේරු පර්වතයේ සිට සංකස්ස නගරය දක්වා යොදුන් 84,000ක් දිග මැණික් ඉණිමගක් ද, රන් ඉණිමගක් ද, රිදී ඉණිමගක් ද ශක්‍රයා විසින් මවා පූජා කෙළේ ය. එදා බුදුපියාණෝ, අවීචියේ සිට භවාග්‍රය දක්වා සියලු ලෝක සත්ත්වයාටම උන්වහන්සේ වඩිනා අයුරු පෙනේවායි අධිෂ්ඨාන කොට වදාළ සේක. මුළු ලෝකවාසී සියලු සත්ත්වයාම ඒ බුද්ධ ආශ්චර්යය එදා දුටහ. මෙසේ මුළු ලෝක සත්ත්වයාටම පෙනි පෙනී, මැණික් ඉණිමගින් ශ්‍රී පාදයෙන් ශ්‍රී පාදය තබ තබා වඩනා බුදුරදුන්ට සහම්පති බ්‍රහ්මයා සේසත් අල්ලමින් පූජා කෙළේ ය. එසේම අසංඛ්‍ය ගණන් දෙවිදේවතා බ්‍රහ්මවරුන් කරනු ලබන චාමර සැලීම්වලින් හා අනේකවිධ සෙසු පුද පූජා ලබමින් ඒ වඩනා බුදුපියාණන් දුටු, ඒ බුද්ධශ්‍රීය දුටු, ඒ බුද්ධ මහිමය දුටු, ඒ බුද්ධ ආනුභාවය දුටු, ඒ බුද්ධ පූජා දුටු, මුළු ලෝකවාසී සත්ත්වයන් සාධුකාර දෙමින් ප්‍රීතිඝෝෂා පවත්වමින් 'අහෝ බුද්ධො, අහෝ බුද්ධො' යැයි කියමින් කළ අනන්ත පුද පූජා කෙසේ නම් සිතා නිම කළ හැකිද? 10,000ක් සක්වළම දෙවියන් බ්‍රහ්මයන් තුන්ලොව ඒකනින්නාද කරමින් සාධුකාර දෙමින්, ජයසක් පිඹිමින්, මැණික් චාමර සලමින්, දිව්‍ය වීණා වයමින්, බුදුගුණ

ගයමින්, අහස පුරා කොඩි ධජ පතාක සේසත් වලින් සරසමින් කළ පූජා විඳ විඳ, සවණක් ඝන බුදුරැස් විහිදුව විහිදුවා, බැබළි බැබළී, වැඩි ඒ බුද්ධශ්‍රීය දුටු සියලු සත්ත්වයෝම පුදුමයට පත්ව, ඇස්පිය නො හෙළා, කට හයාගෙන, සතුටු කඳුළු පෙරමින් 'මමත් බුදුවෙම්වා, මමත් බුදුවෙම්වා' යි පැතුහ. බුදුබව නො පැතූ කෙනෙක් නම් එදා සිටියේ නැත. එදා බුදුරදුන් හමුවේ 30 කෝටියක් සත්ත්වයෝ අමාමහ නිවන් දුටහ. මගේ බුදුපියාණන් වහන්සේට එදා ලැබුණු පුද පූජා සිතා ගත නො හැක. අප්‍රමාණ ය.

1. (vi) තවද බුදුපියාණෝ විශාලා මහනුවරට වැඩ රතන සූත්‍රය දේශනා කොට රෝග - අමනුෂ්‍ය - දුර්භික්ෂ යන ත්‍රිවිධ බිය දුරුකරවා, 168,000ක් නිවනට පමුණුවා ආපසු වඩිනා කල්හි, ගංගා නම් ගඟේ මැණික්වලින් ම කළ නැව් 500ක් දිව්‍ය නාගයන් විසින් මවා බුදුරදුන්ට පූජා කොට නාගලෝකයට වඩනා ලෙස ආරාධනා කළහ. එක් නැවකට වැඩියහොත් අනෙක් අය අසතුටු වන බව දත් බුදුපියාණෝ රහතන් වහන්සේලා 500 දෙනා බැගින් පිරිවරා සිටි බුදුපියාණන් වහන්සේලා 500 නමක් මැවූ සේක. ඒ 500ක් නැව්වලට නිර්මිත බුදුරදුන් වැඩම කළ විට, අපේ නැවේ නියම බුදුරදුන් වැඩ සිටිනවා, අපේ නැවේ නියම බුදුරදුන් වැඩ සිටිනවා යැයි සියල්ලෝම එකසේම සිතුහ. නාගලෝකයට වැඩ ධර්මය දේශනා කොට නැවත ගංගා නම් ගඟට ආපසු වැඩිය විට, දෙවියන් බ්‍රහ්මයන් කුඩ පිට කුඩ තබමින්, සේසත් පිට සේසත් තබමින්, කොඩි ධජ පතාක මත කොඩි ධජ පතාක තබමින්, පෘථිවියේ සිට අකනිටා බඹලෝ දක්වාම මුළු අහස වැසී යන සේ කොඩි සේසත් ධජපතාක ආදී පූජා කරමින් සාධුකාර පූජා පැවැත්වූහ. පොළොවේ සිට අකනිටා බඹලෝ දක්වාම කොඩි සේසත් ආදියෙන් සරසා කරනු ලබන පූජාවන් බුදුපියාණන් වහන්සේ හැර අන් කවරකු නම් ලබයි ද?

1. (vii) තවද අසංඛ්‍ය ගණන් අමාමහ නිවනට පත් කරමින් 24 වාරයක දී 24 අසංඛයක් නිවන් දැක්වූවා වූ බුදුපියාණන් වහන්සේට ඒ 24 වාරයේ දී ලත් පූජා සිතා නිම කළ නො හැක. මහාසමය සූත්‍රය දේශනා කරන විට 10,000ක් ලෝකධාතුවල දෙවියන් බ්‍රහ්මයන් මුළු අහස පුරා යොදුන් ගණන් පිරී සිට අනන්ත අප්‍රමාණ පූජා පැවැත්වූහ.

('දසහිච ලෝකධාතුහි දෙවතා යෙභුයෙයන සන්නිපතිතා හොන්ති භගවන්තං දස්සනාය' ආදී වශයෙන් එය දැක්වේ.) එදා අසංඛ්‍යයක් දෙවි බ්‍රහ්මයෝ අමාමහ නිවන් දුටහ. මහා මංගල සූත්‍රය, රාහුලෝවාද සූත්‍රය, පාරායන සූත්‍ර, සමචිත්ත පරියාය සූත්‍රය ආදිය දේශනා කරන දිනයන්හි දී අසංඛ්‍ය ගණන් සත්ත්වයෝ නිවන් අවබෝධ කළහ. ඒ දිනවල දී බුදුරදුන්ට ලැබුණ පුද පූජා අසංඛ්‍ය ගණන් ය. සීමාවක් ගණනක් නැත.

මේ ආදී වශයෙන් බුදුපියාණන් වහන්සේ ජීවමානව වැඩසිටි කාලය තුළදී ලත් මහා පූජා මෙන්ම, අනෙකුත් මනුෂ්‍යයන් නාගයන් දෙවියන් බ්‍රහ්මයන් ඇතුළු ඉතා දුප්පතාගේ සිට සිටුවරුන් රජවරුන් මහාබ්‍රහ්මයන් දක්වා සියලු සත්ත්වයන්ගෙන් බුදුපියාණන් වහන්සේ ලත් පූජා වෙනත් බුදුකෙනකුන්ට හැර අන් කිසිවකුට සිතාගත නො හැක.

1. (viii) බුදුපියාණන් වහන්සේ පිරිනිවන් පානා දවසේ දී ජීවමාන බුදුරදුන්ට කළ හැකි අන්තිම පූජා කිරීමට පැමිණි අනන්ත අප්‍රමාණ දිව්‍ය බ්‍රහ්මයන් දුටු බුදුපියාණෝ එදා මෙසේ වදාළහ. 'යෙභුයෙයන ආනන්ද දසසු ලොකධාතූසු දෙවතා සන්නිපතිතා තථාගතං දිස්සනාය, යාවතා ආනන්ද කුසිනාරා උපවත්තනං මල්ලානං සාලවනං සමන්තතො ද්වාදස යොජනානි, නත්ථි සො පදෙසො වාළග්ගකොටි නිත්තුදන මත්තෙපි මහෙසක්ඛාහි දෙවතාහි අප්ඵුටො.... ආනන්දය, ඉඳිකටු තුඩු තරම් ඉතා සියුම් වෙස් මවාගත් දිව්‍ය බ්‍රහ්මයන් ගෙන් යොදුන් 16ක් මුළු අහස්කුස ම අතුරු සිදුරු නැතිව පිරී ඇත. ඒ සා විශාල දේව බ්‍රහ්ම පිරිසක් එදා උන්වහන්සේට කළ පූජා කෙතෙක්දැයි අපට සිතාගැනීමට පවා නො හැක.

1. (ix) උන්වහන්සේ පිරිනිවන් පා වදාළාට පසු, උන්වහන්සේ ආදාහනය කළ තැන තිබූ අඟුරු පවා පිප්ඵලි - මොලිය යන රජදරුවන් ගෙන ගොස් දාගැබ් සාදා පූජා සත්කාර කළහ. එසේ ආදාහනය කළ තැන අඟුරු ටිකට පවා පුද පූජා පැවැත්වූ කල, උන්වහන්සේගේ ධාතූන් වහන්සේලාට කළ පුද පූජා ගැන කවර කථා ද? පිරිනිවන් පා වදාළාට පසුව, උන්වහන්සේට කෙතෙක් නම් පූජා ලැබෙනවා ද? උන්වහන්සේගේ පිරිනිවීමෙන් පසු අශෝක රජු 84,000ක් වෙහෙර

විහාර කරවා උන්වහන්සේ වෙනුවෙන් පූජා කළේ ය. ඒ සඳහා 96 කෝටියක් මුදල් වියදම් කෙරිණ. 96 කෝටියක් මුදල් වැය කරවා ලබන පූජා සත්කාර අන් කවරකු නම් එසේ ලබයි ද?

අද වුවත් එක් දවසක දී උන්වහන්සේට පූජා කරනු ලබන දානය පමණක් එක තැනකට රැස්කළොත්, මිනිසුන් 10 ලක්ෂයකටත් වඩා වැඩි දෙනෙකුට ඒ සෑහේ. මෙසේම දිනකට ලැබෙන ගිලන්පස සුවඳදුම් මල් පහන් ආදී පූජා කොතෙක් ද? ලංකාවේ පමණක් ඇති එක් එක් ගමකින් එක් බත් හැන්දක්, එක මලක්, එක සුවඳකූරක්, එක පහනක් පමණක් පූජා කළත් ඒවා ලක්ෂ ගණනකටත් වඩා වැඩි වන්නේ ය. එක් ගමකින් එක් පහනක්, එක් බත් හැන්දක් පමණක් නොව වෙහෙර විහාරවලත් ගෙවල්වලත් බොහෝ දානවස්තු උන්වහන්සේට දිනපතා ම පූජා කරනු ලබන්නේ ය. මෙසේම පිටරටවල ලැබෙන පුද පූජා කෙතෙක් ද? දෙවියන් බ්‍රහ්මයන් කරන පුද පූජා කෙතෙක් ද? උන්වහන්සේ වෙනුවෙන් එක් එක් ගමක එක් එක් විහාරයක් තිබුණත් ලංකාව පුරා ඇති වෙහෙර විහාර ලක්ෂ ගණන් වන්නේ ය. උන්වහන්සේට අද දක්වාත් මෙසේ ලක්ෂ කෝටි ගණන් වෙහෙර විහාරවලින් පූජා ලැබෙන්නේ ය.

වෙසක් පොසොන් වැනි විශේෂ පෝය දිනයන්හි දී උන්වහන්සේ වෙනුවෙන් කොපමණ පුද පූජා අදත් ලැබෙනවා ද? පහන් පූජා පමණක් එක් වෙසක් පෝ දිනකට කොතරම් නම් ලැබේ ද? 84000 පහන් පිංකම්ම කෙතෙක් නම් පවත්වනවා ද?

උන්වහන්සේ ශ්‍රී පාද ලාංඡනය තැබූ ශ්‍රී පාදයට එක් වරක් පමණක් සමහරවිට වැඳීම සඳහා කෙතරම් නම් ජනකායක් ඇදී යනවා ද? තද ශීතලේ ගැහි ගැහී, ඉතා දුක සේ කඳු නැගගෙන, එක් වරක් පමණක්, සමහරවිට විනාඩියකටත් අඩු කාලයක් වන්දනා කිරීමට යන අය කෙතෙක් නම් වෙහෙසක් විඳිමින් ගොස් පූජා පවත්වනවා ද?

සෑම දිනකම ශ්‍රී දන්තධාතූන් වහන්සේට දස දහස් ගණන් දෙනා වන්දනාමාන පවත්වනවා නේද? ශ්‍රී දන්තධාතූන් වහන්සේ ප්‍රදර්ශනය කරන දිනයක, පෝලිමේ යන ගමනේම නො නැවතී එක් වරක් හිස නමා වන්දනා කිරීම සඳහා කෙතරම් නම් කාලයක් මිනිසුන් පෝලිම්වල සිටිනවා ද? අනුරාධපුර වැනි ස්ථානවලට ගොස් වන්දනාමාන පුද පූජා පවත්වන අය කෙතෙක් ද?

මෙසේ කරනු ලබන පුද පූජා පවත්වනු ලබන්නේ ඉතාමත් ම ඉහළින්, ඉතාමත් ම ගෞරවයෙන්, ඉතාමත් ම ශ්‍රද්ධාවෙන්, අග්‍ර වූ ම කොටසින් නේද? මෙසේ උන්වහන්සේ පිරිනිවන් පෑ දින සිට අද දක්වා කෙතරම් නම් පුද පූජා ලබන්නට ඇත් ද?

1. (x) මේ පුද පූජා අවුරුදු 5000ක් මුළුල්ලේම උන්වහන්සේට මිනිස් ලොව දී ලැබෙන්නේ ය. දෙවියන් ගේ ආයුෂ අවුරුදු ලක්ෂ කෝටි ගණන් නිසා, දෙව්ලොව දී උන්වහන්සේට කරනු ලබන පූජා තවත් අවුරුදු ලක්ෂ කෝටි ගණන් ඉදිරියට ද ලැබෙනු ඇත. අසංඛ්‍ය ගණන් මාර්ගඵල ලාභී දෙවිවරු ද, බ්‍රහ්මවරු ද අද ද සිටිති. බ්‍රහ්ම ලෝකවල ආයුෂ කල්ප ගණන් නිසා, බ්‍රහ්මලෝකවල දී උන්වහන්සේට ලැබෙන පුද පූජා තව අවුරුදු කල්ප ගණන් ඉදිරියට ද ලැබෙන්නේ ය. අද අප අටවිසි බුද්ධ පූජා පවත්වනවා මෙන්, අද අප 'අතීතෙ යෙච සම්බුද්ධා' කියා අතීතයේ වැඩ සිටි සියලු බුදුරජාණන් වහන්සේලාට නමස්කාර කරනවා මෙන්, තව කල්ප අසංඛ්‍ය ගණනක් ගියාට පසුව වුව ද මගේ බුදුපියාණන් වහන්සේට පුද පූජා ලැබෙනු ඇත.

මෙසේ උන්වහන්සේට කරනු ලබන සියලු පූජා අපට පවසන්නේ ඒ බුදුපියාණන් වහන්සේගේ අරහං ගුණය අදත් ජීවමාන බව ය. උන්වහන්සේ පිරිනිවන් පෑවාට අනන්ත බුද්ධ ගුණ අදත් ජීවමාන ය.

මෙසේ වූ අනන්ත අප්‍රමාණ වූ සියලු පුද පූජා ලැබූ බැවින් ද, ලබන බැවින් ද, ඒ සියලු පූජා පිළිගැනීමට සුදුසු වූ හෙයින් ද ඒ සම්මා සම්බුද්ධ රත්නය ඒකාන්තයෙන් ම අරහත් නම් වන සේක.

## පූජා මහන්තත්වය

2. බුදුපියාණන් වහන්සේට මෙසේ කරනු ලබන පුද පූජා පිළිගැනීමට සෑම ආකාරයකින් ම උන්වහන්සේ සුදුසු වන සේක. ලෝකයේ උන්වහන්සේට ඉහළින් පුද පූජා ලැබීමට සුදුසු වූ අන් අයකු නැත. උන්වහන්සේට පූජා කරනු ලබන එක බත් හැන්දකින්, එක් මලකින්, එක් වන්දනාවකින් වුව ද කල්ප ගණන් දෙව් මිනිස් සම්පත් හා අවසාන අමාමහ නිවන් සම්පත් ලැබෙන්නේ ය.

2. (i) දිනක් බුදුරජාණන් වහන්සේ වඩිනා විට බකමුහුණකු උන්වහන්සේ දැක ඉතා සතුටට පත්ව, තටු දෙක ඔසවා එක්කොට

උන්වහන්සේට වැන්දේ ය. එවිට බුදුරජාණන් වහන්සේ අනඳ තෙරුන්ට මෙසේ වදාළහ. "ආනන්දය, මේ බකමූහුණා මා කෙරෙහි ඇති කරගත් මේ ශ්‍රද්ධාවෙන්, මේ ප්‍රීතියෙන්, මේ එක්ම වන්දනාවෙන් ලැබෙන කුශල බලයෙන්, මේ බකමූහුණා කල්ප ලක්ෂයක්ම නැවත දුගතියක නූපදින්නේ ය. කල්ප ලක්ෂයකට පසුව පසේ බුදු වන්නේ ය." තිරිසන්ව සිට කළ එක් වන්දනාවකින් කල්ප ලක්ෂයක්ම දුගතියක නො ඉපිද සුගති ලෝකවලට සැරිසරා පසේ බුද්ධත්වයක් ලබා දීමට තරම් වූ උන්වහන්සේ ගේ ගුණ සම්පත්තිය අති මහත් ය.

2. (ii) උන්වහන්සේ දිනක් ගග්ගරා නදිය අසල ධර්මය දේසනා කරන විට, මැඬියකු ඒ කටහඬේ මිහිරි බව විඳිමින් ඒ ධර්මයට කන් යොමා සිටිත්දී ගොපලු දරුවකු පිට උඩ තබා ඉඳගත් කෙවිටක් ඇනීම නිසා මැරීගොස් දෙව්ලොව ඉපදුණි. මහත්වූ දේවානුභාව සහිතව ඒ විගසම බුදුරදුන් දක්නට පැමිණ, ඒ ධර්මයේ ඉතිරි කොටස අසා මණ්ඩුක නම් වූ ඒ දෙවියෝ සෝවාන් වූහ. උන්වහන්සේගේ ධර්මය ඇසීම් මාත්‍රයෙන් පවා මැඬියකුට දෙව්සැපත් හා අවසන නිවන් සැප ලබා දෙන බුදුපියාණන් වහන්සේගේ ගුණ සම්පත්තිය කෙතෙක් ද?

2. (iii) දිනක් මට්ටකුණ්ඩලී නැමැත්තෙක් මැරී දුගතියක ඉපැදීමට යත් දී, ඔහු කෙරෙහි කරුණාවෙන් එතැනට වැඩිය බුදුරදුන් දැක වැඳීමට පවා නො හැකිව සිත පමණක් සතුටු කර ගැනීමේ කුශලයෙන් මැරී දෙව්ලොව ඉපදුණි. ඒ දෙවියන් ද පසුව අවුත් බණ අසා සෝවාන් විය. මෙසේ දැකීම්, තුටුවීම් මාත්‍රයෙන් පවා දිව්‍ය සම්පත් නිවන් සම්පත් ඒ බුදුපියාණෝ ලබා දෙන සේක.

2. (iv) දිනක් ඉතා මහලු සැඩොල් ගැහැණියක් මැරී අපායේ ඉපැදීමට යත් දී ඈ කෙරෙහි කරුණාවෙන් බුදුපියාණන් වහන්සේ එතැන වැඩ සිටිය පසු, සැරියුත් මහරහතන් වහන්සේ ඒ මැහැලියට බුදුරදුන්ට වඳින්න යැයි කියා කීම නිසා වැන්දා ය. ඒ එක් වන්දනාවක් කිරීමේ කුශලයෙන් ඒ ගැහැණිය මැරී දෙව්ලොව ඉපදුණි. මුළු ජීවිතයට ම කළ එක් වන්දනාවකින් දිව්‍ය සම්පත් ලබා දෙන ඒ බුදුපියාණන්ගේ ගුණ සම්පත්තිය කෙතෙක් ද?

2. (v) තවද අජාසත් රජු පිය රජුන් මරා ආනන්තරිය පාපකර්මය කොට, බුදුරදුන් මැරීමට ද දෙව්දත්ට නොයෙක් උපකාර කොට, පසුව එක් දිනක් බුදුරදුන් හමුවට ගොස් බුදුරදුන් ගෙන් ප්‍රශ්න අසා, අතිශයින් ප්‍රසාදයට පත්ව බුදුරජාණන් වහන්සේ කෙරෙහි මහත් වූ ශ්‍රද්ධාවක් ඇතිකර ගත්තේ ය. රජතුමා ගිය පසු බුදුපියාණෝ මෙසේ වදාළ සේක. "මේ රජතුමා මා කෙරෙහි අද ඇතිකරගත් ශ්‍රද්ධාව නිසා, ඔහු පියා නො මරා සිටියා නම්, අද ම සෝවාන් වන්නේ ය. එහෙත් ආනන්තර්ය පාප කර්මය නිසා අවීචියේ ඉපැදීමට සිටිය මේ රජු, මා කෙරෙහි අද ඇතිකරගත් ශ්‍රද්ධාව නිසා අවීචියේ නො ඉපැදී, කුඩා ඔසුපත් නරකයක ඉපැදී, ඉන් මිදුණු පසු කල්ප ලක්ෂයක් ම නැවත දුගතියක නො ඉපැද, කල්ප ලක්ෂයකට පසුව විජිතසේන නමින් පසේ බුදු වන්නේ ය." මෙසේ ආනන්තර්ය පාප කර්මයක විපාක පවා අඩුකර දී, කල්ප ලක්ෂයක් සුගති සම්පත් ලබා දී, අවසන පසේ බුද්ධත්වයක් ද ලබා දීමට තරම් උන්වහන්සේ කෙරෙහි පහළ කරගත් ශ්‍රද්ධාවේ පින මහත් කර දෙන උන්වහන්සේගේ ගුණ සම්පත්තිය අති මහත් ය.

2. (vi) මෙසේම දෙව්දත් කල්ප ගණන් බෝසතුන් මරමින් බෝසතුන්ට හිරිහැර කරමින් අවුත්, බුදුරදුන් මැරීමට ගල් පෙරළා, දුනුවායන් යොදවා, නාලාගිරි ඇතුන් මෙහෙයවා, සංඝභේද කර ආනන්තර්ය පාපකර්මය කොට පොළොව පැලී අපායට යන විට බුදුරජාණන් වහන්සේ සරණ ගියේ ය. ඒ කුශලය නිසා ඔහු කල්ප ලක්ෂයක් ගිය පසු සට්ඨිස්සර නමින් පසේබුදු කෙනකු වන්නේ ය. උන්වහන්සේ සරණයාමේ කුශලයෙන් එතරම් මහත් ආනිශංස ලැබීමට බුදුපියාණන් කෙතරම් නම් ගුණාතිරේක සම්පත්තියකින් යුතු විය යුතු ද?

2. (vii) දිනක් ඡත්ත නම් මානවකයකු ගමනක් යත් දී ඔහු සොරුන් විසින් මරනු ලබන බව දුටු බුදුපියාණෝ ඔහු කෙරෙහි කරුණාවෙන් මගට වැඩ තෙරුවන් සරණ යාමේ ගාථා 3ක් දේශනා කළෝ ය. 'යො වදතං පවරො මනුජෙසු' ආදී ඒ ගාථා 3 කියා තෙරුවන් සරණ යාමේ කුශලය නිසා ඔහු සොරුන් විසින් මැරූ පසු දෙව්ලොව ඉපදුණි. මේ දැක් වූ කථා වැනි කථා අනන්ත ය.

2. (viii) තවද බුදුපියාණන් වහන්සේ කෙරෙහි ප්‍රසාදයෙන් මැරුණු පාරිලෙය්‍යය ඇතා දෙව්ලොව ඉපදුණි. බුදුරදුන්ට එක් මීවද කැල්ලක් දුන් වඳුරා මැරී එදාම දෙව්ලොව ඉපදුණි. බුදුවීමට පසුව තබා බුදුවීමට පෙර කන්ථක අශ්වයා බෝසතුන් කෙරෙහි ප්‍රසාදයෙන් මැරී දෙව්ලොව උත්පත්තිය ලැබී ය.

2. (ix) තවද සක්දෙව්රජ දෙව්ලොවින් චුතවන බව දැන ඉතා දුකට පත්ව, අන් පිහිටක් නො දැක බුදුරදුන් දක්නට ඉන්ද්‍රශාලා නම් ගුහාවට පැමිණි විට බුදුරදුන් දෙසූ 'දිගාසිරි වේවා' යන එක් බුද්ධ වචනයෙන් සක්දෙව් රජුට අවුරුදු තුන්කෝටි හැට ලක්ෂයකට ආයුෂ ලැබී අද දක්වාම ශක්‍ර දෙවියන් ලෙසින් සිටී.

2. (x) එසේම දින 7කට පමණක් ආයුෂ ඇතිව සිටි ආයුවඩ්ඪන කුමාරයාට 'දිගාසිරි ලැබේවා' කියා දෙසූ එක් බුද්ධ වචනයෙන් මිනිස් ලොව ඇති පරමායුෂ වූ අවුරුදු 120ක් ආයුෂ ලැබිණ.

2. (xi) මෙසේ එක් බුද්ධ වචනයකින් දේවායුෂ මනුෂ්‍ය ආයුෂ ලබාදෙන, මෙසේ එක් ශ්‍රවණ මාත්‍රයකින් දෙව් සැප හා නිවන් සුව ලබාදෙන, මෙසේ එක් වන්දනාවකින් සගසුව ලබා දෙන, මෙසේ එක් දර්ශන මාත්‍රයකින් දෙව්සුව නිවන් සුව ලබා දෙන, මෙසේ උන්වහන්සේ කෙරෙහි ඇතිකරගත් ශ්‍රද්ධා මාත්‍රයකින් අපාදුක් අඩුකර දී, මතු දුගති උත්පත්ති නැතිකර දී, සුගති සම්පත් කල්ප ලක්ෂයක තරම් අති දීර්ඝ කාලයක් තුළ ලබා දී පසේ බුද්ධත්වයක් ලබාදෙන, මෙසේ එක් පැහැදීම් මාත්‍රයකින් පවා ආනන්තර්ය පාපකර්මයක විපාක තුනීකර දෙන, වැඳිය යුතු වූ, පිදිය යුතු වූ, පූජාව පූජනීය වූ, අග්‍රදක්ෂිණෙය්‍යය වූ, ඒ මහා බුද්ධ ගුණයන්ගෙන් සමන්නාගත වූ සම්මා සම්බුද්ධ රත්නයට බොහෝ කොට කරනු ලබන පූජා සත්කාරවලින් කෙතරම් නම් ප්‍රතිඵල ලැබේ ද?

'එවං අචින්තියා බුද්ධා - බුද්ධ ධම්මා අචින්තියා
අචින්තියෙසු පසන්නානං - විපාකො හොති අචින්තියෝ'ති

'බුද්ධ ගුණ සිතා නිම කළ නො හැකි බැවින් අචින්තිය ම ය. එසේ ම ධර්ම ගුණ ද අචින්තිය ම ය. සංඝ ගුණ ද අචින්තිය ය. අචින්තිය වූ

ගුණ ඇති තෙරුවන් කෙරෙහි කරනු ලබන ප්‍රසාදයෙන් ලැබෙන්නා වූ විපාකයෝ ද අචින්තිය වන්නාහ' යන්න ඒ ගාථාවේ අදහස ය.

2. (xii) ඒ බුදුපියාණන් වහන්සේට කරනු ලබන පූජාවලින් කල්ප ගණන් දිව්‍ය මනුෂ්‍ය බ්‍රහ්ම සම්පත් ලබා දෙනවා පමණක් නොව සම්මා සම්බුද්ධත්වය, පසේබුද්ධත්වය, අග්‍රශ්‍රාවකභාවය, මහාශ්‍රාවක භාවය, අරහන්ත භාවය ද ලබා දී ලොවුතුරු සැප ද ලබා දෙන්නේ ය. සම්මා සම්බුද්ධත්වය ලබා ගැනීම සඳහා සම්බුදු කෙනකුන් වහන්සේ වෙත ජීවිත පරිත්‍යාගයකින් කරනු ලබන පූජාවක් පවත්වා, පළමු නියත විවරණ ලැබිය යුතු ම ය.

මෙවැනි මහත් දිව්‍ය සම්පත්, මනුෂ්‍ය සම්පත්, බ්‍රහ්ම සම්පත් කල්ප ගණන් අතිදීර්ඝ කාලයක් පුරාම ලබා දී, උන්වහන්සේට, කරනු ලබන පුද පූජාවලින් නිවන් සම්පත් ද ලබාදෙන බැවින් ඒ බුදුපියාණන් වහන්සේ සියලු පුද පූජාවන්ට ඒකාන්තයෙන් ම සුදුසු වන සේක. එබැවින් ඒ මහා ගුණ සාගරය, ඒ මහා සම්මා සම්බුද්ධ රත්නය ඒකාන්තයෙන් ම අරහත් නම් වන සේක.

## මහානිශංස

3. තවද මාගේ බුදුපියාණන් වහන්සේට කරනු ලබන පුද පූජාවලින් ලැබෙන කුශලය ලබා ගැනීමට වෙනත් කවුරුන් වෙත හෝ, බුදුරදුන්ට කළ පූජාවන්ට වඩා අසංඛ්‍ය ගණනකින් පූජා කළත් නො හැකි වන්නේ ය. කෝටි ප්‍රකෝටි අසංඛ්‍ය ගණනකට දුන් දානයකට වඩා බුදුරදුන්ට පිදූ එක් බත් හැන්දක් මහත්ඵල මහානිශංස වන්නේ ය.

තිරිසන් සතුන් 100 දෙනකුට දුන් දානයට වඩා එක් මිනිසකුට දුන් දානය උසස් ය. ශීලයක නො පිහිටි මිනිසුන් 100 දෙනකුට දුන් දානයට වඩා ශීලයක පිහිටි එක් මිනිසකුට දුන් දානය උසස් ය. ශීලවන්ත මිනිසුන් 100 දෙනකුට දුන් දානයට වඩා එක් සාමණේර නමකට දුන් දානය උසස් ය. එසේම සාමණේර 100 දෙනකුට දුන් දානයට වඩා පිරිසිදු උපසම්පදා ශීලයක පිහිටි භික්ෂුවකට දෙන දානය උසස් ය. එවැනි උපසපන් භික්ෂූන් 100 දෙනකුට දුන් දානයට වඩා සෝවාන් වූ භික්ෂුවකට දෙන දානය උසස් ය. සෝවාන් වූ 100 දෙනකුට දෙන දානයට වඩා එක් සකදාගාමී වූ භික්ෂුවකට, සකදාගාමී වූ 100 දෙනකුට වඩා එක් අනාගාමී භික්ෂුවකට ද, අනාගාමී වූ 100

දෙනකුට වඩා එක් රහත් භික්ෂුවකට ද දෙන දානය උසස් ය. මේ අනුව රහතන් වහන්සේ නමකට එක් වරක් දෙනු ලබන දානයක කුශලයකට සමාන කුශලයක් ලබා ගැනීමට උපසපන් භික්ෂූන් දසලක්ෂයකට 100 වරක් දන් දිය යුතු වන්නේ ය.

රහතන් වහන්සේලා 100 දෙනකුට දුන් දානයට වඩා එක් පසේ බුදුරජාණන් වහන්සේ නමකට දෙන දානය උසස් ය. එක් පසේබුදු කෙනකුට පූජා කරන එක් බත් හැන්දක කුශලය ලබා ගැනීමට ශීලසම්පන්න උපසපන් භික්ෂූන් දසලක්ෂයකට 10,000 වාරයක් දන් දිය යුතු වන්නේ ය. එවන් පසේබුදුවරුන් මුළු මහපොළොව පුරාම වැඩ සිටුවා දෙන දානයකටත් වඩා සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමකට දෙන දානය උසස් ය. එක් පසේබුදු කෙනකුට දෙන දානයේ කුශලය ලබා ගැන්මට උපසපන් භික්ෂූන් දසලක්ෂයකට 10,000 වාරයක් දන් දිය යුතු නම්, අසංඛ්‍ය ගණන් පසේ බුදුරජාණන් වහන්සේලාට කරනු ලබන දානයක කුශලය ලබා ගැනීමට, කොතරම් නම් උපසපන් භික්ෂු සංඛ්‍යාවකට කෙතරම් නම් පුද්ගලික දානයන් පිදුවත් නො හැකි වන්නේ ය. එම නිසා සම්මා සම්බුදු කෙනකුන්ට කරනු ලබන එක ම පූජාවක් වුව ද සිතාගැනීමට නො හැකි තරම් කුශල් සම්භාරයක් ලබා දෙන්නේ ය. එම නිසා ම උන්වහන්සේට කළ එක් පිදීමකින් වුව කල්ප ලක්ෂ ගණන් සුගති සම්පත් ලැබෙන්නේ ය. ලෝකයේ පුද පූජා ලැබීමට උන්වහන්සේට වඩා වැඩි කෙනෙක් නැත්තේ ය. සම්මා සම්බුද්ධ රත්නය මේ නිසාම සියලු පුද පූජා ලැබීමට සුදුසු වන සේක. එබැවින් අරහත් නම් ද වන සේක.

## ශීලය

4. තවද ඒ බුදුපියාණන් වහන්සේ ශීලයෙන් අග්‍ර වූ බැවින් ද සියලු පුද පූජා ලැබීමට සුදුසු වන සේක. උන්වහන්සේ චතු පාරිශුද්ධි ශීලය නම් වූ ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයෙන් ද, ආජීව පාරිශුද්ධි ශීලයෙන් ද, ඉන්ද්‍රිය සංවර ශීලයෙන් ද, පච්චය සන්නිශ්‍රිත ශීලයෙන් ද සමන්නාගත වූ සේක.

4. (i) 958 කෝටි 50 ලක්ෂ 36 දාහක් ශික්‍ෂාපද ඇති ප්‍රාතිමෝක්‍ෂ සංවර ශීලය නම් වූ උපසම්පදා ශීලය උන්වහන්සේ එක් සිල්පදයකුදු නො බිඳෙන සේ ආරක්‍ෂා කරන සේක. එතරම් සිල්පද සංඛ්‍යාවක්

ආරක්ෂා කළ හැක්කේ බුදුපියාණන් වහන්සේ කෙනකුන්ට ම ය. සැරියුත් මහරහතන් වහන්සේට පවා ඒ සියල්ල ආරක්ෂා කළ නො හැක. බුදුපියාණන් වහන්සේගේ මෙම ශීලය ගැන භාවනා කරනවා නම් 958 කෝටි 50 ලක්ෂ 36 දහස් අයුරකින් සිතිය යුතු වන්නේ ය. එය සාමාන්‍ය කෙනකුට කිරීමට අසීරු කරුණකි.

බුද්ධොපි බුද්ධස්ස භණෙය්‍ය වණ්ණං
කප්පමපි චෙ අඤ්ඤමභාසමානො
ඛීයෙථ කප්පො චිර දීඝමන්තරෙ
වණ්ණො න ඛීයෙථ තථාගතස්සා'ති

බුදු කෙනකුන් විසින් කල්පයක් මුළුල්ලේ අන් කිසිවක් නො කියා බුදුගුණ පමණක් වර්ණනා කළ ද, කල්පය ගෙවීයන නමුත් බුදුගුණේ නිමාවක් නැත්තේ ය.

4. (ii) තවද ඒ බුදුපියාණෝ ඉන්ද්‍රියසංවර ශීලයෙන් යුක්ත වන සේක. ඇසට මොනම හොඳ හෝ නරක රූපයක් දුටුවත්, කනට මොනම හොඳ හෝ නරක ශබ්දයක් ඇසුවත්, නාසයට මොනම සුවඳක් හෝ දුගඳක් දැනුණත්, දිවට මොනම රසවත් හෝ නීරස දෙයක් දැනුණත්, කයට මොනම සුවදායක හෝ දුක්ඛදායක දෙයක් දැනුණත්, සිතට මොනම සතුටුදායක හෝ අසතුටුදායක දෙයක් දැනුණත්, ඒ කිසිවිටකත් ඒ කිසිම දෙයකට ඇලීමක් හෝ ගැටීමක් උන්වහන්සේට ඇතිවන්නේ නැත. ඉතාම පිළිකුල් දෙයෙහි පවා මැදහත් සිතින්ම උන්වහන්සේ වැඩ සිටිය සේක.

දිනක් මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ශරීරය කුණු වී සිටින හිඟන්නකු කෙරෙහි අනුකම්පාවෙන් ඔහු ඉඳුල් කෑම කමින් සිටි තැනට පිඬු පිණිස ගොස් සිටිය විට, ඒ හිඟන්නා ඔහු කමින් සිටිය ඉඳුල් බත් පාත්‍රයට දැම්මේ ය. එසේ දමන විට ඔහු ගේ කුණු වී ඕජස් ගලමින් තිබූ ඇඟිලි පුරුකක් කැඩී පාත්‍රයට වැටිණ. ඒ මහා ගුණැති රහතන් වහන්සේ ඒ කුණු වූ ඇඟිලි කෑල්ල ඉවත ලා කිසිදු පිළිකුලක් නො මැතිව ඒ ආහාර වැළඳූහ. ශ්‍රාවකයන් පවා මෙසේ වූ කල, බුදුරදුන්ගේ උපේක්ෂාව ගැන කියනුම කවරේද?

4. (iii) මෙසේම උන්වහන්සේ ආජීව පාරිශුද්ධි ශීලයෙන් ද සමන්නාගත වූ සේක. උන්වහන්සේ ජීවත්වීම සඳහා අවශ්‍ය සිවුපසය

ඉතාමත් ම කැපසරුප් විධියට ධාර්මිකව ම ලබාගත් සේක. උන්වහන්සේ වේරඤ්ජාවේ වස් වැසූ පසු තුන් මාසයක් මුළුල්ලේ දානය නො ලැබ යවහාල් වැළඳීමට සිදුවූ අවස්ථාවේ, මුගලන් මහරහතන් වහන්සේ 'පොළොව අනෙක් පැත්තට පෙරළා එහි ඇති රස ඕජාව ලබා දෙන්නදැ'යි බුදුරදුන්ගෙන් ඇසී ය. "ඔබ එසේ කළහොත් පොළොවෙහි සිටින කුඩා පණුවන් කුහුඹුවන් වැනි සතුන්ට කුමක් වෙයිදැ" යි බුදුපියාණෝ විමසූහ. "ස්වාමීනි, එකම සතකුටවත් හිරිහැරයක් නො වන පරිදි පොළොව මතුපිට හා යට සිටිනා සියලු සතුන්ව ඍද්ධියෙන් පොළොවේ අනෙක් පැත්තක තැම්පත් කරමි" යි මුගලන් මහරහතන් වහන්සේ වදාළහ. එවිට බුදුපියාණෝ "පොළොවේ ඇති රස ඕජාව අපට අවශ්‍ය නැතැ" යි වදාළ සේක. එවිට මුගලන් මහරහතන් වහන්සේ ඍද්ධියෙන් උතුරුකුරු දිවයිනට වැඩ දානය ගෙන එන්නදැයි විමසී ය. එය ද බුදුපියාණෝ ප්‍රතික්ෂේප කළහ.

බුදුපියාණන් වහන්සේට අවශ්‍ය නම්, උතුරුකුරු දිවයින නොව වෙන ඕනෑම දිවයිනක් වේරඤ්ජාව සමීපයට ළං කරවිය හැකි ය. ඕනෑම දිවයිනකට ඍද්ධියෙන් වැඩිය හැකි ය. නැතිනම්, ඍද්ධියෙන් වැඩ සිටිය සියලුම භික්ෂූන්ට අවශ්‍ය ආහාරාදිය මැවිය හැකි ය. එසේත් නොමැති නම්, මාරයා ආවේශ වී දානය නො දී සිටි වේරඤ්ජාවේ සියලු මිනිසුන්ගේ මාරාවේශය නැතිවේවා යි අධිෂ්ඨාන කළ හැකි ය. මේ ඕනෑම දෙයක් කිරීමට උන්වහන්සේට තත්පරයක කාලයක් පමණකුදු ගත නොවේ. එහෙත් ජීවත්වීම සඳහා උන්වහන්සේ එවැනි කිසි දෙයක් නො කොට තුන් මාසයක් පුරාම යවහාල් වැළඳූ සේක.

උන්වහන්සේ ගාථාවක් දෙසීම නිසා පැහැදී දෙන දානයක් වුව ද නො පිළිගත් සේක. 'ගාථාභි ගීතං මෙ අභොජනෙය්‍යං....'[1] ආදී වශයෙන් එය දැක්වේ.

දිනක් සැරියුත් මහරහතන් වහන්සේට බඩේ අමාරුවක් සැදුණ විට, එහි වැඩසිටි මුගලන් මහරහතන් වහන්සේ, 'මෙවැනි ලෙඩක් ගිහි කාලේ සැදුණු විට කුමක් කළේ දැ'යි විමසූ විට, මෑණියන් එළඟිතෙල් කිරිබතක් සාදා දෙන බව කීවේ ය. මේ කථාව අසා සිටි දේවතා දුවක් සැරියුත් හාමුදුරුවන්ගේ උපස්ථායක ගෙදරක ළමයකුට ආවේශ වී එවන් කිරිබතක් සාදා දෙන ලෙස ආවේශයෙන් කියැවී ය.

පසු දා සැරියුත් හාමුදුරුවන්ට මේ කිරිබත ලැබිණි. උන්වහන්සේ මෙය කෙසේ ලැබුණේ දැයි දිවසින් බැලූ විට, දේවතා දුවගේ බලපෑම නිසා එය ලැබු අයුරු දැක, ඒ වැළඳූ විගසම රෝගය සුව වන බව දැන දැනත් මෙසේ වදාළහ. "මේ කිරිබත අහකට දමන්න. මෙය වළඳනවාට වඩා තියුණු පිහියකින් බඩ පලාදාන එක හොඳයි. මම ලෙඩෙන් මළත්, දෙන්නටය කියා ඉල්ලාගත් ආහාර වළඳන්නේ නැහැ." මෙසේ සැරියුත් මහරහතන් වහන්සේගේ ආජීව පාරිශුද්ධිය පැවැති කල, බුදුපියාණන් වහන්සේගේ ආජීව පාරිශුද්ධිය ගැන කවර කථා ද?

4. (iv) මෙසේම ඒ බුදුපියාණෝ සිවුපසය නුවණින් සලකා පරිභෝජනය කරන පච්චය සන්නිශ්‍රිත ශීලයෙන් ද යුක්ත වූ සේක. උන්වහන්සේ එක එක දාන පිඩක් පාසාම, ඒ දානය ඇනූ විගසම ජරාවක් බවට පත්වන හැටි, මුඛයේ දී කුණුකෙළ සමඟ මිශ්‍ර වී බලු වමනයක් වගේ වන හැටි, වමන මල්ල නම් වූ ආමාශයට ඒවා වැටුණු පසු ඉතා දුගඳ හමන ජරාවක් බවට පත්වන හැටි, ඒ ගිලින ආහාර දුගඳ හමන අසූචි ගොඩක් උඩට වැටෙන හැටි, ඒ ගන්නා ආහාර ද ටික වේලාවකින් අතිශයින් ම පිළිකුල් අසූචි බවට පත්වන හැටි නුවණින් මෙනෙහි කරමින් ම දානය වැළඳූ සේක. ලෝක සත්ත්වයාට පින් ලබාදීම පිණිස, ලෝක සත්ත්වයාට සේවයක් කිරීම පිණිස, ජීවිතය පැවැත්ම පිණිස, කුසගිනි නැතිකර ගැනීම පිණිස ආහාර වැළඳූ සේක. හිඟන්නකු දුන් ජරා ආහාරය මෙන්ම, රජ කෙනකු දුන් මධුර ආහාරයෙහි ද එකසේම සිත් ඇතිව උන්වහන්සේ ආහාර වැළඳූ සේක.

සිවුරු පරිහරණය කෙළේ ද ශීතලයෙන් ආරක්ෂා වීමට, උෂ්ණයෙන් ආරක්ෂා වීමට, මැසි මදුරුවන්ගෙන්, අව්වෙන්, වැස්සෙන්, පින්නෙන් ආරක්ෂා වීමට, පිළිකුල් තැන් වසා ගැනීමට යනාදී වශයෙන් නුවණින් ප්‍රත්‍යවේක්ෂා කරමින් ය.

සේනාසන පරිහරණය කළේ ද ශීතලයෙන්, උෂ්ණයෙන්, වැස්සෙන්, අව්වෙන්, සර්පයන් ආදී සතුන් ගෙන් ආරක්ෂා වී, විවේක සුවය ලබාගැනීමට පමණක්ම යැයි නුවණින් සිතමින් ම ය. කෝටි ගණන් වියදම් කර දුන් සේනාසන - වෙහෙර - විහාර කියා හෝ, ගල්ලෙනක් තුළ කියා හෝ, ගහක් මුල කියා හෝ, සොහොනක කියා හෝ උන්වහන්සේට කිසිදු වෙනසක් ඇති නො වී ය.

උන්වහන්සේ බෙහෙත් ගිලන්පස වැළඳුවේ ද ශරීරයේ පිපාසය ආදී පීඩා ද, රෝගයන් ද නැතිකර ගැනීමට යනාදී වශයෙන් නුවණින් සිතා ම ය.

ඒ පරිහරණය කළ සිවුරු සේනාසන ගිලන්පස මෙම කුණු ශරීරය පැමිණෙන්නට පළමු ඉතා පිරිසිදුව තිබුණත්, මේ කුණප ගොඩට වැටුණු පසු අපිරිසිදු භාවයට පත්වන අයුරු ද උන්වහන්සේ නුවණින් දුටු සේක. මේ සියල්ලම ධාතු සමූහයක්, මේ ශරීරයත් ධාතු මාත්‍රයක් ම පමණක් විනා සත්වයකු පුද්ගලයකු නොවන බව දකිමින් ම උන්වහන්සේ සිවුපසය පරිභෝග කළ සේක.

4. (v) මෙසේ උන්වහන්සේ ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයෙන් සමන්නාගත වූ සේක. ඉන්ද්‍රිය සංවර ශීලයෙන් සමන්නාගත වූ සේක. ආජීව පාරිශුද්ධි ශීලයෙන් සමන්නාගත වූ සේක. පච්චය සන්නිශ්‍රිත ශීලයෙන් ද සමන්නාගත වූ සේක. මෙවැනි අධිශීලයකින් සමන්නාගත වූ බුදුපියාණන් වහන්සේ සියලු පුද පූජා ලැබීමට ඒ නිසාම සුදුසු වන සේක. එබැවින් ඒ සම්මා සම්බුද්ධ රත්නය, ඒ ශීල සාගරය, ඒ ශීලයෙන්ම නිර්මිත වූවාක් බඳු වූ ශීල ප්‍රතිමූර්තිය ඒකාන්තයෙන්ම අරහත් නම් වන සේක. ඒකාන්තයෙන්ම අරහත් නම් වන සේක.

## සමාධි

5. මෙසේම ඒ බුදුපියාණෝ සමාධියෙන් අග්‍ර වූ බැවින් ද පුද පූජා ලැබීමට සුදුසු වන සේක. අද කවුරු හෝ ධ්‍යාන ලාභියකු පළමු ධ්‍යානය හෝ ලබා ධ්‍යාන සුවයෙන් සිටිනා බව දනී නම් මිනිසුන් ඔහුට කොතරම් සත්කාර ගරුකාර කරයි ද? ඒ බුදුපියාණෝ ඕනෑම භාවනා කර්මස්ථානයකින් ලැබෙනා ඕනෑම උපචාර සමාධියකට මොහොතකින් සමවැදිය හැකි කාමාවචර සමාධියෙන් සමන්නාගත වූ සේක. ඒ ඒ ධ්‍යාන ලැබෙන ඕනෑම කර්මස්ථානයකින් 1-2-3-4 යන රූපාවචර ධ්‍යානයන්ට ක්ෂණයකින් සමවැදිය හැකි රූපාවචර සමාධියෙන් සමන්නාගත වූ සේක. ඇසිපිල්ලන් ගැසීමට පෙර ඕනෑම 1-2-3-4 යන අරූපාවචර ධ්‍යානයන්ට සමවැදීමට සමත් බැවින් උන්වහන්සේ අරූපාවචර ධ්‍යානයන් ගෙන් ද සමන්නාගත වූ සේක.

ඡන්ද සමාධි - චිත්ත සමාධි - විරිය සමාධි - වීමංසා සමාධි - අනිමිත්ත සමාධි - අප්පණිහිත සමාධි - සුඤ්ඤත සමාධි - අටඨ

විමෝක්ෂ - අටධ අභිභායතන ආදී විවිධ සමාධීන් ගෙන් ද සමන්නාගත වූ සේක.

එසේම අරහත්ඵල සමාපත්තියට හා නිරෝධ සමාපත්තියට සමවදනා උන්වහන්සේ ලෝකෝත්තර සමාධීන් ගෙන් ද සමන්නාගත වූ සේක.

ඉතා සමාධිමත් තියුණු මනසක් තිබුණ උන්වහන්සේට ඕනෑම කරුණක් ක්ෂණයකින් බැලිය හැකි ය. දිනක් එක් බමුණකු විසින් දානය දීමෙන් අයහපතක් සිදුවන අවස්ථාත් ඇත්දැයි විමසී ය. එවිට බුදුපියාණෝ ගත් හුස්ම ටික පිටකිරීමට පෙර, කල්ප 89ක් අතීතයේ සිටි සියලුම සත්ත්වයන් දෙස බලා, ඒ කිසිවකුටත් දානයක් දී අයහපතක් වී නැති බව දැන, දානයක් දීමෙහි අයහපතක් සිදු නො වේයැයි දෙසූ සේක. කල්ප 89ක තරම් ඉතා දීර්ඝ කාලයක සිටි සියලු ම සත්ත්වයන් දෙස, ගත් හුස්ම ටික පිටකිරීමට පෙර සිතීම ගැන සාමාන්‍ය අපට සිතන්නත් අපහසු දෙයකි. බුද්ධ විෂයය අචින්තිය ම ය.

තව දිනක් වච්ඡගොත්ත නම් ආජීවකයෙක් පැමිණ, ආජීවකයකුට ආජීවකයකු වශයෙන්ම සිට නිවන් දැකිය හැකිදැයි විමසී ය. නො හැකි බව බුදුපියාණෝ වදාළහ. එසේ නම් අඩු වශයෙන් දිව්‍ය ලෝකයටවත් ආජීවකයකුට ගිය හැකි දැයි විමසී ය. බුදු පියාණෝ තත්පරයක් ගතවීමටත් පෙර කල්ප 91ක් අතීතය බලා, මෙයට කල්ප 91කට පෙර එක් ආජීවකයකු පමණක් දෙව්ලොව උපන් බව දේශනා කළ සේක. ඔහු මෙසේ දෙව්ලොව උපන්නේ ද කුශල් අකුශල් කර්මඵල විශ්වාස කොට වැඩ කළ නිසා බව ද වදාළහ.

මෙවැනි සමාධිමත් ඉතාමත්ම දියුණු මනසක් උන්වහන්සේට තිබිණ. එබැවින් ද උන්වහන්සේ සියලු පුද පූජා ලැබීමට සුදුසු වන සේක. එසේ හෙයින් ම අරහත් නම් ද වන සේක.

## ප්‍රඥා

6. තවද ඒ බුදුපියාණෝ ප්‍රඥාවෙන් අග්‍ර වූ බැවින් ද සියලු පුද පූජා ලැබීමට සුදුසු වන සේක. බුදුරදුන්ගේ ප්‍රඥාව ගැන, එහි ඇති ගැඹුරුභාවය ගැන, එහි ඇති පළල් භාවය ගැන සම්පූර්ණයෙන් සිතීමට තරම් සමත් කිසිම කෙනකු නැත. එය සිතිය හැක්කේ වෙනත් බුදු කෙනකුන්ට ම ය. මුළු ලොව සියලු දෙනාගේ ප්‍රඥාව සැරියුත් මහරහතන් වහන්සේ ගේ ප්‍රඥාවෙන් 16/1 ක් වත් තරම් නො වන්නේ

ය. සැරියුත් මහරහතන් වහන්සේ ගේ ප්‍රඥාව එතරම් නම්, බුදුරදුන් ගේ ප්‍රඥාව ගැන උපමාවක් වත් සිතාගත හැකි ද? බුදුරදුන් අවබෝධ කරගත් හේතු හා ඵල ධර්මයන් ගැන දන්නා කරුණු, බුදු වී 4 වන සතියේ සතියක් පුරා රෑ දහවල් නොකඩවා සිතන විට, ඒ නිසා සන්සිඳුණු බුදු සිරුරෙන් නික්මුණු ඝන බුදුරැස් 10000ක් සක්වළ පුරා ඉතිරී පැතිරෙන්නට විය. එම සතිය තුළ උන්වහන්සේගේ ඥානයට වැටහුණු ඒ කරුණු අවුරුදු දහස් ගණනකිනිදු කිසිවකුට ඉගෙන නිම කළ නො හැක.

6. (i) උන්වහන්සේ අවබෝධ කරගත් වෙනත් බුද්ධ ඥාණ කෙතෙක්දැයි සිතාගැනීමට නො හැකි ය. 14 ක් වූ බුද්ධ ඥාණ, 16 ක් වූ බුද්ධ ඥාණ, 18 ක් වූ බුද්ධ ඥාණ, 44 ක් වූ බුද්ධ ඥාණ, 73 ක් වූ බුද්ධ ඥාණ, 77 ක් බුද්ධ ඥාණ, දසබල ඥාණ, චතුවෙසාරජ්ජ ඥාණ ආදී ඒ ඒ බුද්ධ ඥාණ ගැන භාවනා කරනවා නම් ඒ සඳහා අවුරුදු ගණනක් සිතිය යුතු වන්නේ ය. බුදුගුණ අචින්තිය ම ය.

6. (ii) වෙනත් සම්මා සම්බුදු කෙනකුන්ටම හැර පසේ බුදුකෙනකුට පවා ලැබිය නො හැකි, කිසිම දෙවියකුට බ්‍රහ්මයකුට මාරයකුට හෝ කිසිම සත්ත්වයකුට ලැබිය නො හැකි අසාධාරණ ඥාණ 6 කින්ද උන්වහන්සේ සමන්නාගත වූ සේක.

සත්ත්වයන්ගේ ඉන්ද්‍රිය ධර්මයන් පිළිබඳ තත්ත්වයන් දන්නා ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥානය ඒ බුදුරදුන්ගේ එක් අසාධාරණ ඥානයකි. ඉන්ද්‍රිය ධර්ම යනු සද්ධා - විරිය - සති - සමාධි - ප්‍රඥා යන කරුණු 5 ය. දෙවියන් මනුෂ්‍යයන් බ්‍රහ්මයන් මාරයන් තිරිසනුන් ඇතුළු සෑම සත්ත්වයකුගේම ශ්‍රද්ධාදී මෙම ධර්ම කෙතෙක් දුරට වැඩී තිබේ ද, මොන මොන ඉන්ද්‍රිය ධර්මයන් වැඩී නැත් ද ආදී වශයෙන් දත හැකි ඥානය ඉන්ද්‍රියපරෝපරියත්ත ඥානය යි. අපට අපේ ම ශ්‍රද්ධාව වීරිය ආදී ධර්මයන් කෙතෙක් දුරට වැඩී ඇත්දැයි දැනගැනීමට නො හැක. වෙනත් සත්ත්වයකුගේ තත්ත්වයන් කෙසේ නම් අපට දැනගන්න හැකිවේ ද? ඒ බුදුරදුන්ට අසංඛ්‍ය ගණන් සත්ත්වයන් සිටියත්, ඒ සියලු සත්ත්වයන්ගේ ශ්‍රද්ධා - විරිය - සති - සමාධි - ප්‍රඥා යන කරුණු එක මොහොතක් තුළදී දැනගත හැකි ය. එබැවින් උන්වහන්සේට ලක්ෂ කෝටි ප්‍රකෝටි අසංඛ්‍ය ගණන් එකවර නිවනට

පත් කරලිය හැකිසේ ධර්මය දේශනා කළ හැකි ය. එවැනි අසාධාරණ ඥානයකින් ඒ බුදුපියාණෝ සමන්නාගත වූ සේක.

6. (iii) තවද සත්ත්වයන්ගේ ආශයන් අනුශයන් දන්නා ආශයානුශය ඥානය ද උන්වහන්සේ ගේ අසාධාරණ ඥානයකි. ලෝක ධාතුවේ සිටිනා යම්තාක් දෙවියන්, මනුෂ්‍යයන්, බ්‍රහ්මයන්, අමනුෂ්‍යයන්, තිරිසනුන්, අපායික සත්ත්වයන් ඇතුළු සියලුම සත්ත්වයන්ගේ මේ මේ අදහස් මේ මේ සත්ත්වයා තුළ පවතී - මොහුගේ අදහස හොඳ ප්‍රණීත එකකි - මොහුගේ අදහස හීන පහත් එකකි - මොහුගේ දැනට යටපත් වී ඇති ඕනෑම වේලාවක මතු වී පැන නැගී ආ හැකි මේ මේ අනුශය කෙළෙස් ඇත - මොහුගේ පෙර කරන ලද මේ මේ කුසල, - අකුසල කර්ම ඇත - මොහු පහත් අදහස් ඇත්තෙකි - මොහු උසස් අදහස් ඇත්තෙකි - මොහුට ඇති කෙළෙස් පීඩා අඩුයි - මොහුට ඇති කෙළෙස් පීඩා වැඩියි - මොහුගේ ශ්‍රද්ධාව වීරිය ආදී ධර්මයන් දියුණුයි - මොහුගේ ශ්‍රද්ධාදී ධර්මයන් දියුණු නැත - මොහුට පහසුවෙන් ධර්මය අවබෝධ කරදිය හැක - මොහුට පහසුවෙන් ධර්මය අවබෝධ කරදිය නො හැක - මොහු මේ ජීවිතයේදීම නිවන් දැකිය හැකි අයෙකි - මොහුට මේ ජීවිතයේ දී නිවන් දැකිය නො හැක - යනාදී කරුණු සියල්ලම ඒ බුදුපියාණෝ දත් සේක. බුදුපියාණන් වහන්සේට කුරා කුහුඹුවාගේ පටන් දෙවියන් මනුෂ්‍යයන් බ්‍රහ්මයන් ඇතුළු අසංඛ්‍ය ගණන් සියලු සත්ත්වයන්ගේම මේ තත්ත්වයන් තත්පරයකටත් අඩු කෙටි කාලයක් තුළ, දී දැනගත හැක. අපට අපේම පෙර කළ කර්ම මොනවාද, මේ ජීවිතයේ දී නිවන් දැකීමට හැකි ද යනාදී කරුණුවත් දැනගත නො හැක. අනෙක් කෙනකුගේ ඒ ඒ තත්ත්වයන් කෙසේ නම් දැන ගන්න ද? සත්ත්වයන්ගේ මේ මේ තත්ත්වයන් දන්නා ආශයානුශය නම් වූ අසාධාරණ ඥානයෙන් ද ඒ බුදුපියාණෝ සමන්නාගත වූ සේක.

6. (iv) තවද යමකපාටිහාරියේ ඥානය ද ඒ බුදුරදුන්ගේ අසාධාරණ ඥානයකි. එදා උන්වහන්සේ යමාමහ පෙළහර පෑ අයුරු කෙතරම් නම් ආශ්චර්යමත් ද? බුදුපියාණන් වහන්සේ සැවත් නුවර දී ගණ්ඩබබ නම් අඹ ගසක් ළඟ යමාමහ පෙළහර පානා බව වදාළ විට, තිගණ්ඨයෝ සියලුම අඹ ගස් ඉතා කුඩා පැළෑටියක් පවා ඉතිරි නො කොට විනාශ

කළහ. නියමිත දිනයේ උන්වහන්සේට පිළිගැන්වූ අඹ ගෙඩියක් වළඳා එහි ඇටය ආනන්ද හාමුදුරුවන්ට සිටුවීමට වදාළ සේක. ආනන්ද හාමුදුරුවන් අඹ ඇටය සිටවූ පසු, එතැනට උන්වහන්සේගේ ශ්‍රී හස්ථය සේදූ විට, එවේලේම බලාගෙන සිටිත්දීම බුද්ධානුභාවයෙන් විශාල අඹ ගසක් පැන නැගුණි. බුද්ධානුභාවය ආශ්චර්යමත් ය. එදා යමාමහ පෙළහර දැකීමට 10000ක් සක්වළ දෙවිවරු බ්‍රහ්මවරු සහිත අසංඛ්‍ය ගණන් ජනීජනයා රැස්වී සිටියහ. ඒ සියලු සත්ත්වයාට ම ආවරණයක් වශයෙන් නිලුපුල් මණ්ඩපයක් සක්දෙව්රජ මැවී ය. ඊට පසුව ඒ අඹ ගසට ඉහළින් මුළු අහස පුරා රුවන් සක්මනක් මැවී ය.

එදා පෑ යමාමහ පෙළහර අවීචියේ පටන් භවාග්‍රය දක්වා ම සියලු ම සත්ත්වයන්ට පෙනේවායි බුදුපියාණෝ අධිෂ්ඨාන කළහ. ඒ පෑ යමාමහ පෙළහර නො දුටු සත්ත්වයෙක් නම් නැත.

එදා බුදුපියාණෝ ශ්‍රී බුද්ධ ශරීරයෙන් සවණක් ඝන බුදුරැස් මේ සක්වළ පුරා පමණක් නොව, 10000ක් සක්වළ පුරාම ඉතිරී පැතිරී යන ලෙස පතුරුවා හැර වදාළ සේක. ඊට පසුව බුදුපියාණෝ ලෝකවාසී සියලු සත්ත්වයා පුදුමයෙන් බලා සිටිත්දී, මුළු අහස පුරා විහිදි ඒ රුවන් සක්මනට වැඩ වදාළ සේක. එවිට මුළු ලෝකය පුරාම එකම සාධුකාර පූජාවක් විය. බුදුපියාණෝ ඒ සක්මන මත දැන් සක්මන් කරනා සේක. සවණක් ඝන බුදුරැසින් බැබළි බැබළී, දිලිහි දිලිහී වඩනා බුදුරදුන්ගේ ශ්‍රී බුද්ධ ශරීරයෙන් එකවරම මහත් වූ තල් කඳක් බඳු ජල කඳක් ද, අතිවිශාල ගිනි කඳක් ද එකවිටම නිකුත් වීමට පටන් ගත්තේ ය. ඒ ජලකඳන් හා ගිනිකඳන් මේ සක්වළ පමණක් නොව 10000ක් සක්වළ පුරා ඉතිරී පැතිරී දිවෙයි. ඒ ජලයෙන් තෙමෙනු කැමැති අය තෙමෙති. නො තෙමෙනු කැමැත්තෝ නො තෙමෙති. ඒ ගින්දරට මකුළු දැලක්වත් පිච්චෙන්නේ නැත.

උන්වහන්සේගේ ඒ බුදු සිරුරින් උඩුකයින් ගිනිකඳක් පිට වේ. ඒ අතරම යට කොටසින් ජල කඳන් පිට වේ. ගිනි කඳන් පිට වූ තැනින් ගින්න යටකරගෙන ජලය මතු වේ. ජලය පිට වූ තැනින් ජලය යටකරගෙන ගිනි මතු වේ. මෙසේම ශරීරයේ පසුපසින් ගිනි පිට වේ. ඉදිරිපසින් ජලය පිට වේ. ජලය යටකරගෙන ගිනි පිට වේ. ගිනි යටකරගෙන ජලය පිට වේ. දකුණු අතින් ගිනි පිට වේ. වම් අතින් ජල කඳන් පිටවේ. ගිනි පිට වූ තැනින් නැවත ජල කඳන් පිට වේ.

ජලය මතු වූ තැනින් ඒ යටකරගෙන ගිනි කඳන් පිට වේ.

නැවත දකුණු ඇසින් ගිනි කඳන් පිට වේ. වම් ඇසින් ජල කඳන් නිකුත් වේ. ඒ එක්කම ගිනි තිබූ තැනින් ජල කඳන් ද, ජලය තිබූ තැනින් ගිනි කඳන් ද පිට වේ. දකුණු කන් සිදුරෙන් විශාල තල් ගසක් පමණ ගිනි කඳක් පිට වේ. වම් කන් සිදුරෙන් එවැනිම වූ විශාල ජල කඳන් පිට වේ. ඒ එක්කම ජලය යටකරගෙන ගිනි කඳන් ද, ගිනි යටකරගෙන ජල කඳන් ද එක්වරම නිකුත් වේ. මෙසේම දකුණු උරහිසින් ගිනිකඳන් නිකුත් වේ. වම් උරහිසින් ජල කඳන් නිකුත් වේ. ඒ එක්කම ගිනිකඳ තිබූ තැන ජල කඳන් ය. ජලකඳ තිබූ තැන ගිනි කඳන් ය.

මෙසේම දකුණු අතින් ගිනි කඳන් පිට වේ. වම් අතින් ජල කඳන් පිට වේ. ජලය යටකරගෙන ගිනි ද, ගිනි මතුකරගෙන ජලය ද නිකුත් වේ. මෙසේම එක් එක් ඇඟිල්ලෙන් ජල කඳන් ද, ගිනි කඳන් ද පිට වේ. එක් එක් ශ්‍රී පතුලෙන් ගිනි කඳන් ද, ජල කඳන් ද නිකුත් වේ. එක් එක් ඇඟිලි පුරුකෙන් ජල කඳන් ද, ගිනි කඳන් ද නිකුත් වේ. එක් එක් ඇඟිලිකරු අතරින් ජල කඳන් හා ගිනි කඳන් නිකුත් වේ. මෙසේම එක් එක් රෝම කූපයෙන් ද ගිනි කඳන් හා ජල කඳන් පිට වේ. ජලය තිබූ තැන ඒ එක්කම ගිනි කඳන් ය. ගිනි තිබූ තැන්වල ඒ එක්කම ජල කඳන් ය. මේ ගිනි කඳන් හා ජල කඳන් 10000ක් සක්වළ පුරා දිවෙයි.

දෙවියන් බ්‍රහ්මයන් මනුෂ්‍යයන් ඇතුළු ලෝකධාතු 10000ක සත්ත්වයෝ මෙය දකිති. මුළු ලෝකයාම අතිශයින් පුදුම වී, ගල්ගැසී, කට හයාගෙන, ඇස් දල්වාගෙන 'අහෝ බුද්ධො අහෝ බුද්ධො' කියමින් සාධුකාර දෙමින්, ප්‍රීතිඝෝෂා පවත්වමින් බුදුපියාණන් වහන්සේට මේ අතර පූජා පවත්වති.

ඒ එක්කම තවත් බුද්ධ රූපයක් බුදුපියාණෝ මැවූ සේක. කිසිම දෙවියකුට, කිසිම බ්‍රහ්මයකුට, කිසිම සත්ත්වයකුට මේ නිර්මිත බුදුරදුන් ය, මේ නියම බුදුරදුන් ය කියා හඳුනාගත නො හැක. දෙදෙනා වහන්සේම එක හා සමාන ය.

නිර්මිත බුදුරජාණෝ ද, නියමිත බුදුපියාණෝ ද යන දෙදෙන වහන්සේලාම ජල කඳන් හා ගිනි කඳන් නිකුත් කරති. එක් බුදු කෙනෙක් හිඳිති. එක් බුදු කෙනෙක් සැතපෙති. එක් බුදු කෙනෙක් සක්මන් කෙරෙති. අනෙක් බුදුරදහු සිටගෙන සිටිති. එක් බුදු කෙනෙක් ප්‍රශ්න විචාරති. අනෙක් බුදුරදහු ඒ ප්‍රශ්න විසඳති. එවිට අනෙක්

බුදුපියාණෝ සාධුකාර පවත්වති. මේ අතරතුර දී බුදුපියාණෝ 10000ක් සක්වළ සියලු සත්ත්වයන්ගේ ම කිනම් කිනම් සිත් මේ සත්ත්වයා තුළ පහළ වී දැයි ඔවුන්ගේ සිත් බලනා සේක. එසේම ඒ ඒ සත්ත්වයාගේ ඉන්ද්‍රිය ධර්ම වැඩී නො වැඩී ඇති අයුරු බලනා සේක. නො වැඩුණු ශ්‍රද්ධා වීරිය ආදී ඒ ඒ ඉන්ද්‍රිය ධර්මයන් වැඩෙනා අයුරින් දහම් ද දෙසන සේක. ඒ ඒ සත්ත්වයා දෙස ම බලා සිට බණ වදාරන්නාක් මෙන් පෙනෙන සේ දේශනා කරන ඒ ධර්මය දෙවියෝ දේව භාෂාවෙන් අසති. බ්‍රහ්මයෝ බ්‍රහ්ම භාෂාවෙන් අසති. මනුෂ්‍යයෝ මනුෂ්‍ය භාෂාවෙන් අසති. අමනුෂ්‍යයෝ අමනුෂ්‍ය භාෂාවෙන් අසති. තිරිසන් සත්ත්වයෝ තිරිසන් භාෂාවෙන් අසති. එදා ඒ දහම් අසා 20 කෝටියක් සත්ත්වයෝ අමාමහ නිවන් දුටහ.

මෙවැනි යමාමහ පෙළහරක් පෑමට, එවන් දහමක් දෙසුමට වෙනත් සම්බුදු කෙනකුන්ම විනා අන් කවරෙක් නම් සමත් වේද? මෙවැනි යමකපාටිහාරියේ අසාධාරණ ඥානයෙන් ද ඒ බුදුපියාණෝ සමන්නාගත වූ සේක.

6. (v) තවද ඒ බුදුපියාණෝ මහාකරුණා සමාපත්ති අසාධාරණ ඥානයෙන් ද යුක්ත වූ සේක. උන්වහන්සේ 20 අසංඛ්‍ය කල්ප ලක්ෂයකට උඩ දී බුද්ධත්වය පැතුවේ, 'මම බුදු වී අසරණ සත්ත්වයා සසර දුකින් ගලවමි'යි යන මහත් කරුණාවෙනි. සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකට උඩදී නියත විවරණ ලැබූ දා සිට, උන්වහන්සේ තමන් වහන්සේගේ ඇස් ගලවා දෙමින්, ලේ දන් දෙමින්, මස් දන් දෙමින්, හිස් දන් දෙමින්, අඹුදරුවන් දන් දෙමින්, විශාල වස්තු සම්භාර දන් දෙමින්, දස පාරමී පුරන ලද්දේ මම බුදු වී අසරණ සත්ත්වයා සසර දුකින් ගලවමි යන මහත් වූ කරුණාවක් ඇතිව ය. අනුන් සුවපත් කිරීම සඳහා තමන්ගේ ඇස් ගලවා දීමට, මස් ලබා දීමට, හිස් කපා දීමට කෙතරම් නම් කරුණාවක් තිබිය යුතු ද? 20 අසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලේ ක්‍රමයෙන් වඩමින් ආ මහා කරුණාවකින් ඒ බුදුරජාණෝ සමන්නාගත වූ සේක.

උන්වහන්සේගේ කරුණාව නොයෙක් ආකාරයෙන් පහළ වන්නේ ය. අසරණ ලෝක සත්ත්වයා, නිතරම ප්‍රේතලෝකවලට වැටී, තිරිසන් ලෝකවලට වැටී, අපායවලට වැටී අනන්ත දුක් විඳිනා අයුරු දක්නා බුදුපියාණන් වහන්සේට, මේ අසරණ සත්ත්වයාට අනේ කාගේ පිහිටක්දැයි මහත් වූ කරුණාවක් පහළ වන්නේ ය.

මෙසේම ජාති දුකින් පෙළෙන සත්ත්වයා දකින විට- සිය දහස් ගණන් රෝගවලින් ලෙඩවී කෙඳිරිගාමින් දහදුක් විඳිනා අසරණ සත්ත්වයා දකින විට- මහලු වී, ජරා වී, අතපය පවා වලංගු නැතිව, කිසි පිළිසරණක් නැතිව, ඉතා දුක සේ ජරාවෙන් පීඩිතව ඉන්නා සත්ත්වයා දකිනා විට- මරණයට පත්වෙමින් විඳිනා අනන්ත දුක් දකින විට- නොයෙක් හේතූන් නිසා හඬමින්, වැළපෙමින්, බිම පෙරළෙමින්, ශෝක කරමින් තැවෙන්නා වූ සත්ත්වයා දකිනා විට- ශරීරයේ ඇතිවන නොයෙක් පීඩාවලින් සත්ත්වයා නිරන්තරයෙන් පෙළෙමින් දුක්විඳිනා හැටි දකින විට 'අනේ මේ සත්ත්වයාට කාගේ පිහිටක්ද' යි සිතනා බුදුරදුන්ට ඇතිවන කරුණාව අති මහත් ය.

මෙසේම ආශාවට යට වී ලෝභයෙන් මැඩී, හිස ගිනි ගත්තා සේ සත්ත්වයා මහාදුක් විඳිනා හැටි දකින විට- මෝඩකම නිසා සංසාරයේ අනන්ත දුක් නැවත නැවත විඳිමින් එන සත්ත්වයා දකින විට- කිසිවකුගේ පිහිටක් නැති අසරණ සත්ත්වයා දකින විට- අනාථ වූ සත්ත්වයා දකින විට- කෙළෙස් ගිනිවලින් පිච්චි පිච්චි දැවෙනා සත්ත්වයා දකින විට- අඬදබර කලකෝලාහල හැප්පිලි ගැටිලි යුද්ධ සොරුන් සතුරන් ආදිය නිසා ගිනි ජාලාවක් මැද සත්ත්වයා දඟලන හැටි දකින විට- මහත් වූ ආශාවෙන් උපයා ගත් සියලු දේපොළ ඉඩකඩම් මිලමුදල් දූදරුවන් ආදී සියලු දේම සත්ත්වයාට මරණයෙන් අත්හැර දා යන්න සිදුවන හැටි දකිනා විට 'මේ සත්ත්වයා දුකින් ගැලවීමට මා හැර අන් කවරෙක් ඇත්ද' යි සිතනා ඒ බුදුපියාණන්ට ඇතිවන කරුණාව අති මහත් ය.

එසේම කිසිම නිදහසක් නැතිව හිස ගිනිගත්තා සේ නිතර වැඩෙහි නිරත වූ සත්ත්වයා දකින විට- සැපක් ලබන්නය කියා පංචකාමයෙහි එරී මහා දුක් විඳිනා මෝඩ සත්ත්වයා දකිනා විට- මේ සත්ත්වයා සසර දුකින් ගොඩගන්න සනසවාලන්න අස්වසාලන්න කෙනකු නො මැතිකම නිසා දහදුකෙහිම එරී දුක්විඳිනා සත්ත්වයා දකින විට- කිසි දිනෙක ඇතිවීමක් නො මැතිව තව තවත් මදි මදි යන හැඟීමෙන් පීඩා විඳින සත්ත්වයා දකිනා විට- කිසිවකුගේ පිහිටක් නැතිව, ආරක්ෂාවක් නැතිව, අසරණව, මහා අවුල් ජාලාවක් මැද පැටලී දහදුක් විඳිමින් සුසුම් හෙළන සත්ත්වයා දකින විට ඒ බුදුරදුන්ට 'මේ සත්ත්වයාට මා කෙසේ නම් පිහිටවන්නේ ද'යි මහත් වූ කරුණාවක් ඇතිවන්නේ ය.

මෙසේම තණ්හා ගින්නෙන් සත්ත්වයා දැවෙන පිච්චෙන ආකාරය දකිනා විට- දෝෂ ගින්නෙන් ගිනිගත් සත්ත්වයා දකිනා විට- මෝහ ගින්නෙන් සසර ගිනි ඇවිළගත් සත්ත්වයා ගැලවීමට නො හැකිව ඒ ගිනි මැදම සසරේ නැවත නැවත දුක් විඳිනා අයුරු දකින විට- රාග දෝෂ මෝහ ආදී මහා උගුල්වලට බන්ධනවලට ගැලවිය නො හැකි සේ අසුවී එහිම දඟලමින් දහදුක් විඳිනා හැටි දකිනා විට- මහා ප්‍රපාතයකට වැටුණාක් මෙන්, මහා ගිනි උඳුනක් මතට වැටුණාක් මෙන්, මහා මඩ ගොහොරක එරුණාක් මෙන් සසරින් ගොඩඒමට නො හැකිව එහිම දඟල දඟලා තව තවත් දුකින් දුකටම පත්වන සත්ත්වයා දකින විට 'මේ සත්ත්වයා, කවදා කෙසේ නම් සසර දුකින් ගැලවේ දැ'යි සිතනා ඒ බුදුපියාණන්ට ඇතිවන කරුණාව වචනයෙන් කියා නිම කළ නො හැක.

තවද මහ වධ හිංසාවලින් මහත් වූ පීඩා විඳිනා සත්ත්වයා දකිනා විට- සසර දුක් නිවා දමන නිවන් මග තිබිය දී අපා ගිනි මැදට යන මාවතේ පියවර ඔසවන සත්ත්වයා දකිනා විට- අලාභ අයස නින්දා දුක් ආදී ලෝකධර්මයන්ට යටවී පීඩිතව සිටිනා සත්ත්වයා දකිනා විට- මානයෙන් ඉදිමී දුක්විඳිනා සත්ත්වයා දකිනා විට- වාදවිවාදවලට පැටලි පැටලී සත්ත්වයා දුක් විඳින අයුරු දකිනා විට- අකුශල කර්ම කරමින් තව තවත් දුක්ම උපදවාගන්නා සත්ත්වයා දකින විට- මේ ආදී සිය දහස් ආකාරයෙන් සත්ත්වයා දෙස බලනා විට 'මා හැර මේ සත්ත්වයා සසර දුකින් ගැලවීමට අන් කවරෙක් වේදැ' යි දකිනා ඒ සම්මා සම්බුද්ධ රත්නයට ඇතිවන කරුණාව කෙසේ නම් කියා නිම කරමු ද?[1] (මෙවන් දුක් වින්ද - විඳින - විඳීමට සිදුවන මේ පංචස්කන්ධ ලෝකය ම දුක්ඛ සත්‍යයක් බව දකින්න.)

මුළු ලෝකයේම සිටිනා සියලු සත්ත්වයන්ගේ ම කරුණාව එක්තැන් වුවත්, එය ඒ බුදුරදුන්ගේ කරුණාවෙන් ලක්ෂයෙන් එකකුදු නො වන්නේ ය. කෝටියෙන් එකකුදු නො වන්නේ ය. ඒ බුදුපියාණන් ගේ කරුණාව මහපොළොව නම් සියලු සත්ත්වයන්ගේ ම කරුණාව වැලි කැටයක් බඳු ය.

ඒ බුදුරජාණෝ උදය හා සවස දොළොස් කෝටි ලක්ෂ වාරය බැගින් 24 කෝටි ලක්ෂ වාරයක් දිනකට මහා කරුණා සමාපත්තියට සමවැදී ලෝක සත්ත්වයා දෙස බලා අනන්ත අප්‍රමාණ සත්ත්වයාට සසර දුක් නිවාලීමට පිහිටවන සේක. එසේ සසර දුකින් මුදා ගත්

සත්ත්වයා කොපමණදැයි ගණනකින් දැක්වීමට නො හැකි ය. අසංඛ්‍ය බැගින්ම නිවනට පැමිණ වූ සත්ත්වයෝ 24 අසංඛ්‍යයක් වූහ. 100, 1000, දසදාස, ලක්ෂය, කෝටිය, ප්‍රකෝටිය ආදී වශයෙන් එකවර නිවන් දැක්වූ අවස්ථා ද ගණන් නැත. මෙවැනි මහා කරුණාවකින් තෙත් වූ හදවතක් ඇති ඒ බුදුපියාණෝ මහා කරුණා සමාපත්ති අසාධාරණ ඥානයෙන් ද සමන්නාගත වූ සේක.

6. (vi) තවද දත යුතු යම්තාක් දේ ඇත් ද, ඒ සියල්ල ම දන්නා සර්වඥතා ඥානය ද බුදුරදුන්ගේ අසාධාරණ ඥානයකි. උන්වහන්සේගේ සර්වඥතාඥානයට නො පෙනෙන කිසිවක් නැත. එම ඥානයෙන් නො දත හැකි කිසිවක් නැත. මේ ලෝකධාතුවල යම්තාක් දෙවියන් බ්‍රහ්මයන් මාරයන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් මනුෂ්‍යයන් ආදී සත්ත්වයන් දන්නා යම්තාක් දේ ඇත් ද, ඒ සියලුම දේ බුදුපියාණෝ දන්නා සේක. දත යුතු සියලු දේ සෑම ආකාරයකින් ම උන්වහන්සේට පෙනෙන්නේ ය. මේ ලෝකාර්ථයෙන්, පරලෝකාර්ථයෙන්, මෙලෝ පරලෝ උභයාර්ථයෙන්, යමක මතුපිටින් පෙනෙනාර්ථයෙන්, ගම්භීරාර්ථයෙන්, නො වැසුණු අර්ථයෙන්, වැසුණු අර්ථයෙන්, වැරැදි සහිත අර්ථයෙන්, නිවැරැදි අර්ථයෙන් මේ ආදී නොයෙක් අයුරින් උන්වහන්සේ සියලු දේ ම දන්නා සේක.

අපට ගිය ආත්මයක දෙයක් දැනගැනීමට අපහසු ය. සමහරවිට වසරකට දෙකකට උඩදී සිදු වූ දෙයක් වුව සිහිපත් කළ නො හැක. උන්වහන්සේට කල්ප අසංඛ්‍ය අසංඛ්‍ය ගණන් ඈත සිදු වූ දෙයක් වුව ද, මේ දැන් සිදුවන දෙයක් සෙයින් ඉතා හොඳින් පෙනේ. අතීතය ඇත්තේ යම්තාක් ද, ඒ තාක් දුරට සිදු වූ සියල්ලම ඒ සර්වඥතාඥානයෙන් බැලිය හැකි ය. අතීතයේ කෙළවරක් නැත. එබැවින් ඒ සර්වඥතාඥානයේ ද කෙළවරක් නිමාවක් අන්තයක් නැත.

අපට හෙට සිදුවන දෙයක් වුව ද නිවැරැදිව කිව නො හැක. උන්වහන්සේට අනාගතයේ කොයිතරම් ඉදිරියට වුවත්, කල්ප අසංඛ්‍ය අසංඛ්‍ය අසංඛ්‍ය ගණන් ඈත දී සිදුවන දෙයක් වුවත්, මේ දැන් සිදුවන දෙයක් සෙයින් ඉතා හොඳින් පෙනේ. අනාගතය ඇත්තේ කොයිතරම් ඈතට ද, ඒ තරම් ඈතටම සිදුවන දේ සර්වඥතාඥානයෙන් බැලිය හැක. අනාගතයේ කෙළවරක් නැත. එබැවින් සර්වඥතාඥානයේ ද කෙළවරක් නැත. අනන්ත ය.

එසේම වර්තමානයේ සිදුවන සියල්ල ද ඒ සර්වඥතාඥානයට පෙනේ. ඕනෑම දෙවියෙක්, ඕනෑම බ්‍රහ්මයෙක්, ඕනෑම මාරයෙක්, ඕනෑම සත්ත්වයෙක්, මේ සක්වළ පමණක් නොව අසංඛ්‍ය ගණන් සක්වළට ඇතිත් ඇති සක්වළක සත්ත්වයෙක් පවා සිතූ ඕනෑම දෙයක් පෙනේ. මේ දෙවියා සිතුවේ මෙය යි, මේ බ්‍රහ්මයා සිතුවේ මෙය යි, මේ තිරිසන් සතා සිතුවේ මෙය යි යනා දී වශයෙන් සියලුම සත්ත්වයන් සිතූ සියල්ලම පෙනේ. ඕනෑම කෙනකු ඇසූ දෙයක්, ඕනෑම කෙනකු දුටු දෙයක්, ඕනෑම කෙනකු කල්පනා කළ දෙයක්, ඕනෑම කෙනකු විමසා බැලූ දෙයක් යනාදිය ඒ සර්වඥතාඥානයට ඒ ගැන සිතූ විගස ම පෙනේ. දතයුතු යම්තාක් දේ ඇත් ද, ඒ තාක් සර්වඥතාඥානය ඇත. සර්වඥතාඥානය යම්තාක් ද, දතයුතු දේ ඇත්තේ ද ඒ තාක් පමණි. උන්වහන්සේ ඒ සියල්ල දන්නේ ද සම්පූර්ණයෙන් ම නිවැරැදිව ය. උන්වහන්සේ අනාගතයේ මෙය සිදුවේ යැයි දේශනා කළ දෙයක් කවදාවත් ම සිදු නොවී නො පවතින්නේ ය. මෙසේ සියල්ල දන්නා සර්වඥතාඥානයෙන් ඒ බුදුපියාණෝ සමන්නාගත වූ සේක.

6. (vii) එසේ දන්නා සියල්ලම කිසිම ආවරණයක්, මුවාවක්, වැසීමක් නොමැතිව, වසා තැබූ දෙයක් විවෘත කර බැලුවාක් සේ ඉතා හොඳින් සම්පූර්ණයෙන් නිවැරැදිව පෙනෙන්නා වූ අනාවරණ ඥානය නම් වූ අසාධාරණ ඥානයෙන් ද උන්වහන්සේ සමන්නාගත වූ සේක. මෙවන් ගැඹුරු ප්‍රඥා සාගරයක් බඳු ඒ බුදුරජාණෝ සියලුම පුද පූජා ලැබීමට සුදුසු වන සේක. එසේ හෙයින් ම අරහත් නම් ද වන සේක.

## නික්ලේශීභාවය

7. තවද ඒ භාග්‍යවත් සම්බුදුරජාණෝ සියලුම කෙළෙස්වලින් දුරු වූ බැවින් ද සියලු පුද පූජා ලැබීමට සුදුසු වන සේක. 1500ක් පමණ වූ සියලුම කෙළෙස් වාසනා ශක්තිය ද සහිතව උන්වහන්සේ නැසූ සේක. ඒකාන්තයෙන් ම රාගයෙන් තොර වූ, දෝෂයෙන් තොර වූ, මෝහයෙන් තොර වූ ඒ බුදුරජාණෝ ඒකාන්ත නික්ලේශී වූ සේක. එබැවින්ම උන්වහන්සේට කරනු ලබන පුද පූජා මහත්ඵල මහානිශංස වන්නේ ය. ඒකාන්ත වීතරාගී, ඒකාන්ත වීතදෝසී, ඒකාන්ත වීතමෝහී, ඒකාන්ත නික්ලේශී, චිත්ත පාරිශුද්ධත්වයෙන් අග්‍ර වූ ඒ සම්මා සම්බුද්ධ රත්නය එබැවින් අරහත් නම් වන සේක.

## රහසිනුදු පවක් නො කළ බව

8. තවද උන්වහන්සේ රහසිනුදු පවක් නො කළ බැවින් ද සියලු පුද පූජාවන්ට සුදුසු වන සේක. උන්වහන්සේ රහසින් වත් කයින් සිදුවන කිසිදු වරදක් නො කළ සේක. රහසින්වත් වචනයෙන් සිදුවන කිසිදු වරදක් නො කළ සේක. රහසින්වත් සිතින් සිදුවන කිසිදු වරදක් නො කළ සේක. මුළු ජීවිත කාලය තුළ දී ම උන්වහන්සේ කළ සියලු දේ ම නුවණින් හා සිහියෙන් යුතුව ම කළ සේක. අතපය දිගහැරීමක්, හැකිළීමක්, නැගිටීමක්, හිඳීමක්, යාමක් වැනි සෑම කායික ක්‍රියාවක් ම සිහිනුවණින් යුතුව ම කළ සේක. සෑම වචනයක් ම පිට කළේ සත්‍ය වූ, අර්ථ සහිත වූ, වැඩදායක වූ, කීමට සුදුසු වූ කාලයේ දී ම ය. උන්වහන්සේ මුළු ජීවිත කාලය තුළ දී ම හිස් වචනයක්, නිසරු වචනයක්, නිරර්ථක වචනයක් කිසිදා කිසි විටෙක පිට නො කළ සේක. එසේම කිසිදාක කිසිවිටක කිසිදු නිරර්ථක සිතුවිල්ලක් උන්වහන්සේට ඇති නොවී ය. මෙසේ එක්ම හිස් සිතුවිල්ලක් පවා ඇති නොවන සේ මුළු ජීවිත කාලය තුළ දී ම වැඩ සිටීම කෙතරම් නම් ශ්‍රේෂ්ඨ ද? මෙවන් ශ්‍රේෂ්ඨ සමාචාර සමන්නාගත ඒ උතුමාණෝ එබැවින් සියලු පූජාවන්ට සුදුසු වන සේක. එබැවින් ම අරහත් නම් ද වන සේක.

## ස්වයංභූඥානය - (මාර පරාජය)

9. තවද ඒ බුදුරජාණෝ කිසි කෙනකුගේ උපදේශයක් රහිතව තමන්ගේම ඥානයෙන් නිර්වාණය අවබෝධ කරගත් බැවින් ද සියලු පූජාවන්ට සුදුසු වන සේක. සසර දුක් නිවා සත්ත්වයා සනසවන ඉතාමත් ම සියුම් ඒ නිර්වාණ ධාතුව තමන් වහන්සේ ගේ ම නුවණින් අවබෝධ කර ගැනීම කෙතරම් අසීරු ද? අපට අද නිවන්යාම සඳහා අවශ්‍ය සියලු උපදෙස් තිබියදීත්, නිවන් දුටු අය ගේ අත්දැකීම් දැක දැකත් නිවන් අවබෝධ කරගැනීම අපහසු වන කල, පරෝපදෙශ රහිතව නිර්වාණධාතුව නමැති සසර දුක් නිවන පරමාර්ථ ධාතුවක් ඇතැයි සොයා ගැනීම කෙතරම් ශ්‍රේෂ්ඨ ද? අද රහතන් වහන්සේ කෙනකු වැඩ සිටිනවා යැයි දැනගන්න ලැබුණොත් අපි කොපමණ නම් ගරු සැලකිලි දක්වමු ද? එසේ වූ කල, සම්මා සම්බුද්ධත්වය යන ශ්‍රේෂ්ඨතම ස්ථානය ලබාගත් ඒ බුදුපියාණෝ කොතරම් නම් පූජාවන් ලැබීමට සුදුසු ද? ඒ සම්මා සම්බුද්ධත්වය ලැබුවේ ද එකලාවම ය.

උන්වහන්සේට උදවු කිරීමට එදා කිසිවෙක් නොවී ය.

එදා බුදුවන දා සිරිමහ බෝ සෙවණේ, මහපොළොව පලාගෙන පැන නැගී වජ්‍රාසනය මත උන්වහන්සේ වැඩ සිටියේ, මස් ලේ දියවී ගියත්, සම් ඇට පමණක් ඉතිරි වුවත්, මියගියත් බුදුවී මිස මෙම ආසනයෙන් නො නැගිටිමියි කියන බලවත් අධිෂ්ඨානයෙන් හා චතුරංග සමන්නාගත වීරියයෙන් යුතුව ය. එවිට 'අද බෝසත්තුමා බුදුවන දවස, ඒ බුදු සිරි බලන්න යමුයි' කියා 10000ක් සක්වළ දෙවිවරු බ්‍රහ්මවරු බෝමැඩ වටා රැස්ව නොයෙක් පුද පූජා පවත්වන්නට වූහ.

එවිටම වසවර්ති මාරයා "සිද්ධාර්ථ කුමාරයා මා වළක්වත්දීත් ගිහිගෙය හැර ගියා. අවුරුදු 6ක් ම මා උත්සාහ කළත් මට අවස්ථාවක් ලබා දුන්නේ නැහැ. අද මම බුදුවන්න ඉඩ දෙන්නේ නැහැ" යි වහසි බස් බෙණෙමින් මරසෙනඟ කැඳවා මාර ඝෝෂාව පැතුරුවේ ය. ඒ හඬ ඇසූ බියට පත් දෙවිවරු, එසේ ම බ්‍රහ්මයෝ ද බෝසතුන් තනිකර දමා පලා ගියහ. ඒ දුටු, ඒ හඬ ඇසූ බෝසතාණෝ "අද මාගේ පාරමී ශක්තිය තුන්ලොවට ම පෙනේවි" යැයි සිතමින් එහිම වැඩ උන් සේක. අසංඛ්‍ය ගණන් මාර සේනාව බෝසතුන් කරා දිව එනවිට, "මේ තරම් විශාල පිරිසක් තනි මා සමඟයි සටනට එන්නේ. අද මට මවෙක් වත්, පියෙක් වත්, නෑයෙක් වත්, මිතුරෙක් වත්, කිසිවෙක් වත් පිහිටට නැහැ. දෙවියන්, බ්‍රහ්මයන් පවා පලා ගියා. මාගේ පාරමී ශක්තිය මට පිහිට වේ" යැයි සිතූ සේක. මෙසේ සිතමින් වැඩ උන් බෝසතුන් කරා මාර සේනාව දිව අවුත්, බෝසතුන් ගේ ඒ තේජසින් ළංවිය නො හැකි වූයේ ම ය. එවිට මාරයා ඇතින් සිට මහ සුළඟක් මවා මොහු පරසක්වළ ගසමි යි සිතා මහ සුළඟක් මැව්වේ ය. මහා විශාල ගල් පර්වත පවා ඒ සුළඟට පුලුන් රොදක් සේ පාවෙත් දී, ඒ සුළඟ බෝසතුන්ගේ සිවුරු කොණක් තරම්වත් සෙළවීමට සමත් නොවී ය. බෝධීන් වහන්සේගේ එක පත්‍රයකුදු ඒ සුළඟින් නො සැලිණ.

තවත් බෝසතුන් එසේම සිටිනු දුටු මාරයා මහ වැස්සක් මවා මහ වතුරෙන් පා කර යවමියි සිතා මහ වැස්සක් මැවී ය. දෙකන් පුපුරවන සේ වදින හෙණහඬ විදුලිය හඬ මැද්දේ, මහ මෘගසන් වර්ෂාවේ ගස්ගල් පවා පාවී යත් දී, බෝසතුන් වෙත පැමිණි ඒ ජලකඳ සිවුරු කොණක් තරම්වත් තෙමාලීමට සමත් නොවී ය.

තවත් හොඳින් වැඩසිටිනා බෝසතුන් දැක අද මොහු සුණුවිසුණු කර දමමියි සිතා, මහ ගල් වස්සවන්නට පටන් ගත්තේ ය. විශාල පර්වත අහසින් අවුත් බෝසත් සිරිපාමුල මල් බවට පත්විය.

තවමත් නිදුකින් වැඩසිටිනා බෝසතුන් දැක මොහු ගේ ඇඟ කපා මරා දමමියි සිතා, මහා ආයුධ වැස්සක් වැස්සවී ය. ඒ ඉතා තියුණු ආයුධ පවා බෝසත් සිරිපාමුල මල් බවටම පත්විය.

තවදුරටත් නිරුපද්‍රිතව වැඩ සිටිනා බෝසතුන් දැක ක්‍රෝධයෙන් පිපිරි පිපිරී අද මොහු අළුකර දමමි යි සිතා, මහා ගිනි අඟුරු වස්සවන්නට විය. ඒ බෝසතාණෝ එදා ඛදිරංගාර ජාතකයේ දී පසේබුදු කෙනකුන්ට දානය පූජා කිරීමට යත් දී, ඒ දානය දීම වළක්වා, 7 දිනක් නිරාහාරව සිටි පසේබුදුරදුන් මරමියි සිතා ඒ දානය දීමට නො හැකි වන සේ මහා ගිනි ජාලාවක් මාරයා මැවූ විට, එදා ඒ බෝසතාණෝ "පිච්චී මැරෙනවා නම් මැරුනාවේ. මේ දානය මේ ගිනි මැදින් ගොස් පසේ බුදුරදුන්ට පූජා කරමි" යි සිතා ඇවිළෙන ගිනි ජාලාවට පැන්න විට, ඒ ගිනිජාලාව මැදින් බෝසත් සිරිපා පිළිගැනීමට නෙළුම් මල් පැන නැංගේ ය. ඒ එදා එසේ වූ කල, මේ බුදු වන දා මාරයා මැවූ මේ ගිනි අඟුරු බෝසත් සිරිපා මූලයෙහි කෙසේ නම් මල් බවට පත් නොවී තිබේ ද?

ඊට පසුවත් නිසලව වැඩ සිටි බෝසතුන් දැක, ගිනි අළුවලින් මොහු යටකර මරා දමමියි සිතා ගිනි අළු වස්සවන්නට විය. අනන්ත අප්‍රමාණ බුදු පසේබුදු මහරහතන් වහන්සේලාට සුගන්ධයන් පූජාකොට ඇති ඒ බෝසතුන්ගේ සිරිපා මූලයෙහි ඒ අළු සුගන්ධයන් බවට පත්විය.

තවමත් එසේම වැඩ සිටි බෝසතුන් දැක ඉවසිය නො හැකිව කෝපයෙන් ඇවුණු මාරයා ගිනිගත් වැලි වැස්සක් මැවී ය. ඒ වැලි ද බෝසතුන්ට අනතුරක් කිරීමට සමත් නොවී ය. ඊට පසුව ගිනිගත් මඩ වැස්සක් වැස්සවී ය. ඒ කිසිවකට ඒ බෝසතුන්ගේ තබා උන්වහන්සේට සෙවණ දෙමින් වැඩසිටි සිරිමහ බෝ සමිඳුන්ගේ පත්‍රයකටවත් අනතුරක් කළ නො හැකි වූයේ ම ය. තවමත් කිසිම වෙනසක්, කිසිත් බියක් නො මැතිව වැඩ උන් බෝසතුන් දැක, මොහු බියකරවා මරා දමමියි සිතා මහා ඝන අන්ධකාරයක් මැවී ය. ඒ මහා බෝසතුන් මව්කුස පිළිසිඳ ගත් කල්හි ද, මව්කුසින් බිහි වූ කල්හි ද, අභිනිෂ්ක්‍රමණය කළ කල්හි ද 10000 ලෝකධාතුව හිරු දහසක් පෑවුවා සේ තුමූම ඒකාලෝක වූ කල, මේ අන්ධකාරයන් ඒ

බෝසතුන්ට කුමක් නම් කරන්න ද? ඒ මහ ඝන අඳුරේ බෝසතාණෝ පමණක් දිලිහි දිලිහී බැබළෙමින් වැඩ වෙසෙති.

ඒ දුටු මාරයා, මොහු මරා දමව් යැයි මරසෙනඟට කියමින් ගිරිමේඛලා ඇතා බෝසතුන් මරා දැමීම සඳහා තෙමේම මෙහෙයවී ය. ඇතුන් කෝටි දහයක කාය බලයක් ඇති ඒ උතුමාණන් ළඟ බිය වූ ගිරිමේඛලා ඇතු බෝසත් පා මුල වැටිණ.

එවිට මාරයා තමාගේ බලවත් ආයුධය, ඒ චක්‍රායුධය - මහාමේරුවට ගැසුවොත් එය දෙකඩ කිරීමට සමත්, මහමුහුදට ගැසුවොත් මුහුද වියළවාලීමට සමත් ඒ මහා චක්‍රායුධය බෝසතුන්ට දමා ගැසී ය. පාපී වූ මාරයා බෝසත් ගුණ නො හඳුනතත්, සිත්පිත් නැති ඒ චක්‍රායුධය බෝසත් ගුණ හඳුනන්නා සේ, ඒ චක්‍රායුධය බෝසත් හිසට කරන ලද වියනක් සේ සිටියේ ය.

මේ දුටු මාරයා බැරිම තැන, "මගේ ආසනයෙන් නැගිට පලා යව" යි බෝසතුන්ට කීවේ ය. මෙතෙක් නිසලව තිබූ දෙතොල් විවර කළ බෝසතාණෝ, "මාරය, සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් ඇස් ඉස් මස් ලේ දන් දී පාරමී පුරා ලත් මේ වජ්‍රාසනය තගේ වන්නේ කෙසේදැ" යි විමසූ සේක. "මමත් පාරමී පුරා තමයි ඔය ආසනය ලැබුවේ" යැයි මාරයා එවිට කී විට, "තට එයට සාක්ෂි ඇත්දැයි" බෝසතාණෝ විමසූ සේක. එවිටම ඒ සා විශාල මාර සේනාව "අපි සාක්ෂි, අපි සාක්ෂි" යි කියමින් නැඟූ හඬ බඹලොව දක්වා එදා ඇසෙන්නට ඇත. මෙවිට මාරයා "මෙතරම් පිරිසක් මට සාක්ෂියට සිටිනවා, තොපට කවර නම් සාක්ෂියක් ඇත්දැයි" බෝසතුන් ගෙන් විචාළේ ය. එවිට බෝසතාණෝ, "මාරය, මා පෙරුම් පිරූ බවට මේ සිත්පිත් නැති මහපොළොව හැර වෙනත් සාක්ෂියක් මට නැතැ" යි ඒ ශ්‍රී හස්තය පොළොව දෙසට යොමු කළහ. මහපොළොව කම්පිත කරවමින් පාරමී දහම් පුරා පැමිණි ඒ බෝසතුන් ගේ ඒ වචන නිකුත්වෙත්ම, තවදුරටත් නිසලව සිටිය නො හැකි වූ මුළු පෘථිවියම වෙව්ල වෙව්ලා සැලෙන්නට පටන් ගත්තේ ය. මහපොළොව පලාගෙන 136ක් නරකවල ගිනිදැල් බුර බුරා පැන නගින්නට වන්නේ ය. මෙවිට මාර සෙනඟ බිය වී පලා ගියහ.

ඒ බෝසතුන්ගේ ආනුභාවය, තේජස, පුණ්‍ය ශක්තිය කෙතෙක්දැයි කෙසේ සිතා ගන්න ද?

මෙසේ අති බිහිසුණු මාර සටන්වලට මුහුණ දී ඒ ජයගෙන,

එකලාවම සම්මා සම්බුද්ධත්වයට පත් වූ ඒ සම්බුද්ධ රත්නයට කෙතෙක් නම් පුද පූජා කළත් ඇතිවේ ද? එසේ හෙයින් ඒ බුදුරජාණෝ සියලු පුද පූජා පිළිගැනීමට සුදුසු වන සේක. එබැවින්ම අරහත් නම් වන සේක. අරහත් නම් වන සේක. අරහත් නම් වන සේක.

## අනන්ත ගුණ

10. තවද ඒ බුදුරජාණෝ අනන්ත වූ ගුණයන් ගෙන් අග්‍ර වූ බැවින් ද සියලු පූජාවනට සුදුසු වන සේක. උන්වහන්සේ මෛත්‍රියෙන් අග්‍ර වූ සේක. බෝසත් කාලයේ දී පවා අසංඛ්‍ය ගණන් වාරවල දී කෑලි කෑලි කපා කපා මරත්දීත්, තමන් වහන්සේ එලෙසින් මරණ ඒ අයටත් මරවන අයටත් මෛත්‍රිය පැතුරූ කල, දැන් සම්මා සම්බුද්ධත්වයට පත්ව, උන්වහන්සේ මැරීමට නාලාගිරි ඇතුන් එව්වා ය, ගල් හිසට පෙරළුවා ය, දුනුවායන් යෙදෙව්වා ය යනා දී කිසිත් නො තකා තමන් වහන්සේ මැරීමට තැත් කළ දෙව්දත්තටත්, තමාගේම පුත් රාහුල තෙරුන්ටත්, අග්‍රශ්‍රාවක සැරියුත් - මුගලන් මහරහතන් වහන්සේලාටත් සෙසු ලෝකවාසී සියලු සත්ත්වයාටත් එකසේ ම මෛත්‍රිය පැතුර වූ බව කිව යුතු වන්නේ ද?

එසේම උන්වහන්සේ අසමසම කරුණාවෙන් සමන්නාගතව, ඒ මහා කරුණාව සියලු සත්ත්වයා කෙරෙහිම එකසේ පැතුර වූ සේක. මෙසේම සියලු සත්ත්වයාම සදාකාලික සතුටට පත්කිරීමට කැමැති වූ, අනුන්ගේ සැපසම්පත් තව තවත් වැඩිවනවා දක්නට කැමැති වූ උන්වහන්සේ මහා මුදිතා ගුණයෙන් ද සමන්නාගත වූ සේක. කිසි කලෙක කිසිම කරුණක් ගැන කම්පා නොවී, මහපොළොවටත් වඩා නිශ්චලව නිසලව වැඩ සිටිනා තාදි නම් ගුණයෙන්ද උන්වහන්සේ සමන්නාගත වූ සේක. මෙසේම ඕනෑම කරුණක දී සෑමකල්හිම මැදිහත් බවින්ම වැඩ සිටිනා ඒ මහා උපේක්ෂා ගුණයෙන් ද සමන්නාගත වූ සේක.

උන්වහන්සේ වෙත පැමිණෙන සක්දෙව්රජ ආදී දෙව්වරුන්, සහම්පති ආදී මහා බ්‍රහ්මයන්, රාජරාජ මහාමාත්‍යාදීන් සිටිනවාය, එසේම කෝටි ගණන් ධනය වැය කරමින් උපස්ථාන කරන විශාඛා අනේපිඬු වැනි දායකයන් සිටිනවාය ආදී ඒ කිසිත් නොසලකා අතිශයින්ම නිහතමානීව වැඩ සිටි උන්වහන්සේ නිහතමානී ගුණයෙන්

ද සමන්නාගත වූ සේක. මෙසේ ම උන්වහන්සේට කොපමණ වටිනා දේ ලැබුණත්, කොපමණ නො වටිනා දෙයක් ලැබුණත් ඒ සැම දේ ගැනම ලද දෙයින් තුටු වන 'යථාලාභසන්තුට්ඨි' නම් වූ ඒ මහා ගුණයෙන් ද යුක්ත වූ සේක.

මෙසේම උන්වහන්සේ ඇස් කන් නාසා දී දමනය කරන ලද ඉන්ද්‍රියයන් ඇති බැවින්, කිසිම රූපයකට, කිසිම ශබ්දයකට, කිසිම ගන්ධයකට, කිසිම රසයකට, කිසිම ශාරීරික ස්පර්ශයකට, සිතට දැනෙනා කිසිම දෙයකට හෝ ඇලීමක් ගැටීමක් නොමැතිව වැඩ සිටි ඉන්ද්‍රිය සංවරතා ගුණයෙන් ද යුක්ත වූ සේක. එසේම උන්වහන්සේ ශාන්තවත් ය; දාන්තවත් ය; සුවිනීත ය. ශාන්ත වූ කායකර්ම, ශාන්ත වූ වචීකර්ම, ශාන්ත වූ මනෝකර්ම ඇති උන්වහන්සේ ශාන්තදාන්ත සුවිනීත ගුණයන් ගෙන් ද සමන්නාගත වූ සේක. මෙසේම උන්වහන්සේ මුළු ජීවිත කාලයම අන් සත්ත්වයන් සසර දුකින් මුදා ඔවුන්ට සේවයක් කිරීමෙහි නියැලී සිටි බැවින් පරහිතානුකම්පී මහා දයා ගුණයෙන් ද සමන්නාගත වූ සේක. තවද උන්වහන්සේ ශ්‍රද්ධාවෙන් යුක්ත වූ ශ්‍රද්ධා ගුණයෙන්, වීරියෙන් යුතු වූ ආරබ්ධ වීරිය ගුණයෙන්, සමාධියෙන් යුක්ත වූ බැවින් නො විසුරුණු සමාහිත සිත් ඇති ගුණයෙන්, මුළු ජීවිත කාලය තුළ දී ම සිහියෙන් හා නුවණින් වැඩ සිට ඒ මහා සති ගුණයෙන්, එසේම මහා ප්‍රඥාවෙන් සමන්නාගත වූ නිපක ගුණයෙන් ද යුක්ත වූ සේක.

මෙසේම සත්ත්වයාට නිවන් අවබෝධ කරවාලීමේ කාර්යයෙහි කිසිදු මැලි බවක් උන්වහන්සේට කිසිදිනක ඇති නොවී ය. ඒ සඳහා වූ ඡන්දයේ කිසිදු අඩුවීමක් කිසිදා නොවී ය. සත්ත්වයාට ධර්මය කියාදීමේ ඇති ඕනෑකමේ අඩුවීමක් කිසිදාක නොවී ය. එසේ ම උන්වහන්සේගේ වීර්යයේ ද අඩුවීමක් කිසිදා නොවී ය. උන්වහන්සේ කළ කායික හෝ වාචසික හෝ මානසික කිසිම ක්‍රියාවක ඥානය පූර්වාංගම වීමේ ද කිසිදු අඩුවීමක් කිසිදා නොවී ය. මෙසේ ම උන්වහන්සේ තුළ කිසිදාක ඉක්මන් ක්‍රියාවක් නොවී ය. කිසිදාක ක්‍රීඩා පිණිස කළ ක්‍රියාවක් නොවී ය. කිසිදාක වේගවත් ක්‍රියාවක් නොවී ය. කිසිදාක නිරර්ථක ක්‍රියාවක් නොවී ය. කිසිදාක නො සන්සුන් ගතියක් නොවී ය. කිසිදාක අවිනීත ගතියක් නොවී ය. මේ සියලුම ගුණයන්ගෙන් ද උන්වහන්සේ සමන්නාගත වූ සේක.

සැමකල්හිම නිවැරැදි වූ ම අදහස් ඇති ගුණයෙන්, සැමකල්හිම

නිවැරැදි වූ සංකල්පනා ඇති ගුණයෙන්, සැමකල්හිම නිවැරැදි වූ වචන ඇති ගුණයෙන්, සැමකල්හි ම නිවැරැදි ලෙස ජීවිතය ගෙනයාමේ ගුණයෙන් හා සැමකල්හිම ඇති හිරි - ඔතප් ගුණයන්ගෙන් ද උන්වහන්සේ සමන්නාගත වූ සේක. තවද උන්වහන්සේ සැමකල්හිම පවත්නා ඒ මහා ඉවසීමේ හෙවත් අධිවාසනා නම් වූ ගුණයෙන් ද සමන්නාගත වූ සේක. මෙසේම උන්වහන්සේ සැමකල්හිම සත්‍යයක්ම ප්‍රකාශ කිරීමේ ගුණයෙන්, සැමකල්හිම කිසිවක් නො වරදින ගුණයෙන්, සැමකල්හිම අනුන්ට ආදර්ශවත්ව ජීවත්ව සිටීමේ ගුණයෙන්, සැමකල්හිම අනුන් වරදින් මුදවාලීමේ ගුණයෙන්, සැමකල්හිම අනුන්ට යහපතක් කිරීමේ ගුණයෙන් සමන්නාගත වූ සේක. සත්ත්වයාට මෙලොව යහපත සඳහා කරුණු කියාදීමේ ගුණයෙන්, පරලොව යහපත සඳහා කරුණු පෙන්වාදීමේ ගුණයෙන්, නිර්වාණාවබෝධය සඳහා කරුණු පෙන්වාදීමේ ගුණයෙන් ද යුක්ත වූ උන්වහන්සේ අතිපාරිශුද්ධ සන්තාන සමන්නාගත නික්ලේශී ගුණයෙන් ද සමන්නාගත වූ සේක.

මේ ආදී කෙතෙක් සිතුවත් නිම නො වන අනන්ත වූ ගුණයන් ගෙන් සමන්නාගත වූ ඒ සම්මා සම්බුද්ධ රත්නයේ එක් එක් ගුණය ගැන පමණක් ම සිතුවත්, ජීවිතය පූජා කිරීමට තරම් ශ්‍රද්ධාවක් උපදවා, දෙනෙතින් ශ්‍රද්ධා කඳුළු වගුරුවාලන ඒ බුදුපියාණන් වහන්සේට කෙතෙක් පූජා පැවැත්වුවත් ඇති වේද? එසේ හෙයින් ඒ මහා ගුණ සාගරයක් බඳු වූ, ගුණ විශ්වයක් බඳු වූ, ගුණයෙන් ම නිර්මිත පිළිරුවක් බඳු වූ, ගුණ ප්‍රතිමූර්තියක් බඳු වූ, මහා කාරුණික සම්මා සම්බුද්ධ රත්නය සියලු පුද පූජාවන්ට සුදුසු වන සේක. එබැවින් ම අරහත් නම් ද වන සේක.

## ලබා දුන් ශාන්තිය

11. තවද ඒ බුදුපියාණන් අනන්ත අප්‍රමාණ සත්ත්වයාට ශාන්තියක් උදාකර දුන් බැවින් ද සියලු පූජාවනට සුදුසු වන සේක.

11. (i) මේ ලෝක සත්ත්වයා අතීතයේ කර ඇති අකුශල කර්මවලින් තවමත් විපාක දීමට ඉතිරිව ඇති අකුශල කර්ම ප්‍රමාණය සාගරයේ ජල බිංදු ගණනටත් වඩා ඉතා අධික ය. එවැනි අකුසල කර්ම, විපාක දීමට මාන බලමින් පසුපස එළවන බැවින්, අපායට ඇදගෙන යාමට

වරෙන්තු නිකුත් වී ඇති සත්ත්වයා, ඒ මහා අපා ගිනිවලින් මුදවා, ඒ මහා ලෝහ ගුලිවලින් මුදවා, ඒ මහා ලෝදියවලින් මුදවා, බුද්ධාන්තර ගණන් කල්ප ගණන් අපායේ පිච්චි පිච්චී හඬ හඬා විඳීමට සිදුවන ඒ මහා අපාදුක් වලින් මුදවා අනන්ත අප්‍රමාණ සත්ත්වයාට මග ඵල - නිවන් සුව ලබා දෙමින් උන්වහන්සේ විසින් ඇතිකර දුන් ශාන්තිය කියා නිම කළ නො හැකිය.

11. (ii) මෙසේම ලෝකාන්තරික නරකවල කිසිදු ආලෝකයක් නැති ඝන අඳුරේ, ඉසිලිය නො හැකි තද ශීතලේ ගැහි ගැහී, කිසි ම අහරක් නැතිව කුසගින්නේ තැවි තැවී සිට, එවැනි ම නිරි සතකු ඇඟේ හැපුණොත් ගොදුරක් යැයි සිතා අල්ලා ගැනීමට යනවිට, යටින් ඇති අයිස් ජලයේ වැටී, චිටි චිටි හඬින් ශීතලේ පුපුර පුපුරා මැරි මැරී, නැවත නැවතත් එහිම ඉපදි ඉපදී මහ දුක් විඳින ලෝකාන්තරික නරකවලට යාමට සිටි අනන්ත අප්‍රමාණ සත්ත්වයා නිවනට පත් කරවා ඒ මහා දුක්වලින් මුදවා අතිවිශාල ශාන්තියක් උන්වහන්සේ ඒ සත්ත්වයාට ඇතිකර දුන් සේක.

11. (iii) මෙසේම ප්‍රේත ලෝකයේ අවුරුදු සිය දහස් ගණන්, බුද්ධාන්තර ගණන්, කල්ප ගණන්, කෑමට බත්හුලක් නැතිව කුසගින්නේ දැවි දැවී - බීමට වතුර බිඳක් නො මැතිව පිපාසයෙන් පෙළි පෙළී - ශරීරයේ ඇතුළතින් හා පිටතින් ඇවෙන ගිනිවලින් පිච්චි පිච්චී 'පිච්චෙනවා, පිච්චෙනවා, දනවෝ, දනවෝ' ආදී ලෙසින් විලාප දිදී - සිටීමට තැනක් හවුහරණයක් නැතිව වැස්සෙන් තෙමි තෙමී - ශීතලයෙන් ගැහි ගැහී - ඉණට වතක් නැතිව - කිසිවකුගේ පිළිසරණක් හෝ පිහිටක් නැතිව දුක්ම විඳ විඳ - දින ගණනකට මාස ගණනකට වරක් පමණක් ලැබෙන සෙම්සොටු ආදිය කමින්, ඒවාම සොය සොයා - මිනිසුන් ආදී වෙනත් සත්ත්වයන් ගේ සැප බල බලා හූල්ල හූල්ලා - මුළු ජීවිත කාලය තුළ ම අසූචි වළවල එරී සිටිමින් මහා දුක් විඳ විඳ - ආයුධවලින් කැපි කැපී - සතුන් විසින් කොට කොටා උලුප්ප උලුප්පා කත් දී හඬ හඬා - මේ ආදී තවත් බොහෝ දුක් විඳිනා ප්‍රේතයන් අතරට යාමට සිටි අනන්ත අප්‍රමාණ සත්ත්වයා නිවනට පත් කරමින් ඒ මහා ප්‍රේත දුකින් මුදවා ඒ සත්ත්වයන්ට ද මහා ශාන්තියක් උන්වහන්සේ උදාකර දුන් සේක.

11. (iv) මෙසේම තිරිසන් ලෝකයේ නිරතුරුවම කුසගින්නෙන් පෙළී පෙළී - අව්වෙන් වැස්සෙන් ශීතලයෙන් උෂ්ණයෙන් කිසි ආරක්ෂාවක් නො ලබා මහා දුක් විඳ විඳ - සතුරු වූ ලොකු තිරිසන් සතුන් එළවගෙන එත් දී පණ බියේ කෙතෙක් දිව්වත් ගැලවීමක් නො ලබා ඔවුන් ගේ ගොදුරට හසු වී කෑලි කෑලි ඉර ඉරා කත්දී, පණ පිටින් හඬව හඬවා ගිලිත් දී, මස් කොට කොටා කත් දී, මහත් දුක් විඳ විඳ - මේ ආදී තවත් බොහෝ දුක් විඳිනා තිරිසනුන්ගේ ලෝකයට යාමට සිටි අනන්ත අප්‍රමාණ සත්ත්වයා ඒ භයානක දුක්වලින් මුදවා මහත් වූ නිර්වාණ ශාන්තියක් ඒ සත්ත්වයන්ට උන්වහන්සේ උදාකර දුන් සේක.

11. (v) තවද අසුර අපායේ, ඉඳිකටු සිදුරක් තරම් කුඩා මුඛ ඇතිව, ගවු ගණන් විශාල ශරීර ඇතිව, ඇටසැකිලි පෑදී මරණය දක්වා ම අවුරුදු දහස් ගණන් ලක්ෂ ගණන් කෑමක් බීමක් නො ලබා දුක් විඳීමට යාමට සිදුවන පව් පොදි කරේ තබාගෙන සිටිනා අනන්ත අප්‍රමාණ සත්ත්වයා ඒ දුකින් මුදවා නිවන් සුව ලබා දී ඔවුන්ට මහත් වූ ශාන්තියක් ඒ බුදුපියාණෝ ඇතිකර දුන් සේක.

11. (vi) මෙසේම මිනිස් ලොව මව්කුසවල හිර වී දුක් විඳිමින් සිට, දුකින් ම ලෝකයට පහළව, දුකින් ම ජීවත් වී, දුකින් ම ශරීරය පවත්වාගෙන යමින්, ජරාවට පත්ව අතපය පවා වාරු නැති ව මලමුත්‍ර ගොඩවල ම සෝදා පවිත්‍ර කරගැනීමට නො හැකිකම නිසා ඉඳිමින්, දහසකුත් එකක් ලෙඩ රෝගවලින් දුක් විඳිමින්, මරණ දුක් මධ්‍යයේ, ශෝක කිරීමට සිදුවන දුක් මධ්‍යයේ, හඬා වැලපෙන දුක් මධ්‍යයේ, ශෝකයෙන් සිහිසන් නැතිව ඇදවැටෙන දුක් මධ්‍යයේ, ලෝභ දෝෂ මෝහ ආදී ගිනි මධ්‍යයේ, තව අනන්ත අප්‍රමාණ දුක් ගොඩක සිටි අනන්ත අප්‍රමාණ මනුෂ්‍යයන් ඒ දුක්වලින් මුදවා අනන්ත වූ අප්‍රමාණ වූ අමා සුව ශාන්තියක් ඒ සත්ත්වයන්ට උන්වහන්සේ උදාකර දුන් සේක.

11. (vii) තවද සැපයක් යැයි සිතා සිටින දිව්‍යලෝකවල පවා රාග ගින්නෙන් දැවි දැවී, දෝෂ ගින්නෙන් දැවි දැවී, මෝහ ගින්නෙන් දැවි දැවී, ජරා මරණ ශෝක පිරිදේව දුක්ඛ දෝමනස්ස උපායාස ගිනිවලින් දැවි දැවී, මේ ආදී එකොළොස් ගිනි මැද ම සිට, ඉන් චුත වන විට

මහත් වූ දුකක් විඳ, ඉන් චුත වී අවුත් කලින් හොඳට පුරුදු අපා දුක්වලට, ප්‍රේත දුක්වලට, තිරිසන් ලෝක දුක්වලට, මිනිස්ලොව දුක්වලටම යාමට නියමිතව සිටි අනන්ත අප්‍රමාණ දෙවියන් ද ඒ දුක්වලින් මුදවා අනන්ත අප්‍රමාණ ලොව්තුරු ශාන්තියක් ඔවුන්ට ද ඒ බුදුපියාණෝ උදාකර දුන් සේක.

11. (viii) තවද ඉතා සැපවත් යැයි සිතන බ්‍රහ්ම ලෝකවල පවා ඉතා දුක සේ ධ්‍යාන වඩා එහි ඉපැදිය යුතු බැවින් දුකින් ම ඉපැද, ප්‍රමාද නමැති ගින්නෙන්, මදය නමැති ගින්නෙන්, මානය නමැති ගින්නෙන් වෙළී සිට, ඉන් චුත වී පළමුව දෙව්මිනිස් ලෝකවලට ද, පසුව අපාය ප්‍රේත අසුර තිරිසන් ලෝකවලට ද ගොස්, අනන්ත දුක් ලැබීමට නියමිතව සිටි අසංඛ්‍ය ගණන් බ්‍රහ්මයන්ට ද අතිවිශාල නිර්වාණ ශාන්තියක් ඒ බුදුපියාණෝ ලබා දුන් සේක.*

මෙසේ සකල ලෝකවාසී සත්ත්වයාටම උන්වහන්සේ ලබා දුන්නා වූ ශාන්තිය කෙසේ නම් කියා නිම කළ හැක්කේ ද? එසේ හෙයින් භයානක සසර දුක් නිවා සනහා, අමා නිවන් සුව පොවා, ලෝක සත්ත්වයාට ඒ සා විශාල ශාන්තියක් උදාකළ ඒ ශාන්ති නායකයාණෝ පුද පූජා ලැබීමට අතිශයින් ම සුදුසු වන සේක. එබැවින්ම ඒ සම්මා සම්බුද්ධ රත්නය අරහත් නම් ද වන සේක.

## අනන්ත ඍද්ධි

12. තවද ඒ බුදුපියාණෝ අනන්ත වූ ඍද්ධියෙන් සමන්නාගත වූ බැවින් ද සියලු පූජාවනට සුදුසු වන සේක. අද කෙනකු රහත් වී අහසින් යනවා යැයි කීවොත්, මිනිසුන් කෙතරම් නම් ගෞරව පුද පූජා ඔහුට දක්වයි ද? ඒ බුදුපියාණන් වහන්සේට අහසින් යාම පමණක් නොව ඍද්ධියෙන් නො කළ හැකි දෙයක් ඇත්තේ නැත. උන්වහන්සේට ඇසිපිය හෙළීමටත් පෙර ඕනෑම තැනකට වැඩිය හැක. අතිමහත් ගෙයක් පමණ කළු ගලක් බ්‍රහ්ම ලෝකයේ සිට

---

* සතර අපාදී මෙවන් භයානක සසර දුක් තමා වින්ද බව හා නිර්වාණාවබෝධ නො කළහොත් ඉදිරියේදීත් එවන් දුක් විඳීමට සිදුවන බව අවබෝධ කර ගන්න.

දැමුවොත් එය පොළොවට ඒමට මාස 4ක පමණ කාලයක් ගත වේ. එතරම් දුර ඇති බ්‍රහ්මලෝකවලට ද, නැවූ අතක් දිගහැරීමට පෙර උන්වහන්සේට වැඩීමට පුළුවන.

වක් කළ අතක් දිගහැරීමට පෙර මුළු ලොව වටා තුන් වරක් යා හැකි තරම් මහා සෘද්ධිමත් මුගලන් මහරහතන් වහන්සේ ලෝකයේ කෙළවර බැලීමට ඒ සා මහත් සෘද්ධියෙන් දින 7 ක් රෑ දාවල් මුළුල්ලේ ගමන් කොට ඝන අන්ධකාරයට අසු වූ පසු, බුදුරජාණන් වහන්සේ එක් ක්ෂණයකින් ශ්‍රී හස්තය දක්වා මුගලන් මහරහතන් වහන්සේ ආපසු ගෙන්වා ගත් සේක. මුගලන් මහරහතන් වහන්සේ ගේ දින 7ක සෘද්ධිය බුදුපියාණන් වහන්සේ ගේ ඇසිපිය හෙළන කාලයක තරම් වූ සෘද්ධියකටවත් සම නොවේ.

උන්වහන්සේට අහසේ හිඳීම - නිදීම - සක්මන් කිරීම - සිටීම ආදිය පොළොවේ මෙන් ම කළ හැක. පොළොවේ ජලයෙහි මෙන් කිඳාබැසීම මතුවීම ආදිය කළ හැක. ජලයෙහි ගොඩබිමේ මෙන් මතුපිටින් යාම, හිඳීම, නිදීම ආදිය කළ හැකි ය. ඉරහඳේ ගමන නැවැක්විය හැකි ය. ඉරහඳ අතින් අතගෑ හැකි ය. ඉර හඳ මත සිටීම ගමන් කිරීම ආදී ඉරියව් පැවැත්විය හැකි ය. ඉරහඳ උන්වහන්සේට කිට්ටු වන සේ ළං කළ හැකි ය. නො පෙනී සිටීමට හැකි ය.

මෙසේම මුළු ලෝකයේම සියලු ම සත්ත්වයාගේ සිත් බැලිය හැකි ය. අසංඛ්‍ය ගණන් ලෝකධාතුවලට ඇසෙන සේ කථාකළ හැකි ය. අනන්ත අප්‍රමාණ අතීත ආත්ම භාවයන් බැලිය හැකි ය. ඕනෑ තරම් තමන් වහන්සේ වැනි ම බුද්ධ ශරීර මැවිය හැකි ය. ශ්‍රී බුද්ධ ශරීරය සැතපුම් සිය දහස් ගණන් තරම් වුව ද විශාල කළ හැකි ය. එසේ ම ඇස් පිහාටුවක වුව ගමන් කිරීමට තරම් කුඩා කිරීමට ද හැකි ය. අවීචියේ පටන් භවාග්‍රය දක්වා අසංඛ්‍ය ගණන් ලෝකධාතුවල ශබ්ද ඇසිය හැකි ය. අනන්ත අප්‍රමාණ දෙවියන් බ්‍රහ්මයන් මනුෂ්‍යයන් තිරිසනුන් ආදී සත්ත්වයන් මැරී නැවත උපදින තැන් බැලිය හැකි ය.

යමාමහ පෙළහර පෑ හැකි ය. සැතපුම් ලක්ෂ කෝටි ගණනකට එහා වුව ද සිටින කෙනකුට තමන් වහන්සේ ළඟම සිටින්නා සේ පෙනී සිටීමට හැකි ය. එසේ පෙනී සිට ධර්මය ද දේශනා කිරීමට හැකි ය. අවශ්‍ය නම් තුන් ලෝකයට ම ඇසෙන සේ දහම් දෙසිය හැකි ය. අවශ්‍ය නම් ළඟම ඉන්නා අයට නො ඇසී, ඈත සිටිනා අයට ඇසෙන සේ දහම් දෙසිය හැකි ය. භාෂා සිය දහස් ගණන් කථා කරන අය

රැස්වී සිටියත්, ඒ සැමට ම තමන්ගේ ම භාෂාවෙන් තමා දෙස ම බලමින් ධර්මය දේශනා කරන්නා සේ වැටහෙන ලෙසින් එකවිට ධර්මය දේශනා කළ හැකි ය. ඕනෑම කෙනකු තවත් කෙනකුට නො පෙනී සිටීමට සැලැස්විය හැකි ය. අනන්ත ලෝක ධාතු ආලෝක කළ හැකි ය, අන්ධකාර කළ හැකි ය, කම්පිත කරවිය හැකි ය. ගල් පර්වත වැනි ඕනෑ ම දෙයක් මැදින් අහසේ යන්නාක් මෙන් ගමන් කළ හැකි ය. පොළොව දෙබෑකොට අපායවල් පෙන්නිය හැකි ය. අහස දෙබෑකොට දිව්‍යලෝක බ්‍රහ්මලෝක පෙන්නිය හැකි ය. බුද්ධ ශරීරයෙන් ගින්දර පිට කළ හැකි ය. අනන්ත ලෝකධාතු පුරා සවණක් ඝන බුදුරැස් පතුරුවා හැරිය හැකි ය.

ඕනෑම දෙයක් මවා පෙන්විය හැකි ය. ඕනෑම දෙවියකු බ්‍රහ්මයකු හෝ වෙනත් ඕනෑම සත්ත්වයකු මවා පෙන්විය හැකි ය. අන්ධකාරයේ පෙනී සිටින සේ වැඩ සිටිය හැකි ය. බිත්ති ප්‍රාකාර, ගල් පර්වතවලට මුවා වී සිට, පෙනී සිටින සේ පෙනෙන්නට සැලැස්විය හැකි ය. අනන්ත සක්වළට ම තමන් වහන්සේ පෙනෙන සේ වැඩ සිටිය හැකි ය. ඒහිභික්ෂු භාවයෙන් පැවිදි කළ හැකි ය. දිව්‍යලෝක බ්‍රහ්මලෝක අපායවල් ඇතුළු මුළු තුන් ලොව ම එකම මිදුලක් සේ පෙනෙන සේ පෙන්විය හැකි ය. දිව්‍යලෝක මනුෂ්‍යලෝක ආදිය එකිනෙකට ගැටෙන සේ ළං කළ හැකි ය. ඕනෑම කෙනකුට උන්වහන්සේට සමීපවීමට නො හැකි වන සේ වැඩ සිටිය හැකි ය. කුඩා දේවල් මහාමේරු පර්වතය තරම් හෝ විශාල කළ හැකි ය. ඕනෑම ලොකු දෙයක් අබ ඇටයකටත් වඩා කුඩාකර පෙන්විය හැකි ය. යොදුන් 4800ක් උස රාහු අසුරේන්ද්‍රයාට හෝ තමන් වහන්සේගේ සිරිපතුලේ අගමුල නො පෙනෙන සේ වැඩ සිටිය හැකි ය. මහා සාගරයේ මුළු ජලයම අල්ලට ගත හැකි ය.

මහ පොළොව නිය පිටට ගත හැකි ය. මහ පොළොව පියනක් විවෘත කරන්නාක් සේ විවෘත කළ හැකි ය. ඕනෑ ම කෙනෙකුගේ සිතට ඇතිවන සිතුවිලි නැවැත්විය හැකි ය. සතුන් ලවා මනුෂ්‍ය භාෂාවෙන් කථා කරවාලිය හැකි ය. මේ ආදී වශයෙන් උන්වහන්සේ ගේ ඍද්ධි විෂයය අචින්තිය ම ය. අන් දෙයක් තබා උන්වහන්සේ පිරිනිවන් පා අවුරුදු 5000 ක තරම් දීර්ඝ කාලයකට පසුව වුවත්, මේ මේ දේවල් සිදුවේවා යි අධිෂ්ඨාන කොට ඒ දේවල් සිදුකරවාලිය හැකි ය.

උන්වහන්සේ පිරිනිවන් පානා දිනයේ අපගේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ වූ දක්ඛිණ ශාඛාව ඉබේ ගැලවී ඒමටත්, එය අනුරාධපුරයට ගෙනා පසු, සවණක් බුදුරැස් විහිදුවමින් අහසේ වැඩ සිටීමටත් අධිෂ්ඨාන කළ සේක. එය එසේ ම සිදු විය.

එසේම රුවන්මැලි සෑයේ ධාතු නිදන් කරන දිනයේ ඒ ධාතුන් වහන්සේලා අහසට පැන නැගී ජීවමාන ශරීරයම වැනි බුද්ධ ශරීරයක් මැවෙන්නත්, සවණක් ඝන බුදුරැස් විහිදෙන්නත්, ධර්මය දේශනා කොට සත්ත්වයා නිවනට පමුණුවාලන්නටත් අධිෂ්ඨාන කළ සේක. මෙය ද එසේම සිදුවිය. බුදුරදුන් පිරිනිවී අවුරුදු ගණනකට පසුව බුද්ධ ශරීරය මවා, එයින් ධර්මය දේශනා කරවා, සත්ත්වයාට නිවන් අවබෝධ කරවාලීමට කෙතරම් නම් ඍද්ධියක් අවශ්‍ය ද?

එසේම පිරිනිවී අවුරුදු 5000 ක් ගිය පසු සියලුම ධාතුන් වහන්සේලා දඹදිව බුද්ධත්වයට පත් බෝමැඩ මුලට වඩින්නටත්, එහි දී බුද්ධත්වයට පත් වූ දිනයේ මෙන්ම දෙතිස් පූර්ව නිමිති පහළ වීමටත්, අහසට පැන නැඟී යමාමහ පෙළහර පෑමටත්, අහසේදීම ගිනිගෙන සියලු ධාතුන් වහන්සේලා අන්තර්ධාන වීමටත් අධිෂ්ඨාන කොට වදාළ සේක. එය ද එදින එලෙස ම සිදුවනු ඇත.

මුළු විශ්වයේම සිටිනා සියලුම දෙවිවරුන්ගේ, බ්‍රහ්මයන්ගේ අනෙකුත් සියලුම ඍද්ධිමතුන්ගේ ඍද්ධීන් එක්තැන් කළත්, ඒ සියල්ලම බුදුරදුන් ගේ ඍද්ධියෙන් කෝටි ප්‍රකෝටියෙන් එකක් තරම් ද නො වන්නේ ය.

උන්වහන්සේගේ බුද්ධ ගුණ අචින්තිය ම ය, උන්වහන්සේගේ ඍද්ධි විෂයය ද අචින්තිය ම ය. මෙසේ වූ අනන්ත ඍද්ධි ඇති බුදුපියාණෝ සියලු පූජාවන්ට ඒකාන්තයෙන්ම සුදුසු වන සේක. එබැවින්ම ඒ මහා ඍද්ධිමතාණෝ ඒකාන්තයෙන්ම අරහත් නම් වන සේක.

## අනන්ත ආනුභාව

13. තවද ඒ බුදුරජාණෝ තුන්ලෝකාග්‍ර වූ බැවින් ද, අනන්ත තේජසින් සමන්නාගත වූ බැවින් ද, අනන්ත ආනුභාවයකින් සමන්නාගත වූ බැවින් ද සියලු පූජාවන්ට සුදුසු වන සේක.

13. (i) උන්වහන්සේ මව්කුස පිළිසිඳගත් දිනයේ ද, මව්කුසින් බිහි

වූ දිනයේ ද, බුද්ධත්වයට පත් වූ දිනයේ ද, පළමු ධර්ම දේශනා කළ දිනයේ ද, යමාමහ පෙළහර පෑ දිනයේ ද, දෙව්ලොවින් සංකස්ස නුවරට වැඩිය දිනයේ ද, ආයුසංස්කාර හළ දිනයේ ද, පිරිනිවන් පෑ වදාළ දිනයේ ද යන දිනයන්හි දී 10000ක් ලෝකධාතු කම්පිත විය. 10000ක් ලෝකධාතු ආලෝකමත් විය. දෙතිස් පූර්ව නිමිති පහළ විය. ඒ දිනවල දී උත්පත්තියෙන්ම අන්ධ අයට පෙනීම පහළ විය. උත්පත්තියෙන් ම බිහිරි අයට ඇසිය හැකි විය. උත්පත්තියෙන්ම ගොළු වූ අය කථා කළහ. උත්පත්තියෙන්ම කොර වූ අය ගමන් කළහ. කුරු වූ, කුදු වූ සත්ත්වයන් ගේ ශරීර ඍජු විය. බන්ධනගත සියලු සත්ත්වයෝ බන්ධනවලින් මිදුනහ. අපායේ ගිනි නිවී ගියේ ය. බුද්ධාන්තර ගණන් අහර නො ලැබ සිටි ප්‍රේතයෝ ආහාරපාන ලැබූහ. සතුරු තිරිසන් සත්ත්වයෝ ඔවුනොවුන්ට ප්‍රිය වූහ. නිධන්ගත රෝගීහු සුවපත් වූහ. මුළු ලොවම ප්‍රියවචන ම කථා කළහ. ඇත් - අස් - සිංහ - ව්‍යාඝ්‍ර ආදී සියලු සිවුපාවෝ ප්‍රීතිනාද පැවැත්වූහ. රන් රිදී ආදී ආභරණ ඉබේ දිලිසෙමින් නාද විය. ඉතා සුඛදායක මද පවනක් හමා ගියේ ය. අකල් වැසි වස්නට විය. සියලු පක්ෂීහු පොළොවට බැස මිහිරි නාද පැවැත්වූහ. මහා සමුද්‍රය නිසල විය. මහා සමුදුරු ජලය මිහිරි විය. ගංගා ඇළදොළ ගලා නො ගොස් නතර විය. මුළු සාගරයෙහි ම පියුම් පිපී ගියේ ය. දියෙහි ද, ගොඩෙහි ද සියලු පුෂ්පයෝ එකවර පිපී ගියහ. මුළු ලොව සෑම ගසක්ම පිපි මලින් බර විය. පොළොව පලාගෙන පියුම් පැන නැංගේ ය. මුළු අහස වියනක් සේ මලින් සැදී ගියේ ය. මුළු ලොව කොඩි ධජ පතාකවලින් වැසී ගියේ ය. මෙවන් ප්‍රාතිහාර්ය පහළ කරවීමට උන්වහන්සේ කෙතරම් නම් ආනුභාවසම්පන්න විය යුතු ද?

13. (ii) මෙසේම උන්වහන්සේගේ බුද්ධශ්‍රීය, බුද්ධ මහිමය හා බුද්ධ තේජස ද අසමසම ය. දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් ගෙන් ශෝභාසම්පන්න වූ, 80ක් කුඩා ලක්ෂණවලින් රූප සම්පන්න වූ, සවණක් ඝන බුදු රැසින් බැබළුණු, රන් පිළිමයක් මෙන් දිලිහුණු, සියලු දෙවියන් සියලු බ්‍රහ්මයන්ගේ පවා රූප ශෝභාව මැඩලමින් දකින දකින අය වශී කරවන තරම් ශෝභාසම්පන්න වූ උන්වහන්සේගේ බුද්ධ ශ්‍රීය වර්ණනා කොට නිම කළ නො හැක. මෙලෙසම උන්වහන්සේගේ ගමන් විලාශය ද ශෝභාසම්පන්න ය.

දේශනා විලාශය ද ශෝභාසම්පන්න ය. ඉරියවු පැවැත්වීම ද ශෝභාසම්පන්න ය.

13. (iii) මෙසේම උන්වහන්සේ අභිභවනය කිරීමට සමත් කිසිවකු තුන් ලොවම නැත. තුන් ලොවම අභිභවනය කරමින් වැඩ සිටි උන්වහන්සේගේ ජීවිතයට කිසිවකුට අනතුරක් කළ නො හැක. උන්වහන්සේගේ සවණක් ඝන රැස් මැඩලීමට සමත් කිසිවෙක් ද නැත. උන්වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ට කිසිවෙකුට අනතුරක් කළ නො හැක. උන්වහන්සේ තුන්වර දක්වා විමසත්දීත් නිසලව සිටිය හැකි කෙනෙක් ද නැත. උන්වහන්සේ ගෙන් වැඳුම් පිදුම් සාමීචිකම් ලබා ගැනීමට සමත් කිසිවකු ද නැත. උන්වහන්සේ වෙනුවෙන් පිළියෙල කළ සිවුපසයකට අනතුරක් කළ හැකි කිසිවෙක් ද නැත. මේ කිසිවක් කළ අයකු වේ නම්, ඔහුගේ හිස හත් කඩකට හෝ පුපුරන්නේ ය. හිස බොටුවෙන් හෝ ගැලවී බිම පතිත වන්නේ ය. උන්වහන්සේගේ තේජස එතරම්ම මහත් ය.

13. (iv) තවද උන්වහන්සේගේ උපතින්ම 10000ක් සක්වළ උන්වහන්සේගේ අණසක පවත්නේ ය. ඒ උන්වහන්සේගේ ජන්ම ක්ෂේත්‍රය ය. කෝටි ලක්ෂයක් සක්වළ උන්වහන්සේගේ ආඥාව පවතින්නේ ය. එය උන්වහන්සේගේ ආඥා ක්ෂේත්‍රය ය. උන්වහන්සේ විසින් දේශනා කළ රතන සූත්‍රය - ධජග්ග සූත්‍රය වැනි සූත්‍රවල ආඥාව කෝටි ලක්ෂයක් සක්වළ පුරාම පවතින්නේ ය. යම්තාක් සක්වළ ඇත් ද, ඒ සියලුම සක්වළ උන්වහන්සේගේ සර්වඥතාඥානයට පෙනේ. එය උන්වහන්සේගේ විෂය ක්ෂේත්‍රය ය. මෙසේ 10000ක් සක්වළ උත්පත්තියේ දී පවා සසල කරවූ, මෙසේ කෝටි ලක්ෂයක් සක්වළ අණසක පැවැත්වූ, මෙසේ අනන්ත වූ සක්වළ අනන්ත වූ සර්වඥතාඥානයෙන් දක්නා වූ උන්වහන්සේ ගේ ආඥානුභාවය කෙතෙක් ද?

අද අප මෙසේ පුද පූජා පවත්වන්නේ එසේ මෙසේ උත්තමයකුට නොව, 10000ක් ලෝකධාතුව කම්පා කරවමින්, අපායේ ගිනි නිවමින්, ලෝකාන්තරික නරක පවා අලෝක කරවමින්, සාගරය නිසල කරවමින්, සාගර ජලය මිහිරි කරවමින්, ගංගා ඇළදොළ ගලායාම නතර කරවමින් මේ ආදී දෙතිස් ප්‍රාතිහාර්ය ඇති කරවමින් ලෝකයට

ජනිත වූ, දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන්, සවණක් ඝන බුදු රැසින් බැබළි බැබළී වැඩ සිටි, කෝටි ලක්ෂයක් සක්වළ පුරා තමන්වහන්සේ ගේ අණසක පැවැත් වූ, ඒ අතිශ්‍රේෂ්ඨ තුන්ලෝකාග්‍ර මහෝත්තමයාණන් වහන්සේට ය. මෙසේ වූ මහත් සෘද්ධි ඇති, මෙසේ වූ මහත් ආනුභාව ඇති, මෙසේ වූ මහත් ශ්‍රී ඇති, මෙසේ වූ මහත් තේජස් ඇති, මෙසේ වූ මහත් ගුණ ඇති, ඒ සම්මා සම්බුදුපියාණෝ සියලු පුද පූජා ලැබීමට අතිශයින්ම සුදුසු වන සේක. එබැවින්ම අරහත් නම් ද වන සේක.

## පාරමිතා ප්‍රකරණය

14. තවද ඒ බුදුපියාණෝ අප නිසාම අතට පත් නිවන් හැරපියා අති දීර්ඝ කාලයක් ජීවිත පූජා කරමින් පාරමී දහම් පිරූ බැවින් ද සියලු පුද පූජාවන්ට සුදුසු වන සේක.

උන්වහන්සේ නියත විවරණ ලැබීමෙන් පසු සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමී දහම් පිරූ සේක. අසංඛ්‍යයක් යනු ගණනින් දැක්විය නො හැක්කකි. මුහුදේ ඇති ජල බිඳු ගණන, පොළොවේ වැලිකැට ගණන සංඛ්‍යාවකින් දැක්විය නො හැක. ඒවා අසංඛ්‍ය ය. කල්පයක් යනු අතිදීර්ඝ කාලයකි. යොදුන් 84000ක් දිග පළල උසැති මහාමේරු පර්වතය දිනපතා සියුම් රෙදි කඩකින් වරක් බැගින් පිස දැමීමෙන් එය ගෙවී යතත් කල්පය නො ගෙවේ. මහාමේරු පර්වතය නොව, ගෙයක් පමණ වූ ගලක් වුව දිනපතා රෙදිකඩකින් එක්වර බැගින් පිසදමා එය ගෙවා දැමීමට යන කාලය කෙතෙක්දැයි සිතා ගැනීමටවත් නො හැක. එසේ නම් යොදුන් 84000ක් දිග පළල උසැති මහාමේරු පර්වතය ගෙවීයාමට ගතවන කාලය කොතරම් නම් දීර්ඝ විය යුතු ද? කල්පය ඊටත් වඩා දීර්ඝ ය. එවිට සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් යනු කෙතරම් දීර්ඝ කාලයක් ද? එතරම්ම දීර්ඝ කාලයක් බෝසතාණෝ අප වෙනුවෙන් පාරමීදම් පිරූ සේක. මෙය නියත විවරණ ලැබීමෙන් පසුව ය. මෙයට පෙර සොළසාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මනෝප්‍රණිධාන, වාග්ප්‍රණිධාන පිරූ කාලය වන්නේ ය. එවිට ඒ බෝසතාණෝ පාරමී පිරූ මුළු කාලය 20 අසංඛ්‍ය කල්ප ලක්ෂයකි.

මේ තරම් දීර්ඝ කාලයක් තුළ උන්වහන්සේ කෙසේ නම් පාරමී පුරන ලද්දේ ද, කොතෙක් නම් පාරමී පුරන ලද්දේ ද කියා දැනගත හැක්කේ වෙනත් සම්මා සම්බුදු කෙනකුන් වහන්සේට ම ය. පසේ බුදු කෙනකුන් වහන්සේට වුවත් දැනගත හැක්කේ කල්ප අසංඛ්‍ය

දෙකක් පමණි. සම්බුදු කෙනකුන්ගේ ගුණ සම්පූර්ණයෙන් දත හැක්කේ වෙනත් සම්බුදු කෙනකුන් වහන්සේට ම ය. සත්ත්වයා කෙරෙහි අනුකම්පාවෙන් හා කරුණාවෙන් ඒ බෝසතුන් මේ මේ අයුරින් පාරමී පිරුවේ යැයි කල්පයක් තිස්සේ සිතුවත් ඒ කාලය ගෙවී යන නමුත් උන්වහන්සේ පිරූ පාරමී සිතා නිම කළ නො හැක්කේ ම ය. බුදුගුණ අචින්තිය ම ය.

මෙතරම් දීර්ඝ කාලයක් මුළුල්ලේ උන්වහන්සේ දාන-සීල, නෙක්ඛම්ම-ප්‍රඥා-විරිය-ඛන්ති-සච්ච-අධිට්ඨාන-මෛත්‍රී-උපේක්ෂා යන දස පාරමිතා පිරූ සේක. ශරීරයේ අඟපසඟ පරිත්‍යාග කරමින් දස උප පාරමිතා පිරූ සේක. ජීවිතය පරිත්‍යාග කරමින් දස පරමර්ථ පාරමිතා පිරූ සේක.

මෙම කාලය තුළ දී උන්වහන්සේ මුහුදේ ජලයටත් වඩා තමන්වහන්සේගේ ලේ දන් දුන් සේක. පොළොවේ පස්වලටත් වඩා ශරීරය කප කපා මස් දන් දුන් සේක. පොළොවේ වැලි කැට ගණනටත් වඩා ඇස් ගලව ගලවා දන් දුන් සේක. මහාමේරු පර්වතයටත් වඩා උසට ඔටුණු පළන් හිස් දන් දුන් සේක. ප්‍රාණය සේ ප්‍රිය අඹුදරුවන් බැඳ දන් දුන් වැල් එකතු කළහොත්, යොදුන් 84000ක් උස මහාමේරු පර්වතයටත් වඩා එය උස වන්නේ ය. දන්දෙන ලද වෙනත් වස්තු සම්භාර එකතු කළහොත්, මුළු විශ්වයමත් ඒවා තැබීමට මද වන්නේ ය.

මෙම උපමා දක්වා ඇත්තේ උන්වහන්සේ පිරූ පාරමිතා අතිශයෝක්තියකින් දැක්වීමට නොව, ඊට වඩා ලොකු උපමා නැති බැවිනි. උන්වහන්සේ එක් කල්පයකට එක් එක් ලේ බිංදුව බැගින් දන් දුන්නත් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක දී සාගර ජලයට වඩා එය වැඩි වන්නේ ය. එම කාලසීමාවට මුහුදේ ජල බිංදු ගණනට වඩා කල්ප ඇති බැවිනි. එක් කල්පයකට දන් දෙන ලද්දේ එක් ලේ බිංදුවක් නොව, මහා ගංගාවල ජලයටත් වඩා වැඩි තරම් ලේ ය. එවිට සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් වැනි දීර්ඝ කාලයක් තුළ දී දන්දුන් ලේ දැක්වීමට උපමාවක් ද නැත්තේ ය. මෙසේ ම එක් එක් කල්පයක දී එක එක ඇස බැගින් එක එක මස් කඳුළ බැගින්, එක එක හිස බැගින්, එක එක අඹුවකු බැගින්, එක එක දරුවකු බැගින් දන් දුන්නත් ඉහත කී උපමාවලටත් වඩා ඒවා වැඩි වන්නේ ය. කල්පයක දී දන්

දුන්නේ එක එක ඇස, එක එක හිස ආදී වශයෙන් නොව ලක්ෂ කෝටි ප්‍රකෝටි අසංඛ්‍ය ගණනින් ය.

මෙසේම උන්වහන්සේ අනෙකුත් පාරමිතා ද ජීවිතය පරිත්‍යාග කරමින් අප වෙනුවෙන් පූරණය කළ සේක. උන්වහන්සේ ජීවිතය නැති වී යත් දී පවා ශීල පාරමිතාව පිරූ ජාති අසංඛ්‍ය ගණන් වන්නේ ය. චක්‍රවර්ති රාජ්‍ය සම්පත් හැරදමා නෙක්ඛම්ම පාරමිතාව පිරූ ජාති ද අසංඛ්‍ය ගණන් වන්නේ ය. ජීවිතය විනාශ වෙත්දී විරිය පාරමිතාව පිරූ ජාති ද අසංඛ්‍ය ගණන් ය. ජීවිතය නැතිවෙත් දී පවා බොරුවක් නො කියා සත්‍යය පාරමිතාව පිරූ ජාති ද, අධිෂ්ඨාන - මෛත්‍රී - උපේක්ෂා වැනි පාරමිතාවන් පිරූ ජාති ද අසංඛ්‍ය ගණන් ම වන්නේ ය.

මේ සියල්ලම උන්වහන්සේ කෙළේ "මම බුදු වී අසරණ සත්ත්වයා සසර දුකින් ගලවමි" යි යන මහා කරුණාවෙනි. එතරම් කරුණාවකින් අප වෙනුවෙන් පාරමී පිරූ බුදුපියාණන් වහන්සේට කෙතෙක් නම් පුද පූජා පැවැත්විය යුත්තේ ද? උන්වහන්සේ ප්‍රාර්ථනය කෙළේ මෙසේ ය.

'බුද්ධොහං බොධියිස්සාමි - මුත්තොහං මොචයෙ පරෙ
තිණ්ණොහං තාරයිස්සාමි - සංසාරොඝා මහබ්භයා'ති'

"මම චතුසසත්‍යය අවබොධ කොට අනික් සත්ත්වයාට ද චතුස්සත්‍යය අවබොධ කරවමි. මම සසර දුකින් මිදී අනෙක් සත්ත්වයා ද සසර දුකින් මුදවමි. මහා භයානක සංසාරයෙන් මම එතරවී අනෙක් සත්ත්වයා ද එතර කරවමි" මෙවැනි මහා කාරුණික ප්‍රාර්ථනාවක් ඇතිව උන්වහන්සේ අරතරම් ඇස් - ඉස් - මස් - ලේ දන් දෙමින් අප වෙනුවෙන් ම පාරමිතා පිරූ සේක. මුහුදේ ජලයට වඩා ලේ දන් දෙන්න කොයිතරම් නම් ජීවිත ප්‍රමාණයක් කැප කළ යුතු වේද? මුහුදේ ජලය තබා ලොකු වැවක තරම් ලේ දන් දෙන්න වුවත් කොයිතරම් ජීවිත ගණනක් කැප කළ යුතු වන්නේ ද?

පොළොවේ පස්වලට වඩා මස් දන් දෙන්න කෙතරම් නම් ජීවිත ප්‍රමාණයක් උන්වහන්සේ පූජා කරන්න ඇත්ද? මුළු පොළොවේ ම පස් තබා අක්කර 5-6 ක ඇති සියලුම පස්වලට වඩා මස් දන් දෙන්න වුවත් කොපමණ ජීවිත පූජා කළ යුතු වේද? යොදුන් දෙලක්ෂ හතළිස් දහසක් ඝන මහපොළොවේ පස් පරයා අප වෙනුවෙන් ජීවිත පූජා කළ උන්වහන්සේට කෙසේ නම් අප කළගුණ සලකන්න ද?

14. (i) මෙසේම උන්වහන්සේ ජීවිතය පරිත්‍යාග කරමින් තමන්වහන්සේගේ ජීවිතය විනාශවෙත්දීත් අප නිසාම, අප වෙනුවෙන් ම ඉවසීම හා මෛත්‍රිය වැඩූ ජාති අසංඛ්‍ය ගණන් වන්නේ ය. ඒ අතුරෙන් එදා ක්ෂාන්තිවාදී ජාතකයේ දී උන්වහන්සේ 'ක්ෂාන්තිවාදී' නම් තාපස කෙනෙකි. දෙව්දත් එදා 'කලාබු' නමින් රජව සිටියේ ය. කලාබු රජුට ක්ෂාන්තිවාදී තාපස උතුමාණන් ඇසට දුටු විගසම කලින් ආත්මවල එන සතුරුකම එකවරටම මතුවී ආයේ ය. රජු තාපසතුමා වෙත ගොස් "තා කවුදැ" යි විමසී ය.

"මහරජ, මගේ නම ක්ෂාන්තිවාදී" ඒ බෝසත් වචන පිටවුණි. "ක්ෂාන්තිවාදී කියන්නේ මොකක් ද?" රජු විමසූ විට "මහරජ, හතුරු මිතුරු කාටත් එකසේ ම මෛත්‍රිය පතුරුවන, එකසේ ම කරුණාව පතුරුවන බැවින් මා ක්ෂාන්තිවාදී" යැයි කියා බෝසතාණෝ පැවසූහ.

"තොගේ ක්ෂාන්තිය මා බලන්නම්. වධකය මේ කුට තාපසයා බිම දමා පිටට පහරවල් 500ක් ද, බඩට පහරවල් 500ක් ද, දෙපැත්තට පහරවල් 200 බැගින් ද ගසාලව" රජු කෝපයෙන් අණ කෙළේ ය.

ඒ අවිහිංසාවාදී උතුමාණන්ට වධකයා නිරපරාදේම කස පහරවල් 1400ක් තැලී ය. බෝසත්තුමා ගේ පිට පැලී, හම පැලී ලේ වැගිරෙන්නට විය. බලවත් දුකින් සිටින තාපසයාණන් වෙතින්, "තා කියන්නේ තවත් ක්ෂාන්තිවාදී කියලදැ" යි රජු ඇසී ය.

"මහරජ මගේ ක්ෂාන්තිය පෙර සේ ම ය. මට ඔබ කෙරෙහිවත්, වෙන කිසිවකු කෙරෙහි වත් වෛරයක් නැත. ක්ෂාන්තිවාදී මම, මහරජ, ක්ෂාන්තිවාදී ම" යැයි ඒ උතුමාණෝ පැවසූහ. "මේකාගේ ක්ෂාන්තිය මේකට මම පෙන්නන්නම්. වධකය මේකාගේ කන් නාසා කපා දමපිය" යි රජු කෝපයෙන් වධකයාට නියම කෙළේ ය. වධකයා ඒ ශාන්තවත් කන් නාසා කපා ඉවත් කෙළේ ය.

"තා කියන්නේ තවත් ක්ෂාන්තිවාදී කියලදැ" යි රජු ඇසී ය. "මහරජ, මගේ ක්ෂාන්තිය කන් නාසාවල නැත. මගේ ක්ෂාන්තිය එසේම" යැයි බෝසතාණෝ පැවසූහ. "වධකය, එහෙමනම් මේකගේ කකුල් දෙකත් දැන් කපා දාපියැ" යි රජු වධකයාට එවිට අණ කෙළේ ය. කුරා කුඹුවකුටවත් හිංසාවක් නො වන සේ ගමන් ගත් ඒ අහිංසක පාද දෙක ම වධකයා කපා ඉවත් කෙළේ ය. පා දෙක ම නැතිව, කන් නාසා නැතිව, ගැසූ ගැසූ පහරවලින් පිපුරුණු හම ඇතිව, ලේ විලක්

මැද අතිශයින් ම දුකින් සිටිනා බෝසත් උතුමාණන් ගෙන් "තවත් තගේ ක්‍ෂාන්තිය තියෙනවාදැ" යි රජු ඇසී ය.

"මහරජ, මගේ ක්‍ෂාන්තියේ කිසිම අඩුවීමක් වූයේ නැත. ඒ ක්‍ෂාන්තිය එසේ ම ය. මාගේ මේ ඉවසීම, මාගේ මේ ක්‍ෂාන්තිය, මට බුදුබව ලැබී, ඔබ ද ඇතුළු අසරණ සත්ත්වයන් සසර දුකින් මුදවාලීමට හේතු වේවා" යි ඒ බෝසත් වචන පිටවිණ.

රජු තවත් කෝපයට පත්ව, "වධකය, මේකාගේ දැන් අත් දෙකත් කපා දාපියැ" යි අණ කෙළේ ය. මැසි මදුරුවකුට පවා පීඩාවක් කිරීමට නො එස වූ ඒ අහිංසක අත් දෙක ම වධකයා සිඳ දැමී ය. රජු සිනහමුසුව "තගේ ක්‍ෂාන්තිය දැන් නම් ඉවර ඇතැ" යි කීවේ ය. අත් පා නැතිව, කඳ කැල්ල පමණක් ම තිබූ බෝධිසත්ත්ව මුවින් මෙම වචන එවිට පිටවිණ.

"මහරජ මගේ ක්‍ෂාන්තියට ඔබට කළ හැකි අනතුරක් නැත. මා පෙරසේ ම ක්‍ෂාන්තිවාදීම ම ය. මතු බුදු වී ඔබ ඇතුළු අසරණ සත්ත්වයන් මුදාලීමට ප්‍රාර්ථනා කරන මා වැන්නවුන් ගේ ක්‍ෂාන්තිය වෙනස් වන්නේ නැත. මහරජ ඔබ ද සුවපත් වේවා!" මෙවිට, රජුගේ ප්‍රධාන ඇමැතියා බෝසත්තුමා වෙත ගොස් රජු කළ වරදට තමා හා රටවැසියා කෙරෙහි කෝප නො වන ලෙස බැගෑපත්ව අයැද සිටියේ ය. ඒ බෝසතාණෝ එවිට,

**"යො මෙ හත්‍ථෙච පාදෙච - කණ්ණ නාසඤ්ච ඡේදයී**
**චිරං ජීවතු සො රාජා - නහි කුජ්ඣන්ති මා දිසා" ති**

මගේ අත් පා කන් නාසා කැපූ ඒ මහරජතුමා චිරාත් කාලයක් නිදුකින් ජීවත් වේවා, මා වැන්නෝ කුපිත නොවෙත්" යැයි පැවසූහ.

රජු කෝපයෙන් රත් වී බෝසත් උතුමාණන්ගේ පපුවට පයින් ද ගැසුවේ ය. එවැනි මහෝත්තමයාණන් වහන්සේ කෙනකුගේ, එවැනි ගුණවන්තයකුගේ, එවැනි බෝධිසත්ත්වයකුගේ හදවතට ගැසූ පා බිම දරා සිටීමට හිත්පිත් නැති මහපොළොව ඉඩ තැබුයේ නැත. මහපොළොව පැලී, අපායේ ගිනි දැල් බුර බුරා පැන නැග, රජු වටකර වෙළාගෙන අවීචියටම ඇදගෙන ගියේ ය. ඒ බෝධිසත්ත්වයාණෝ, ඒ ශාන්තිවාදියාණෝ, මතු ලොවුතුරු බුදු වී මේ රජු ද ඇතුළු අසරණ සතුන් සසර දුකින් මුදාලීමට ලැබේවායි පතමින් මියගොස් බඹලොව ඉපදුණි.

මගේ බෝසතාණන් වහන්සේ අප නිසාම, අප වෙනුවෙන් ම පාරමී පිරුවේ මෙසේ ය. අප නිසා ම, අප වෙනුවෙන් ම ජීවිත පරිත්‍යාග කෙළේ මෙසේ ය. අප කෙරෙහි කරුණාව පැතුරුවේ මෙසේ ය.

14. (ii) තවද ඒ බෝසතාණෝ චූලධම්පාල ජාතකයේ දී චූලධම්පාල නමින් රජ කුමරුව ඉපදිණි. දෙව්දත්, එදා මහා ප්‍රතාපවත් නමින් චූලධම්පාල කුමාරයා ගේ පිය රජු වශයෙන් ඉපදිණි. මව්, චන්ද්‍රදේවී බිසව්තොමෝ, චූල ධම්පාල රන් කඳක් වැනි පුත් කුමරා සුරතල් කරමින් සිටිනා විට රජු පැමිණියේ ය. පුත් කුමරා සුරතල් කරමින් සිටි බැවින්, බිසවට රජු දැක සිටි තැනින් නැගී සිටීමට අමතක විය.

කෝපයට පත් රජු වධකයා කැඳවී ය.

"මහරජතුමනි, කවුද ඔබේ හතුරා, කාටද වධ පමුණුවන්නේ" යැයි කියමින් වධකයා පැමිණියේ ය.

"චූල ධම්පාලයා හැර වෙන කවුද මට හතුරෙක් ඉන්නේ. උගේ මව හඬත්දීම ධම්පාලයා කකුල් දෙකෙන් අල්ලා ඇද බිම දමා සොලව සොලවා අරගෙන එව" යි රජු වධකයාට අණ කෙළේ ය. මව හඬමින් පසුපස දුවගෙන එත්දී ද, වධකයා රජු කී අයුරින් ම අහිංසක ධම්පාල කුමරු ඇදගෙන ආවේ ය.

"මා කළ වරදට මගේ පුතා මොනවා කරන්නද? මට ඕනෑම වධයක් දෙන්න. මගේ පුතා බේරන්න" යැයි මව් බිසව රජු ගේ පා මුල වැටී හඬමින් ඉල්ලා සිටියා ය.

"මහරජ මොහුට මොන වධයක් ද පමුණුවන්නේ?" වධකයා විමසී ය.

"මේකාගේ අත් දෙක කපා දමපිය" යි රජු නියම කෙළේ ය.

"අනේ මගේ අත් කපා දමන්න. මගේ අහිංසක පුතාට වධයක් කරන්න එපා" යැයි මව් බිසව හඬමින් ඉල්ලා සිටියා ය.

එයට කන් නො දුන් වධකයා, ඒ සුකුමාල අත් දෙක ම එක පහරින් ම කපා ඉවත් කෙළේ ය. මව් බිසව, කැපූ අත්කෑලි පපුවේ තුරුලු කරගෙන, "මා කළ වරදට මට ඕනෑ වධයක් දෙන්න. දැන්වත් මගේ පුතා දෙන්න" යැයි විලාප කීවා ය. මේ අතර බෝසත් ළදරුවාණෝ මව කෙරෙහිත්, පියා කෙරෙහිත්, වධකයා කෙරෙහිත් එකසේම මෛත්‍රිය පතුරුවන්නාහ.

"මේකාගේ කකුල් දෙකත් දැන් කපා දමව" යි රජු නියම කෙළේ ය.

"මගේ කකුල් කපා දමන්න. මගේ පුතා බේරන්න" යැ යි මව් බිසව පෙරසේම විලාප නැගුවා ය.

ඒ මහෝත්තම බෝසතාණන් වහන්සේ මෙවන් වධ අණ කරනා පියරජු කෙරෙහිත්, හඬා වැලපෙන මව කෙරෙහිත්, රකුසකු සේ සිටිනා වධකයා කෙරෙහිත් එකසේම පැතුර වූ මෛත්‍රිය පෙර සේම පතුරුවන සේක. වධකයා කකුල් දෙක ද කපා දැමී ය.

"ඔය කඳ කෑල්ල හරි මට දෙන්න. කඳ කෑල්ලට රජකම් කරන්න බැහැ" කියමින් මව් බිසව නැවත නැවතත් හඬමින් රජු ගේ පා මුල පෙරළී වඳිමින් ඉල්ලා සිටියා ය.

ඒ කඳුළුවලට එම ගල් හිත උණුකිරීමට නො හැකි විය.

"වධකය, මේකාගේ බෙල්ල දැන් කපා දාපිය" යි වධකයාට රජු නැවතත් අණ කෙළේ ය.

"අනේ මාව මරා දාන්න. මගේ පුතා මරාදාන්න එපා" කියමින් මව් විලාප හඬ දුන්නා ය.

ඒ බෝසත් උතුමාණෝ ඒ නියෝගය අසා, උගුලකට හසුවී ගැලවීමට නො හැකිව සිටිනා අහිංසක මුව පොව්වකුගේ බඳු ඇස් ඇතිව, හඬා වැලපෙන දුක්බර මව දෙස ද බලමින්, කෝපයෙන් රත් වී දිලෙන පිය රජු වෙත ද බලමින්, කඩුව අමෝරා ගෙන සිටිනා බිහිසුණු වධකයා දෙස ද බලමින් මෙසේ සිතී ය. "ධම්පාලය, ඔබ දැන් තරහ වුවහොත්, මේ හඬා වැලපෙන මවත්, මේ කෝපයෙන් බර වූ පියරජුත්, මේ බියකරු වධකයාත් ඇතුළු අහිංසක සත්ත්වයා කෙසේ නම් සසර දුකින් ගලවාලන්න ද? මෙතෙක් වේලා හඬා වැලපෙන මවටත්, අණකරන පිය රජතුමාටත්, වධකාර වධකයාටත් එකසේ ම පැතුරූ මෛත්‍රිය එසේ ම පවත්වාගෙන පලයන්. මේ හඬා වැලපෙන මවට වඩා උඹට පිය රජතුමා දැන් උපකාර කරනවා නේද? මෙවන් වධයක් නැත්නම්, උඹ මොනවා නම් ඉවසන්න ද? කොහොම නම් පාරමී පුරන්න ද? කොහොම නම් මතු ලොවුතුරා බුදු වන්න ද? කොහොම නම් සත්ත්වයා සසර දුකින් ගලවාලන්න ද? මේ පිය රජතුමාට මෙයින් පාපයක් සිදු නොවේවා! මේ පිය රජතුමාවත්, එසේ ම මා වෙත මහා කරුණාවක් දක්වන මවත්, මේ වධකයාත් එකසේ ම සුවපත් වේවා! සුවපත් වේවා! සුවපත් වේවා!

මේ ක්ෂාන්ති පාරමී බලයෙන්, මේ මෛත්‍රී පාරමී බලයෙන් සියලු කෙලෙස් නසා මතු ලොවුතුරා සම්මා සම්බුද්ධත්වයට පත් ව, මේ මවත්, මේ පිය රජතුමාත්, මේ වධකයාත් ඇතුළු සියලු සත්ත්වයන්ම සසර දුකින් මුදා ගැනීමට ලැබේවා!"

"තවත් ප්‍රමාද නොවී මේකාගේ බෙල්ල ද කපා දමපිය" රජු නැවතත් කෝපයෙන් අණ කෙළේ ය.

වධකයා ඒ මහෝත්තමයාණන් වහන්සේගේ බෙල්ල ද කපා දැමී ය.

මෙය දුටු මව් බිසව ශෝකය දරා සිටීමට නො හැකිව ළය පැලී මැරී වැටුණා ය.

වෛරයේ කෙළවරක් නො දුටු ඒ මහා ප්‍රතාප රජු, අත් පා නැති, බෙල්ල නැති, හිස් කඳ කෑල්ල පවා උඩ දම දමා, වදමල් පෙති සේ කෑලි කෑලිවලට කප්පවා අභිමාල නම් වධය පැමිණවී ය.

මෙවැනි දරුණු අපරාධයක් දරා සිටීමට නො හැකි වූ මහපොළොව පැලී අවීචි ගිනි දැල් මතු වී රජු අවීචියටම ඇදගෙන ගියේ ය.

ධර්මයෙන් සිත පාලනය කරගත්, ඒ ධර්මපාල බෝසතාණෝ මියගොස් බඹලොව ඉපැදිණි. මගේ බෝසතාණන් වහන්සේ අප වෙනුවෙන් ජීවිතය පූජා කෙළේ මෙසේ ය; අප වෙනුවෙන් පාරමී පිරුවේ මෙසේ ය; අප කෙරෙහි කරුණාව පැතුරුවේ මෙසේ ය.

මෙසේ අසංඛ්‍ය ගණන් ජාතිවල දී අප වෙනුවෙන් ම අසංඛ්‍ය ගණන් ජීවිතය පරිත්‍යාග කළ ඒ බුදුපියාණන් වහන්සේට ඊට කළගුණ සැලකීමක් වශයෙන් හෝ කොපමණ නම් පුද පූජා පැවැත්විය යුතු ද? බඹලොව උසට ගොඩගසා පුද පූජා පැවැත්වූවත් ඇති ද? මෙම නිසා ද උන්වහන්සේ සියලු පූජාවනට සුදුසු වන සේක; එබැවින් ම අරහත් නම් ද වන සේක.

මෙවැනි මහා ගුණ ඇති ඒ මහා ගුණවන්තයාණන් වහන්සේට, මහා සෘද්ධිවන්තයාණන් වහන්සේට, මහා පුණ්‍යවන්තයාණන් වහන්සේට, මහා ප්‍රඥාවන්තයන් වහන්සේට, මහා තේජවන්තයාණන් වහන්සේට, සුගතයන් වහන්සේට, තථාගතයන් වහන්සේට, මහා කාරුණිකයාණන් වහන්සේට, ශාස්තෘන් වහන්සේට, විනේතෘන් වහන්සේට, විමුක්තිදායකයාණන් වහන්සේට, භාග්‍යවතුන් වහන්සේට,

මාගේ බුදුරජාණන් වහන්සේට, ඒ මාගේ සම්මා සම්බුද්ධ රත්නයට මාගේ ජීවිතය ද පූජා කරමි, පූජා කරමි, පූජා කරමි, පූජා වේවා, පූජා වේවා, පූජා වේවා!

මේ ජීවිත පූජාමය කුශලයේ බලයෙන්, මේ දෙනෙතට නැඟෙනා ශ්‍රද්ධා කඳුළු බිඳු බලයෙන්, මේ භාවනාමය කුශලයේ බලයෙන් නිවන් සුව ම අත්වේවා!

# ප්‍රතිපත්ති පූජා

1. ඒ බුදුපියාණන් වහන්සේ ආමිෂ පූජා මෙන්ම ප්‍රතිපත්ති පූජා ලැබීමට ද ඒකාන්තයෙන්ම සුදුසු වන සේක. උන්වහන්සේ පෙන්වා දුන් පරිදි ශීල - සමාධි - ප්‍රඥා ආදී ධර්මානුධර්ම ප්‍රතිපත්ති අනුගමනය කිරීම, උන්වහන්සේට කරනු ලබන ප්‍රතිපත්ති පූජා නම් වන්නේ ය.

ආමිෂ පූජා මෙන් ම උන්වහන්සේ ලද ප්‍රතිපත්ති පූජාවන් ද සිතා ගැනීමට පවා නො හැකි තරමට අනන්ත ය, අප්‍රමාණ ය.

උන්වහන්සේ බෝධිසත්ත්ව කාලයේ දී පවා, උන්වහන්සේ පෙන්වා දුන් පරිදි අකුශල ධර්මයන් ගෙන් වෙන්ව, කුසල දහම්හි යෙදුණු, එසේම අෂ්ට සමාපත්ති අභිඥා ආදිය වැඩූ, උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පිදූ අය අසංඛ්‍ය ගණන් වන්නේ ය. මෙසේ එදා බෝසත් කාලයේ බොහෝ දෙනා උන්වහන්සේගේ උපදෙස් පිළිපදිමින්, පැවිදි වී උන්වහන්සේගේම ශ්‍රාවකයන් බවට පත්ව, උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවලින් පුදන ලද ජාති අසංඛ්‍ය ගණන් වන්නේ ය. එදා කුද්දාල ජාතකයේ දී 12 යොදුනක් (සැතපුම් 192) පුරා සිටි සියලුම ජනතාව උන්වහන්සේගේ උපදෙස් පරිදි පැවිදි වී, උන්වහන්සේගේ ශ්‍රාවක භාවයට පත්ව, ප්‍රතිපත්ති පූජාවෙන් ඒ බෝසතාණන්ට පූජා කළහ. මෙසේම මූගපක්ඛ සමාගමයේ දී තුන් යොදුනක් ද (සැතපුම් 48), චුල්ල සුතසෝම සමාගමයේ දී යොදුන් 30 ක් ද (සැතපුම් 480), අයොඝර සමාගමයේ දී යොදුන් 12 ක් ද, හත්ථිපාල සමාගමයේ දී යොදුන් 36 ක් ද පුරා සිටි සියලුම ජනතාව උන්වහන්සේගේ ශ්‍රාවකයන් බවට පත්වූහ; උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පිදූහ. මෙවන් බෝධිසත්ත්ව මූලයේ දී ප්‍රතිපත්ති පූජාවෙන් පිදුම් ලත් ජාති අනන්ත ය.

තවද උන්වහන්සේ බුදු වූවාට පසුව උන්වහන්සේ ලද ප්‍රතිපත්ති පූජා කොපමණ දැයි අප වැන්නවුන්ට සිතා ගැනීමට පවා නො හැක.

උන්වහන්සේ පළමු ධර්ම දේශනය කළ දිනයේ ම බ්‍රහ්මයන් පමණක් ම 18 කෝටියක් රහත්ව, එදා උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන්

පිදූහ. එසේම ඒ ධර්මය ඇසූ අසංඛ්‍ය ගණන් දෙවිවරු ද සෙසු මාර්‍ගඵල ලබා උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් එදා පිදූහ.

තවද තිරෝකුඩ්ඩ සූත්‍රය දේශනා කළ දා 84000ක් දෙනා ද, ඛදිරංගාර ජාතකය දෙසූ දිනයේ 84000ක් දෙනා ද, ජම්බුක ආජීවක සමාගමයේ දී 84000ක් දෙනා ද, ආනන්ද සෙට්ඨි සමාගමයේ දී 84000ක් දෙනා ද, සක්කපඤ්හ සූත්‍රය දෙසූ දිනයේ 84000ක් දෙනා ද නිවන් දකිමින් උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පූජා කළහ. මෙවැනි ම 84000 බැගින් ම මාර්‍ගඵල ලබමින් උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පිදූ වෙනත් අවස්ථා ද බොහෝ ය.

මෙසේම පාරායන සූත්‍ර දේශනා දෙසූ දා 13 කෝටියක් ද, යමාමහ පෙළහර පෑ දා 20 කෝටියක් ද, දෙව්ලොව දී අභිධර්‍මය දෙසූ විට 80 කෝටියක් ද, සංකස්ස නුවරට වැඩි දා 30 කෝටියක් ද ලෙසින් මේ අවස්ථා හතරේ දී පමණක් 143 කෝටියක් දෙනා නිවන් දකිමින් උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පිදූහ. මෙවැනිම කෝටි ගණනින් උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පිදූ වෙනත් අවස්ථා ද එමට ය.

තවද මහාසමය සූත්‍රය, රාහුලෝවාද සූත්‍රය, මහාමංගල සූත්‍රය, සමචිත්ත පරියාය යන සූත්‍ර දේශනා කළ දිනයන්හි දී සාරාසංඛ්‍යයක් සත්ත්වයා නිවන් දකිමින් උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පිදූහ.

මේ හැර සිය ගණන්, දහස් ගණන්, දස දහස් ගණන්, ලක්‍ෂ ගණන් උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පිදූ අවස්ථා ද බොහෝ ය. එදා සැවැත් නුවර ගිහියන් 5 කෝටියක් ද, රජගහ නුවර ගිහියන් 3 කෝටියක් ද මාර්‍ගඵල ලබා උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පිදූහ.

රතන සූත්‍රය දේශනා කළ විට, එක් ලක්‍ෂ හැටඅටදාහක් නිවන් දකිමින් කළ ප්‍රතිපත්ති පූජා වැනි අවස්ථා ද බොහෝ ය.

ජීවමානව බුදුපියාණන් වහන්සේ වැඩ සිටි කාලය තුළ දී උන්වහන්සේ ලද ප්‍රතිපත්ති පූජා කෙතෙක් ද කියා සිතාගැනීමට හැක්කේ වෙනත් සම්බුදු කෙනකුන් වහන්සේට ම ය. අපට ඒවා අවිෂය ය.

මෙවැනි ප්‍රතිපත්ති පූජා උන්වහන්සේට ලැබුණේ මනුෂ්‍යයන් ගෙන් පමණක් නොව, අසංඛ්‍ය ගණන් දෙවිවරුන්, අසංඛ්‍ය ගණන් බ්‍රහ්මයන්, අනන්ත අප්‍රමාණ දිව්‍ය නාගයන් ඇතුළු තුන්ලෝක වාසී සත්ත්වයන්ගෙන් ම ය.

මෙසේ උන්වහන්සේ ලද ප්‍රතිපත්ති පූජා උන්වහන්සේ පිරිනිවන්

පා වදාළාට පසුව ද, අද දක්වා ම උන්වහන්සේට ලැබෙන්නේ ය. අද දක්වා ම යම්තාක් දෙනා උන්වහන්සේ පෙන්වා දුන් මාර්ගයේ ගමන් කරත් ද, ඒ සියලුම දෙනා උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පූජා කරන්නෝ ය. වෙසක්, පොසොන්, ඇසළ වැනි විශේෂ පොහොය දිනවල දී අද දක්වා ම කෙතෙක් නම් දෙනා උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පූජා කරත් ද?

මේ ප්‍රතිපත්ති පූජා, මෙසේම අනාගතයේ දී ද උන්වහන්සේට තව බොහෝ කලක්ම ලැබෙන්නේ ය. දෙවිවරුන් තව අවුරුදු ලක්ෂ කෝටි ගණනින් ද, බ්‍රහ්මයන් අවුරුදු කල්ප ගණනින් ද ඉදිරි අනාගතයේ දී උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පුදනු ඇත. යම්තාක් කල්, මනුෂ්‍යයෝ උන්වහන්සේ පෙන්වා දුන් ධර්මානුධර්ම ප්‍රතිපත්තියේ යෙදෙත් ද, ඒ තාක් කල් ම උන්වහන්සේ ප්‍රතිපත්ති පූජාවෙන් පූජා ලබති.

මෙසේ ඒ බුදුපියාණන් වහන්සේ අනන්ත අප්‍රමාණ අසංඛ්‍ය ගණන් ප්‍රතිපත්ති පූජා ලද බැවිනුත්, අනාගතයේ දී ද ලබන බැවිනුත්, ඒ ප්‍රතිපත්තිමය පූජා පිළිගැනීමට සුදුසු වූ බැවිනුත්, ඒ සම්මා සම්බුද්ධ රත්නය අරහත් නම් වන සේක.

## ප්‍රතිපත්ති පූජාවන්ට සුදුසු බව

2. බුදුරජාණන් වහන්සේට කරනු ලබන සියලුම ප්‍රතිපත්ති පූජා පිළිගැනීමට උන්වහන්සේ සෑම ආකාරයකින්ම සුදුසු වන සේක.

උන්වහන්සේ පෙන්වා දුන් ධර්මානුධර්ම ප්‍රතිපත්ති මාර්ගය අනුගමනය කිරීමෙන් මෙලෝ යහපත සැලසෙන්නේ ය. පරලොව යහපත සැලසෙන්නේ ය. එසේ ම අමාමහ නිවන් සුව ද ලැබෙන්නේ ය.

උන්වහන්සේ අපගේ මෙලොව යහපත සඳහා, පිරිහීමේ කරුණු, දියුණුවීමේ කරුණු, මංගල කරුණු, අපායමුඛ, දෙමාපිය - දූදරු - අඹුසැමි - ගුරුගෝල ආදීන් එකිනෙකා ඔවුනොවුන් කෙරෙහි පිළිපැදිය යුතු සැලකිය යුතු අයුරු යනාදී දේ මහා කරුණාවෙන් පෙන්වා දුන් සේක. මෙලොව යහපත සඳහා උන්වහන්සේ විසින් මෙසේ පෙන්නා දුන් ප්‍රතිපත්ති අනුගමනය කිරීමෙන් නො වරදවාම, ඒකාන්තයෙන්ම යහපතක් ම සිදුවන බැවින් ද, කිසිදා කිසිවිටක ඉන් අයහපතක් නො සිදුවන බැවින් ද ඒ ප්‍රතිපත්ති අනුගමනය කරමින් උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පූජා කිරීම සුදුසු වන්නේ ය.

මෙසේම අපගේ පරලොව යහපත සඳහා ද, මේවා කුශල්, මේවා අකුශල්, මේවා වැරැදි සහිත ධර්‍ම, මේ නිවැරැදි ධර්‍ම, මේ සේවනය කළ යුතු ධර්‍ම, මේ සේවනය නො කර බැහැර කළ යුතු ධර්‍ම, මේ මේ දේ කිරීමෙන් මෙවන් නරක විපාක ලැබේ, මේ මේ දේ කිරීමෙන් මෙවන් හොඳ යහපත් විපාක ලැබේ, අපායේ උපදින්නේ මේ මේ දේ කළ නිසා, දෙව්ලොව මිනිස්ලොව උපදින්නේ මේ මේ දේ කිරීම නිසා, බ්‍රහ්මලෝකයේ ඉපැදීමට මේ මේ ධ්‍යාන කුශල් වැඩිය යුතුයි යනාදී නොයෙක් කරුණු පෙන්වා දුන් සේක. ඒ කරුණු අතරින්, අත්හළ යුතු අකුශල් ආදී ධර්‍ම අත්හැර, වැඩිය යුතු, භාවිත කළ යුතු, සේවනය කළ යුතු ධර්‍මයන්හි යෙදීමෙන් නො වරදවාම පරලොව යහපත සිදුවන බැවින් ද, එසේ කිරීමෙන් කිසිදිනක අයහපතක් සිදු නො වන බැවින් ද ඒ බුදුපියාණෝ සියලු ප්‍රතිපත්ති පූජාවලින් පිදීමට සුදුසු වන සේක.

එසේම ඒ සම්බුදුපියාණෝ මේ භයානක මහා සංසාර දුක් නැති කරන නිර්‍වාණය අවබෝධ කරගැනීම සඳහා අවශ්‍ය වන මාර්‍ගය ද අපට මහත් කරුණාවෙන් පෙන්වා දුන් සේක. ඒ පෙන්වා දුන් නිවන් මග ගමන් කිරීමෙන්, ඒකාන්තයෙන් ම නිර්‍වාණය අවබෝධ වන්නේ ය. එය කවරදාවත් ම වරදින්නේ නැත. ඒ පෙන්වා දුන් මාර්‍ගය හැර නිවන් යාම සඳහා වැඩිය යුතු වෙනත් මාර්‍ගයක් ද නැත. මෙතෙක් යම්තාක් සත්ත්වයා නිවන් දුටුවා නම්, ඒ නිවන් දුටුවේ මේ මාර්‍ගය අනුගමනය කිරීමෙන් ම ය. එසේම ඉදිරි අනාගතයේ දී යම්තාක් සත්ත්වයා නිවන් දක්නේ නම්, ඒ සියල්ලන් ම නිවන් දකින්නේ ද මේ මාර්‍ගය අනුගමනය කිරීමෙන් ම ය. ඒ මාර්‍ගය පෙන්වා දෙන බුදුපියාණෝ සීල - සමාධි - ප්‍රඥා යන ත්‍රි ශික්ෂාව පෙන්වා දුන් සේක. මේ කරුණු තුනම විස්තර සහිතව දේශනා කරන බුදුපියාණෝ සතිපට්ඨාන - සම්මප්පධාන - ඉද්ධිපාද - ඉන්ද්‍රිය ධර්‍ම - බල ධර්‍ම - බොජ්ඣඞ්ග හා ආර්ය අෂ්ඨාංගික මාර්‍ගය යන බෝධිපාක්ෂික ධර්‍ම 37 ද පෙන්වා දුන් සේක. මේ කරුණු ගැන විස්තර සහිතව සිතන්නේ නම්, එය ද භාවනාවක් වන අතර, ඒ සඳහා දින ගණනක් වුව ගතකිරීමට තරම් ධර්‍ම කරුණු මේවායේ අන්තර්ගත ය.

සත්ත්වයා සසර දුකින් මුදාලීමේ මහත් කරුණාවෙන් ම පාරමී පුරා, ඒ මහා කරුණාවෙන් ම අපට පෙන්වා දුන් ප්‍රතිපත්ති මාර්‍ගය

අනුගමනය කරමින් උන්වහන්සේට අප ප්‍රතිපත්ති පූජාවෙන් පිදිය යුතු වන්නේ ය.

මෙසේ මෙලොව යහපත සලසා දෙන්නා වූ, මනුෂ්‍ය සම්පත් දිව්‍ය සම්පත් බ්‍රහ්ම සම්පත් ලබාදෙමින් පරලොව යහපත සලසා දෙන්නා වූ, අවසන ලොවුතුරු නිවන් සුව ලබා දෙන්නා වූ, කවරදාවත් ම නොවරදින ඒ ප්‍රතිපත්ති මාර්ග අනුගමනය කරමින් ඒ සම්මා සම්බුද්ධ රත්නයට ප්‍රතිපත්ති පූජාවෙන් පූජා කිරීමට තරම් උන්වහන්සේ ඒකාන්තයෙන්ම සුදුසු වන සේක. එසේ හෙයින්ම අරහත් නම් ද වන සේක.

3. තවද ඒ බුදුපියාණන් වහන්සේ වදාළ ප්‍රතිපත්ති මාර්ගය අනුගමනය කිරීම නිසා සතර අපා දුකින් ගැලවී සිටිය හැකි බැවින් උන්වහන්සේට ඒ ප්‍රතිපත්ති පූජාවෙන් පිදිය යුතු වන්නේ ය.

අප මේ සංසාරයේ දී සතර අපාවලට වැටී විඳි දුක් ප්‍රමාණය සිතා නිම කිරීමටවත් නො හැකි තරම් ය. කෙනකු කොහේ ගියත් තමන්ගේ ම නිවසට ම ආපසු එන්නාක් මෙන්, තමන්ගේ ම නිවසේ ම නිතර වාසය කරන්නාක් මෙන්, ලෝක සත්ත්වයා නිතරම යන්නේ අපායට ම ය. අපාය ලෝක සත්ත්වයාගේ නිවහනය ය. සත්ත්වයා ඒ අපාවල විඳි දුක් අනන්ත අප්‍රමාණ වේ. වරක් අපායට වැටුණොත් ගොඩ එන්නේ බොහෝ කාලයකට පසුව ය. පළමුවෙන් ම ඇති සංජීව නරකයේ මෙම මිනිස්ලොව අවුරුදු 90 ලක්‍ෂයක් එහි එක් දවසකි. එවැනි දින 30 ක් මාසයකි. එවැනි මාස 12ක් අවුරුද්දකි. ඒ අනුව මිනිස් ලොව අවුරුදු ලක්‍ෂයේ ඒවා 32,400ක් සංජීව නරකයේ අවුරුද්දකි. එවැනි අවුරුදු 500ක් එහි ආයු කාලය වේ. මේ මිනිස් ලොව අවුරුදු වලින් කියනවා නම් එහි ආයුෂ අවුරුදු ලක්ෂයේ ඒවා එක්කෝටි හැට දෙලක්ෂයකි.

සංජීව නරකයට යටින් යටින් ඇති නරකවල ආයු කාලය ඊටත් වඩා එන්න එන්නම වැඩි වේ. දෙවැනි කාලසූත්‍ර නරකයේ මෙහි අවුරුදු තුන්කෝටි 60 ලක්ෂයක්ම එහි එක දවසකි. එවැනි අවුරුදු 1000ක් එහි ආයුෂ කාලය වේ. මෙසේ ක්‍රමයෙන් යට යට ඇති නරකවල ආයු කාලය වැඩි වේ. අවීචියේ ආයුෂය කල්පයකි. එහි ආයු කාලය මෙහි අවුරුදු වලින් දැක්වීමට නො හැකි ය. යොදුන් 84000 ක් දිග පළල උස ඇති මහාමේරු පර්වතය දිනකට එක්වර

බැගින් රෙදි කඩකින් පිස දමමින් ගියවිට මහාමේරු පර්වතය ගෙවී ගියත්, අවීචියේ ඇති ආයු කාලය ගෙවෙන්නේ නැත.

මේ තරම් අතිදීර්ඝ කාලයක් අපායේ වැටී අපායේ ගිනි වලින් දැවෙමින්, ලොහෝ ගුලි ගිලිමින් විඳීමට සිදුවන, දුක් හා වෙනත් කිව නො හැකි තරම් වූ අපා දුක්වලින් මුදවාලන ප්‍රතිපත්ති මාර්ගයක් දේශනා කළ ඒ බුදුපියාණන් වහන්සේට එම ප්‍රතිපත්ති පූරණය කරමින් ප්‍රතිපත්ති පූජාවෙන් කෙතෙක් නම් පූජා කළ යුතු වන්නේ ද?

3. (ii) මෙසේම ප්‍රේත ලෝකයේ, තිරිසන් ලෝකයේ, අසුර නිකායේ බුද්ධාන්තර ගණන් කල්ප ගණන් විඳීමට සිදුවන අපා දුක් වලින් ද මේ ප්‍රතිපත්ති මාර්ගය අනුගමනය කිරීමෙන් මිදිය හැකි ය. සතර අපායට වැටුණොත් වැටුනා ම ය. ඉන් ගොඩ එන්නට ලැබෙන්නේ ඉතා කලාතුරකිනි. දිනක් බුදුපියාණන් වහන්සේ නියපොත්ත මතට පස් ටිකක් ගෙන, දුගතියක උපන් සත්ත්වයාට නැවත සුගතියක උපදින්නට ලැබෙන්නේ මේ නියපොත්ත මත තිබෙන පස් ටික තරම් ඉතා ටික දෙනකුට පමණක් බවත්, නැවත නැවත දුගතිවල ම උපදින සත්ත්වයන් පොළොවේ පස් තරම් විශාල වන බවත් වදාළ සේක. එබැවින් සතර අපායේ උපන් සත්ත්වයාට සුගතියක ඉපැදීම ඉතාමත් ම ඉතාමත් ම ඉතාමත් ම අපහසු දෙයකි.

තවද මිනිස්ලොව හා දෙව්ලොව සිටිනා සත්වයන්ගෙන් මරණයෙන් පසු සුගතිගාමී වන අය සිටින්නේ නියපොත්ත මත ඇති පස් ටික තරම් ඉතා සුළු දෙනකු පමණක් බවත්, වැඩි දෙනා සතර අපාවල ම උපදින බවත් බුදුපියාණෝ වදාළහ.

එම නිසා සුගතිගාමී සත්ත්වයකුට නැවත සුගතියක ඉපැදීමට ලැබෙන්නේ ඉතාමත්ම කලාතුරකින් වන අතර, සතර අපාවලට යන සුගතිගාමී සත්ත්වයාට නැවත අපාවලින් ගොඩ ඒමට ලැබෙන්නේ ද ඉතාමත්ම කලාතුරකිනි. සමහරවිට බුද්ධාන්තර ගණන් කල්ප ගණන් ගත වූවාට පසුව ය. මේ අනුව සෝවාන් නොවූ සත්ත්වයා සිටින්නේ කෙතරම් නම් භයානක හා අවදානම් තත්ත්වයක ද?

මෙසේ බුද්ධාන්තර ගණන් කල්ප ගණන් සතර අපාවලම දුක් විඳිමින්, නැවත ද නැවත ද නැවත ද ඒවායේම ඉපදෙමින්, ගැලවීමට නො හැකිව මහත් සතර අපාදුක් විඳිනා සත්ත්වයා ඒ දුක්වලින් මුදවා ලන ප්‍රතිපත්ති මාර්ගයක් දෙසූ ඒ මහා කාරුණික බුදුපියාණන්

වහන්සේ ඒකාන්තයෙන්ම ප්‍රතිපත්ති පූජාවෙන් පිදීමට සුදුසු වන සේක. එසේ හෙයින් ම අරහත් නම් ද වන සේක.

4. තවද ඒ බුදුරදුන් දේශනා කොට වදාළ ප්‍රතිපත්ති මාර්ගය අනුගමනය කිරීමෙන් ජාති දුකින් මිදෙන්නේ ය; මහලු වී විඳීමට සිදුවන ජරා දුකින් මිදෙන්නේ ය; අනේක විධ රෝග දුක්වලින් මිදෙන්නේ ය; මරණ දුකින් මිදෙන්නේ ය; එසේ ම ශෝක කිරීමට සිදුවන දුක්වලින්, හැඬීමට සිදුවන දුක්වලින්, වැළපෙමින් විලාප කීමට සිදුවන දුක් වලින් මිදෙන්නේ ය.

කෙළවරක් අගක් මුලක් නැති මේ සංසාරයේ සැරිසරන සත්ත්වයාට ජාති ජරා ආදී දුක් කොපමණ නම් විඳින්න සිදුවුණා ද කියා සිතාගැනීමටවත් නො හැකි ය. මනුෂ්‍යයන් වශයෙන් උපදින විට මව්කුස තුළ මාස ගණන්, මහා අඳුරේ, අසූචි මැද හිරවී විඳීමට සිදුවන දුක් අනන්ත ය අප්‍රමාණ ය. හඬ හඬා ලොවට බිහිවන විට විඳි දුක් ද අනන්ත ය. ආයුෂ බොහෝ වැඩි කාලවල දී මව්කුසවල මාස ගණන් නොව, අවුරුදු 100 ගණන් එකදිගටම දුක් විඳින්න සිදුවන්නේ ය. අණ්ඩජ සත්ත්වයාට බිත්තර කටු ඇතුළේ හිර වී විඳින්න සිදුවන දුක් ද අනන්ත ය. අසූචි ආදී කුණු වල උපදනා සත්ත්වයා ද මහත් දුකක් විඳින්නේ ය. අන් දෙයක් තබා බ්‍රහ්මලෝකයක උත්පත්තිය පවා, මහත් දුකින්, බලවත් මහන්සියෙන් ධ්‍යාන උපදවා, දුකින්ම ධ්‍යාන පිරිහෙළීමට නොදී රැකගෙන සිට ඉපදිය යුතු බැවින් දුකක් ම වන්නේ ය.

යම්තාක් දුක් විඳීමට සිදුවන්නේ නම්, ඒ සියලු දුක් ඇති වන්නේ ජාති දුක නිසා ම ය. ජාතිය නැත්නම් දුකක් නැත. මෙවැනි මහා ජාති දුකින් මුදවාලන ප්‍රතිපත්ති මාර්ගයක් අපට පෙන්වා දුන් බුදුපියාණන් වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පිදිය යුතු වන්නේ ය.

මෙසේම මහලුව ජරා ජීර්ණ වී, කුදු ගැසී, සම රැළි වැටී, කෙස් සුදු වී, දත් වැටී, වෙව්ල වෙව්ලා, අතපය වාරු නැතිව මලමූත්‍ර සෝදා ගැනීමට නො හැකි නිසා මලමූත්‍ර ගොඩේම හිඳිමින්, ඇස් කන් ආදී ඉන්ද්‍රියයන් දුර්වලව, ඇස් නො පෙනී, කන් නො ඇසී, තමන්ගේම දූ දරුවන්ට පවා කිට්ටුවීමටත් නො හැකි වන තරමට පිළිකුල් ව, හන්දිපත් තුනටිය ආදී ස්ථානවල ඇතිවන ඉවසිය නො හැකි මහත් දුක් විඳිමින්, අවුරුදු ගණන් විඳීමට සිදුවන ජරා දුකින් මුදවාලන ප්‍රතිපත්ති මාර්ගයක් උන්වහන්සේ දේශනා කළ සේක.

මෙසේම ඒ ප්‍රතිපත්ති මාර්ගය, සිය දහස් ගණන් රෝග දුකින් ද සත්ත්වයා මුදාලන්නේ ය. ඇස්- කන්- නාස්, උගුර- කට - පපුව - බඩ ආදී යටිපතුලේ සිට හිස් මුදුන දක්වා, ශරීරය පුරා ඇතිවන අනන්ත රෝග වලින් සත්ත්වයාට දුක් විඳීමට සිදු වේ.

ඇස් දැවිලි- කබකඳුළු ගැලිලි- ඇස්කෙවිලි- ඇස්වල අඳුරුපටල- ඇස්වල සුද වැසීම - ඉන්නන් - නගන වැනි ඇස් රෝග, නාස්වල මස් දළු ඒම - සෙම සොටු ගැලීම් - පීනස - සෙම්ප්‍රතිශ්‍යාව වැනි නාස් රෝග, දත් කැක්කුම් - දත් පණුවෝ කෑම් - දත් හිරි වැටීම් - පණුගෙඩි- දත්මුල් දියවීම්- තොල කට පිපිරීම්- පයරියා - සෙම් ගෙඩි වැනි මුඛ රෝග, ඇම්ම - ඇවිලිල්ල - හිසරදය - ක්ලාන්තය - කැරකිල්ල - ඔළුව බරගතිය - පිස්සුව - ඔල්මාදය වැනි හිසේ රෝග, පපුවේ වාතය හිරවීම - පපුවේ සෙම හිරවීම - පෙනහළුවල වතුර පිරීම් - ක්ෂය රෝගය - රුධිර පීඩනය අඩු වැඩි වීම් - හදවත් ඉදිමීම් - නියුමෝනියා වැනි පපුවේ රෝග, අක්මාව ඉදිමීම - අක්මාව දියවීම - වකුගඩු කුණුවීම - ලේ අඩුවීම - පාණ්ඩුව- වමනය- ඔක්කාරය- අජීර්ණය - කෑ හැටියේ බඩයාම - අතීසාරය - පාචනය- බඩ වේලීම් - බඩවැල්වල ගෙඩි - පිළිකා හටගැනීම් - අර්ශස් - බඩ පුරවා ඇමීම් වැනි උදරගත රෝග, තුනටිය හන්දිපත් රිදීම් - අත් පා ඉදිමීම් - කැඩීම් - බිඳීම් - උළුක්කුවීම් - අංසභාග - මීමැස්මොර - ඇදුම - පැපොල - සරම්ප - කම්මුල්ගාය - කඩුවේගන් - දද - කුෂ්ට - මුත්‍රා දැවිල්ල - මුත්‍රා හිරවීම - දියවැඩියාව - රක්තවාතය - අත් පා හිරිවැටීම - කබර - ඇඟිලි පුරුක් හන්දි කුණුවී ගැලවී වැටෙන ලාදුරු - පක්ෂඝාත - කැසිලි - යටිපතුල් බඩ පපුව වැනි තැන්වල දැවිලි - මැලේරියා - මුත්‍රාශයේ ගල් - බඩවැල් පාත්වීම ආදී තවත් රෝග දස දහස් ගණනින් සත්ත්වයාට දුක් විඳින්න සිදුවන්නේ ය. කොයි මොහොතේ කොයිතරම් දරුණු රෝගයක් වැළඳේ ද කියා කීමට නො හැකි ය. කොයි වයසේ සිටියත්, කොපමණ නිරෝගී ලෙසින් සිටියත්, රෝග සෑදීමේ ශක්තිය ඇතිව සිටිනා සත්ත්වයා රෝගයෙන් මිදී නැත. උපන් දා සිට වලිප්පුව වැනි රෝගවල පටන් මරණය දක්වා අනන්ත අප්‍රමාණ රෝග සත්ත්වයාට හැදෙන්නේ ය. මෙවැනි මහත් රෝග දුකින් මුදවාලන ප්‍රතිපත්ති මාර්ගයක් බුදුපියාණන් වහන්සේ දේශනා කොට වදාළ සේක.

මෙසේ ජාති ජරා ව්‍යාධි දුක් මෙන්ම මරණ දුකින් ද සත්ත්වයාට

පෙළෙන්නට සිදුවන්නේ ය. හුස්ම ගැනීමට නො හැකි ව, හුස්ම හිරවී අමාරුවෙන් හුස්ම ගනිමින්, පණ අදිමින්, (හුස්ම ගැනීමට නිසි පරිදි නො හැකි වීමේ දුක මදක් තේරුම් ගැනීමට හුස්ම හිරකරගෙන මද වේලාවක් සිට බලන්න. එයට වඩා බොහෝ දරුණු අයුරින් බොහෝ වේලාවක්, සමහරවිට දින ගණන්, හුස්ම හිරවී පණ ඇදීමේ දුක මරණ වේලාවේ දැනෙන්නේ ය.) පපුවේ සෙම හිර වී පපුවේ මහත් වූ වේදනා විඳිමින්, හිස පොඩිකර දමන්නාක් මෙන් දුක් ලබමින්, පපුව කපන්නාක් වැනි දුක් විඳිමින්, බඩට තියුණු උලකින් අනින්නාක් වැනි බලවත් දුක් විඳිමින්, හන්දිපත් තුනටිය ගැලවී යන්නාක් මෙන් කෙනකුට කිව නො හැකි තරමේ බලවත් දුක් විඳිමින් මැරීමට සිදුවන සත්ත්වයාට මැරෙන්නට සිදුවන ආකාරයන් ද අනන්ත ය. හුස්ම හිරකර- දියේ ගිලී- ගිනි ඇවිලගෙන- වාහන ආදියට යටවී- වෙඩි පහරවල් වැදීම වලින්- සතුන්ට හසුවී- බෙල්ල කපා- උල තියා- නොයෙක් රෝග සෑදී- අනුන් ගේ පහරදීම් වලට ලක්වී- මේ ආදී අනන්ත අප්‍රමාණ ආකාර වලින් මරණයට පත්වන්නේ ය. මෙසේ සංසාරයේ අපි විඳි මරණ දුක් කෙතෙක් ඇ යි කෙසේ නම් සිතා ගනිමු ද? එවන් මහා මරණ දුකින් ගලවාලන ප්‍රතිපත්ති මාර්ගයක් උන්වහන්සේ දෙසූ සේක.

මෙසේම සත්ත්වයාට ශෝක කරමින්, හඬා වැළපෙමින්, ශාරීරික මානසික දුක් විඳිමින් අනන්ත අප්‍රමාණ දුක් විඳීමට සිදුවන්නේ ය.

සත්ත්වයාට ශෝක පරිදේව ආදී මේ දුක් ලබා දෙන කරුණු අනන්ත ය. මව් මැරෙන විට- පියා මැරෙන විට - දූ දරුවන් මැරෙන විට - සොයුරු සොයුරියන් මළ විට - ඉඩකඩම් පාළු වූ විට - කෙත්වතු නියඟින් ජලයෙන් සුළඟින් සොරුන්ගෙන් සතුන්ගෙන් විනාශ වූ විට - ගෙවල් ගිනිගත් විට- රස්සාව නැතිවී යන විට - උසාවිවල පොලීසිවල රස්තියාදු වන්න සිදුවන විට- කරන වැඩ වරදින විට- සතුරන් පැමිණි විට- සොරුන් පැමිණි විට- මහ නියඟ ඇති වූ විට- ජල ගැලීම් ඇති වූ විට- අමනුෂ්‍යයන් පීඩා කරන විට- අකැමැති දේ හා අකැමැති අය මුණ ගැසෙන විට - අකැමැති ශබ්ද ඇසෙන විට - අකැමැති ගන්ධයක් දැනෙන විට - අකැමැති රස දැනෙන විට - අකැමැති කායික ස්පර්ශ ලැබෙන විට- බලාපොරොත්තු කඩ වූ විට- තිබුණ දේ නැති වූ විට- අඹු දරුවන් අකීකරු වූ විට- නින්දා ලැබෙන විට- අඹු දරුවන් දෙමාපිය සොයුරු සොයුරියන්

ලෙඩවන විට- කන්න අඳින්න නැතිව යන විට- දූ දරුවන්ට කන්න අඳින්න දෙන්නේ කෙසේ දැයි සිතෙන විට- තද ශීතල දැනෙන විට- තද උෂ්ණය දැනෙන විට- මැරෙන්න සිදුවේයැයි දැනෙන විට- වසංගත රෝග පැතිරෙන විට-බඩුමිල වැඩි වන විට- රටේ කලකෝලාහල ඇති වන විට-යුද්ධ ඇති වන විට- නෑදැයින් හිරගෙවල්වල වැටෙන විට- ගමන් කිරීමට බලාපොරොත්තු වන වාහන කලට වේලාවට නො එන විට- අලාභ අපකීර්ති ආදිය ඇති වූ විට. මේ ආදී ලක්ෂ ගණන් කරුණු වලින් සත්ත්වයාට බලවත් දුක් විඳින්න සිදුවන්නේ ය. හඬන්න සිදුවන්නේ ය- සමහර විට විලාප කිය කියා බිම පෙරළි පෙරළී කෑගසමින් සිහි නැතිව ඇද වැටෙන්නට සිදුවන්නේ ය.

මෙසේ සත්ත්වයා සංසාරයේ විඳි දුක් කියා හෝ සිතා හෝ නිම කළ නො හැක. එකම අම්මා කෙනකු මළ පසු හැඩූ කඳුළු එකතු කළහොත් එය මුහුදේ ජලයටත් වඩා වැඩි වන්නේ ය. මුහුදේ ජලය තරම් කඳුළු යාමට කොතරම් නම් ශෝක කරන්න ඇත් ද? එසේම කුකුළන් ඌරන් වැනි සතුන් වී කැපූ බෙලිවලින් ගැලූ ලේ ද සාගර ජලයට වඩා වැඩි ය. එක් සත්ත්වයකු මෙසේ මරණයට පත් වූ වාර ගණන් කියා නිම කළ නො හැක්කේ ය. මෙසේම අප්‍රියයන් හා එක්වීමේ දුක්, ප්‍රියයන්ගෙන් වෙන්වීමේ දුක්- කැමැති දෑ නො ලැබීමේ දුක්- පංචස්කන්ධය පවත්වාගෙන යාමේ, පරිහරණය කිරීමේ දුක් වලින් පෙළුණු සත්ත්වයා එවන් දුකින් සංසාරයේ කෙතරම් නම් පෙළෙන්නට ඇත් ද?*

මෙසේ එකම ගිනි ජාලාවක් සේ ගිනිගෙන දැවෙන මේ සංස්කාර ලෝකයෙන් ඈත් කරවන, අමා මහ නිවනට පමුණුවා සත්ත්වයා සනසවන - පිනවන - සිසිල් කරවන - සදාකාලික - අමරණීය සුවයකට පත් කරවාලන ප්‍රතිපත්ති මාර්ගයක් ඒ බුදුපියාණෝ දෙසූ සේක. මෙවන් මාර්ගයක් දෙසූ උන්වහන්සේ ප්‍රතිපත්ති පූජාවෙන් පිදීමට ඒකාන්තයෙන්ම සුදුසු වන බැවින් අරහත් නම් වන සේක.

---

* මෙවන් දුක් සසර පුරා විඳ ඇති බව හා ඉදිරියටත් විඳීමට සිදුවන බව අවබෝධ කර ගන්න. දුක්ඛ සත්‍යය දකින්න. එය නැති කරන මාර්ගය වඩන්න.

5. තවද ඒ බුදුරජාණන් වහන්සේ සත්ත්වයා ලෝභ දෝෂ මෝහ ආදී කාන්තාර වලින් එතර කරවාලන සේක. වාලුකා කාන්තාරයක් මැද, ගහක් කොළක් නැති ගිනිගත් අව්වේ, රත් වූ යකඩයක් සේ දැවෙනා වැල්ලේ, පිපාසයට වතුර බිඳක් නැති ව, සිසිලට සෙවණක් නැති ව, පරතෙරයක් නො පෙනී එහිම මහත් වූ දුකකට බඳුන් වූ සත්ත්වයකු සේ, මේ ලෝකයා ලෝභයෙන් දැවෙන්නේ ය. කිසි දිනක ඇතිවීමක් නො ලබා වෙහෙසෙමින්, දුක් විඳිමින්, ඒ ලෝභය නිසා ම සතර අපායේ වැටී අපාදුක් විඳිමින් සිටිනා මේ ලෝක සත්ත්වයාට සසර දුකින් ගැලවීමක් නැත්තේ මේ ලෝභය නිසා ම ය. ඒ ලෝභ කාන්තාරයෙන් සත්වයා එතර කරවාලන ප්‍රතිපත්ති මාර්ගයක් බුදුපියාණෝ දෙසූ සේක.

මෙසේම දෙවශය නිසා ද සත්වයා මෙලොවත් දැවෙන්නේ ය. පරලොවත් දැවෙන්නේ ය. කයත් දැවි දැවී, සිතත් දැවි දැවී දුක් විඳින්නේ ය. ඒ ද්‍වෙශය නිසාම යක්ෂයන් ප්‍රේතයන්, තිරිසනුන්, නිරිසතුන් බවට පත්වෙමින් කල්ප ගණන් නිරාදුක් විඳින්නේ ය.

මෙසේම අති භයානක සංසාරය මී වදයක් සේ සිතමින්- ඒ සසරෙහි රැඳී සිටුවාලන සංස්කාරම රැස් කරමින්- සැබෑ වූ නිත්‍ය වූ සැපය නො දැන,- ඒ සැපය ලබනා මාර්ගය ද නො දැන,- දැවි දැවී නැවත නැවතත් ගිනි සිළුවකට පතිනා පළඟැටියකු සේ මෝහයෙන් අන්ධව, මුළාවෙන් වල්මත්ව, අවිද්‍යාවෙන් වැසී සිටිනා සත්ත්වයා මෝහ නැමැති කාන්තාරයෙන් එතර කරවාලන මාර්ගයක් ඒ බුදුපියාණෝ දෙසූ සේක.

එසේම 1500 ක් පමණ වූ කෙලෙස් ගිනි නැවත නූපදිනා ලෙසම නිවා දමනා මාර්ගයක් උන්වහන්සේ පෙන්වා දුන් සේක.

මෙසේ ලෝභ - දෝෂ - මෝහ - ඊර්ෂ්‍යා - මද - පමාද - මාන - අතිමාන ආදී 1500 ක් පමණ කෙලෙස් ගිනි නිවා දමන, ඒ කෙලෙස් නිසා ම සසරින් එතරවිය නො හැකි ව සංයෝජන වලින් බැඳී දුක් විඳිනා සත්ත්වයා සසරින් එතර කරවාලන, අමා මහ නිවන්සුව පොවා සතපවන එවන් ප්‍රතිපත්ති මාර්ගයක් පෙන්වා දුන් බුද්ධ රත්නය ඒකාන්තයෙන් ම ප්‍රතිපත්ති පූජාවෙන් පිදීමට සුදුසු වන සේක. එබැවින්ම අරහත් නම් ද වන සේක.

6. තවද ඒ බුදුපියාණන් වහන්සේ දේශනා කොට වදාළ ධර්මය අනුගමනය කරන අය මනා හික්මීමකට පත් වන්නේ ය.

උන්වහන්සේගේ ධර්මය අවබෝධ කර ගැනීමෙන් හික්මුණු තැනැත්තා හික්මුණා ම ය. නැවත කිසි දිනක නො හික්මුණු තැනැත්තකු බවට පත් නො වන්නේ ය. ශාන්ත- දාන්ත භාවයට පත් වන්නේ ය. කයින් හෝ සිතින් හෝ වචනයෙන් හෝ කිසිදු වරදක් නො කරන පිරිසිදු කාය කර්ම, පිරිසිදු වචී කර්ම, පිරිසිදු මනෝ කර්ම ඇත්තකු බවට පත් වන්නේ ය. එසේම ඒ ප්‍රතිපත්ති මාර්ගය අනුගමනය කරන්නා ගරු කටයුතු අයකු බවට ද පත් වන්නේ ය. අඩු වශයෙන් පන්සිල් හෝ හොඳින් ආරක්ෂා කරන්නාට දෙවියෝ පවා සැලකිලි දක්වති. ඊට උසස් අට සිල්, දස සිල් වැනි ශීලයක පිහිටි උපාසක- උපාසිකාවන්ට ද ගරු සැලකිලි වැඳුම් පිඳුම් ලැබෙන්නේ ය. එදාම පැවිදි වූ සාමණේර දස ශීලයක පිහිටි සාමණේර කෙනකුට පවා දෙමාපියන් වුව ද වඳින්නේ ය. එසේ වන්නේ ඒ ප්‍රතිපත්ති මාර්ගයේ ඇති ගරු ගාම්භීර භාවය නිසා ය.

මෙසේ සත්ත්වයා අකුශලින් මුදවා හික්මවා, පිරිසිදු ශීලවන්තයකු බවට-පිරිසිදු ජීවිතයක් ගත කරන්නකු බවට - ගරුකළ යුතු සැලකිය යුතු කෙනකු බවට පත් කරවාලනු ලබන ප්‍රතිපත්ති මාර්ගයක් උන්වහන්සේ අපට පෙන්වා දුන් සේක. එවන් හික්මීමක් ලැබීමට නම්, එවන් ශාන්ත- දාන්ත භාවයක් ලැබීමට නම්, එවන් ශීලවන්ත පාරිසුද්ධත්වයෙන් පිරිපුන් ජීවිතයක් ලැබීමට නම්, ඒ ප්‍රතිපත්ති මාර්ගය අනුගමනය කරමින්, ඒ බුදු රජාණන් වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පිදිය යුතු වන්නේ ය. ඒ ප්‍රතිපත්ති පූජා ලැබීමට උන්වහන්සේ ඒ නිසාම ඒකාන්තයෙන්ම සුදුසු වන සේක. එබැවින්ම අරහත් නම් ද වන සේක.

7. තවද ඒ බුදු පියාණන් වහන්සේ දේශනා කොට වදාළ ප්‍රතිපත්ති මාර්ගය කුරා- කුහුඹුවකුටවත් කරදරයක් නො වන ඉතාමත්ම අහිංසක අවිහිංසාවාදී එකකි. වෙනත් ලබ්ධිකයන් සතුන් මවා ඇත්තේ මිනිසුන්ගේ ප්‍රයෝජනයට යැයි කියා සතුන්ගේ බෙලි කපත් දී, මගේ බුදුපියාණන් වහන්සේ අනුගමනය කරන්නෝ කුරා- කුහුඹුවකු දු නො මරන්නෝ ය.

වෙනත් ශාස්තෘවරුන් තමනුත් මුළා වී, අනුනුත් මුළා කොට, සංසාරයේම රැඳී ශ්‍රාවකයන් දුකින් දුකට ම පත් කරවත් දී, මගේ බුදුපියාණෝ කුරා කුහුඹුවකුටවත් හිංසාවක් නො කොට උන් වහන්සේ

අවබෝධ කරගත් නිවන් සුව සැමටම ලබා දී සත්ත්වයා සසර දුකින් මුදාලන සේක. මෙසේ හෙයින් ද උන්වහන්සේ ප්‍රතිපත්ති පූජාවන්ට සුදුසු වන සේක.

8. තවද ඒ ප්‍රතිපත්ති මාර්ගය අනුගමනය කිරීමෙන් කිසිදිනක පසු තැවීමක් ඇති නො වන්නේ ය. "අනේ මා කළේ වරදක්, මට සිදුවුනේ අයහපතක්" කියා කීමට ඒ ප්‍රතිපත්ති අනුගමනය කරන්නකුට කිසිදාක සිදු නො වන්නේ ය. ඒ ප්‍රතිපත්ති අනුගමනය කරන්නෝ මෙලොවත් සතුටු වෙති. පරලොවත් සතුටු වෙති. නිවන් සුව ලබා සදාකාලිකවම සතුටු වෙති. මෙම නිසා ද ඒ ප්‍රතිපත්ති පූරණය කරමින් උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පිදිය යුතු වන්නේ ය.

9. මෙසේම ඒ ප්‍රතිපත්ති මාර්ගය සර්වඥතාඥානයේ පිහිටා සිට දේශනා කොට ඇති බැවින් ද, ඒ ප්‍රතිපත්ති අනුගමනය කරමින් උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පූජා කිරීමට වටනේ ය. බුදු පියාණෝ සර්වඥතාඥානයෙන් සියල්ල දත් සේක. උන්වහන්සේ අතීතයේ සිදු වූ සියල්ල දත් සේක. අනාගතයේ සිදුවන සියල්ල ද දත් සේක. මෙසේම වර්තමානයේ සිදුවන සියල්ල ද දත් සේක. උන්වහන්සේ කුශල් වලින් යහපත් විපාක අතීතයේ ලැබී ඇති බව ප්‍රත්‍යක්ෂ වශයෙන් ම දත් සේක. එසේම අනාගතයේ දී ද කුශල් වලින් යහපත් ප්‍රතිඵල ලැබෙන බව ද ප්‍රත්‍යක්ෂව ම දත් සේක. එසේම අකුශල් වලින් අයහපත් විපාක ලැබූ බව ද ලැබෙන බව ද ප්‍රත්‍යක්ෂව ම අවබෝධ කොට වදාළ සේක. මෙසේම නිවන් දැකිය යුතු මාර්ගය ද ප්‍රත්‍යක්ෂව ම දත් සේක. මෙසේ උන්වහන්සේ යම් ප්‍රතිපත්ති මාර්ගයක් දේශනා කෙළේ නම්, එය දේශනා කෙළේ අතීතයේ දී මෙන් ම අනාගතයේ දී ද ඉන් ලැබෙන ප්‍රතිඵල ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන ගෙන ම ය. උන්වහන්සේ විසින් අනුමානයෙන්, සිතට සිතුන පළියට දේශනා කළ කිසිවක් නැත. එසේම ඒ දේශනා කළ දෑ කිසිදාක වරදින්නේ ද නැත.

දිනක් බුදු පියාණන් වහන්සේ මෙසේ දේශනා කළ සේක.

**අභිඤ්ඤායාහං භික්ඛවේ ධම්මං දේසේමි, නො අනභිඤ්ඤාය, සනිදානාහං භික්ඛවේ ධම්මං දේසේමි, නො අනිදානං- සප්පාටිහාරියාහං භික්ඛවේ ධම්මං දේසේමි, නොඅප්පාටිහාරියං තස්ස**

මය්හං භික්ඛවේ අභිඤ්ඤාය ධම්මං දේසයතෝ නො අනභිඤ්ඤාය, සනිදානං ධම්මං දේසයතෝ නො අනිදානං, සප්පාටිහාරියං ධම්මං දේසයතෝ නො අප්පාටිහාරියං, කරණීයෝ ඕවාදෝ, කරණීයා අනුසාසනී අලඤ්ච පන වෝ භික්ඛවේ තුට්ඨියා, අලං අත්තමනතාය, අලං සෝමනස්සාය "සම්මා සම්බුද්ධෝ භගවා, ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ, සුපටිපන්නෝ සඞ්ඝෝ"ති

ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානේ සහස්සී ලෝකධාතු අකම්පිත්ථාති (අංගුත්තර නිකාය)

"මහණෙනි, මම ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන ගෙනම ධර්මය දේශනා කරමි. එසේ නො දැන, දේශනා නො කරමි. හේතු සහිතවම දේශනා කරමි. හේතු රහිතව දේශනා නො කරමි. මෙම ප්‍රතිපත්තීන්ට විරුද්ධ අදහස් බිඳ හෙලීමට සමත්කම ඇතිවම දේශනා කරමි, එසේ නො මැතිව දේශනා නො කරමි. මෙසේ ප්‍රත්‍යක්ෂ වශයෙන්ම දැනගෙන ම, හේතු සහිතව ම, විරුද්ධවාදී අදහස් බිඳ හෙලීමේ සමත්කම් ඇතිව ම, මා ධර්මය දේශනා කරන විට, මහණෙනි, ඔබලාට භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධ ය, ධර්මය ඒකාන්තයෙන්ම ස්වාක්ඛාත ය, සංඝරත්නය ඒකාන්තයෙන්ම සුපටිපන්න ය කියා සතුටු විය හැකි ය." මෙසේ දේශනා කරන විට, ඒ සර්වඥතාඥානය තහවුරු කෙරෙන දේශනය උසුලා සිටීමට අසමත් වූ 10000ක් සක්වළ කම්පිත විය.

මෙසේ සියල්ල නිවැරැදි ලෙසින් ම දැන ගෙන ම, කිසිදු වැරැදීමක් නොමැතිව, ඒකාන්තයෙන් ම යහපතක් සිදුවන ඒ ප්‍රතිපත්ති මාර්ගය දේශනා කළ බුදු පියාණන් වහන්සේට, කිසිදු සැකයකින් තොරව ඒ ප්‍රතිපත්ති අනුගමනය කරමින් ප්‍රතිපත්ති පූජාවන්ගෙන් පූජා කිරීමට වටනේ ය. එසේ හෙයින් එවන් පූජාවන්ට සුදුසු උන්වහන්සේ අරහත් නම් වන සේක.

10. තවද උන්වහන්සේ දේශනා කොට වදාළ ධර්මය ස්වාක්ඛාත ගුණයෙන් යුක්ත වූ නිසා ද, ඒ ප්‍රතිපත්ති පිළිපදිමින් උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවන් ගෙන් පිදිය යුතු වන්නේ ය.

ඒ ස්වාක්ඛාත ධර්මය මුල- මැද- අග යන සැම තැන ම යහපත් ය. ඒ ධර්මය පරම සත්‍යය වන්නේ ය. ඒ ධර්මයේ කිසිදු අඩු පාඩුවක් නැත. මේ මේ දේ අඩු ය කියා කීමට කිසිවක් නැත. මේ මේ දේ

වැඩියි කියා අස්කර දැමීමට කිසිවක් ද ඒ ධර්මයේ නැත. මේ කාලයට මේවා ගැළපෙන්නේ නැහැ කියා බැහැර කළ යුතු දෙයක් ද එහි නැත. උන්වහන්සේ දේශනා කළ ධර්මයේ 'එසේ නො වෙයි මෙසේ විය යුතු යැ' යි කියා කිසිම දෙවියකුට - බ්‍රහ්මයකුට - මාරයකුට හෝ වෙනත් කිසිවකුට කරුණු සහිතව කිව හැකි කිසිවක් නැත. ඒ ධර්මයේ කිසි තැනක වැරැදීමක් ද නැත. අවුරුදු 45 ක් තුළ දේශනා කළ ඒ ධර්මයේ, අවුරුදු ගණනකට හෝ පෙර දෙසූ මේ ධර්මයට දැන් දේශනා කරන ධර්මය සැසඳෙන්නේ ගැළපෙන්නේ නැහැ කියා කියන්නට කිසිවක් නැත. උන්වහන්සේ යමක් දේශනා කළ සේක් නම්, එය ඒ ආකාරයෙන් ම වන්නේ ය. වෙනත් ආකාරයකින් නො වන්නේ ය. මේ ධර්මය බොරු යැයි කිසි ම දෙවියකුට- බ්‍රහ්මයකුට- මාරයකුට හෝ වෙනත් කිසිවකුට හෝ ඔප්පු කළ නො හැකි ය. මේ ආදී කරුණු ඒ ධර්මයේ ඇති ස්වාක්ඛාත ගුණය යි. ඒ ධර්මයේ ඇති ස්වාක්ඛාත ගුණය නිසා ම වුව ද, උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පිදිය යුතු වන්නේ ය.

එසේම ඒ ධර්මය සන්දිට්ඨික ගුණයෙන් ද යුක්ත ය. වෙනත් ආගම්වල ඇති ස්වර්ගය වැනි දේවල්, කෙනකු ගේ මරණයෙන් පසුව ලැබෙනවා යැයි සිතා සිටිනා සිතුවිලි පමණි. මගේ බුදුපියාණන් වහන්සේ අවබෝධ කළ නිර්වාණය, කවුරුන් හෝ කියන පළියට නොව, නිකම් සැකයට හිතාගෙන නොව, තමන්ට ම, මේ ජීවිතයේදී ම, මරණයට පත්වීමට පෙර දී ම, පාරමී පිරී ඇත්නම් අවබෝධ කරගත හැකි වන්නේ ය. මේ ආදී ඒ ධර්මයේ ඇති සන්දිට්ඨික ගුණය නිසාම ඒ ප්‍රතිපත්ති පූජාවෙන් උන්වහන්සේට පිදීමට වටනේ ය.

එසේම ඒ ධර්මයේ ඇති අකාලික ගුණය නිසා ද උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පිදීමට සුදුසු ය. වෙනත් කුශල් අකුශල් වල විපාක ලැබෙන්නේ ඒ කුශල් අකුශල් කර කාලයක් ගත වූ පසුව ය. සමහර විට කල්ප ගණනකට පසුව ය. බුදු පියාණන් වහන්සේ අවබෝධ කරගත් නිර්වාණය දක්නා සෝවාන් ආදී මාර්ග කුශලයන්ගේ විපාකය හෙවත් ඵල සිත ඒ ජීවිතයේ දී ම ලැබෙන්නේ ය. ඒ විපාකය ලැබූ කෙනකුට අවශ්‍ය නම්, පුරුදු වූවාට පසුව ඕනෑ ම වේලාවක නිවන් සුව විඳිමින් සිටිය හැකි වන්නේ ය. මේ ධර්මයේ ඇති අකාලික ගුණය ය. එසේ මේ ජීවිතයේ දී ම ඕනෑම වේලාවක ඒ විපාක සිත් උපදවාගෙන කැමැති තාක් වේලා ඵල සමවත් සුව විඳීමට හැකිවන

ධර්මයක් දෙසූ උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පිදීමට සුදුසු ය.

තවද ඒ ධර්මයේ ඇති ඒහිපස්සික ගුණය නිසා ද, ඒ ප්‍රතිපත්ති පූරණය කිරීමට වටනේ ය. අතේ තබාගෙන සිටිනා දෙයක් කෙනකුට අත දිගහැර පෙන්වන්නාක් මෙන්, 'මේ නිවන දෙස මෙහි පැමිණ බලන්න' කියා කීමට තරම් ඒ නිර්වාණ ධාතුව ඒකාන්ත වශයෙන්ම ඇත්තේ ය. ඒ තරම් සත්‍ය වශයෙන් පවත්නා නිර්වාණය ද, එය ලැබීමට පිළිපැදිය යුතු මාර්ගය ද දෙසූ බුදුපියාණන්ට එබැවින්ම ඒ ප්‍රතිපත්ති පූජාවෙන් පිදීමට සුදුසු ය.

තවද ඒ ධර්මය ඕපනයික ගුණයෙන් ද සමාන්නාගත ය. වෙනත් වැඩ සියල්ල අතහැර දමා හෝ, හිස ගිනිගත් මොහොතක හෝ, ගිනි ඇවිලගත් ගෙයක් මැද සිට හෝ, ඉන් මිදීමට උත්සාහ නො කොට නිර්වාණය අවබෝධ කර ගැනීම සඳහාම උත්සාහ කිරීම සුදුසු ය. මොනම කරදරයක් පැමිණියත්, මොනම බාධකයක් පැමිණියත්, මොන දුකක් විඳගෙන හෝ ජීවිතය පරිත්‍යාග කරමින් හෝ නිවන් අවබෝධ කර ගැනීමට කටයුතු කිරීම වටනේ ය. මෙය ධර්මයේ ඇති ඕපනයික ගුණය ය. මෙසේ කළ යුත්තේ අප මෙතෙක් සංසාරයේ විඳි දුක් වැනි ම වූ අනාගත දුක් නැති කර දැමීම සඳහා ය. මේ සංසාරයේ අප විඳි දුක් සිතාගැනීමට වත් නො හැකි තරම් ය. බුදුපියාණන් වහන්සේට ඇසිපිල්ලක් ගැසීමට පෙර, කල්ප සිය ගණන් එපිට හෝ අපි ඉපැදී සිටිය හැටි බැලිය හැකි ය. කල්පයක් කියන්නේ කෙතරම් නම් දීර්ඝ කාලයක් ද? ඇසිපිල්ලක් ගැසීමට පෙර කල්ප 100 ගණන් එහා අප ඉපැදී සිටි හැටි කීමට සමත් බුදුපියාණන් වහන්සේට, පැයක් තිස්සේ සිතුවොත් කොපමණ ඈත ඇති අපේ අතීත භවයන් පෙනේ ද? එසේ දවසක් මුළුල්ලේ සිතුවොත්? දවසක් නොව මාසයක් සිතුවොත්? අවුරුද්දක් සිතුවොත්? අවුරුද්දක් නොව මුළු ජීවිත කාලය තුළ දී ම බුදුපියාණන් වහන්සේ කෙනකුගේ අතීත භව ගැන බැලුවත්, ඇසිපිල්ලක් ගැසීමට පෙර කල්ප 100 ගණන් වුව ඈත පෙනෙනා බුදුරදුන්ගේ ජීවිතය ගෙවී යන්නේ ය. එහෙත් අපගේ අතීත භව තවත් එහාට ඇත්තේ ය. අප කොපමණ නම් කාලයක් සංසාරයේ රැඳී සිටිනවා ද කියා සිතාගන්නවත් හැකි ද? මේ කාලය තුළ අපි විඳි දුක් කෙතෙක් ද? ඌරන් බල්ලන් හරකුන් වැනි තිරිසන් සතුන් වී අප අතීත සංසාරයේ කොපමණ නම් දුක් විඳ ඇත් ද? යක්ෂයන් භූතයන් ප්‍රේතයන් වී කොපමණ නම් දුක් විඳ ඇත් ද? අපායවල වැටී සිටි

කාලය, එහි විඳි දුක් කෙතෙක් ද? මේ ආදී සිතාගැනීමට පවා නො හැකි තරම් මහා දුක් විඳිනා ලද අප, අනාගතයේ දී ඇති වන එවන් දුක් වැළකීම සඳහා හිස ගිනිගෙන දැවෙත් දී වුවත්, නිවන් දැක්මට කටයුතු කළ යුතු නො වේ ද? අපේ සංසාර ගමනේ දී අපගේ හිස ගිනි ගත් වාර ම අසංඛ්‍ය ගණන් වන්නේ ය. ගිනිගත් ගෙවල් මැද කරවුන වාර ද අසංඛ්‍ය ගණන් වන්නේ ය. අප නිවන් අවබෝධ කර ගත්තේ නැත්නම්, අනාගතයේ දී කොපමණ නම් කාලයක් සංසාර දුක් විඳින්න සිදුවේ ද? මේ තරම් භයානක දුක් ජාලාවක් නිවා දැමීම සඳහා හිස ගිනිගන්නා තබා වෙන කවර නම් දෙයක් සිදුවුවත්, ඒ සියල්ල අමතක කර දා හෝ නිවන් දැක්මට කටයුතු කළ යුතු නේද? එසේ කටයුතු කළ යුතු බව ධර්මයේ ඇති ඕපනයික ගුණය ය. එවැනි ඕපනයික ගුණයෙන් යුක්ත වූ ධර්මයක් දේශනා කළ බුදුපියාණන් වහන්සේට අපේ ජීවිත පරිත්‍යාගයෙන් වුව ද ප්‍රතිපත්ති පූජාවෙන් පිදීමට අගනේ ය.

තවද ඒ ධර්මය පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි ගුණයෙන් ද සමන්නාගත ය. තමන් තමන් ම තමාගේ ම නුවණින් ඒ නිර්වාණය දැකිය යුතු වන්නේ ය. එය ධර්මයේ ඇති පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි ගුණය යි.

**තුම්හේහි කිච්චං ආතප්පං**

අක්ඛාතාරො තථාගතා - මේ බුදු වදනින් උන්වහන්සේ අපට පෙන්වා දුන්නේ 'ඔබ ඔබලා ම නිවන් දැක්ම සඳහා කටයුතු කළ යුතු වන්නේ ය. තථාගතවරු මාර්ගය පමණක් පෙන්වන්නාහ.' යන්න ය. එසේ අප අපම උත්සාහ කොට අවබෝධ කර ගත යුතු නිර්වාණය දැක්මට සීල සමාධි ප්‍රඥා ත්‍රිශික්ෂාව පූරණය කිරීම සඳහා උත්සාහ කටයුතු නොවේ ද? එය බුදුරජාණන් වහන්සේට කරනු ලබන ප්‍රතිපත්ති පූජාවක් වන්නේ ය. එවන් ප්‍රතිපත්ති පූජාවන්ට උන්වහන්සේ සුදුසු වන බැවින් උන්වහන්සේ අරහත් නම් වන සේක.

11. තවද ඒ ධර්මානුධර්ම ප්‍රතිපත්ති මාලාව අනුගමනය කිරීමෙන් මහත් සැනසිල්ලක් ලැබෙන බැවින් ද, බුදුරජාණන් වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පූජා කිරීමට සුදුසු වන්නේ ය.

අඩුම වශයෙන් සෝවාන් වූ අයකුට පවා ඇති වන සැනසිල්ල කොපමණ ද? අනන්ත අප්‍රමාණ කාලයක් තිස්සේ සතර අපාවල

වැටෙමින් දුක් විඳ විඳ පැමිණ, දැන් අපායෙන් මිදී සිටිමියි කියා සිතෙන විට කොපමණ නම් සැනසිල්ලක් සිතට දැනේ ද? අපමණ කාලයක් සසර දුක් විඳිමින් පැමිණ, දැන් නැවත ඉපැදීමට ඇත්තේ වැඩිම වුවහොත් හත් වරක් පමණයි කියා සිතෙන විට කෙතරම් නම් සහනයක් ද? නැවත කිසිදිනක අපායට යන පව් සිදුවන්නේ නැහැ, එසේම අතීතයේ කර ඇති අනන්ත අප්‍රමාණ අපායගාමී අකුශල කර්ම දැන් අහෝසියි කියා සිතෙන විට කොයිතරම් නම් ශාන්තියක් ද?

මෙසේම 'මම' 'මගේ' කියා අල්ලාගත් කිසිවක් දැන් 'මම' 'මගේ' කියා ගන්නේ නැහැ. කවරදාවත් ම තෙරුවන් කෙරෙහි සැකයක් ඇති වන්නේ නැහැ. කිසිදිනක සදාකාලික සැප සොයන්නය කියා මේ භාවනා මාර්ගය හැර වෙනත් මාර්ගයක් අනුගමනය කරන්නේ නැහැ. දිට්ඨිය කියන අකුශලය සහමුලින් නැසුවා. විචිකිච්ඡාව කියන අකුශලයත් සසර කවරදාවත් ම නැවත නූපදින පරිදි ම නසා දැමුවා. යනා දී ලෙසින් සිතට දැනෙනවිට සෝවාන් වූ අයකුට කොයිතරම් නම් සිතට සැහැල්ලුවක් ද?

පෘථග්ජන භාවයෙන් මිදී, ආර්ය භාවයට පත්වුණා කියා සිතට දැනෙන විට කෙතරම් නම් සැනසිල්ලක් ද?

**"පඨව්‍යා ඒකරජ්ජේන- සග්ගස්ස ගමනේන වා**

**සබ්බලොකාධිපච්චේන- සොතාපත්ති ඵලං වරං"**

මුළු ලෝකයට ම රජවනවාටත් වඩා, දිව්‍යලෝක ස්වර්ග සම්පත් ලබනවාටත් වඩා, මුළු ලෝකයට ම අධිපතිකම් කරවනාටත් වඩා සෝවාන් ඵලය උසස් ලෙසින් බුදුපියාණන් වදාළ, ඒ උතුම් ධර්මය මා ලබාගෙනයි සිටින්නේ කියා සිතට දැනෙන විට කොයිතරම් නම් සතුටක් ද?

නැවත කිසිදිනක මිථ්‍යා දෘෂ්ටි කුලයක උපදින්නේ නැහැ. නැවත කිසි දිනක දැන් සිටිනා තත්ත්වයට පහත් හීන දීන කුලයක උපදින්නේ නැහැ. ක්‍රමයෙන් වඩ වඩා යස ඉසුරු සැප සම්පත් ඇති තැන්වලමයි නැවත උපදින්නේ. බ්‍රහ්ම ලෝකයකට ගියොත් නැවත කිසිදිනක මේ ලෝකයට එන්නේ නැහැ යනාදී ලෙසින් සිතට දැනෙන විට හිතට කෙතරම් නම් සහනයක් ද?

දවසින් දවස, මාසයෙන් මාසය, අවුරුද්දෙන් අවුරුද්ද ගුණ ධර්ම තව තවත් වැඩෙනවා, ශීලය දවසින් දවස වැඩෙනවා. සමාධිය

දවසින් දවස වැඩෙනවා, ප්‍රඥාව දවසින් දවස වැඩෙනවා, නිවන් ලැබීම සඳහා වැඩිය යුතු බෝධිපාක්ෂික ධර්ම 37 වැඩෙමින් දිනෙන් දින, මසින් මස, වසරෙන් වසර, ජාතියෙන් ජාතිය දියුණුවෙමින් ස්ථිරභාවයට පත්වනවා කියා දැනෙනවිට කොයිතරම් නම් ශාන්තියක් ද? සුවයක් ද? සැනසිල්ලක් ද?

දවසින් දවස රහත්වීම කරා කිට්ටුවනවා, ඇත්වීමක් කවදාවත් ම සිදුවන්නේ නැහැ කියා දැනෙන විට කොයිතරම් නම් සතුටක් ද? අවබෝධ කරගත් නිර්වාණ ධාතුව කිසිදිනක නැතිවන්නේ නැහැ. මොනම මාරයකුටවත්, මොනම බ්‍රහ්මයකුටවත්, මොනම දෙවියකුටවත්, මොනම යක්ෂයකුටවත්, වෙනත් මොනම සමතකුටවත් ඒ අවබෝධ කරගත් නිර්වාණය නැතිකරන්න බැහැ. රහත්වීම කරා දවසින් දවස ළංවන එක නතර කරන්න වසවර්ති මාරයාටවත් බැහැ. මාරග්‍රහණයෙන් දැන් මිදිලා. මේ ආදී ලෙසින් සිතට දැනෙන විට කෙතරම් නම් නිර්භයක් ද? සුඛයක් ද?

මෙතෙක් කල් ආශාවට යට වී සසරේ පැමිණියා, මීට පසුව ආශාවට අධිපතිකම් කරන්න, හපන්කම් කරන්න, ලොකුකම් පෙන්වන්න ලැබෙන්නේ නැහැ. නිවනම අධිපතිකම් කරමින් ඉදිරියට එනවා කියා සිතට දැනෙන විට කොයිතරම් නම් සැනසිල්ලක් ද?

මීට පසුව සසර දිග් ගැසෙනා කුශල් හෝ අපාගාමී අකුශල් සිදු වන්නේ නැහැ. සියලුම කුශල් නිවන් සුව ලබාදීම සඳහා ම වූ විවට්ටගාමී කුශල් වනවා කියා සිතෙන විට ඇති වන සතුට කොපමණ ද?

සෝවාන් වීමේ දී නැති කළ කෙළෙස් නැවත කවරදාවත් ම ඇති වන්නේ නැහැ. ඒවා නැතිකර දැමීමට දැන් කරන්න දෙයක් ඇත්තෙත් නැහැ. ලබාගත් නිර්වාණ ධාතුව කිසිදිනෙක නැවත නැති නො වන බැවින් එය රැකගැනීමට කළ යුතු කිසිවකුත් නැහැ. ඒ ලබාගත් නිර්වාණයේ කවරදාවත් ම ගෙවීමක් දිරීමක් බිඳීමක් අඩුවීමකුත් නැහැ. ඒ ලබාගත් සුවය සදාකාලික යි. මේ ජීවිතයේ දී ඉතිරි මාර්ග ඵල නො ලැබුණත්, දැන් බියවන්න දෙයක් නැහැ. මේ ආදී ලෙසින් දැනෙනා විට කොයිතරම් නම් සිතට සහනයක් ද?

මෙසේම ඕනෑම වේලාවක අවබෝධ කර ගත් නිවන දෙස බලමින්, ඕනෑම අවස්ථාවක නිවන් සුව විඳිමින් සිටිනා විට කොයිතරම් නම් සිතට ශාන්තියක් ද? කොයිතරම් නම් සිසිලක් ද? සියලුම දැඟලිලි

බැඟිලිලි නැති, සියලුම හැප්පිලි ගැස්සිලි නැති, සියලුම නැටිලි පැනිලි නැති, සියලුම සංස්කාර සමනය කළ, සියලුම කෙළෙස් නැති, ඒ ශාන්ත අමා මහ නිවන් සුව විඳිනා විට, "ඒ නිවන ශාන්තය. ඒ නිවන ප්‍රණීතය" කියා සිතට මතුවෙවී එත් දී, ඒ නිවන් සුවේ ගැලී සිටිනා විට කොයිතරම් නම් ශාන්තියක් ද? සමනය වූ, ව්‍යුපසමනය වූ, නිසල වූ, ශීතිභූත වූ, සනසන පිනවන සතපවන, කාය දරථ- චිත්ත දරථ- කාය පරිලාහ- චිත්ත පරිලාහ,- කාය සන්තාප,- චිත්ත සන්තාප නිවා සිසිල් කරවාලන, අසමසම සුවයක, අසමසම සුඛයක කිඳා බස්සවාලන, සිසිල් ජලයෙන් - සිසිල් පවනින් කය හා සිත තෙමාලන, ශාන්ත ඉමිහිරි සුඛයක ගැලී සිටිනා ඔහුට දැනෙනා සුවය කෙතෙක් ද?

කෙළෙස් වලින් කරනා ඇවිලි පිච්චිලි ගිනිගැනිලි වලින් හදවත නිවා දමා, සියලු සසර දුක් නිවා දමා, සියලුම සංස්කාර වලින් ඈත්ව, සිතට සර්ව සම්පූර්ණ විවේකයක් ලබා දී, නිවන් සුවේ ගැලී සිත සනසවන විට, සිත ශාන්තවත් කරන විට, සිත ප්‍රණීතවත් කරන විට, සිත සිසිල් කරවාලන විට කොයිතරම් නම් සැනසිල්ලක් ද?

මේ තරම් සැනසිල්ලක් ලබාදෙන නිවන කොයිතරම් ශාන්තද- ඒ නිවන පෙන්වා දුන් බුදුපියාණන් වහන්සේ ඒකාන්තයෙන් ම සම්මා සම්බුද්ධයි නේ ද- ඒ ධර්මය ඒකාන්තයෙන් ම ස්වාක්ඛාතයි නේද- අෂ්ටාර්ය පුග්ගල සඞ්ඝරත්නය ඒකාන්තයෙන් ම සුපටිපන්නයි නේ ද යනාදී ලෙසින් ත්‍රිවිධ රත්නයේ අනන්ත ගුණ හදවතින් ප්‍රත්‍යක්ෂ වශයෙන් ම දැනී, ඒ බුදුපියාණන් වහන්සේට ජීවිතය පුද කරන, ඒ බුදුරජාණන් වහන්සේගේ ගුණ තුළින් ශ්‍රද්ධා කඳුළු වගුරුවන, ඒ බුදුරජාණන් වහන්සේ කෙරෙහි මහත් ප්‍රසාදයක් ඇති කරවන අති මහත් ශ්‍රද්ධාවක් ජනිත වන විට සිතට කොයිතරම් නම් සැනසිල්ලක් ද?

මේ ආදී ලෙසින් සෝවාන් වූ පුද්ගලයකුට මේ තරම් නම් සැනසිල්ලක් ලැබෙන විට, සකදාගාමි - අනාගාමී - අරහත් වූ කෙනකුට කොපමණ නම් සැනසිල්ලක් ඇතිවේ ද?

මේ තරම් සහනයක් ලබා දෙන ඒ සහනදායකයාණන් වහන්සේට, මේ තරම් සැනසිල්ලක් ලබා දෙන ඒ නිර්වාණදායකයාණන් වහන්සේට, මේ තරම් ශාන්තියක් ලබා දෙන ඒ ශාන්තිනායකයාණන් වහන්සේට, මේ තරම් විමුක්තියක් ලබාදෙන ඒ විමුක්තිදායක සුගත

තථාගත සම්මා සම්බුද්ධ රත්නයට ඒ ප්‍රතිපත්ති පූජාවෙන් පිදිය යුතුම නේ ද? එවන් පූජාවන්ට ඒකාන්තයෙන්ම සුදුසු ඒ විමුක්තිදායකයාණෝ එබැවින්ම අරහත් නම් වන සේක.

12. තවද මෙවන් නිවන් සුවයක් ලෝකයාට ලබාදීම සඳහා ම අප වෙනුවෙන් අපමණ දුක් ගැහැට විඳිමින් ඒ බෝසතාණෝ පාරමී පිරුවේ ලෝක සත්ත්වයා කෙරෙහි පතළ ඒ මහා කරුණාව නිසා ම ය. ඒ මහා කරුණාවට ණය ගෙවීමට හෝ ඒ ප්‍රතිපත්ති පූරණය කරමින් උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පූජා කළ යුතු වන්නේ ය.

මගේ බෝසතාණන් වහන්සේ 20 අසංඛ්‍ය කල්ප ලක්ෂයකට උඩ දී "මම බුදුවී අසරණ ලෝක සත්ත්වයා සසර දුකින් මුදවාලමි" යි යන මහා කරුණාවෙන් පාරමී පුරා, නියත විවරණ ලත් දා සිට, ඇස් ගලව ගලවා දන් දෙමින්, ලේ වගුරුව වගුරුවා දන් දෙමින්, මස් කප කපා දන් දෙමින්, හිස් ගලව ගලවා දන් දෙමින්, අඹුදරුවන් දෙඅත් අල්ලා බැඳ බැඳ දන් දෙමින් පාරමිතා පිරුවේ, උපපාරමිතා පිරුවේ, ජීවිතය පරිත්‍යාග කරමින් පරමාර්ථ පාරමිතා පිරුවේ අපේ සසර දුක් නැති කර දැමීමට අපට පිහිටවීමේ මහත් කරුණාව නිසා ම නේ ද?

අද ලෝකයේ කවුරු නම් වෙනත් කෙනකුට යහපතක් කිරීම සඳහා තමාගේ ශරීරයේ ඇස් ගලවා දන් දෙයි ද- මස් කපා දන් දෙයි ද- ලේ දන් දෙයි ද- හිස් ගලවා දන් දෙයි ද- ඉතා ප්‍රිය අඹුදරුවන් දන් දෙයි ද - දන් දෙනවා තබා එහෙම සිතක්වත් සිතයි ද? "දුල්ලභො බුද්ධුප්පාදො ලොකස්මිං" බුදු කෙනකු ගේ පහළවීම ඉතා දුර්ලභ ම ය. ඒ එසේම ය.

මේ තරම් මහා කරුණාවෙන් පාරමී පිරූ බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ දානමාන ආදී ආමිෂ පූජාවට වඩා උන්වහන්සේට කරන ප්‍රතිපත්ති පූජාව උසස් බව ය. උන්වහන්සේ මෙසේ වදාළ සේක: "මහණෙනි, ශ්‍රාවකයන් කෙරෙහි කරුණාවෙන්, ශ්‍රාවකයන් කෙරෙහි අනුකම්පාවෙන් යම් ශාස්තෘවරයකු විසින් යමක් කළ යුතු වේ නම්, මා ඒ සියලු දේ තොප වෙනුවෙන් කොට ඇත. මේ රුක්ඛ මූල ඇත. මේ ශූන්‍යාගාර ඇත. මේ ආරණ්‍යයන් ඇත. ඒවාට වී භාවනා කරවු. ප්‍රමාද වී පසුව පසුතැවිලි නො වවු, ඒ මාගේ තොපට කරනු ලබන අනුශාසනය ය." බුදුපියාණෝ එසේ දේශනා කෙළේ කොයිතරම් නම් කරුණාවෙන් ද?

අප කෙරෙහිම කරුණාවෙන් මෙසේ පාරමී පිරූ, අප කෙරෙහිම කරුණාවෙන් මෙසේ දහම් දෙසූ බුදුපියාණන් වහන්සේට කෙතරම් නම් ප්‍රතිපත්ති පූජාවෙන් පූජා කළ යුතු ද?

එදා උන්වහන්සේ පිරිනිවන් මංචකයේ වැඩ සිටිත් දී, 10000ක් සක්වළින් පැමිණි දෙවියන් බ්‍රහ්මයන් දොළොස් යොදුනක් (සැතපුම් 192) පුරා, මුළු අහස ම වැසී යන සේ ඉඳිකටු තුඩු තරම් සියුම් වෙස් මවා ගෙන ජීවමාන බුදුරජාණන් වහන්සේට අවසාන බුද්ධ පූජා පවත්වන විට බුදුරජාණන් වහන්සේ ආනන්ද තෙරුන්ට මෙසේ වදාළ සේක.

"ආනන්දය, දොළොස් යොදුනක් පුරා, ඉතා සියුම් වෙස් මවා ගෙන මේ තරම් විශාල මහේශාඛ්‍ය දෙවියන් බ්‍රහ්මයන් මට මෙසේ දිව්‍යමය පූජා පැවැත් වුවත්, ආනන්දය, මට ගරු කළා වන්නේ, මෙවැනි ආමිෂ පූජාවෙන් පූජා කිරීමෙන් නොව ප්‍රතිපත්ති පූජාවෙන් පූජා කිරීමෙනි."

"නහි මයහං මාලා ගන්ධාදීහි පූජං කරොන්තා මම පූජානං කරොන්ති නාම. ධම්මානුධම්මං පටිපජ්ජන්තා පන මං පූජෙන්ති නාම."

ඒ අන්තිම අවස්ථාවේ දී පවා මහා කරුණික බුදුපියාණන් වහන්සේ අපට පෙන්වා දුන්නේ සීල- සමාධි- ප්‍රඥා ආදී ප්‍රතිපත්ති පූරණය කළ යුතු බව ය.

මරණයට ඉතා ආසන්නව සිටින දයාබර මවකු, මරණින් පසු තමා දිව්‍යලෝකයට ගෙන යාමට දිව්‍ය රථ ගෙනවුත් තිබෙනවා දැක දැක, සිය දූ දරුවන්ට මහත් කරුණාවෙන් අවසාන වශයෙන් කථා කරන්නා සේ ඒ බුදුපියාණන් වහන්සේ, ඒ බුදු මැණියන් වහන්සේ එදා පිරිනිවන් මංචකයේ දී අප කෙරෙහි මහා කරුණාවෙන් අවසාන ශ්‍රී බුද්ධ වචනය මෙසේ දේශනා කොට වදාළ සේක.

"හන්දානි භික්ඛවෙ ආමන්තයාමි වො, වයධම්මා සඞ්ඛාරා, අප්පමාදෙන සම්පාදෙථ"

"මහණෙනි, මම තොපට අවසාන වශයෙන් අමතමි. සියලු සංස්කාරයෝ නැසෙන සුලු ය. ප්‍රමාද නොවී නිවන් සම්පාදනය කරවු."

මේ මහා කාරුණික බුද්ධ වචනයන් පිට කළ ඒ මාගේ බුදු පියාණෝ එදා අවසන් වරට දෙනෙත් පියමින් පිරිනිවන් පා වදාළ සේක.

එකෙණෙහි ම ඒ මහා උතුමාණන්ගේ, ඒ මහා ගුණස්කන්ධයේ අභාවය දරා සිටීමට නො හැකි වූ මේ මහා පෘථිවිය හඬා වැළපෙමින් බිම වැටෙන්නා සේ කම්පාවෙමින් සැලෙන්නට විය. මේ 10000ක් සක්වළ වෙව්ලමින් කම්පිත වෙමින් සැලෙන්නට විය. අහසෙහි අකාලයේ විදුලි කොටන්නට විය. අකුණු සැර පුපුරන්නට විය. දෙතිස් පූර්ව නිමිති පහළ විය. මේ තරම් ගුණස්කන්ධයක් ඇති ඒ බුදුපියාණන් වහන්සේ පවා පිරිනිවන් පා වදාළ සේක. සියලු සත්ත්වයාම මරණයට පත්වන්නේ ය. අපට ද ඒ මරණය නියත ය. මරණයෙන් ගැළවීමක් නැත්තේ ය. සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ ය.

මෙසේ අප කෙරෙහි මහත් කරුණාවෙන් ඒ බුදු පියාණන් වහන්සේ අපට පෙන්වා දුන් ප්‍රතිපත්ති මාර්ගය අනුගමනය කරමින් අප උන්වහන්සේට ප්‍රතිපත්ති පූජාවෙන් පූජා කළ යුතු ම නේ ද? මෙවන් ප්‍රතිපත්ති පූජාවන් පිළිගැනීමට සුදුසු ඒ මහා කාරුණිකයාණෝ එබැවින්ම අරහත් නම් ද වන සේක. අරහත් නම් ද වන සේක. අරහත් නම් ද වන සේක.

මෙවැනි අරහත් ගුණ ඇති, වෙනත් අනන්ත ගුණයන් ගෙන් සමන්නාගත වූ, ඒ සම්මා සම්බුද්ධ රත්නයට මේ ජීවිතය ද පූජා කරමි, පූජා කරමි, පූජා කරමි. පූජා වේවා, පූජා වේවා, පූජා වේවා. එසේ ම ශ්‍රී සද්ධම්ම රත්නයට ද මේ ජීවිතය පූජා කරමි. අෂ්ටාර්ය පුග්ගල සඞ්ඝරත්නයට ද මේ ජීවිතය පූරා කරමි. පූජා වේවා, පූජා වේවා, පූජා වේවා.

මේ මාගේ ජීවිතය ගියත් සික පදයක් කඩ නො කරමි. සියලු පාපයෙන් වළකිමි. කය සංවර කර ගනිමි. වචනය සංවර කර ගනිමි. සිත සංවර කර ගනිමි. මොන කරදර බාධක පීඩන මධ්‍යයේ වුව ජීවිත පරිත්‍යාගයෙන් ශීල සමාධි ප්‍රඥා යන ධම්මානුධම්ම ප්‍රතිපත්තියේ යෙදෙමි. මෙවන් ප්‍රතිපත්ති පූජාවෙන් ඒ මාගේ බුදුපියාණන් වහන්සේට පූජා කරමි, පූජා කරමි, පූජා කරමි. පූජා වේවා, පූජා වේවා, පූජා වේවා.

"ඉමාය ධම්මානුධම්ම පටිපත්තියා බුද්ධං පූජෙමි".....

# සියලු කෙළෙසුන් කෙරෙන් දුරුවීම

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ සියලු කෙලශයන් ගෙන් දුරු වූ බැවින් ද අරහත් නම් වන සේක. උන්වහන්සේ ලෝභයෙන් දුරු වූ සේක. දෝෂයෙන් දුරු වූ සේක. මෝහයෙන් දුරු වූ සේක. මානයෙන්- දිටඨියෙන්- විචිකිච්ඡාවෙන්- ථීන මිද්ධයෙන්- උද්ධච්ච කුක්කුච්චයෙන් දුරු වූ සේක. 1500ක් පමණ වූ සියලු කෙලෙස් වලින් දුරු වූ සේක.

වෙනත් රහතන් වහන්සේලාට කෙලෙස් දුරු කළත් පෙර පැවැති ගති පැවතුම් එසේ ම පවතින බැවින්, දකින අයකුට උන්වහන්සේලා රහත් වී ඇත්දැයි කියා කීමට පවා නො හැකි ය. බුදුපියාණන් වහන්සේ ඒ කියන වාසනා ගුණය ද නැති කෙරෙමින් සියලු කෙලෙසුන් නැසූ සේක. එබැවින් උන්වහන්සේ දෙවියන් බ්‍රහ්මයන් මාරයන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත සියලු ලෝකයා ඉදිරියේ "මම සියලු කෙලෙස්වලින් දුරු වී සිටිමි" යි ඉතා නිර්භීතව ප්‍රකාශ කිරීමට තරම් වූ විශාරද නුවණකින් ද සමන්නාගත වූ සේක.

1. ඒ සම්මා සම්බුද්ධ රත්නයට උන්වහන්සේ සතු දේවල් ගැන ලෝභයක් නැත. බාහිර දේවල් ගැන ලෝභයක් නැත. අතීත දේවල් ගැන ලෝභයක් නැත. අනාගත දේවල් ගැන ලෝභයක් නැත. වර්තමාන දේවල් ගැන ද ලෝභයක් නැත. ලක්ෂ කෝටි ගණන් වටිනා චීවර පිණ්ඩපාත සේනාසන ආදී සිවුපසය ලැබුව ද, සත්ත්වයා කෙරෙහි කරුණාවෙන්, දෙන අයට පින් සිදු කරවා දීමේ අදහසින් ඒවා කිසිම ලෝභකමක් නො මැතිව පරිභෝග කළ සේක.

උන්වහන්සේගේ ශ්‍රාවක භාවයට පත් වූ අනන්ත අප්‍රමාණ දෙවියන් බ්‍රහ්මයන් හා ලක්ෂ කෝටි ගණන් සඟ පිරිස් කෙරෙහි කිසි ම ඇලීමක් නො මැතිව ඒ පිරිස් මැද උන්වහන්සේ කඟවේණ අඟක් සේ එකලාවම වැඩ සිටි සේක. උන්වහන්සේගේම පුත් රාහුල තෙරුන් වහන්සේට කියා හෝ උන්වහන්සේ තුළ කිසිදු විශේෂ ළැදියාවක් නො වීය. උන්වහන්සේට තම පුත් රාහුල තෙරුන් හා තමන්වහන්සේ මැරීමට නාලාගිරි ඇතුන් මෙහෙය වූ, හිසට ගල් පෙරලූ, දුනුවායන් යෙද වූ දෙව්දත් අතර කිසිදු වෙනසක් නො වීය.

උන්වහන්සේ හමුවට පැමිණෙන කිසිම රූපයකට උන්වහන්සේගේ ඇලීමක් නැත. අනාගාමී නොවූ ඕනෑම අයකු කාමයෙන් මූර්ඡා කිරීමට තරම් සමත් තණ්හා, රතී, රගා දුටු විට, ඔවුන් උන්වහන්සේට පෙණුනේ අසූචි වළක එහාට මෙහාට ගමන් කරනා පණුවන් ලෙසිනි. උන්වහන්සේ වෙත ගලා ආ ලාභ ගැන, ලක්ෂ කෝටි ගණන් වඳිමින් පුදමින් දිනපතා කරනු ලබන ස්තුති- ප්‍රශංසා ගැන උන්වහන්සේට ඇල්මක් නැත. "බෝමැඩ දී පිරිසිඳ දැනගත් මේ පංචස්කන්ධයට සත්ත්වයෝ ගරු බුහුමන් දක්වති" යි තමන්වහන්සේ සිතනා බව උන්වහන්සේ දිනක් වදාළහ. සැවැත් නුවර පමණක් 5 කෝටියක් මාර්ග - ඵල ලාභීහු එවකට උන්වහන්සේට දිනපතා පූජා කළහ. උන්වහන්සේගේ කීර්තිය 10000ක් සක්වළ පුරා ඉතිරි පැතිරී යත් දී උන්වහන්සේට ඒ පිළිබඳව කිසිම උද්දාමයක් ඇති නො වීය.

උන්වහන්සේ අවබෝධ කරගත් ශාන්ත නිර්වාණ සුවය, ධ්‍යාන සමාපත්ති සුඛය, නිරෝධ සමාපත්ති සුඛය ගැන වුව ද නිකාන්තියක් ඇලීමක් උන්වහන්සේට නො වීය.

උන්වහන්සේගේ ශ්‍රී බුද්ධ ශරීරය, දකින්නන් වශී කරවන, කියා නිමකළ නො හැකි සේ රූමත්, දෙවියන් බ්‍රහ්මයන්ගේ පවා රූප ශෝභාව යටපත් කරවන, දෙතිස් මහා පුරිස ලක්ෂණයෙන් හෙබි, සවණක් ඝන රැසින් බැබළුණු, රන් පිළිමයක් බඳු ඒ බුද්ධ ශරීරය උන්වහන්සේ සැලකුවේ දෙතිස් කුණප කොටසක් ලෙසිනි; දෙතිස් මහා පුරිස ලක්ෂණ ඇතුළේ දෙතිස් මහා කුණප කොට්ඨාශ ගැබ් වී ඇති ලෙසිනි. වක්කලී ස්වාමීන් වහන්සේ උන්වහන්සේගේ ඒ රූමත් ශ්‍රී බුද්ධ ශරීරය දෙස බලා සිටින විට, "මේ කුණප රාශිය දෙස බලා සිටීමෙන් කවර නම් අර්ථයක් දැයි" උන්වහන්සේ වදාළ සේක.

උන්වහන්සේට කිසිම බාහිර ශබ්දයකට ඇල්මක් නැත. ලොව ඇති ඉතාමත්ම මිහිරි, ඇසුවන් වශී කරවන ඒ කර්ණරසායන මධුර මනෝහර උන්වහන්සේගේ බ්‍රහ්ම ස්වරයට වුව ද ඇල්මක් උන්වහන්සේට නො වීය. මෙසේම කිසිම ගන්ධයක් ගැන, කිසිම රසක් ගැන උන්වහන්සේට ඇලීමක් නො වීය. උන්වහන්සේට ලැබුණු රාජ භෝජන ද, දුගීන්ගේ පිළිකුල් නීරස ආහාර ද කිසි වෙනසක් නො මැතිව සම සිතින් උන්වහන්සේ වැළඳූ සේක. ඉතා සුඛෝපභෝගී සෙනසුන් පරිභෝග කිරීමේ දී ශරීරයට දැණුන කිසිම ස්පර්ශයකට ඇල්මක් උන්වහන්සේට නැත. උන්වහන්සේගේ ඒ

අසමසම ඥානවලට, සියල්ල දන්නා සර්වඥතාඥානයට, උන්වහන්සේ අවබෝධ කරගත් කියා නිම කළ නො හැකි තරම් විශාල හා ගැඹුරු වූ ශ්‍රී සද්ධර්ම රත්නයට උන්වහන්සේට ඇල්මක් නො වීය.

අනිත්‍ය වූ, දුක්ඛ වූ, අනාත්ම වූ සංස්කාරයන් අනිත්‍ය- දුක්ඛ- අනාත්ම ලෙසින් ම මැනවින් අවබෝධ කරගත්, නාම- රූපයන් ම ක්ෂණයක් පාසා ඇතිවෙමින් නැතිවෙමින් යන හැටි අවබෝධ කරගත් උන්වහන්සේට කවර නම් ලෝභයක් ඇති වේද? මෙසේ 108 ආකාරයකින් වැඩෙනා ලෝභය කිසිදිනක නැවත නූපදින පරිදි සම්පූර්ණයෙන් සිඳලූ බැවින් ඒ භාග්‍යවත් අරහත් තුන් ලෝකාග්‍ර සම්මා සම්බුද්ධ රත්නය ඒකාන්තයෙන්ම අරහත් නම් වන සේක.

2. මෙසේම උන්වහන්සේ දෝෂය සිඳලූ බැවින් ද අරහත් නම් වන සේක. කිසිම රූපයකට, කිසිම ශබ්දයකට, කිසිම ගන්ධයකට, කිසිම රසයකට, ශරීරයට දැනෙනා කිසිම ස්පර්ශයකට, සිතට දැනෙනා කිසිම ධර්ම කරුණකට උන්වහන්සේ තුළ කිසිදා දෝෂයක් පහළ නො වීය. මොනම කැත පිළිකුල් දේ දුටුවත්, මොනම නින්දා වචන ඇසුවත්, මොන තරම් දුගඳක් දැනුණත්, මොනම නීරස දෙයක් දිවට දැනුණත්, ශරීරයට මොන තරම් කටුක වේදනාවක් දැනුණත්, උන්වහන්සේ දෝෂයක් තබා අමනාපයක්, නො සතුටක්, අප්‍රිය බවක් නො කැමැත්තක් පවා ඇති නො කර ගත් සේක.

එදා චිංචමානවිකාව බොරුවට දරු ගැබක් සේ බඩ බැඳගෙන සිවුවණක් පිරිස් මැද නින්දා පරිභව කරත් දී "ඒකාන්ත නිකෙලෙස් මා වැන්නකුටත් මෙසේ කියනවා නේ ද?" කියන සිතුවිල්ලක් පවා උන්වහන්සේ ඇති නො කර ගත් සේක. මාගන්ධිය සතියක් පුරා ඉතා නින්දිත අන්දමින් බුදුරදුන්ට පමණක් නොව සඞ්ඝරත්නයට ද කළ මහා පරිභවයන් ගැන ද උන්වහන්සේ තුළ නො සතුටක් පහළ නො වීය. සුන්දරී නම් ගණිකාව මරා, ජේතවනාරාමය අසල වළ දා ගොඩගෙන, නගරය පුරා ගෙන යමින්, බුදුරදුන්ට තීර්ථකයන් විසින් දොස් තබන විට දී ද, උන්වහන්සේ ඒ මහා උපේක්ෂා ගුණයෙන්ම වැඩ සිටි සේක.

වේරංජාවේ දී මාස 3 ක් යවහාල් වැළඳීමට සිදු වූ විට පවා, "මුහුදේ ලේ පරදවමින් කෙතරම් නම් මා ජීවිත පරිත්‍යාග කළා ද- පොළොවේ පස් වලට වඩා මස් දන් දෙමින් කොපමණ ජීවිත

පරිත්‍යාග කළා ද- අහසේ තරු වලට වඩා ඇස් ගලවා දන් දුන් වාර කොපමණ ද- හදවත් උපුට උපුටා- මස් ලිය ලියා- ලේ වගුරුව වගුරුවා දන් දුන් ප්‍රමාණයත් අසංඛ්‍ය ගණන් නේ ද- ඉතා ප්‍රිය අඹුදරුවන් ඔවුන්ගේ කඳුළු පිරි දෙනෙත් දකිමින් ම බැඳ දන් දුන් වැල් පටවල් එකතු කළොත් එය මහාමේරු පර්වතයටත් වඩා වැඩි නේ ද- මා දන් දුන් දාන වස්තු එකතු කළහොත් ඒවා තැබීමට මේ මුළු විශ්මයමත් ඉඩ මදි නේ ද- එසේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා දාන පාරමිතාව පිරූ, ජීවිතයේ අඟපසඟ දෙමින් දාන උපපාරමිතාව පිරූ- ජීවිතය දන් දෙමින් දාන පරමාර්ථ පාරමිතාව පිරූ මටත්, මෙසේ යවහාල් මාස 3ක් වැළඳීමට සිදුවුණා නේ ද" යන සිතිවිල්ලක්වත් උන්වහන්සේට ඇති නො වීය.

උන්වහන්සේට කිසිදාක කිසිම හිස්, නිරර්ථක, නිසරු සිතිවිල්ලක් පහළ වන්නේ නැත.

උන්වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත් වූවාට පසුව නොව ඊට පෙර බෝසත් භූමියේ දී පවා කෙසේ නම් දෝෂයක් ඇති නො කර ගෙන සිටි සේක් ද? ශාන්තිවාදී තාපසව වැඩ සිටින විට, කස පහර දෙත් දී, කන් නාස් කපත් දී, වැගිරෙන ලේ පෙනි පෙනී උන්වහන්සේ තරහක් ඇති නො කර ගත් සේක. උන්වහන්සේගේ අත් පා කපත් දී, ශරීරයෙන් වෙන්ව ගිය අත් පා දෙස බලමින්, 'තවමත් මා ක්ෂාන්තිවාදී' යැයි කියූ ඒ බෝසත් උතුමාණෝ කළේ සාමාන්‍ය කෙනකුට කිරීමට පවා හිතීමටවත් හැකි දෙයක් ද? අත්පා සිඳ දමා, ලේ විලක් මැද ඉතා දුක සේ සිටිනා විට, පපුවට පයින් පහරක් දුන් පසු පවා "මට මෙසේ කළ මේ රජතුමාට ශාන්තියක් වේවා, දිගුකල් ජීවත් වේවා" යැයි කී ඒ බෝසත් වචන කෙතරම් නම් ශ්‍රේෂ්ඨ ද?

චූලධම්මපාල කුමාරව ඉපැද, තමා ගේ අත්පා සිඳ බෙල්ල කැපීමට අණ කරන පිය රජු දෙසත්, විලාප නගනා මහා කරුණාබර මව දෙසත්, කඩුව අමෝරා සිටිනා වධකයා දෙසත් බලා, ඒ තිදෙනාට ම එක සේ මෛත්‍රිය දැක් වූ බෝසත් උතුමාණන්ගේ ගුණය කෙසේ නම් සිතන්න ද?

අසංඛ්‍ය ගණන් ජාතිවල දී එවන් පාරමී පුරමින් පැමිණි උන්වහන්සේට දෝෂය සම්පූර්ණයෙන් නැවත නො ඉපදෙනා ලෙස නැති කිරීමට තරම් සමත් වූ පාරමී පුණ්‍ය ශක්තියක් තිබිණ.

විඳින්නෙක් නැති, කරවන්නෙක් නැති, ඊශ්වර භාවයක් නැති, ස්වාමිත්වයක් නැති, අනාත්ම වූ නාමරූපයන් ම, පටිච්ච සමුප්පන්න අන්දමින් ක්ෂණයක් ක්ෂණයක් පාසා බිඳි බිඳී යාම හැර, පංචස්කන්ධය තුළ සුවදුක් විඳින්නකු නැති බව, 'මමකු' නැති බව සර්වප්‍රකාරයෙන් අවබෝධ කරගත් උන්වහන්සේට දෝෂයක් ඇති වීමට ඉඩක් නැත. "නාම රූපයෝ ම හේතු ඵලයන්ට අනුරූපව බිඳි බිඳී යෙත්. එහි ලා කවර නො සතුටක් ද?" කවර අමනාපයක් ද? කවර දෝෂයක් ද?

මෙසේ ඒ සම්මා සම්බුද්ධ රත්නය දෝෂය ද නැවත කිසිදිනක නූපදිනා අයුරින් ම දුරු කළ බැවින් අරහත් නම් වන සේක.

3. මෙසේම උන්වහන්සේ මෝහය සිඳලූ බැවින් ද අරහත් නම් වන සේක.

උන්වහන්සේ අනිත්‍ය දේ අනිත්‍ය ලෙසින්ම දුටු සේක. කිසිම සංස්කාරයන් නිත්‍ය ලෙසින් නුදුටු සේක. අනිත්‍ය දේ නිත්‍ය ලෙසින් ගන්නා 'අනිච්චෙ නිච්ච සඤ්ඤා චිත්ත විපල්ලාස, දිට්ඨි විපල්ලාස හා සඤ්ඤා විපල්ලාස' සහමුලින්ම සිඳලූ සේක.

දුක්ඛ දේ දුක් ලෙසින්ම දුටු සේක. කිසිම සංස්කාරයක් සුඛ වශයෙන් නුදුටු සේක. දුක් දේ සැප ලෙසින් ගන්නා චිත්ත - දිට්ඨි - සඤ්ඤා විපල්ලාසයන් උන්වහන්සේට නැත. උන්වහන්සේ අනාත්ම දේ අනාත්ම ලෙසින්ම දුටු සේක. කිසිම ධර්මයක් ආත්ම ලෙසින් නුදුටු සේක- අනාත්මයේ ආත්මයක් ඇතැ යි ගන්නා සඤ්ඤා - චිත්ත - දිට්ඨි විපල්ලාස ද දුරු කළ සේක.

උන්වහන්සේ රූප අරූප බ්‍රහ්ම ලෝක හා දිව්‍ය ලෝක ඇතුළු මුළු සංස්කාර ලෝකයම දුකක් වශයෙන් ම දත් සේක. මෙම සංස්කාරයන්ගේ පැවැත්ම ම දුකක් වශයෙන් දත් සේක. එම සංස්කාරයන්ගේ නො පැවැත්ම නම් වූ ශාන්ත පදය පරම සුවය වශයෙන් අවබෝධ කර ගත් සේක.

මෙම දුක තේරුම් නො ගෙන සසරේ රැඳී සිටීමට ඇලුම් කරවන, භයානක සංසාරයේ මහත් වූ දුක් උපදවන අවිද්‍යාව හා අත්වැල් බැඳගත් ආශාව, දුක් ඉපැදීමේ හේතුව වශයෙන් සර්වප්‍රකාරයෙන් ම දුටු සේක.

මෙසේම ඒ දුකෙහි සර්ව සම්පූර්ණ නිරෝධය වූ නිර්වාණය අවබෝධ කර ගත් සේක. ඒ නිවන් අවබෝධ කිරීම සඳහා වැඩිය යුතු

මාර්ගය ද අවබෝධ කළ සේක.

මෙසේ උන්වහන්සේ දුකත්, දුක ඉපැදීමේ හේතුවත්, දුක නැතිකිරීමත්, දුක නැතිකරන මාර්ගයත් යන චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීමෙන් අවිද්‍යාව සම්පූර්ණයෙන්ම සිඳලූ සේක.

ජීවී අජීවී සෑම රූපස්කන්ධයක්ම සෑම මොහොතක් පාසාම බිඳි බිඳී යන්නේ ය. ඇසිපිල්ලක් ගැසීමට යන කාලයටත් වඩා අඩු කාලයකට පෙර තිබූ රූප, ඇසිපිල්ල ගසා නිම වන විට, නැවත නූපදින ලෙසම සම්පූර්ණයෙන්ම නිරොධයට පත් වේ. මෙම රූපස්කන්ධය ඇසුරු කොට හෝ නො කොට පවත්නා නාමස්කන්ධය ද, රූපයටත් පෙරම නිරුද්ධ වන්නේ ය. මෙම මොහොතේ පවත්නා 'මම' යැයි ගනු ලබන මෙම පංචස්කන්ධය, මොහොතක් ගත වූ විට සම්පූර්ණයෙන්ම නැවත නූපදින ලෙසින් ම නිරුද්ධ වේ. එවිට 'මමයා' ද සම්පූර්ණයෙන්ම නිරුද්ධ වේ. විනාශ භාවයට පත් වේ. ඊළඟ ක්ෂණයේ දී සිදු වන්නේ ද මෙලෙස ම ය. මෙම ක්ෂණයේ සිටිනවා යැයි සැලකෙන 'මමයා' ඊළඟ ක්ෂණය වන විට සම්පූර්ණයෙන් නිරෝධයට පත් වේ. මෙම යථා තත්ත්වය නො දැක නැති 'මමයෙක්' ඇති 'මමකු' විලස ගනී නම්, ඒ අවිද්‍යාව හැර අන් කවරක් ද?

'මමයා' ඇති කල අවිද්‍යාව ඇත. අවිද්‍යාව ඇති කල, සංස්කාර ඇත. අවිද්‍යාව හා මමයා ඇති කල නැවත ඉපැදීමක් ඇත.

'මමයා' නැතැ යි සම්පූර්ණයෙන්ම ප්‍රත්‍යක්ෂ වශයෙන් ම අවබෝධ කරගත් කල, අස්මිමානය නැත. අස්මිමානය නැති කල, අවිද්‍යාව ද නැත. නැවත ඉපැදීම ද නැත.

වේගයෙන් හමායන සුළඟක් දැක දිගුකර බදා ගැනීමට යන කල, අත් දෙක එක්වීමට පෙර ම එහි පැවැති සුළඟ නැති වේ. එවිට බදා ගනු ලබන්නේ කුමක් ද? මෙසේම ක්ෂණයක් ගතවීමටත් පෙර සම්පූර්ණයෙන්ම නිරෝධයට පත්වන පංචස්කන්ධය කෙසේ නම් උපාදාන වශයෙන් අල්ලා ගන්න ද? කවරක් නම් උපාදාන වශයෙන් අල්ලා ගන්න ද? ක්ෂණයක් පාසා නැවත නූපදින ලෙසින්ම නිරෝධයට පත්වන ජීවි අජීවි සියල්ලම ශූන්‍ය ය. ශූන්‍ය වූ ලෝකය, ශූන්‍ය ලෙසින්ම උන්වහන්සේ ප්‍රත්‍යක්ෂ වශයෙන් ම අවබෝධ කර ගත් සේක.

මේ ආදී වශයෙන් ඒ "ප්‍රඥා සාගරය" මෝහය සම්පූර්ණයෙන්ම සිඳලූ බැවින් ද අරහත් නම් වන සේක.

4. මෙසේම උන්වහන්සේ මානය සම්පූර්ණයෙන්ම දුරු කළ බැවින් ද අරහත් නම් වන සේක.

ලෝකයේ වෙනත් කිසිවකුටත් නැති තරමේ මානය ඇති කර ගත හැකි කරුණු උන්වහන්සේට තිබිණි. ක්ෂත්‍රිය රාජකුමාරයකු ලෙස උත්පත්තිය ලත් උන්වහන්සේ ලෝකයට ජනිත වූයේ 10000ක් ලෝකධාතු කම්පිත කරවමිනි. ලෝකයට ජනිතවන අවස්ථාවේම ගවු ගණන් දිග පළල සතර මහ නිධාන පහළ විය. මුළු පෘථිවියටම අධිපතිකම් කිරීමට හැකි සක්විති රජකම් හැර දමා අභිනිෂ්ක්‍රමණය කෙළේ ද 10000ක් ලෝකධාතු සසල කරවමිනි. බුද්ධත්වයට පත්වන අවස්ථාවේ මහපොළොව දෙසට ශ්‍රී හස්ථය දිගු කරමින් මහ පෘථිවිය කම්පා කරවීමට තරම් උන්වහන්සේ සමත් විය.

බුද්ධත්වයට පත් වූ අවස්ථාවේ අසංඛ්‍ය ගණන් දෙවිවරු හා බ්‍රහ්මවරු උන්වහන්සේට වැඳීමට පිදීමට පැමිණියහ. සහම්පතී මහා බ්‍රහ්මයා උන්වහන්සේට සේසත් ඇල්ලී ය. ශක්‍ර දේවරාජයා උන්වහන්සේට ඇප උපස්ථාන කෙළේ ය. ලක්ෂ කෝටි ප්‍රකෝටි ගණන් පුද පූජා උන්වහන්සේට ලැබිණි. එක් වරක දී පූජා කරන ලද පාපිස්ස පවා මසුරන් ලක්ෂයක් වටිනා එකක් විය. දෙවියන් බ්‍රහ්මයන් මනුෂ්‍යයන් ආදී අසංඛ්‍ය ගණන් සත්ත්වයෝ උන්වහන්සේට ජීවිතය පූජා කිරීමට තරම් භක්තියකින් හා ගෞරවයකින් උන්වහන්සේගේ ආර්ය ශ්‍රාවක භාවයට පත්ව සිටියහ.

අනන්ත පුණ්‍ය භාග්‍යයකින් උන්වහන්සේ සමන්නාගත වූ සේක. අනන්ත වූ ප්‍රඥාවෙන් සමන්නාගත වූ සේක. අනන්ත වූ තේජසින් සමන්නාගත වූ සේක. අනන්ත වූ ගුණ තේජසින්, අනන්ත වූ ශීල තේජසින්, අනන්ත වූ ඥාණ තේජසින්, අනන්ත වූ බුද්ධ තේජසින් සමන්නාගත වූ බුදුපියාණන් වහන්සේ හමුවේ දෙවියන් බ්‍රහ්මයන් පමණක් නොව මාරයා පවා කකියවා යන්නේ ය. මෙසේ ම උන්වහන්සේ අනන්ත වූ ඍද්ධියෙන් ද සමන්නාගත වූ සේක. ඒ ඍද්ධියට කිසිම දෙවියකුට, කිසිම බ්‍රහ්මයකුට, කිසිම මාරයකුට ළංවීමට වත් නො හැකි ය.

මෙසේම උන්වහන්සේ අසමසම රූපකාය සම්පත්තියකින් ද සමන්නාගත වූ සේක. උන්වහන්සේගේ ශීර්ෂය වටා හතර රියනක් පැතිරි ව්‍යාමප්‍රභා නම් වූ රැස් විහිදුවමින්, ශ්‍රී දේහය වටා අසූ රියනක් තැන් පැතිරි අසීති ප්‍රභා නම් වූ රැස් නිරන්තරයෙන් විහිදුවමින්,

ශීර්ෂයෙන් කේතුමාලාවක් බඳු නීල වර්ණ රශ්මීන් අහසට විහිදුවමින්, ඌර්ණ රෝම ධාතුවෙන් ද, දෙතොල් සගල විවෘත කළ විට දන්තධාතුන් වහන්සේලාගෙන් ද විදුලියක් සේ වූ සුදු රැස් විහිදුවමින්, සවණක් බුදුරැස් විහිදුවමින් උන්වහන්සේ ඇවිළ ගත් ගින්නක් සේ ප්‍රභාස්වරව තේජවත්ව බැබළුණ සේක. ඒ බුද්ධ රශ්මීන් හමුවේ, මහා ප්‍රභාස්වර දෙවියන් බ්‍රහ්මයන් හිරු දුටු කදෝපැණියන් මෙන් වන්නේ ය.

තවද උන්වහන්සේ තබන තබන පියවරෙන් පියවරට සිත් පිත් නැති මහා පොළොව වළ ගොඩ වී සමතලා වන්නේ ය. කටු අකුල් ඉවත් වන්නේ ය. සමහරවිට පොළොව පලාගෙන නෙළුම් මල් පැන නඟින්නේ ය. උන්වහන්සේ පා තැබූ ස්ථානයට පවා දෙවියන් මනුෂ්‍යයන් බ්‍රහ්මයන් ආදී සත්ත්වයෝ පුද පූජා පවත්වති.

උන්වහන්සේගේ ජීවිතයට කිසිම සත්ත්වයකුට කිසිම අනතුරක් කළ නො හැක. උන්වහන්සේ වෙනුවෙන් ම පිළියෙල කළ සිවුපසයට කිසිවකුට අනතුරක් කළ නො හැක. උන්වහන්සේගෙන් කිසිවකුට වැඳුම් පිදුම් සාමීචිකම් ලබා ගත නො හැක. වෙන දෙයක් තබා උන්වහන්සේ ඉපැදුණු දිනයේම, කල්ප 80 ක් අතීතානාගත බැලීමට තරම් ඍද්ධිමත් වූ, දිව්‍යලෝකයට ගොස් එහි ධ්‍යාන සුව විඳ පෑවීියට ඒමට තරම් ඍද්ධි සම්පන්න වූ අසිත කාල දේවල තවුසාගේ ශීර්ෂය මතට ඒ බෝසත් සිරිපතුල් පතිත විය. මෙසේම උන්වහන්සේගේ ශරීරයේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ට කිසිවකුට අනතුරක් කළ නො හැක. උන්වහන්සේගේ ශ්‍රී දේහයෙන් නික්මුණු සවණක් ඝන බුදුරැස් වලට අනතුරක් කළ හැකි කිසිවෙක් මෙම ලෝක ධාතුවේ පමණක් නොව කෝටි ලක්ෂයක් සක්වළවත් නැත. උන්වහන්සේගේ ආඥාව කෝටි ලක්ෂයක් සක්වළ පුරා පැතිර පවත්නේ ය. උන්වහන්සේගේ ශීලයට- සමාධියට- ප්‍රඥාවට- විමුක්තියට- විමුක්ති ඤාණදස්සනයට කිසිවකුට බාධාවක් කළ නො හැක. උන්වහන්සේ තෙවරක් විචාරත්දීත් නිශ්ශබ්දව සිටිය හැකි අයකු ද නැත. උන්වහන්සේගේ ඉදිරියට "මමත් බුදුම්" යැයි කියමින් කිසිවකුට පැමිණිය නො හැක. උන්වහන්සේ විචාරන විට දැන දැන බොරුවක් කිසිවකුට කිව නො හැක. මේවා කළ ඕනෑම අයකුගේ හිස හත් කඩකට පුපුරන්නේ ය; සිය දහස් කඩකට හෝ පුපුරන්නේ ය; බොටුවෙන් ගැලවී බිම හෝ පතිත වන්නේ ය.

ඒ සා විශාල ආඥාවක්, ඒ සා විශාල තේජසක්, ඒ සා විශාල

ආනුභාවයක්, ඒ සා විශාල භාග්‍යයක් තිබිය දී පවා උන්වහන්සේ කිසිදු මානයක් ඇති නො කර ගත් සේක. නිහතමානී භාවයෙන් තුන් ලෝකයෙන් ම අග්‍රව වැඩ සිටි සේක. උන්වහන්සේට වඩා නිහතමානී කිසිවෙක් තුන් ලෝකයේම නැත.

මානය ඇති වන්නේ 'මමෙකු' සිටිනා කල ය. අස්මිමානය දුරු කළ බුදුරජාණන් වහන්සේට කෙසේ නම් මානයක් ඇති වන්නේ ද? අස්මිමානය දුරු කළ කල්හි, 27 ආකාර සියලු මානයෝ දුරු වන්නාහ.

මෙසේ ශාන්ත වූවන් අතුරෙන් අග්‍ර වූ, දාන්ත වූවන් අතුරෙන් අග්‍ර වූ, ශාන්ත- දාන්ත නිහතමානී ගුණයෙන් අග්‍ර වූ, මහා කරුණා-සාගර සම්බුද්ධ රත්නය මානය සම්පූර්ණයෙන් සිඳලූ බැවින් ද අරහත් නම් වන සේක.

5. මෙසේම උන්වහන්සේ දිට්ඨිය සම්පූර්ණයෙන්ම දුරු කළ බැවින් ද අරහත් නම් වන සේක. උන්වහන්සේ 62 ආකාරයක සෑම වැරැදි දෘෂ්ටියක්ම දුරු කළ සේක. සදාකාලිකව පවත්නා ආත්මයක් ඇතැ යි ගන්නා ශාස්වත දෘෂ්ටිය උන්වහන්සේ දුරු කළ සේක. මරණින් මතු සියල්ල නිමයි යන උච්ඡෙද දෘෂ්ටිය උන්වහන්සේ දුරු කළ සේක. මේ පංචස්කන්ධය මම - මගේ ආත්මය යැයි ගන්නා සක්කාය දිට්ඨිය ද දුරු කළ සේක.

අනිත්‍ය දේ නිත්‍ය ලෙසින් ගන්නා දිට්ඨි විපරියාසය, අශුභ දේ ශුභ වශයෙන් ගන්නා දිට්ඨි විපල්ලාසය, දුක්ඛ දේ සැප ලෙසින් ගන්නා දෘෂ්ටි විපල්ලාසය, අනාත්ම දේ ආත්ම ලෙසින් ගන්නා දිට්ඨි විපල්ලාසය යන දෘෂ්ටීන් ද උන්වහන්සේ දුරු කළ සේක.

පංචස්කන්ධ සඞ්ඛ්‍යාත සත්ත්ව ලෝකය, පඨවි- ආපෝ- තෙජෝ- වායෝ- ආකාස- විඤ්ඤාන යන පටිච්ච සමුප්පන්තික ධාතු මාත්‍රයක් ම පමණක් විනා සත්ත්වයකු පුද්ගලයකු නො වන බව, ප්‍රත්‍යක්ෂ වශයෙන්ම සර්වප්‍රකාරයෙන්ම අවබෝධ කර ගත් උන්වහන්සේට කවර නම් සක්කාය දිට්ඨියක් ද? සක්කාය දිට්ඨිය හා අස්මිමානය දුරු කළ විට දෙසැට මිසදුටුම දුරු වන්නේ ය. ගස මුලින් සිඳලූ කළ, එහි ඇති කොළ මල් ගෙඩි ආදිය ගැන කවර කථා ද?

උන්වහන්සේ දෙසැට මිසදිටි දුරු කළ බවට ප්‍රතිඥා කරමින් එදා බ්‍රහ්මජාල සූත්‍රය දේශනා කරන විට, ඒ මහා බුද්ධ වචනයන් දරා සිටීමට අසමත් වූ මහා පෘථිවිය 62 වාරයක්ම කම්පිත විය. මෙසේ

පෘථිවියම කම්පා කරවීමට තරම් මහා තේජවත් වූ, මහා ගුණවත් වූ, මහා ප්‍රඥාවත් වූ, ඒ සම්බුදු පියාණෝ දිටඨිය නැවත නූපදිනා අයුරින් ම සම්පූර්ණයෙන් දුරු කළ බැවින් ද අරහත් නම් වන සේක.

6. මෙසේම උන්වහන්සේ විචිකිච්ඡාව සිඳලූ බැවින් ද අරහත් නම් වන සේක. බුද්ධාදී අට තැන්හි පහළවන සියලුම සැකයන් උන්වහන්සේ නැසූ සේක.

බුද්ධ- ධම්ම- සඞ්ඝ යන ත්‍රිවිධ රත්නය කෙරෙහි උන්වහන්සේට කිසිදු සැකයක් නැත. අතීත භව පිළිබඳව, අනාගත භව පිළිබඳව, අතීතානාගත භව පිළිබඳව උන්වහන්සේට සැකයක් නැත. ශීල සමාධි ප්‍රඥා යන ත්‍රිශික්ෂාව කෙරෙහි ද, මේ සංසාරය පවත්වන හේතුන් වූ පටිච්ච සමුප්පාද ධර්මයන් ගැන ද උන්වහන්සේට සැකයක් පහළ නො වීය. ත්‍රිවිධ රත්නයේ අගය උන්වහන්සේට තරම් වෙනත් කිසිවකුට ඇති වන්නේ නැත. බුද්ධ රත්නයේ අගය තේරුම් ගැනීමට සම්මා සම්බුද්ධත්යට ම පත් විය යුතු ය. උදාහරණ වශයෙන් නඩුකාරයකු වීමට ගත් උත්සාහය, නඩුකාරයකුගේ දැනුම නඩුකාරයකුම දන්නා සේ, දොස්තර කෙනකු වීමේ දී ගත් උත්සාහය, දොස්තර කෙනකුගේ දැනුම ආදිය දොස්තර කෙනකුම දන්නා සේ, සෝවාන් වූ අයකුගේ අගය, සෝවාන් වීමට ගත් උත්සාහය හා දැනුම ආදිය තවත් සෝවාන් වූ අයකුම දන්නේ ය. සෝවාන් වූ අයකු විඳිනා විමුක්ති රසය වෙනත් සෝවාන් වූ අයකුට හැර පෘථජ්ජන අන් කිසිවකුට දත නො හැක. එසේම සකදාගාමි, අනාගාමී, අරහත් වූ අයකුගේ අගය එවැනිම සකදාගාමි අනාගාමි අරහත් වූ කෙනකුම දන්නේ ය. මෙසේම පසේ බුදු කෙනකුන්ගේ අගය සර්වප්‍රකාරයෙන් වැටහෙන්නේ බුදු කෙනකුන්ටම ය. සම්මා සම්බුද්ධත්වයේ අගය, වටිනාකම, සම්මා සම්බුද්ධත්වයට ගත් අසීමිත උත්සාහය, සම්බුදු කෙනකුන්ගේ ප්‍රඥාව හා සම්බුදු කෙනකුන්ගේ අසීමිත ගුණ හරියාකාරවම සම්පූර්ණයෙන්ම දත හැක්කේ තවත් සම්මා සම්බුදු කෙනකුන්ට ම ය. වෙනත් කෙනකුට ඒ විෂය නො වේ.

මගේ බුදුපියාණෝ ඔබ වැනි ම වූ සියලුම සම්මා සම්බුදු රජාණන් වහන්සේලාගේ ගුණයන් සම්පූර්ණයෙන්ම දත් සේක. උන්වහන්සේ පාරමී පූරන කාලය තුළ දී පමණක් සම්බුදුරජාණන් වහන්සේලා

512,027ත් නමක් දැක ඇත. පසේ බුදුපියාණන් වහන්සේලා උන්වහන්සේට පුත්‍රව උපන් අවස්ථා ද බොහෝ ය.

**අහම්පි පුබ්බ බුද්ධේසු - බුද්ධත්තමභිපත්ථයිං**
**මනසායේව හුත්වාන - ධම්මරාජා අසඞ්ඛියා**

අතීතයේ වැඩ සිටි අසංඛ්‍ය ගණන්
බුදුවරයන් හමුවේ, මම ද සිතින්ම
බුදු බව පැතුවෙමි.

(බුද්ධාපදාන පාළි)

අසංඛ්‍ය ගණන් සම්බුදුවරයන් උන්වහන්සේගේ ඥානයට දර්‍ශනය වේ. ඒ සියලු සම්බුදුරදුන්ගේ සියලු ගුණ උන්වහන්සේ සර්‍වඥතාඥානයෙන් දුටු සේක. එබැවින් උන්වහන්සේට බුද්ධ රත්නය ගැන කවර නම් සැකයක් පහළ වේද?

තවද උන්වහන්සේ පරෝපදේශ රහිතව ම, පරම ශාන්ත අති උතුම් ශාන්තපද නිර්වාණ ධාතුව අවබෝධ කළ බැවින් ධම්මරත්නය ගැන උන්වහන්සේට සැකයක් නැත. ධම්මරත්නයේ ස්වාක්ඛාත ගුණය, සන්දිට්ඨික ගුණය, අකාලික ගුණය, ඒහිපස්සික ගුණය, ඕපනයික ගුණය, පච්චත්තං වෙදිතබ්බෝ විඤ්ඤූහි ගුණය ගැන උන්වහන්සේට තරම් වූ ප්‍රත්‍යක්ෂ අවබෝධයක් අන් කිසිවකුටත් නැත. එබැවින් ධම්මරත්නය ගැන කිසිදු සැකයක් උන්වහන්සේට පහළ විය නො හැක.

මෙසේම අෂ්ටාර්ය පුද්ගල සඞ්ඝරත්නයේ ගුණයන් ද උන්වහන්සේට තරම් වෙනත් කිසිවකුට අවබෝධ වන්නේ නැත. අති දීර්ඝ අනමතග්ග සංසාරයේ සතර අපා දුක් සහිත සියලු දුක් මධ්‍යයේ දැවෙමින් පැමිණි පුද්ගලයකු එක් මවකු මළ පසු හැඬූ කඳුළු සාගර ජලයට වඩා වැඩි ය. එක් පියකු වෙනුවෙන්, එක් සහෝදර සහෝදරියක වෙනුවෙන්, එක් අඹුවක වෙනුවෙන්, එක් හිමියකු වෙනුවෙන්, එක් දරුවකු වෙනුවෙන්, මේ එකිනෙකා වෙනුවෙන් හැඬ- කඳුළු වෙන් වෙන්ව සාගර ජලයට වඩා අධික ය. එක් එක් තිරිසනකු වී බෙලි කැපෙත් දී ගිය ලේ එකතු කළහොත් එය ද සාගර ජලය ඉක්මව යි. තිරිසන්ව ඉපිද වාර ගණන පොළොවේ වැලි කැට ගණනටත් අධික ය. සතර අපාවල වැටුණු කාලය ද පොළොවේ වැලි කැට ගණන් ඉක්මව යි. ඒ තරම් අති දීර්ඝ කාලයක් සසර

සැරිසරමින් දුක් විඳිමින් පැමිණි පුද්ගලයා සසරේ කොපමණ නම් දුක් විඳින්න ඇත් ද? එවන් පුද්ගලයකු සෝවාන් වූවාට පසුව නැවත 7 වරකට වඩා නූපදින බව උන්වහන්සේ දන්නා සේක. "මුහුදේ ජලය එක් ජල බිංදුව දක්වා සිඳී ගියහොත්, සෝවාන් වූ පුද්ගලයාට විඳීමට ඇති දුක් ප්‍රමාණය ඒ ජල බිංදුව තරම් ය. නැති කළ දුක් ප්‍රමාණය සාගර ජලය තරම් යැ" යි උන්වහන්සේ දේශනා කළ සේක. මේ සියල්ල දත් බුදුරදුන්ට සෝවාන් වූ භික්ෂුවක ගේ අගය කෙතරම් නම් දුරට වැටහේ ද? ඒ ඒ ආර්යයා නැති කළ කෙලෙස් දන්නා, මෙසේම සකදාගාමි වූ අයකු නැවත දෙවරක් නූපදින බව දන්නා, අනාගාමී අය නැවත මෙම කාමලෝකයට නො එන බව දන්නා උන්වහන්සේට ඔවුන්ගේ කෙලශ පාරිශුද්ධිය මැනවින් අවබෝධ වන්නේ ය. සියලු කෙලෙස් වලින් දුරුවූ, ඒකාන්ත නිකෙලශී භාවයට පත් රහතන් වහන්සේලා සියලු ආශ්‍රවයන් ක්ෂය කළ බව, නැවත නූපදිනා බව, මාරග්‍රහණයෙන් ගැළවුන බව දන්නා, ඒ අෂ්ටාර්ය පුද්ගල සඞ්ඝරත්නයේ සීල- සමාධි- ප්‍රඥා- විමුක්ති- විමුක්ති ඤාණ දස්සන ස්කන්ධයන් ද, උන්වහන්සේලා ගේ අනන්ත අප්‍රමාණ ගුණයන් ද, උන්වහන්සේලා නියම මාර්ගයට පිළිපන් බව, ඍජු මාර්ගයට පිළිපන් බව, නිවන් ලබා දෙන මාර්ගයට පිළිපන් බව, සාමීචිපටිපන්න බව, ආහුනෙය්‍ය- පාහුනෙය්‍ය- දක්ඛිණෙය්‍ය- අඤ්ජලිකරණීය, හා අනුත්තරං පුඤ්ඤක්කෙබත්තං ලොකස්ස බව ආදිය ද, වෙනත් කිසිවකු හෝ නො දන්නා තරමින් දන්නා උන්වහන්සේට සඞ්ඝරත්නය කෙරෙහි ද සැකයක් පහළ වන්නේ නැත.

මෙසේම ශීල සමාධි ප්‍රඥා යන මාර්ගය වැඩීමෙන් ම තමන් වහන්සේ නිර්වාණධාතුව අවබෝධ කර ගත් බව දන්නා උන්වහන්සේ, පෙර සෑම සම්බුදුරජාණන් වහන්සේ නමක්ම, සෑම පසේ බුදුරජාණන් වහන්සේ නමක්ම, සෑම රහතන් වහන්සේ නමක්ම, නිවන් අවබෝධ කළේ, එසේම අනාගතයේ පහළවනු ලබන බුදු පසේබුදු මහරහතන් වහන්සේලාම නිවන් අවබෝධ කරනු ලබන්නේ මෙම ත්‍රි ශික්ෂාව වැඩීමෙන් ම බව දන්නා සේක. එබැවින් ඒ ත්‍රි ශික්ෂාව ගැන ද උන්වහන්සේට සැකයක් ඇති විය නො හැක.

මෙසේම පෙර විසූ ආත්ම භාවයන් බුදුරජාණන් වහන්සේ මැනවින් දන්නා සේක. මහා ශ්‍රාවකයන් කල්ප ලක්ෂයක්, අග්‍ර ශ්‍රාවකයන් කල්ප අසංඛ්‍යයක්, පසේ බුදුරජාණන් වහන්සේලා කල්ප අසංඛ්‍ය දෙකක්

පමණක් පෙර අත් බව් දන්නා නමුත්, ඒ සම්බුද්ධ රත්නයට කල්ප අසංඛ්‍ය අසංඛ්‍ය අසංඛ්‍ය ගණන් ඈත වුව ද පෙර අත්බව් දැකිය හැකි ය. එයට සීමාවක් ඇත්තේ නැත. මේ නමින්, මේ ගෝත්‍රයෙන්, මේ ආහාර ගනිමින්, මේ සුවදුක් විඳිමින්, මෙතෙක් ආයු වළඳමින්, මෙතැන්හි සිට ඉන් චුතව මෙවැනි තැනක ඉපැදුනෙමි යනාදී වශයෙන් පෙර අත් බවයන් දැකීමේ පෙරවිසූ කඳ පිළිවෙළ දන්නා මහා ඥානයෙන් සමන්නාගත වූ උන්වහන්සේට පෙර ආත්ම භාවයන් ගැන ද සැකයක් නැත.

එසේම මතු අනාගත ආත්ම භාවයන් දත හැකි දිබබවකබු ඤාණයෙන් ද උන්වහන්සේ සමන්නාගත වූ සේක. මේ බ්‍රහ්මයන් චුත වී, මේ මේ තැන්වල උපදී. මේ දෙවියන් චුතවී, මේ මේ තැන්වල උපදී. මේ මිනිසුන් මැරී, මේ තිරිසන් සතුන් මැරී, මේ අපායේ සතුන් මැරී මේ මේ තැන්වල උපදී යනාදී ලෙසින් උන්වහන්සේට බැලිය හැකි ය. කල්ප අසංඛ්‍ය ගණනකට පසුව වුව ද මොහු උපදින්නේ මෙසේ යැයි කීමට උන්වහන්සේට හැකි ය. උන්වහන්සේගෙන් නියත විවරණ ලබන අය 'ඔබ මෙපමණ කල්ප අසංඛ්‍ය ගණනක් ගිය විට, මේ නමින් බුදු වේ, මේ නමින් පසේ බුදු වේ; මේ නමින් අග්‍ර ශ්‍රාවක වේ' යනාදී ලෙසින් දේශනා කිරීමට උන්වහන්සේ සමත් ය. අවශ්‍ය නම් එසේ බුද්ධත්වයට පත් වන්නකු, එසේ බුද්ධත්වයට පත්වන තුරු දෙවියන් වන වාර ගණන්, සක්දෙව් රජ භාවය ලබනා වාර ගණන්, බ්‍රහ්මත්වය ලබන වාර ගණන්, සක්විති රජකම් ලබනා වාර ගණන්, රජකම් ලබනා වාර ගණන්, මිනිස්ව ඉපැදෙන වාර ගණන්, ඒ ඒ තිරිසන් සතුන් වී ඉපැදෙන වාර ගණන් යනාදී ලෙසින් දේශනා කිරීමට ද උන්වහන්සේට හැකි ය. මෙසේ අනාගතය දන්නා අනාගතංසේ ඤාණයෙන් සමන්නාගත වූ උන්වහන්සේට අනාගත භව ගැන කවර නම් සැකයක් ද?

එබැවින් ම උන්වහන්සේට අතීතානාගත භව දෙකම ගැන ද සැකයක් පහළ විය නො හැක.

එසේම මේ සත්ත්වයා භයානක සංසාරයේ නැවත නැවත උපදවන ආකාරය දන්නා පටිච්ච සමුප්පාද ධර්මය උන්වහන්සේ මැනවින් අවබෝධ කළ සේක. එබැවින් ඒ පටිච්ච සමුප්පාද ධර්මයන් ගැන ද උන්වහන්සේට සැකයක් නැත.

මෙසේ බුදුපියාණන් වහන්සේ මේ අටතැනෙහි උපදනා සැකයන්

කිසිම සැකයකින් තොරව දුරු කළ හෙයින් උන්වහන්සේ නිසැකයෙන් ම අරහත් නම් වන සේක.

7. තවද ඒ බුදුපියාණන් වහන්සේ ථීන මිද්ධ කෙලශයෙන් දුරු වූ බැවින් ද අරහත් නම් වන සේක.

සිත කය දුබල කරවන, අප්‍රාණික කරවන, සිතට නිදිමත ඇති කරවන, ඇලි මැලි දුබලකම් ඇති කරවන, අප්‍රාණ ගති ඇති කරවන, වැඩක් කිරීමෙහි උද්යෝගය නැති කරන ථීනමිද්ධ නැමැති කෙලශය උන්වහන්සේට කිසි දිනක කිසි විටෙක දී ඇති නො වීය.

උන්වහන්සේගේ අසීමිත, කියා නිම කළ නො හැකි තරම් වූ වීර්යය හමුවේ ථීනමිද්ධය කෙසේ නම් නැඟී සිටී ද? උන්වහන්සේ 20 අසංඛ්‍ය කල්ප ලක්ෂයකට පෙර බුද්ධත්වය පතා ඒ ගත් උත්සාහය, බුද්ධත්වය ලබනා තෙක් ම, ඒ තරම් දීර්ඝ කාලයක් මුළුල්ලේ ම අත් නො හැර, කඩ නො කොට පවත්වා ගෙන පැමිණි සේක. දුෂ්කර ක්‍රියා කරන සමයේ උන්වහන්සේ ගත් උත්සාහය සාමාන්‍ය මිනිසකුට කරනවා තබා හිතීමටවත් නො හැකි ය. එක් මුං ඇටයකින්, එක් තල ඇටයකින්, එක් සහල් ඇටයකින් පමණක් උන්වහන්සේ බොහෝ දිනවල ජීවත් වූ සේක. ජලයේ මතුපිටින් බලනා විට අහස ඉතා ගැඹුරින් පෙනෙන්නා සේ, අතිශයින් දුර්වල වී ගිය උන්වහන්සේගේ ශරීරයේ ඇස් යටට ගොස් පෙනිණ. ඉල ඇට ඉල්පී, හිසෙහි සම ගැලවී වියළී ගොස්, නැගී සිටීමට නො හැකිව සිහි නැතිව ඇද වැටෙමින්, ඇඟ ඇල්ලූ විට කුණු වී ගිය ලෝම දුගඳ හමමින් අතට ගැලවී එත් දී ද උන්වහන්සේ ගත් වීර්යය අත් නො හළ සේක. ගොපළු දරුවන් කන් නාස් වලට ඉරටු ගසත් දී, කෙළ සොටු පස් දමත් දී, එකම පාප සිතක් හෝ ඇති නො කර ගෙන ඒ වීර්යය වැඩූ උන්වහන්සේ, දත් ඇඟි එකිනෙකට තද කර ගෙන හුස්ම ගැනීම පවා නතර කර ගෙන වීර්යය වැඩී ය. එවිට ඇති වූ ඉසිලිය නො හැකි පපුවේ වේදනාව උසුලමින් හුස්ම නො ගෙන සිටිනා විට, කන් සිදුරු වලින් වාතය පිටවන්නට විය. එය ද නතර කළ පසු හිස පැලී යන තරම් වේදනා එත් දී, ශරීරය තියුණු පිහියකින් කපන්නාක් සේ, පොඩි කරන්නාක් සේ වූ දරුණු වේදනා එත් දී, ගින්නෙන් දැවෙන්නාක් මෙන් දාහයෙන් පීඩා එත් දී පවා ඒ ගත් උත්සාහය උන්වහන්සේ අත් නො හළ සේක.

බුදු වනදා උන්වහන්සේ වජ්‍රාසනය මත වැඩ සිටියේ මස් දියැවී

ගියත්, ලේ සිඳී ගියත්, සමත් ඇටත් පමණක් ඉතිරි වුවත්, මිය ගියත් බුද්ධත්වයට නො පැමිණ මෙම ආසනයෙන් නො නැඟිටිමියි යන චතුරංග සමන්නාගත මහත් වූ වීර්යයකිනි. මෙසේ වැඩූ වීර්යයේ අඩුවීමක් පිරිනිවන් පානා තෙක්ම උන්වහන්සේට ඇති නො වීය.

මෙසේම ඕනෑම අවස්ථාවක ඇසිපිය ගැසීමටත් පෙර තේජෝ කසිණ, ආලෝක කසිණ ධ්‍යානයන්ට සමවැදීමේ හැකියාව උන්වහන්සේට ඇත. ගින්නට ජලය දැමූ විගස ඒ ගින්න නිවී යන්නාක් මෙන්, තේජෝ කසිණ, ආලෝක කසිණ ධ්‍යාන ගැන සිතන විටම ථීනමිද්ධය දුරු වේ. පිරිනිවන් පානා තෙක්ම ඒ ධ්‍යානයන්ගේ කිසිම අඩුවීමක් කිසිදාක උන්වහන්සේට ඇති නො වීය.

මෙසේම ථීන මිද්ධය ඇති වන්නේ අකුශල් සිත්වල බැවින්, සියලු අකුශල් සිත් නැවත නූපදින ලෙස දුරු කළ බුදුපියාණන් වහන්සේට ථීන මිද්ධයක් ඇති වීමට ඉඩක් නැත.

මෙසේ අසමසම අතුල්‍ය වීර්යයක් ඇති, අසමසම සුසමාහිත සිතක් ඇති, දුරුකළ අකුශල් සිත් ඇති, ඒ මහා වීර, මහා ප්‍රතාපවත්, මහෝත්තම, මහා පුරිෂ, බුදුපියාණන් වහන්සේට කවර නම් ථීන මිද්ධයක් ඇති වෙයි ද? මෙසේ ථීන මිද්ධය දුරු කළ බැවින් ද උන්වහන්සේ අරහත් නම් වන සේක.

8. මෙසේම උන්වහන්සේ උද්ධච්ච නම් වූ සිත විසුරුණ ගතියෙන්, සිත එකඟ නො වන ගතියෙන් සම්පූර්ණයෙන් දුරු වූ බැවින් ද අරහත් නම් වන සේක.

උන්වහන්සේ 20 අසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලේ පාරමී පුරත් දී, ධ්‍යාන අභිඥා ලබා අහසින් ගිය වාර අසංඛ්‍ය ගණන් වන්නේ ය. එසේ පුහුණු කරගෙන, පුහුණු කරගෙන ආ සිතේ එකඟතාවයක් ඇති බෝසතාණන්ට, එදා මහාභිනික්මන් කොට ආලාරකාලාම, උද්දකාරාම තවුසන් වෙත ගිය පසු එක් දිනයකින්ම අරූපාවචර 3 වන හා 4 වන ධ්‍යානයන් ඉපැදවීමට හැකි විය.

බුද්ධත්වයෙන් පසු උන්වහන්සේ කාමාවචර ධ්‍යානයන්ගෙන් ද, රූපාවචර ධ්‍යානයන්ගෙන් ද, අරූපාවචර ධ්‍යානයන්ගෙන් ද, ලෝකෝත්තර ධ්‍යානයන්ගෙන් ද අග්‍ර වූ සේක. ඇසිපිය හෙළන තරම් කෙටි කාලයක් තුළ දී ධ්‍යානවලට සමවැදී ඉන් නැගී සිටීමට ද හැකියාවක් උන්වහන්සේට තිබිණ.

ධර්ම දේශනා කරන අතරතුර දී අසන්නන් සාධුකාර දෙන කෙටි කාලය තුළ දී පවා ධ්‍යානවලට සමවැදී ඉන් නැගී සිට, නැවත ධර්මය දේශනා කිරීමට තරම් අසමසම චිත්ත වශී භාවයකින් උන්වහන්සේ සමන්නාගත වූ සේක.

සිතේ විසුරුණු ස්වභාවය වූ උද්ධච්චය ඇති වන්නේ අකුශල් සිත්වල බැවින්, එවන් අකුශල් සිත් පහළ නො වන උන්වහන්සේට උද්ධච්චය පහළ වීමට ඉඩක් නැත. අධි ශීලයකින්, අධි චිත්තයකින්, අධි ප්‍රඥාවකින් සමන්නාගත වූ උන්වහන්සේගේ සිතේ නො විසුරුණු බවක් කිසි විටක ඇති නො වේ.

මෙසේම උන්වහන්සේගේ සිත විසිරී යන අන්දමට කිසිම දෙවියකුට, කිසිම බ්‍රහ්මයකුට, කිසිම මාරයකුට, කිසිම අමනුෂ්‍යයකුට කිසිම අනතුරක් කළ නො හැක. එවන් චිත්තෛශ්වර භාවයකින් උන්වහන්සේ සමන්නාගත වූ සේක.

එදා උන්වහන්සේ ආලවක යක්ෂයා දමනය කිරීමට වැඩිය වේලාවේ උන්වහන්සේ වෙත ආයුධ, ගිනි, ගල්, අඟුරු ආදී නොයෙක් වැසි වස්වා එයින් ඵලක් නොවූ විට, අහසට ගැසුවොත් 12 අවුරුද්දක් වැසි නො වසින, මුහුදට ගැසුවොත් මුහුද වේලීයන තරම් ප්‍රබල වජ්‍රායුධය දමා ගැසූ පසු, එය උන්වහන්සේගේ සිරිපතුල් ළඟ පාපිස්සක් මෙන් සිටියේ ය. එවිට ආලවක යක්ෂයා තෙවරක්ම පිටවන ඇතුළු වන ලෙස කියා, එසේ කළ බුදුපියාණන් වහන්සේට සිවුවැනි වරටත් පිටවෙන ලෙස කී පසු "ඔබට කළ හැකි ඕනෑම දෙයක් කරව, මා පිටවන්නේ නැහැ" යි බුදුපියාණෝ දේශනා කළ සේක. එවිට ආලවක යක්ෂයා "ශ්‍රමණය, මම ඔබෙන් ප්‍රශ්න අසනවා, විසඳුවේ නැත්නම්, හදවත හෝ පලාදමමි, සිත හෝ වික්ෂිප්ත කරවාලමි, දෙකකුලින් ගෙන පරසක්වළ හෝ ගසමියි" කී විට, බුදුපියාණන් ආලවක යක්ෂයාට වදාළේ මෙසේ ය. "ආලවකය ඔබ තබා දෙවියන්, බ්‍රහ්මයන්, මාරයන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත මේ ලෝක ධාතුවල කිසිවකු මගේ හදවත පැලීමට හෝ සිත වික්ෂිප්ත කරවාලීමට හෝ දෙකකුලින් ගෙන පරසක්වළ ගැසීමට හෝ සමත් නැත. ආලවකය, තොපට කැමැති ප්‍රශ්නයක් අසව."

මෙසේ උන්වහන්සේ දේශනා කෙළේ උන්වහන්සේගේ සිත කිසිම දෙවියකුට බ්‍රහ්මයකුට මාරයකුට අමනුෂ්‍යයකුට හෝ අන් කවරකුට හෝ වික්ෂිප්ත කළ නො හැකි බැවිනි.

මෙසේ චිත්තෙශ්වරභාවයෙන් අග්‍ර වූ, සියලු පවින් දුරු වූ, එකඟ කර ගත්, වසී කර ගත්, සුසමාහිත කර ගත් සිතකින් සමන්නාගත වූ ඒ සම්මා සම්බුද්ධ රත්නය උද්ධච්චය නැවත නූපදින ලෙසින්ම සම්පූර්ණයෙන්ම නැසූ බැවින් ද අරහත් නම් වන සේක.

9-10 තවද ඒ බුදුපියාණෝ පවට ලජ්ජා නො වන අහිරික නම් වූ කෙලශයෙන් ද, පවට බිය නො වන අනොත්තප්ප නම් වූ කෙලශයෙන් ද දුරු වූ සේක.

බුදුරජාණන් වහන්සේ තරම් පව ගැන දන්නා, ඉන් ඇති වන විපාක ගැන දන්නා, පවට බියවන, පවට ලජ්ජා වන අන් කිසිවෙක් ලෝක ධාතුවේ නැත.

උන්වහන්සේ පුබ්බෙනිවාසානුස්සති ඤාණයෙන්, අතීතයේ ප්‍රේතව ඉපැදුණු, අපායේ ඉපැදුණු, අසුර නිකායේ ඉපැදුණු, තිරිසන්ව ඉපැදුණු අසංඛ්‍ය වාර ගණන් ප්‍රත්‍යක්ෂ වශයෙන්ම දත් සේක.

කර්ම ඵල දන්නා නුවණින් මේ මේ අකුශල කර්ම නිසා මේ මේ විපාක ලැබේයැයි දත් සේක.

උන්වහන්සේගේ දිබ්බචක්ඛු ඤාණයට, සතර අපාවල දුක් විඳිනා සත්ත්වයා පෙනෙන්නේ ය.

දිබ්බසෝත ඤාණයට, සතර අපායේ දුක් අඳෝනා නගන සත්ත්වයාගේ දුක්ඛිත හඬ උන්වහන්සේට ඇසෙන්නේ ය.

උන්වහන්සේගේ අනේකධාතු නානාධාතු ලෝක දන්නා නුවණින් උන්වහන්සේට ඒ ඒ ලෝකවල ඇති කටුක වේදනා පෙනෙන්නේ ය. ඒ ඒ ලෝකවල දුක් විඳීමට සිදුවන අති දීර්ඝ ආයු කාලය ද පෙනෙන්නේ ය. අකුශල කිරීම නිසා කල්ප ගණන් අපායේ දුක් විඳීමට සිදුවන බව, බුද්ධාන්තර ගණන් ප්‍රේතව ඉපැදීමට සිදුවන බව, සතර අපායට වැටුණොත් පහසුවෙන් ඉන් ගොඩ ඒමට නො ලැබෙන බව උන්වහන්සේ මැනවින් දත් සේක.

උන්වහන්සේගේ ඨානාඨාන ඤානයෙන් අකුශල් නිසා කිසිවිටක යහපත් විපාකයක් නො ලැබෙන බව දත් සේක.

සබ්බත්ථගාමිණී පටිපදා ඤාණයෙන්, සතර අපායේ උපදවනු ලබන පටිපදාව ද උන්වහන්සේ දත් සේක.

මෙවන් ඤාණයන්ගෙන් සමන්නාගත, සියල්ල ප්‍රත්‍යක්ෂ වශයෙන්ම අවබෝධ කරගත් ඒ බුදුපියාණන් වහන්සේට, කෙතෙක් නම් පාපයට

බියක් හා ලජ්ජාවක් ඇති වේද?

මෙසේ අහිරික අනෝත්තප්ප කෙලශයන් ගෙන් සම්පූර්ණයෙන් වෙන් වූ උන්වහන්සේ අරහත් නම් වන සේක.

11. දස කෙලශවත්ථූන් ගෙන් මෙසේ වෙන් වූ උන්වහන්සේ 1500 ක් පමණ වූ සියලුම කෙලෙස් වාසනා සහිතවම සිඳලූ සේක. ඒ බුදුපියාණන් වහන්සේ ක්‍රෝධ- උපනාහ- මක්ඛ- පලාස- ඉස්සා- මච්ඡරිය- මායා- සාඨෙය්‍ය- ථම්භ- සාරම්භ- මාන- අතිමාන- මද- පමාද- විපරීත මනසිකාර- අවිජ්ජා- ත්‍රිවිධ අකුසල මූල- දුච්චරිත- සංකිලෙස- මල- විසම සංඥා - අකුසල විතක්ක- ප්‍රපංච- ආසව- ග්‍රන්ථ- ඕඝ- යෝග- අගති- තණ්හුප්පාද- උපාදාන- පංච චෙතෝඛීල- පංච විනිබන්ධන- නීවරණ- අභිනන්දන- විවාද මූල- තණ්හාකාය- අනුසය- මිච්ඡත්ත- තණ්හාමූලක- දස අකුසල කර්ම පථ- දරථ- පරිළාහ- සන්තාප- අභිසංඛාර ආදිය නැසූ බැවින් ද අරහත් නම් වන සේක. (මෙම ඡේදයේ ඇති වචන පොතකින් උපුටා ගන්නා ලදී. මෙහිලා 'කෙලෙස් 1500' නම් රේරුකානේ චන්දවිමල ස්වාමීන් වහන්සේ විසින් රචිත පොත කියැවීම අගනේ ය.)

# කෙළෙස් සතුරන් නැසීම

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේ කෙලෙස් සතුරන් නැසූ බැවින් ද අරහත් නම් වන සේක.

බුදුපියාණන් වහන්සේ සෝවාන්, සකදාගාමි, අනාගාමි, අරහත් යන සතර මාර්ගයෙන් කෙලෙස් සතුරන් නැසූ සේක. (මේ පිළිබඳව තරමක හෝ විස්තරයක් ලිවීමට නම් පිටු 100 ගණනක් වැය වන්නේ ය. එවන් විස්තරයකට නො බැස මෙහි මාතෘකා පමණක් දක්වනු ලැබේ.)

1. බුදුපියාණන් වහන්සේ සෝවාන් මාර්ගයෙන්, සක්කායදිට්ඨි- විචිකිච්ඡා- සීලබ්බතපරාමාස යන සංයෝජන තුන නැසූ සේක. දිට්ඨානුසය හා විචිකිච්ඡානුසය යන අනුසය දෙක නැසූ සේක. අපායගමනීය වූ කාමාසව- භවාසව- අවිජ්ජාසවයන් නැසූ සේක. අතීතයේ රැස් වී තිබූ සියලු අපායගාමී කර්ම ක්ෂය කළ සේක. අපායගමනීය වූ කාමරාග- පටිඝ යන සංයෝජන සිඳලූ සේක.

මෙසේම දිට්ඨි- විචිකිච්ඡා යන කෙලශයෙන් ද, මිච්ඡා කම්මන්ත- මිච්ඡා ආජීව යන මිච්ඡත්තයන් ද නැසූ සේක.

අනිත්‍යයේ නිත්‍ය සංඥා සඤ්ඤා විපල්ලාස, අනිත්‍යයේ නිත්‍ය සංඥා චිත්ත විපල්ලාස, අනිත්‍යයේ නිත්‍ය සංඥා දිට්ටි විපල්ලාස සහ අනාත්මයේ ආත්ම සංඥා සඤ්ඤා විපල්ලාස, අනාත්මයේ ආත්ම සංඥා චිත්ත විපල්ලාස, අනාත්මයේ ආත්ම සංඥා දිට්ඨි විපල්ලාස යන විපල්ලාස 6 නැසූ සේක.

මෙසේම සීලබ්බතපරාමාස හා ඉදංසච්චාභිනිවෙශ යන ග්‍රන්ථ දෙක ද- දිට්ඨාශ්‍රවය ද, දිට්ඨි ඕඝය ද, දිට්ඨි යෝගය ද, විචිකිච්ඡා හා ඕදාරික කුක්කුච්ච යන නීවරණ දෙක ද, මිච්ඡාදිට්ඨි පරාමාශය ද- සීලබ්බතපරාමාස උපාදානය ද, අත්තවාදූපාදාන උපාදානය ද පාණාතිපාත, අදින්නාදාන, කාමමිච්ඡාචාර, මුසාවාද, මිච්ඡාදිට්ඨි යන අකුශල කර්ම පථයන් ද, දිට්ඨි විචිකිච්ඡා සම්ප්‍රයුක්ත අකුශල් සිත්

පහද, සියලු අපායගාමී සෙසු අකුශල් සිත් 10 ද සෝවාන් මාර්ගයෙන් ඔබවහන්සේ නැවත නූපදින ලෙසින්ම සිඳ ලූ සේක.

2. මෙසේම සකදාගාමී මාර්ගයෙන් කාමරාග පටිඝ සංයෝජනයන් තුනී කළ ඔබවහන්සේ, ඕලාරික වූ කාමරාග පටිඝ යන සංයෝජනයන් ද, ඕලාරික වූ පටිඝ සම්ප්‍රයුක්ත වූ සිත් දෙක ද සිඳලූ සේක. ඉදිරියේ කියැවෙන අනාගාමී මාර්ගයෙන් සිඳලන සියලු ධර්මයන් සකෘදාගාමී මාර්ගයෙන් තුනී කළ සේක. උදාහරණ වශයෙන් ඖළාරික වූ කාමරාග පටිඝ යන අනුසයන් සහ ඒ හා සම්බන්ධ ඕලාරික වූ භවාසව අවිජාසව ද කෙලශයන් ද සිඳලූ සේක.

3. මෙසේම උන්වහන්සේ අනාගාමී මාර්ගයෙන් කාමරාග සංයෝජනය ද- කාමාසවය ද ශේෂ නො කොට ම ක්ෂය කළ සේක. පටිඝ සංයෝජනය ද, පටිඝානුසය ද ක්ෂය කළ උන්වහන්සේ ඒ හා සම්බන්ධ භවාසව හා අවිජ්ජාසවයන් ද සිඳලූ සේක.

තවද, දෙවශය නැමැති කෙලශය ද, මිච්ඡා සංකප්ප මිච්ඡත්තය ද, අලාභ අයස නින්දා දුක්ඛ යන ලෝක ධර්මයන්ගෙන් වන චිත්ත වික්ෂෙපයන් ද, අශුභේ ශුභ සංඥා- "සඤ්ඤා විපල්ලාස හා චිත්ත විපල්ලාස" යන විපල්ලාස දෙක ද, ව්‍යාපාද ග්‍රන්ථය ද, කාමාශ්‍රවය ද, කාම ඕඝයන් ද, කාම යෝගයන් ද, කාමච්ඡන්ද - ව්‍යාපාද - කුක්කුච්ච යන නීවරණයන් ද, දොස මලය ද, ව්‍යාපාද - ක්‍රෝධ - උපනාහ යන උපක්ලෙශයන් ද, පිසුණාවාචා - ඵරුසාවාචා - ව්‍යාපාද යන අකුශල කර්ම පථයන් ද, පටිඝ සම්ප්‍රයුක්ත සිත් දෙක ද උන්වහන්සේ අනාගාමී මාර්ගයෙන් සිඳලූ සේක.

4. මෙසේම අරහත් මාර්ගයෙන් නිච්ච සඤ්ඤා- සුඛසඤ්ඤා- අත්ත සඤ්ඤා- නන්දිය- රාගය- සමුදය- ආදානය- ඝන සඤ්ඤාව- ආයූහනය- ධ්‍රැව සඤ්ඤාව- නිමිත්ත- පණිධිය (සුඛ සහගත ප්‍රාර්ථනාව)- අත්තාභිනිවේශ, (අත්ත අභිනිවෙශ)- සාරාදාභිවෙස (සාර වශයෙන් සංස්කාර අභිනිවෙශ කිරීම)- සම්මොහාභිනිවේශ- ආලයාභිනිවෙශ- අප්පටිසඞ්ඛය (අවිජ්ජාව), හා සංයොගාභිනිවෙශයන් නැවත නූපදිනා අයුරින් නැසූ උන්වහන්සේ රූපරාග- අරූපරාග- මාන- උද්ධච්ච- අවිජ්ජා යන සංයෝජනයන් ද- මානානුසය, භවරාගානුසය

අවිජ්ජානුසය යන අනුශයන් ද ශේෂ නො කොට ම නැසූ සේක.

මෙසේම, ලෝභ- මෝහ- මාන- ථීන- අහිරික- අනොත්තප්ප- උද්ධච්ච යන කෙලශයන් ද, මිච්ඡා වායාම- මිච්ඡා සති- මිච්ඡා සමාධි- මිච්ඡා විමුක්ති- මිච්ඡා විමුත්තිඤාණදස්සන යන මිච්ඡත්තයන් ද, ලාභ- යස- ප්‍රශංසා- සුඛ යන ලෝක ධර්මයන් කෙරෙහි වන චිත්ත වික්ෂෙපයන් ද, දුක්ඛෙ සුඛ සඤ්ඤා චිත්ත විපල්ලාස හා සඤ්ඤා විපල්ලාස යන විපල්ලාස දෙක ද, අභිජ්ඣා ග්‍රන්ථය ද, භවාශ්‍රව- අවිද්‍යාශ්‍රව යන ආශ්‍රව දෙක ද, භවයෝග- අවිජ්ජා යෝග යන යෝගයන් දෙක ද, භවඕඝ- අවිජ්ජාඕඝ යන ඕඝයන් දෙක ද, ථීනමිද්ධ- උද්ධච්ච යන නීවරණ දෙක ද, කාමුපාදානය ද, ලෝභ- මෝහ යන මලයන් ද, අභිජ්ඣා- විසමලෝභ- ථම්භ- සාරම්භ- මාන- අතිමාන- මද යන උපකෙලශයන් ද, සම්ඵපලාප- අභිජ්ඣා යන අකුශල කර්ම පථයන් ද, ලෝභ සහගත දිට්ඨිවිප්‍රයුක්ත හා උද්ධච්ච යන සිත් 5 ද අරහත් මාර්ගයෙන් නැසූ උන්වහන්සේ පරම පාරිශුද්ධත්වයට පත් වූ සේක.

මෙසේ සතර මාර්ග ඥානයෙන් කෙලෙස් සතුරන් නැසූ උන්වහන්සේ අරහත් නම් වන සේක.

# සංසාර චක්‍රයේ අරයන් සිඳලීම

1. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේ සංසාර චක්‍රයේ අවිද්‍යා ආදී අරයන් සිඳලූ බැවින් ද අරහත් නම් වන සේක.

(මේ පිළිබඳව ද තරමක හෝ විස්තරයක් ලිවීමට පිටු 100 ගණනක් ලිවීමට සිදුවන බැවින්, මෙහි දක්වා ඇත්තේ කෙටි හැඳින්වීමක් පමණි.)

අප බෝධිසත්වයන් වහන්සේ සාවුරුද්දක් දුෂ්කර ක්‍රියා කොට, බුදු වන දා චතුරංග සමන්නාගත වීරියෙන් යුතුව වජ්‍රාසනය මත වැඩ සිට, පෙර භාවිතා කර තිබූ රූපාවචර අරූපාවචර ධ්‍යානයන්ට සමවැදී, ඉන් නැඟී චතුර්ථ ධ්‍යානයෙන් පාරිශුද්ධත්වයට පත් ප්‍රභාස්වර සිතින්, රාත්‍රියේ මුල් යාම දෙකේ දී පුබ්බෙනිවාසානුස්සති ඥාණය හා දිබ්බචක්ඛු ඥාණය යන ලෞකික අභිඥාවන් උපදවා ගත් සේක.

පුබ්බෙනිවාසානුස්සති ඥාණයෙන්, කල්ප අසංඛ්‍ය ගණන් පෙර භවයන් හා එම භවයන්හි දී විඳිනා ලද අනන්ත අප්‍රමාණ දුක් රාශිය උන්වහන්සේට පෙනී ගියේ ය. එසේම ලෝක සත්ත්වයාට අති දීර්ඝ කාලයක් මුළුල්ලේ නැවත නැවත ඉපදෙමින් අනන්ත අප්‍රමාණ දුක් රාශියක් විඳීමට සිදුවන බව ද අවබෝධ විය. මෙසේම වර්තමාන භවයේ විඳීමට ඇති, විඳ ඇති ජරා දුක්, ව්‍යාධි දුක්, මරණ දුක්, අප්‍රිය සම්ප්‍රයෝග දුක්, ප්‍රිය විප්‍රයෝග දුක්, කැමැති දේ නො ලැබීමේ දුක්, ශෝක- පරිදේව- දුක්ඛ- දොමනස්ස- උපායාස දුක් මෙන්ම පංචස්කන්ධ පරිහරණ දුක් සහිත පංචස්කන්ධය ම හුදු කේවල දුක්ඛ පිණ්ඩයක් බව අවබෝධ විය.

2. චතුර්ථධ්‍යානයෙන් සමාහිත වූ, පරිභාවිත වූ, මෘදු වූ, කර්මනීය වූ, පාරිශුද්ධත්වයට පත් වූ, ප්‍රභාස්වර වූ චිත්තයකින් එවකට සමන්නාගතව සිටි උන්වහන්සේ, මේ දුක් රාශිය කුමක් ඇති කල්හි කුමන හේතුවක් නිසා හටගන්නේ දැයි විමසා බැලූ සේක.

උන්වහන්සේට මෙම දුක් රාශිය ඇති වන්නේ, එම දුක් රාශියට හේතු වන්නේ ජාතිය හෙවත් ප්‍රතිසන්ධි විඥානය පහළවීම නිසා බව අවබෝධ විය. යම්තාක් දුක් ඇත්තේ නම්, ඒ සියල්ල ම ඇති වන්නේ

ජාතිය නිසා ය. ජාතියක් නැත්නම් දුකක් නැතැයි උන්වහන්සේට පෙනී ගියේ ය.

3. කාම- රූප- අරූප ලෝකයන්හි, සඤ්ඤී- අසඤ්ඤී- නේවසඤ්ඤා නාසඤ්ඤී ලෝකයන්හි- ඒක වොකාර- චතුවෝකාර- පඤ්චවෝකාර ලෝකයන්හි මුලින්ම පහළවීම ඇති කරවන මෙම ජාති සංඛ්‍යාත ප්‍රතිසන්ධි විඥානය කුමක් නිසා, කුමක් හේතු කොට ගෙන ඇතිවේ දැයි ඊළඟට උන්වහන්සේ විමසා බැලූ සේක.

විඥානය හෙවත් සිතක් පහළවීමට අරමුණක් තිබිය යුතු ය. අරමුණක් නො මැතිව සිතක් පහළ නොවේ. පෙර භවයේ චුති සිත ඇතිවීමට පෙරාතුව අරමුණු වූ කර්ම, කර්ම නිමිති, ගති නිමිති යන කිසිවකින් හෝ මෙම භවයේ පහළ වූ පළමුවෙනි ප්‍රතිසන්ධි විඥානයට අරමුණු වන බව උන්වහන්සේට පෙනී ගියේ ය. කර්ම හෝ කර්ම නිමිති හෝ ගති නිමිති පහළ වීමට, කුශල් හෝ අකුශල් සඞ්ඛ්‍යාත කර්ම භව තිබිය යුතු ය. කුශලා කුශල කර්ම භවයන් නො මැති නම්, කර්ම, කර්ම නිමිති හෝ ගති නිමිති නැත, කුමන භවයක හෝ ප්‍රතිසන්ධියක් ද නැත. මෙය අවබෝධ වූ උන්වහන්සේට ජාතිය, කර්ම භව නිසා ඇතිවන බව පෙනී ගියේ ය.

4. දැන් උන්වහන්සේගේ සිත දිවෙන්නේ මෙයට පෙර තිබූ අතීත භවය දෙසට ය. මෙම කර්ම භව කුමක් හේතු කොට, කවරක් ඇති කල්හි වන්නේ ද කියා මීළඟට විමසා බැලී ය.

සත්ත්වයා නොයෙක් ආකාරයෙන් නොයෙක් දේ දැඩිකොට ග්‍රාහණය කොට ගෙන සිටී. කාමය මෙසේ දැඩිකොට අල්ලාගත්, උපාදාන කර ගත් සත්ත්වයා රූප- ශබ්ද- ගන්ධ- රස- ඵොට්ඨබ්බ- ධම්ම යන කරුණු හේතුවෙන් විටෙක කුශල් ද කරෙයි, විටෙක අකුශල් ද කරයි. රූප ශබ්ද ආදී ඒ ධර්මයන් අත්පත් කර ගැනීම, ආරක්ෂා කිරීම, පරිභෝග කිරීම ආදිය නිසා ලෝභ මෝහ දෙකින් යුතුව ද, ඒවා විනාශවන අවස්ථාවන්හි දී, දෝෂ මෝහ දෙකින් යුතුව ද කටයුතු කරමින් අකුශල් රැස් කරන සත්ත්වයා, දෙව් මිනිස් බ්‍රහ්ම සම්පත් ආදී භවගාමී ප්‍රාර්ථනයෙන් කුශල් ද රැස් කරයි. මෙසේ කාමූපාදානය නිසා කර්ම භව රැස් වේ.

"දෙවියන් සතුන් මවා ඇත්තේ මිනිසාගේ ප්‍රයෝජනයට ය- යාග

හෝම යාඥා ආදිය කිරීමෙන් සවර්ගසතගාමී වේ" යනාදී දිට්ඨීන් උපාදාන කරගත් සත්ත්වයා දිට්ඨුපාදානය නිසා ද කුශලාකුශල කර්ම රැස් කරයි. විටෙක සතුන් මැරීම් ආදී අකුශල් ද, විටෙක දන් දීම් ආදී කුශල් ද මෙසේ රැස් කරයි.

තමාගේ ආත්මය පෝෂණය කිරීම, නඩත්තු කිරීම, මතු භවයන්හි දී යහපත් ආත්ම භාවයන් ලබා ගැනීම ආදි වශයෙන් තමාගේ ආත්මය උපාදාන කර ගත් සත්ත්වයා කුශලාකුශල කර්ම භව රැස් කරයි.

ආත්ම පාරිශුද්ධියක් ලැබීම- ශුද්ධාත්මය හා එක්වීම, සදාකාලික සුවයක් ලැබීම යනාදී අදහස් පෙරදැරි කරගෙන යාඥා කිරීම්, අත්තකිලමථානුයෝග හෝ කුක්කුර ආදී ව්‍රත වැනි වැරදි සීල හා වත් කරමින්, සීලබ්බතුපාදානය නිසා සත්ත්වයා කර්ම භව රැස් කරයි.

මෙසේ කාමුපාදාන- දිට්ඨුපාදාන- සීලබ්බතුපාදාන හා අත්තවාදූපාදාන හේතුවෙන් කර්ම භව රැස්වන බව උන්වහන්සේට අතිශයින්ම පෘථුල අයුරින් වැටහෙන්නට විය.

5. මෙම උපාදානයන් කවරක් නිසා, කවර හේතුවක් ඇති විට ඇතිවේදැයි මීළඟට උන්වහන්සේ විමසා බැලූ සේක. අතීතයේ පැවැති රූපාදියක් අරමුණු කර හෝ, වර්තමානයේ පවත්නා රූප- ශබ්ද- ගන්ධ- රස- ඵොට්ඨබ්බ- ධම්ම යන කරුණු වලට හෝ, මතු මෙම ජීවිතයේ හෝ, අනාගත මතු භවයක එවැනි රූප ශබ්ද ආදී ධර්මයන් කෙරෙහි ඇති තණ්හාව නිසාම සත්ත්වයා මෙසේ ඇඩිකොට ගනී, උපාදාන කරයි යනාදී ලෙසින් තණ්හාව නිසා උපාදාන ඇතිවන බව උන්වහන්සේට පෙනී ගියේ ය.

6. මෙම තණ්හාව ඇති වන හේතු මීළඟට විමසා බැලූ උන්වහන්සේට වේදනාවක් ඇති කල්හි, තණ්හාව ඇති වන බව වැටහිණි.

චක්ඛු- සොත- ඝාන- ජිව්හා- කාය- මනෝ යන ඉන්ද්‍රියයන් පටිබද්ධව ඇති වන මෙම වේදනාව සුඛ සහගත වූ විට එයට සත්ත්වයා ඇලුම් කරමින් තණ්හාවක් ඇතිකර ගනී; වේදනාව දුක්ඛ සහගත වූ විට, එම දුක් වේදනාවෙන් මිදීමේ ආශාව හෝ එම දුක් වේදනාව වෙනුවට සුඛ නැත්නම් උපේක්ෂා වේදනාවක් ලබාගැනීමේ

ආශාව ඇති කර ගෙන තණ්හාවක් උපදවා ගනී. වේදනාව උපේක්ඛා සහගත වූ විට, මෙයත් ප්‍රමාණවත් යැයි සිතමින් එයට ද ආශාවක් ඇති කර ගනී. මෙසේ වේදනාවක් ඇති කල්හි, තණ්හාව වේ, වේදනාව නොමැති නම් තණ්හාවක් නූපදී යැයි උන්වහන්සේට වැටහිණි.

7. මීළඟට උන්වහන්සේ විමසා බැලුවේ මෙම වේදනාව ඇතිවන හේතුව ය.

ස්පර්ශය නිසාම වේදනාව උපදින බව උන්වහන්සේට පෙනිණ. ඇසත්, රූපයත් ගැටීම නිසා චක්ඛුවිඤ්ඤාණ නම් වූ සිත පහළ වේ. මෙම ඇස- රූපය- චක්ඛුවිඤ්ඤාණය යන තිදෙනාගේ එක්වීම, සම්ප්‍රයුක්ත වීම චක්ඛු සම්ඵස්සය යි.

කනත්, ශබ්දයත් ගැටීම නිසා සොතවිඤ්ඤාණය පහළ වේ. ඒ තිදෙනාගේ එක්වීම සොතසම්ඵස්සය යි.

නාසයයත්, ගන්ධයත් නිසා ඝානවිඤ්ඤාණය ද, ඒ තිදෙනාගේ එක්වීමෙන් ඝානසම්ඵස්සය ද පහළ වේ.

දිවත්, රසයත් එක්වීම නිසා ජිව්හාවිඤ්ඤාණය පහළ වේ. ඒ තිදෙනාගේ සම්ප්‍රයුක්තභාවය ජිව්හාසම්ඵස්සය යි.

කයත් ඵොට්ඨබ්බයත් නිසා කායවිඤ්ඤාණය ද, ඒ තිදෙනාගේ එක්වීමෙන් කායසමඵස්සය ද පහළ වේ.

මනසත්, ධර්මත් නිසා මනෝවිඤ්ඤාණය ද ඒ තිදෙනා ගේ එක්වීමෙන් මනොසම්ඵස්සය ද ඇති වේ.

මෙසේ ස්පර්ශය නිසා වේදනාව උපදී. ස්පර්ශයක් නොමැති නම් කෙසේ නම් වේදනාවක් උපදී ද? ඵස්සය නිසා වේදනාව ඇති වන ආකාරය මෙසේ උන්වහන්සේට අවබෝධ විය.

8. මෙම ස්පර්ශය කුමක් නිසා, කවරක් ඇති කල්හි වන්නේ දැයි මීළඟට උන්වහන්සේ විමසා බැලූ සේක.

චක්ඛු- සොත- ඝාන- ජිව්හා- කාය- මනෝ, යන ආයතන හය නිසා ඵස්සය ඇති වන බව උන්වහන්සේට පෙනිණ. ඇස් කන් නාසාදී ඉන්ද්‍රියයන් නැත්නම් කවර නම් ඵස්සයක් ඇතිවේ ද? මෙසේ සළායතන නිසා ඵස්සය ඇතිවන බවත්, සළායතන නොමැති නම් ඵස්සය ඇති නො වන බවත් උන්වහන්සේට අවබෝධ විය.

9. මෙම සළායතනයන් කවරක් ඇති කල්හි, කුමක් හේතු කොටගෙන ඇති වේදැයි මීළඟට උන්වහන්සේ විමසා බැලූ සේක.

නාම රූපයන් නිසා සළායතන පහළවන බව උන්වහන්සේට අවබෝධ විය.

10. නාම රූපයන් ඇතිවන හේතූන් ඊළඟට විමසා බැලූ සේක. දැන් උන්වහන්සේ ගේ සිත පවත්නේ මීට පෙර භවයේ හටගත් ප්‍රතිසන්ධි විඥානය කෙරෙහි ය. මෙම ප්‍රතිසන්ධි විඥානය නිසා නාමරූප පහළ වේ.

සිතක්, චෛතසික ධර්මයන්ගෙන් තොරව පහළ නො වේ. ප්‍රතිසන්ධි විඥානය පහළ වන විටම පෙර පසු නොවී එහි චෙනත් චෛතසිකයෝ ද පහළ වෙත්. එම ප්‍රතිසන්ධි විඥානයේ යෙදුනු සඤ්ඤාව සඤ්ඤාස්කන්ධය ය. එහි යෙදෙනු වේදනාව වේදනා-ස්කන්ධය ය. එහි යෙදෙනු චෙනත් චෛතසිකයන් සංස්කාර ස්කන්ධය ය. මෙසේ ප්‍රතිසන්ධි විඥානය නිසා සඤ්ඤා- වේදනා- සංස්කාර යන නාම ස්කන්ධ තුන ද පහළ වේ.

මව් කුසක උත්පත්තිය ලබමින් ප්‍රතිසන්ධි විඥානය පහළ වන විටම කායදශක- භාවදශක-වත්ථු දශක යන රූප කලාපයෝ ද පහළ වෙත්. මේවා කර්ම චිත්ත- ඍතු- ආහාර යන ප්‍රත්‍යය ධර්මයන් නිසා දිනෙන් දින වර්ධනය වී, කලක් ගිය පසු ඇස කන නාසය දිව යන ඉන්ද්‍රියයන් ඇති වේ. මෙම සසම්භාර චක්ඛු සෝතාදිය නිසා චක්ඛායතන- සොතායතන- ඝානායතන- ජිව්හායතන යන ආයතන පහළ වේ. ප්‍රතිසන්ධි විඥානය සමඟ ම ඇතිවූ කායාතනය රූපයත් ක්‍රමයෙන් වැඩෙන විට ශරීරය පුරා පැතිරී බොහෝ වූ කායාතනයෝ පහළ වෙති.

ඕපපාතික සත්ත්වයන්ට ප්‍රතිසන්ධි විඥානය සමඟම මෙම සියලු ආයතනයෝ පහළ වෙති. බ්‍රහ්මයන්ට චක්ඛු- සෝත- මනෝ යන ඉන්ද්‍රිය තුන පමණක් ආයතන වශයෙන් ක්‍රියාත්මක වේ.

මෙසේ ප්‍රතිසන්ධි විඥානය නිසා නාමරූපයන් ද, එම නාමරූපයන් නිසා සළායතනයන් ද පහළ වේ. සළායතන අතුරෙන් මනායතනය යනුවෙන් දැක්වෙන්නේ විඤ්ඤාණය නිසා ඇතිවනවා යැයි කියූ නාමස්කන්ධයම ය. විඤ්ඤාණය නිසා ඇතිවනවා යැයි කියූ නාමයම නැවත මනායතනය නම් වූ නාමය ඇති කරවන බව දැක්වීම, එකම

කරුණ දෙවතාවක දී දක්වා තිබීමක් ලෙස පෙනේ. වරක් ඇති වූ චිත්ත චෛතසික ධර්ම නිසා එයට සම්බන්ධව තව බොහෝ චිත්ත චෛතසික ධර්ම ඇතිවන බව තේරුම් ගැනීමෙන් මෙය විසඳේ.

11. මීළඟට උන්වහන්සේ විමසා බැලුවේ, මීට පෙර භවයේ හටගත් ප්‍රතිසන්ධි විඥානය කුමක් නිසා, කුමක් ඇතිවිට පහළ වන්නේ ද යන්නයි.

මෙයට හේතු වශයෙන්, ඊට පෙර භවයේ වූ සංස්කාර උන්වහන්සේට පෙනී ගියේ ය. කර්ම භව නිසා ජාතිය ඇතිවන බව කලින් දක්වා ඇත. එය හා "සංස්කාර නිසා විඤ්ඤාණය පහළ වේ" යන්න අතර වෙනසක් නැත. මෙම චක්‍රය භව තුනකට සම්බන්ධ බැවින් එය දෙවරක් ම දැක්විය යුතුව ඇත.

මීට පෙර දෙවන භවයේ වූ කුශලාකුශල සංස්කාර නිසා, මීට පෙර භවයේ ප්‍රතිසන්ධි විඥානය ඇති විය. මෙසේ පහළ වන්නේ ප්‍රතිසන්ධි විඥානය වශයෙන් පහළවිය හැකි සිත් 19 අතුරෙන් එක් සිතකි. එම සිත එම භවයේ චුතිය දක්වාම, වෙනත් සිත් පහළ නො වන විට පහළ වේ. මෙසේම චක්ඛු සොත ආදී ආයතනයන්ට රූප ශබ්දාදිය ගැටීම නිසා, චක්ඛු විඤ්ඤාණ සෝත විඤ්ඤාණ ආදී විපාක විඤ්ඤාණයෝ ද ප්‍රවෘති වශයෙන් රහත් චුති චිත්තය දක්වා ම ඇති වේ. එය සංස්කාර නිසා පහළ වන්නකි. කුශල කර්මයන් නිසා ඉෂ්ට වූ චක්ඛු විඤ්ඤාණාදිය ද, අකුශල කර්මයන් නිසා අනිෂ්ට වූ චක්ඛු විඤ්ඤාණාදිය ද මෙසේ පහළ වේ. මේ අනුව කුශලාකුශල සංස්කාර නිසා ප්‍රතිසන්ධි හා ප්‍රවෘති විඥාන පහළ වේ. මෙම විඥාන පරම්පරා සන්තතිය රහත් චුති චිත්තය දක්වා ම නො සිඳී දිවෙයි. එහි තාවකාලික නැවැත්මක් ඇත්තේ අසඤ්ඤී භව උප්පත්තිය, නිරොධ සමාපත්තිය වැනි අවස්ථාවල දී පමණි.

මෙම විඥාන සන්තති පරම්පරාවේ මෙසේ නො සිඳී පැවැත්ම ම සංසාර චක්‍රයේ පැවැත්ම ය.

12. මීළඟට උන්වහන්සේ, මෙම සංස්කාරයන් කුමක් නිසා, කුමක් අසුරු කොට, කුමක් ඇති කල්හි පවත්නේදැයි විමසා බැලූ සේක.

අවිද්‍යාව නිසා ම මෙම සංස්කාර හටගන්නා බව උන්වහන්සේට අවබෝධ විය.

ඇත්ත ඇති සැටියෙන් නො පෙන්වා මුළා කරන ස්වභාවයක් අවිද්‍යාවේ ඇත. අවිද්‍යාවෙන් වැසුණු සත්ත්වයාට, නිරන්තරයෙන් බිඳෙන අනිත්‍ය වූ රූප ස්කන්ධය පෙනෙන්නේ නිත්‍ය ලෙස ය. අනිත්‍ය වූ, නිරන්තරයෙන් වෙනස් වන වේදනාස්කන්ධය පෙනෙන්නේ ස්ථිර ලෙස ය. අනිත්‍යවූ සංඥා- සංස්කාර- විඥාන ස්කන්ධයන් පෙනෙන්නේ නිත්‍ය ලෙස ය.

ඒකාන්ත දුකක් වූ රූපස්කන්ධය, අවිද්‍යාවෙන් මුළා වූ විට පෙනෙන්නේ සැපයක් ලෙස ය. දුකක් වූ වේදනාස්කන්ධය පෙනෙන්නේ සැපක් ලෙස ය. දුක්ඛ වේදනාව දුකක් බව කවුරුත් දනිති. එහෙත් සුඛ වේදනාව, උපෙක්ඛා වේදනාව දුකක් ලෙසින් නො පෙනේ. සුඛ වේදනාව ඉබේ නො ලැබෙන බැවින්, එය ලබා ගැනීමට අවශ්‍ය ප්‍රත්‍යයන් සොයා ගත යුතු ය. එය සුඛ වේදනාවේ සංඛත දුක ය. සුඛ වේදනාව වහා නැති වී යන්නේ ය. එය එහි විපරිනාම දුක්ඛය ය. සුඛ වේදනාවට ඇලීම නිසා සතර අපායත් සහිත සංසාර දුක්ඛයේ සත්ත්වයා ගිල්වාලන්නේ ය. හලාහල විෂ මිශ්‍ර රසවත් ආහාරයක් මෙන්, සුඛ වේදනාව නිසා සත්ත්වයා දුකටම පත් වන්නේ ය. අවිද්‍යාව මෙම තත්ත්වය වසා, සුඛ වේදනාව සැපයක් ලෙසින් මවා පෙන්වයි. මෙසේම දුකක් වූ සංඥා සංස්කාර විඥානස්කන්ධයන් සැපක් ලෙසින්ම අවිද්‍යාව පෙන්වනු ලබයි.

මෙසේම අනාත්ම වූ රූපස්කන්ධය ආත්ම ලෙසින් ද, අනාත්ම වූ වේදනා- සංඥා- සංස්කාර- විඥාණ යන නාම ස්කන්ධයන් ආත්ම ලෙසින් ද, අවිද්‍යාවේ මුළාව නිසා සත්ත්වයා ග්‍රාහණය කරයි. මෙසේ ම අශුභ වූ පංචස්කන්ධය ශුභ වශයෙන් අවිද්‍යාව පෙන්වනු ලබයි.

හේතූන්ගේ සංයෝගය නිසා කිසිවකුගේ බලපෑමක් නොමැතිව ඉබේ හටගන්නා පඨවි- අපෝ- තේජෝ- වායෝ- ආකාස- විඥාන යන ධාතු මාත්‍රයක් ම වූ පංචස්කන්ධය, අවිද්‍යාවේ බලපෑම නිසා සත්ත්වයාට පෙනෙන්නේ සත්ත්වයකු පුද්ගලයකු හැටියට ය. 'මමකු' හැටියට ය. සොයුරු සොයුරියන් දෙමාපියන් දූදරුවන් මිතුරන් දෙවියන් බ්‍රහ්මයන් ආදී සත්ත්වයන් හැටියට ය.

මුළු සංස්කාර ලෝකයම ගිනිගෙන දැවෙන එකම ගිනි ජාලාවකි. පංචස්කන්ධය ඒකාන්ත දුක්ඛ පිණ්ඩයකි. මෙය අවිද්‍යාව නිසා නො පෙනී ගිය සත්ත්වයා පංචස්කන්ධයට 'මම' කියා ඇලීමක් ඇතිකර ගනී. එසේම දූදරු දෙමාපිය ආදී බාහිර පංචස්කන්ධයන්ට ද ඇලීමක්

ඇති කරගනී. මෙම ඇලීම නිසා භයානක සංසාර සාගරයේ නැවත නැවත ඉපැදෙන සත්ත්වයා වරෙක අපාදුක් විඳී. වරෙක ප්‍රේත දුක් විඳී. වරෙක තිරිසන්ව දුක් විඳී. සසර දුකෙහිම නැවත නැවත ගැලේ. මෙසේ දුක් ඇති කරවන ආශාව සැපක් ලබාදෙන දෙයක් ලෙසින් අවිද්‍යාවෙන් මුළා වූ විට පෙනේ.

මෙම භයානක සංසාරයෙන් ඈත් වූ, පංචස්කන්ධය නැතිකර දමන නිවන තරම් ශාන්තියක් සුවයක් නැත. සසරේ භයානකකම, දුක කොයිතරම් දුරට තේරේ ද, ඒ තරම් දුරටම නිවනේ අගය වැටහේ. පංචස්කන්ධය නැති කරන නිවන් සුවය, සුවයක් ලෙසින් අවිද්‍යාවට නො පෙනේ.

මෙසේම අවිද්‍යාව නිසා, නිවන් ලබනා මාර්ගය සැප ලබනා මාර්ගයක් ලෙසින් නො පෙනේ. සසර දිග්ගස්සවන සසරෙහි ම රඳවන මාර්ගයක්, සැප ලබා දෙන්නක් ලෙසින් පෙනේ.

අවිද්‍යාවේ මේ ආදී මුළා කරවන ස්වරූපය නිසා 'මමයා' පවත්වාගෙන යාමට, පෝෂණය කිරීමට, සතුටු කිරීමට, සැනසවීමට, නැළවීමට සත්ත්වයා නොයෙක් දේ කරයි. අනාගත භවවල දී ලබා ගැනීමට අදහස් කරන 'මමයා' යහපත් එකකු, සුවපත් එකකු කරවාලීමට ද නොයෙක් දේ කරයි. කයින් නොයෙක් දේ (කාය සංස්කාර) වරෙක කරයි. වචනයෙන් තව වරෙක (වචී සංස්කාර) කරයි. විටෙක මනසින් (මනෝ සංස්කාර) නොයෙක් දේ කරයි.

වරෙක කුශල් කරයි (පුඤ්ඤාභිසංස්කාර). වරෙක අකුශල් කරයි (අපුඤ්ඤාභිසංස්කාර). තව වරෙක බ්‍රහ්මලෝක සම්පත් සඳහා ධ්‍යාන වඩයි (ආනෙඤ්ජාභිසංස්කාර). මෙසේ අවිද්‍යාව නිසා සංස්කාර රැස් කෙරේ.

13. සසරෙන් ගොඩ ඒමට නොදී භයානක සසරේ ම රඳවමින් නැවත නැවත සත්ත්වයා උපදවන ආකාරය දැක්වෙන, මෙම පෙර නො ඇසූ විරූ පටිච්චසමුප්පාද ධර්මයන් පිළිබඳව, මෙසේ සිතනා බෝසතාණන් වහන්සේට ප්‍රඥාලෝකය පහළ විය.

පටිච්චසමුප්පාදය කියන්නේ පංචස්කන්ධ ප්‍රවෘති ක්‍රමය ය. නො සිඳී අඛණ්ඩව පැවතීගෙන යනු ලබන මෙම හේතු- ඵල ප්‍රවාහය හැර සත්ත්වයකු නැත. හේතු ඵල නො සිඳී පැවතගෙන යාම එලෙසින්ම නො දන්නා සත්ත්වයා, මෙහි සත්ත්වයකු ඇතැයි වරදවා තේරුම් ගනී.

මෙම පටිච්චසමුප්පාද විස්තරයේ දැක්වෙන්නේ ඒ ඒ ඵලයන් ඇතිවන ප්‍රධාන හේතූන් පමණකි. මේ හැර ඒ ඵලයන් උපදවන වෙනත් හේතූන් ද ඇත.

මේ සියල්ල පිළිබඳව නැවත නැවත විමසා බලනා බෝසතාණන් වහන්සේට සොවාන්- සකදාගාමි- අනාගාමි- අරහත් යන මාර්ග ඥානයන් පහළ විය.

අරහත් මාර්ග ඥාණ ප්‍රතිලාභයෙන් අස්මිමානය සම්පූර්ණයෙන් ගිලිහී යන්නේ ය. එවිට 'මම' කියන හැඟීම සම්පූර්ණයෙන්ම නිරුද්ධ වේ. 'මම' කියන හැඟීම ඇති තාක් කල්, මමයා ජීවත් කරවාලීමට ආශාවක් ඇති වේ. මරණ මොහොතේ පවා මේ ආශාව බලපවත්වන බැවින්, නැවත සසරේ රැඳී සිටීමේ ආශාව ද එවිට ඇත. 'මම' කියන හැඟීම ඇති තාක් කල්, සංස්කාර ද රැස් කරයි. මෙසේම 'මම' කියන හැඟීම ඇති විට ග්‍රාහණය හෙවත් උපාදාන කිරීම ද සිදුවේ. මෙසේ අවිද්‍යාවත්, තණ්හාවත්, සංස්කාරත්, උපාදානත් සහිත සත්ත්වයා මරණයෙන් පසු නැවත ඉපිදේ.

'මම' කියන හැඟීම සම්පූර්ණයෙන්ම නැති කරමින් අස්මිමානය සිඳලූ විට, ඔහුට පෙනෙන්නේ හේතු සංයෝගය නිසා ඇතිවන නාමරූපම ක්ෂණයක් පාසා ඇතිවෙමින් නැතිවෙමින් යන බව පමණි. ඔහේ ඇතිවෙවී නැතිවෙවී යන නාමරූපයන් පවත්වාගෙන යාමට ඔහුට ආශාවක් නැත. 'මම' කියන හැඟීම නැති නිසා සංස්කාර රැස්වන්නේ ද නැත. මරණ මොහොතේ නාම රූපයන් ගේ නිරුද්ධවීම ගැන ඔහුගේ කිසිදු තැකීමක් නැත. නාමරූපයෝම නිරුද්ධ වෙත්. එහිලා කවර තැකීමක් ද? මෙසේ අස්මිමානය දුරුකළ රහතන් වහන්සේ ගේ චුති සිතින් නාමරූපයෝ නැවත නූපදින ලෙසින්ම සම්පූර්ණයෙන්ම සිඳීයති. එවිට මෙතෙක් සංසාරයේ දැල්වුන මහා ගිනිකඳ සදහටම නිවී යනු ඇත.

මෙසේ අවිද්‍යාව සිඳලූ කල සංස්කාර ද නිරුද්ධ වන්නේ ය. විඤ්ඤාණය ද නිරුද්ධ වන්නේ ය. නාමරූප- සළායතන- ඵස්ස- වේදනා - තණ්හා- උපාදාන- භව- ජාති- ජරා මරණ ද නිරුද්ධ වන්නේ ය.

"අභෙදි කායො- නිරොධි සඤ්ඤා - වෙදනා සීතිභවිංසු සබ්බා වූපසමිංසු සඞ්ඛාරා - විඤ්ඤාණං අත්ථමාගමා" ති.

"කය බිඳී යන්නේ ය. සඤ්ඤාව නිරුද්ධ වන්නේ ය. සියලු

වේදනාවෝ සීතිභාවයට පත් වන්නෝ ය. සඞඛාරයෝ ව්‍යුපශමනය වෙත්. විඤ්ඤාණය නැති වී යේ." මේ සංසාර ගමනේ කෙළවර වූ අනුපාදිශේෂ නිර්වාණය යි.

මෙසේ බුදුපියාණෝ අරහත් මාර්ග ඤාණයෙන් සංසාර චක්‍රයේ අවිද්‍යා අරය සිඳලූ සේක. සංස්කාර අරය සිඳලූ සේක. විඤ්ඤාණ අරය සිඳලූ සේක. මෙසේ ම නාම රූප- සළායතන- ඵස්ස- වේදනා- තණ්හා- උපාදාන- භව- ජාති- ජරාමරණ- යන අරයන් ද සිඳලූ සේක. එබැවින් ම ඒ මහා නැණවතාණෝ අරහත් නම් වන සේක.

(පටිච්චසමුප්පාද ධර්මයන් එක් භවයකට පමණක් සීමා කර විස්තර කළ හැකි වුවත්, පහසුවෙන් තේරුම් ගැනීම සඳහා එය භව 3කට සම්බන්ධ කර මෙහි විස්තර කර ඇත.)

දැන් මේ බුදුගුණ භාවනාව ඉදිරියේ දක්වා ඇති පරිදි විදර්ශනාවට නගන්න.

# විදර්ශනාවට නැඟීම

1. බුදුගුණ භාවනා කිරීමේ දී මෙතෙක් පහළ වූ සිත් දැන් එකක්වත් නැත. ඒ සිත් ඉපැදුණු ඉපැදුණු විගසම බිඳි බිඳී ගිය බැවින් අනිත්‍යයෝ ය.

- මෙසේම බුදුගුණ භාවනා කරන විට ඇති වූ වේදනා දැන් එකක්වත් නැත. ඒ වේදනාවෝ ද ඉපැදුණු ඉපැදුණු විගසම නැති වූ බැවින් අනිත්‍යයෝ ය.

- මෙසේම බුදුගුණ භාවනා කරන විට පහළ වූ බුදුගුණ හැඟීම් කිසිවක් දැන් නැත. ඒ හැඟීම් හෙවත් සංඥාවෝ ද ඉපැදුණු ඉපැදුණු විගසම බිඳි බිඳී ගිය බැවින් අනිත්‍යයෝ ය.

- මෙසේම බුදුගුණ භාවනා කිරීමේ දී පහළ වූ කුශල චේතනාවන් දැන් නැත. බුදුගුණ භාවනා කරන විට තිබූ ශ්‍රද්ධාව ද දැන් නැත. එවිට ඇතිවූ ප්‍රඥාව ද දැන් නැත. මේ ආදී සංස්කාරයෝ ද ඉපැදුණු විගසම එවෙලේම බිඳී ගිය බැවින් අනිත්‍යයෝ ය.

- මෙසේම බුදුගුණ භාවනා කිරීමේ දී තිබූ ශරීරය ද දැන් නැත. චක්ඛායතනයේ රූපයෝ එහි දී ම බිඳී ගියහ. සොතායතනයේ රූපයෝ එහි දී ම බිඳී ගියහ. ඝානායතනයේ රූපයෝ ඝානායතනයේ දී ම බිඳී ගියහ. ජිව්හායතනයේ රූපයෝ ජිව්හායතනයේ දී ම බිඳී ගියහ. කායායතනයේ රූපයෝ එහි දී ම බිඳී ගියහ. එකිනෙකට සම්බන්ධයක් නැති, වෙන් වෙන්ව පවත්නා මේ ආයතනයෝ, එකිනෙකට සම්බන්ධයක් නො මැතිව වෙන් වෙන්වම බිඳී ගියහ.

ආහාරයෙන් උපන් රූපයෝ ද බිඳී ගියහ. චිත්තයෙන් උපන් රූපයෝ ද බිඳී ගියහ. ඍතුන්ගෙන් උපන් රූපයෝ ද බිඳී ගියහ. කර්මයෙන් හටගත් රූපයෝ ද බිඳී ගියහ. එම රූප ඉපැද වූ හේතූන් ද බිඳී ගියේ ය.

පඨවි ධාතුව බිඳී ගියේ ය. ආපෝ ධාතුව බිඳී ගියේ ය. තේජෝ ධාතුව බිඳී ගියේ ය. වායෝ ධාතුව බිඳී ගියේ ය.

මේ ශරීරයේ මෙසේ නිරන්තරයෙන් බිඳි බිඳී යන බැවින් අනිත්‍යය ය.

- මෙසේ මේ පංචස්කන්ධයම අනිත්‍යය ය. රූපය ද අනිත්‍යය ය. වේදනාව ද අනිත්‍යය ය. සංඥාව ද අනිත්‍යය ය. සංඛාර ද අනිත්‍යය ය. විඤ්ඤාණය ද අනිත්‍යය ය.

2. අනිත්‍ය නිසාම මෙම පංචස්කන්ධය දුකක් ය. මේ පංචස්කන්ධය පවතින එකත් දුකක් ය. පවත්වාගෙන යන එකත් දුකක් ය. මෙය පවත්වාගෙන යාමට ආහාර පාන සැපයීමත් දුකක් ය. යම්තාක් දුක් ඇත්තේ නම්, ඒවා ඇත්තේ ගස් ගල්වල නොව මේ පංචස්කන්ධයේ ය. හැම දුකක්ම ඇති වන්නේ මෙයට ය. ජරා දුක ඇත්තෙත් මෙහි ය. ව්‍යාධි දුක ඇත්තෙත් මෙහි ය. මරණ දුක ඇති වන්නෙත් මෙයට ය. ශෝක පරිදේව දුක්ඛ දොමනස්ස උපායාස දුක් ඇත්තේ ද මෙහි ය. අකැමැති රූප - ශබ්ද- ගන්ධ- රස- ඵොට්ඨබ්බයන් නිසා ඇතිවන දුකත් ඇත්තේ මෙහි ය. සා පිපාසා දුක් ඇත්තෙත් මෙහි ය. ටික වේලාවක් සිටගෙන සිටීමත් දුකක් ය. වැඩිවේලා හිඳගෙන සිටීමත් දුකක් ය. නිදාගෙන සිටීමත් දුකක් ය. ගමන් කිරීමත් දුකක් ය. මල මූත්‍රා ආදිය පිරී ඉතිරියාම නිසා සෝදා පවිත්‍ර කරන්න සිදුවීමත් දුකක් ය. මෙම පංචස්කන්ධය තිබෙන තාක් කල් දුකෙහි කෙළවරක් ඇත්තේ නැත. දුකෙන් ගැළවීමක් ඇත්තේ නැත.

3. මෙසේම අනිත්‍ය වූ, දුක්ඛ වූ මේ පංචස්කන්ධය අනාත්ම ය. එය මම නොවේ. මගේ නොවේ. මට ඕනෑ විධියට පවතින්නක් නොවේ. ඇසට රූපයක් ගැටුනොත් නො දැක සිටීමට නුපුළුවන. මගේ කැමැත්තට අනුව එය සිදු නොවේ. කනට ශබ්දයක් වැදුනොත් නො අසා සිටීමට ද නො හැකි ය. නාසයට ගන්ධයක් දැනුන විට එය නො දැන සිටීමට ද හැකියාවක් නැත. දිවට රසයක් දැනුනොත්, කයට ස්පර්ශයක් දැනුනොත්, මනසට දැනෙනා දෙයක් අරමුණු වුවහොත් ඒවා නො දැන සිටීමට නො හැක. ඒවා හේතූන් ගේ සංයෝගයෙන් කිසිවකුගේ බලපෑමකින් තොරව ඉබේ හටගන්නා බැවින් මම හෝ මගේ නොවේ.

මෙසේම මේ කය ද (ශරීරය) මට ඕනෑ විධියට නො පවතී. ජරා මහළු භාවයට පත් නො වී සිටීමට, ව්‍යාධි ඇති නො කර ගෙන සිටීමට, මරණයට පත් නො වී සිටීමට අප සිතුවත්, එය එසේ සිදු නොවේ. ආහාර ලැබීම මත කෙට්ටුවීම් මහත්වීම් සිදුවන මේ ශරීරය හේතූන් නිසා පවතී.

ඇස කන නාසය දිව ශරීරය යන මේ ආයතනයෝ එකිනෙකට සම්බන්ධකමක් නො මැතිව වෙන් වෙන්වම පවතිත්. ඒ සියල්ලම එකට ගෙන එයට 'මම' කියා සිතුවාට එය මම නොවේ.

මේ ශරීරයේ ඇත්තේ හේතූන් නිසා හටගනු ලබන පඨවි- ආපෝ- තේජෝ- වායෝ- ආකාශ- විඥාන යන ධාතූන් පමණි. නිරන්තරයෙන් බිඳී බිඳී යන, එසේ ඒ බිඳෙන නාම රූප කිසිදිනක නැවත නූපදින ලෙසම නිරෝධයට පත්වන, මෙහි ඇත්තේ නාමරූප මාත්‍රයක් පමණි. මෙහි සත්ත්වයෙක් නැත. පුද්ගලයෙක් නැත. මමෙක් නැත. අයිතිකාරයෙක් නැත. වශයෙහි පැවැත්විය හැකි ඉසුරු බවක් නැත. විඳින්නෙක් නැත. කරන්නෙක් නැත. අධිපතියෙක් හෝ අධිපතිභාවයක් ද මෙහි නැත. හේතූන් අනුව රූපය ඇතිවී ඇතිවී, බිඳී බිඳී යෙයි, නාමයද හේතූන් අනුව ඇතිවී ඇතිවී, බිඳී බිඳී යෙයි. එබැවින් මෙය අනාත්මය, එය මම නොවේ. මගේ නොවේ.

4. මේ පංචස්කන්ධය නිතරම පීඩා ගෙන දෙන නිසා ද දුකක් ය. අනිත්‍යයට පත් වන නිසා ද දුකක් ය. මට ඕනෑ විධියට නො පවතින බව ද දුකක් ය. එබැවින් පංචස්කන්ධ සඞ්ඛ්‍යාත සියලු සංස්කාරයන් දුක්ඛ සත්‍යය වන්නේ ය.

මෙම දුක් කන්ද, හොඳ දෙයක් වටනා දෙයක්, සාරවත් දෙයක් ලෙසින් ගෙන එයට ආශා කිරීම නිසා මේ දුක් නැවත නැවත උපදින්නේ ය. දුක් ඉපැදවීමේ හේතුව වූ තණ්හාව සමුදය සත්‍යය වන්නේ ය.

මෙම සියලු දුකින් ඈත් වූ, සියලු සංස්කාරයන් නැති කරන නිර්වාණය, නිරෝධ සත්‍යය වන්නේ ය.

ඒ නිවන් අවබෝධය සඳහා වැඩිය යුතු ශීල- සමාධි- පඤ්ඤා සඞ්ඛ්‍යාත ආර්ය- අෂ්ටාඞ්ගික මාර්ගය, මාර්ග සත්‍යය වන්නේ ය.

මගේ මේ භාවනාමය කුශලය, එම චතුරාර්‍ය සත්‍යාවබෝධයෙන් ලබනා නිර්වාණය සඳහා ම හේතු වේවා. වාසනා වේවා.

සාධු! සාධු!! සාධු!!!